පිරුවානා පොත් වහන්සේ

සංස්කරණය සහ පිරිත් සජ්ජායනය

පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි

පිරුවානා පොත් වහන්සේ

පිරිත් සහිත සංයුක්ත තැටිය සමග

සංස්කරණය සහ පිරිත් සජ්ජායනය

පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි

ප්‍රකාශනය

වේරගොඩ සුනන්දා මෙහෙණින් වහන්සේ

ටෙලිෆෝන් +94 770589498 +94 755218421

+65 94656570

1B

සමනල ප්‍රින්ටර්ස් - බටපොල
091 2260785 / 0777 557 127
samanalaprinters@yahoo.com

ප්‍රථම මුද්‍රණය
30 11 2017

"සබ්බදානං ධම්මදානං ජිනාති"
(ධර්ම දානය සෙසු දාන සියල්ලටම වඩා අගනේය)

"පිරුවානා පොත් වහන්සේ"

නමැති මේ ග්‍රන්ථය ප්‍රකාශ කිරීම සඳහා පූර්ණ අනුග්‍රහය සපයන ලද්දේ,
සිංගප්පූරුවේ න් වූ හින් මහතා (Mr. Ng Wu Hin) **සහ ඒ පවුලේ සියලු දෙනාත් විසිනි.**

මෙම අනර්ඝ ග්‍රන්ථය ප්‍රකාශ කිරීමට අනුග්‍රහය සම්පාදනයෙන්,
අත්පත් කොට ගන්නා ලද පින් බෙලෙන්,
න් වූ හින් මහතාට සහ එම පවුලේ සියලු දෙනාට ම
ශ්‍රේෂ්ඨ ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය ලැබී, එහි බලයෙන්
නිදුක්, නීරෝගී සුවයත්, සර්ව සෞභාග්‍යයත්,
සියලු ශුභ සිද්ධියත් ලැබේවායි යි
මගේ ප්‍රාර්ථනය යි.

පූජ්‍ය වේරගොඩ සාරද නායක මහා ස්ථවිරයන් වහන්සේ
ප්‍රධාන සංඝනායක, සිංගප්පූරුව,
විහාරාධිපති, වේරගොඩ ජයන්ති විහාරය.
01.01.2019

පටුන

පිරිත් පේකිරීම .....

1. සරණාගමනං 1
(බුද්දක නිකාය - බුද්දකපාඨපාලි - සරණාගමනය (1)

2. දස සික්ඛාපදානි 4
(බුද්දක නිකාය - බුද්දකපාඨපාලි - දස ශික්ෂාපද (2)

3. සාමණේර පඤ්හො 5
(බුද්දක නිකාය - බුද්දකපාඨපාලි - සාමණේර පඤ්හො (4)

4. ද්වත්තිංසාකාරො 7
(බුද්දක නිකාය - බුද්දකපාඨපාලි - ද්වත්තිංසාකාරො (3)

5. පච්චවෙක්ඛණා 7
(අංගුත්තර නිකාය - දසක නිපාත පාලි - අක්කොස වග්ගො (5) -
පබ්බජිතඅභිණ්හසුත්තං (48)

6. දස ධම්ම සුත්තං 8
(අඞ්ගුත්තර නිකාය-දසක නිපාතපාලි - අක්කොසවග්ගො (5)-පබ්බජිත අභිණ්හ සුත්තං (48) (8)

7. මහා මංගල සුත්තං 11
(බුද්දක නිකාය - බුද්දකපාඨපාලි - මංගල සූත්‍රය (5)
(බුද්දක නිකාය - සුත්තනිපාත පාලි - චූළ වග්ගො (2) - මංගල සූත්‍රය (4)

8. රතන සුත්තං 14
(බුද්දක නිකාය - බුද්දකපාඨපාලි - රතන සූත්‍රය (6)
(බුද්දක නිකාය - සුත්තනිපාත පාලි - චූළ වග්ගො (2) - රතන සූත්‍රය (1)

9. කරණීය මෙත්ත සුත්තං 19
(බුද්දක නිකාය - බුද්දකපාඨපාලි - මෙත්ත සූත්‍රය (9)
(බුද්දක නිකාය - සුත්තනිපාත පාලි - උරග වග්ගො (1) - මෙත්ත සූත්‍රය (8)

10. බන්ධ පරිත්තං 21
(අංගුත්තර නිකාය - චතුක්ක නිපාත පාලි - පත්තකම්ම වග්ගො (7) - 2 අභිරාජසුත්ත (7))

11. මෙත්තානිසංස සුත්තං.....24
(අංගුත්තර නිකාය - එකා දසක නිපාත පාලි - අනුස්සති වග්ගො (2) - මෙත්තානිසංස සුත්තං (5)

12. මිත්තානිසංස සුත්තං 25
(බුද්දක නිකාය - ජාතක පාලි 2 - මහා නිපාතො (22) -
මුගපක්ඛ ජාතකය (538 ජාතකය) 12 සිට 20 දක්වා ගාථාවන්)

13. මොර පරිත්තං 27
(බුද්දක නිකාය - ජාතක පාලිය (1) - දුක නිපාත (2) - මොර ජාතකං (159 (2 1 9)

14. චන්ද පරිත්තං 28
(සංයුක්ත නිකාය - සගාථාවග්ග පාලි - දේවපුත්ත සංයුත්තං (2) - චන්ද පරිත්ත (14/9)

15. සුරිය පරිත්තං 30
(සංයුක්ත නිකාය - සගාථාවග්ග පාලි - දේවපුත්ත සංයුත්තං (2) - සුරිය පරිත්ත (15/10)

16. ධජග්ග පරිත්තං 32
(සංයුක්ත නිකාය - සගාථාවග්ග පාලි - සක්ක සංයුත්තං (11) - ධජග්ග සුත්ත (3)

17. මහා කස්සපත්ථෙර බොජ්ඣඞ්ගං 36
(සංයුත්ත නිකාය - මහාවග්ග පාලි (5) - බොජ්ඣඞ්ග සංයුත්ත (2) - ගිලාන වග්ගො (2)
පඨම ගිලාන සුත්තං (4) - මහා කස්සපත්ථෙර බොජ්ඣඞ්ගං (195)

18. මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣඞ්ගං 40
(සංයුත්ත නිකාය - මහාවග්ග පාලි (5) - බොජ්ඣඞ්ග සංයුත්ත (2) - ගිලාන වග්ගො (2) -
දුතිය ගිලාන සුත්තං (5) - මහා කස්සපත්ථෙර බොජ්ඣඞ්ගං (196)

19 මහා චුන්දත්ථෙර බොජ්ඣඞ්ගං 43
(සංයුත්ත නිකාය - මහාවග්ග පාලි (5) - බොජ්ඣඞ්ග සංයුත්ත (2) - ගිලාන වග්ගො (2) -
තතිය ගිලාන සුත්තං (6) - මහා කස්සපත්ථෙර බොජ්ඣඞ්ගං (197)

20. ගිරිමානන්ද සුත්තං 46
(අංගුත්තර නිකාය - දසක නිපාත පාලි - සචිත්ත වග්ගො (6 1) - ගිරිමානන්ද සුත්තං (10)

21. ඉසිගිලි සුත්තං 55
(මජ්ඣිම නිකාය - උපරිපණ්ණාසපාලි (3) - අනූපදවග්ගෝ (2) - ඉසිගිලි සූත්‍රය (6))

22. ධම්මචක්කප්පවත්තන සුත්තං 63
(සංයුත්ත නිකාය - මහා වග්ග පාලි - සච්ච සංයුත්තං (12) -
ධම්මචක්කපවත්තන වග්ගෝ (2) - ධම්මචක්කපවත්තන සූත්‍රය (1))

23. මහා සමය සුත්තං 76
(දීඝ නිකාය - මහා වග්ග පාලි - මහා සමය සූත්‍රය (7)

24. ආළවක සුත්තං 89
(සංයුත්ත නිකාය - සගාථාවග්ග පාලි - යක්ඛසංයුත්තං (10) - ආළවක සුත්තං (12)
(බුද්දක නිකාය - සුත්තනිපාත පාලි - උරග වග්ගො (1) - ආළවක සූත්‍රය (10)

25. කසීභාරද්වාජ සුත්තං 94
(සංයුත්ත නිකාය - සගාථාවග්ග පාලි - බ්‍රාහ්මණසංයුත්තං (7) - උපාසක වග්ගො (2) සහ
(බුද්දක නිකාය - සුත්තනිපාත පාලි - උරග වග්ගො (1) - කසීභාරද්වාජ සුත්තං (4)

26. පරාභව සුත්තං 99
(බුද්දක නිකාය - සුත්තනිපාත පාලි - උරග වග්ගො (1) - පරාභව සූත්‍රය (6)

27. වසල සුත්තං 103
(බුද්දක නිකාය - සුත්තනිපාත පාලි - උරග වග්ගො (1) - වසල සූත්‍රය (7)

28 සච්ච විභඞ්ග සුත්තං 110
මජ්ඣිම නිකාය - උපරිපණ්ණාසපාලි (3) - විභඞ්ග වග්ගො (4) - සච්ච විභඞ්ග සුත්තං (11) (371)

29. ආටානාටිය සුත්තං 121
(දීඝ නිකාය - පාථික වග්ග පාලි - ආටානාටිය සූත්‍රය (9))

පිරුවානා පොත් වහන්සේ

පිරිත් සහිත සංයුක්ත තැටිය සමග

පිරිත් පේකිරීම

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං,
විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං,
සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වේදනා,
වේදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා
භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙව
දුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති එවමෙතස්ස කෙවලස්ස දුක්ඛන්ධස්ස
සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙස විරාගනිරොධා සඞ්ඛාර
නිරොධො, සඞ්ඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා
නාමරූප නිරොධො, නාමරූප නිරොධා සළායතනං නිරොධො, සළායතන
නිරොධා ඵස්සො නිරොධො, ඵස්ස නිරොධා වේදනා නිරොධො, වේදනා
නිරොධා තණ්හා නිරොධො, තණ්හා නිරොධා උපාදාන නිරොධො,
උපාදාන නිරොධා භව නිරොධො, භව නිරොධා ජාති නිරොධො, ජාති
නිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා
නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛන්ධස්ස නිරොධො හොති.

අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං
ගහකාරක දිට්ඨොසි පුනගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛිතං
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං බයමජ්ඣගාති.

ඉතිපිසො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො
සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං
බුද්ධො භගවාති ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො
අකාලිකො එහි පස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො
විඤ්ඤූහීති. සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො උජුපටිපන්නො
භගවතො සාවකසඞ්ඝො ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො
සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො යදිදං චත්තාරි පුරිසයුගානි
අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යා
පාහුනෙය්‍යා දක්ඛිනෙය්‍යා අඤ්ජලිකරණීයො අනුත්තරං
පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

එතෙන සච්චවජ්ජෙන දුක්ඛාවූපසමෙනතුතෙ. එතෙන සච්චවජ්ජෙන
භයාවූපසමෙනතුතෙ. එතෙන සච්චවජ්ජෙන රෝගාවූපසමෙනතුතෙ.

(ජය මඞ්ගල ගාථා, මඞ්ගලසූත්‍රය, රතන සූත්‍රය, කරණීයමෙත්ත සූත්‍රය,
මෙතැනට දේශනා කළ යුතුයි.)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

භාග්‍යවත් වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ සර්‍වඥයන් වහන්සේට නමස්කාර වේවා.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

භාග්‍යවත් වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ සර්‍වඥයන් වහන්සේට නමස්කාර වේවා.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

භාග්‍යවත් වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ සර්‍වඥයන් වහන්සේට නමස්කාර වේවා.

1. සරණාගමනං

සරණාගමනය

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සංඝං සරණං ගච්ඡාමි

බුදුන් සරණාකොට යෙමි.
ධර්මය සරණාකොට යෙමි.
(සර්‍වඥපුත්‍ර වූ) සංඝයා සරණාකොට යෙමි.

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි

දෙවනුව ද බුදුන් සරණාකොට යෙමි.
දෙවනුව ද ධර්මය සරණාකොට යෙමි.
දෙවනුව ද සංඝයා සරණාකොට යෙමි.

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
තතියම්පි සංඝං සරණං ගච්ඡාමි

තුන්වෙනුව ද බුදුන් සරණාකොට යෙමි.
තුන්වෙනුව ද ධර්මය සරණාකොට යෙමි.
තුන්වෙනුව ද සංඝයා සරණාකොට යෙමි.

2. දස සික්ඛාපදානි
දස ශික්ෂාපද

පාණාතිපාතා වේරමණී සික්ඛාපදං
ප්‍රාණාතිපාතයෙන් වැළකීමේ ශික්ෂාපදය

අදින්නාදානා වේරමණී සික්ඛාපදං
අදත්තාදානයෙන් වැළකීමේ ශික්ෂාපදය

අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං
අබ්‍රහ්මචරියාවෙන් වැළකීමේ ශික්ෂාපදය

මුසාවාදා වේරමණී සික්ඛාපදං
මුසාවාදයෙන් වැළකීමේ ශික්ෂාපදය

සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං
මදයට ප්‍රමාදයට කාරණා වූ රහමෙරින් වැළකීමේ ශික්ෂාපදය

විකාල භෝජනා වේරමණී සික්ඛාපදං
විකාලභෝජනයෙන් වැළකීමේ ශික්ෂාපදය

නච්ච ගීත වාදිත විසූකදස්සනා වේරමණී සික්ඛාපදං
තමා නැටීම ය, තමා ගී කීම ය, තමා බෙර ආදිය වාදනය, යම්කෙනෙකුන් විසින් කරන නෘත්‍යාදී විසුලුබැලීම ය යන මෙයින් වැළකීමේ ශික්ෂාපදය

මාලාගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං
දැසමන් ආදීවූ යම් කිසි මල් ජාති ය, සුගන්ධ ද්‍රව්‍ය ය, කසා සඳුන් ආදී අඹරා ඇඟ ආලේප කරන ජවිරාගකරණය යන මෙකී දෙය පැලඳීමෙන් දැරීම ය, උනුතැන් බලබලා නැවත නැවත සැරසීමෙන් මණ්ඩන ය, ජවිරාගවශයෙන් ඉවසා සැරසීමය යන කාරණයෙන් වැළකීමේ ශික්ෂාපදය

උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං
උසසුන් මහ අස්නෙන් වැළකීමේ ශික්ෂාපදය

ජාතරූප රජත පටිග්ගහණා වේරමණී සික්ඛාපදං
රන් රිදී මසු කහවනු පිළිගැන්මෙන් වැළකීමේ ශික්ෂාපදය

3. සාමණේර පඤ්හො
සාමණේර ප්‍රශ්නය

එක නාම කිං?
(මේ ශාසනයෙහි) එක නම් කිම?

සබ්බේ සත්තා ආහාරට්ඨිතිකා
හැම සත්හු ආහාර පසයෙන් සිටිති.

ද්වෙ නාම කිං?
දෙක නම් කිම?

නාමඤ්ච රූපඤ්ච
නාමය හා රූපය යි.

තීණි නාම කිං?
තුන නම් කිම?

තිස්සො වේදනා
තුන් වේදනාවෝ ය.

චත්තාරි නාම කිං?
සතර නම් කිම?

චත්තාරි අරියසච්චානි
සතර ආර්‍ය සත්‍යයෝ ය.

පඤ්ච නාම කිං?
පස නම් කිම?

පඤ්චූපාදානක්ඛන්ධා
පස් උපාදානස්කන්ධයහ.

ඡ නාම කිං?
සය නම් කිම?

ඡ අජ්ඣත්තිකානි ආයතනානි
ආධ්‍යාත්මික ෂඩායතනයහ.

සත්ත නාම කිං?
සත නම් කිම?

සත්ත බොජ්ඣඞ්ගා
සත් බොජ්ඣඞ්ගයහ.

අට්ඨ නාම කිං?
අට නම් කිම?

අරියො අට්ඨඞ්කො මග්ගො
අරි අටඟ මඟ

නව නාම කිං?
නවය නම් කිම?

නව සත්තා වාසා
සත්තවාස නවය යි.

දස නාම කිං?
දශය නම් කිම?

දසහඞ්ගෙහි සමන්නාගතො අරහාති වුච්චතීති.
දසඟින් යුත් මහණාතෙමේ රහතැයි කියනු ලැබෙයි.

තුන් වේදනා: සුඛ, දුක්ඛ, උපෙක්ෂා

සතර ආර්‍ය්‍ය සත්‍යය: දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග

පංච උපාදානස්කන්ධ: රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන

සය ආයතන: චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන

සත් බොජ්ඣඞ්ගය: සති ධම්මවිචය,පීති, විරිය, පස්සද්ධි, සමාධි, උපෙක්ෂා

ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය: සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා සති, සම්මා සමාධි

නව සත්තවාස: නානත්තකායා, නානත්ත සඤ්ඤිය, නානත්තකායා එකන්ත සඤ්ඤිය, එකන්ත කාය නානත්ත සඤ්ඤිය, එකත්තකායා එකත්ත සඤ්ඤිය අසඤ්ඤිය, අකාසානඤ්චායතනූපගය,විඤ්ඤානඤ්චායතනූපගය, ආකිඤ්ඤානුයතනූපගය, නෙවවිඤ්ඤානාසඤ්ඤායතනූපගය

දශය: අසෙඛ සම්මා දිට්ඨි, අසෙඛ සම්මා සංකප්ප, අසෙඛ සම්මා වාචා, අසෙඛ සම්මා කම්මන්ත, අසෙඛ සම්මා ආජීව, අසෙඛ සම්මා සති, අසෙඛ සම්මා සමාධි, අසෙඛ සම්මා ඥාන, අසෙඛ සම්මා විමුක්ති

4. ද්වත්තිංසාකාරෝ
ද්වත්තිංසාකාරය

අත්ථි ඉමස්මිං කායෙ කෙසා, ලොමා, නඛා, දන්තා, තචෝ, මංසං, නහාරු, අට්ඨි, අට්ඨිමිඤ්ජා, වක්කං, හදයං, යකනං, කිලොමකං, පිහකං, පප්ඵාසං, අන්තං, අන්තගුණං, උදරියං, කරීසං, පිත්තං, සෙම්හං, පුබ්බො, ලොහිතං, සෙදෙ, මෙදෙ, අස්සු, වසා, බෙලෝ, සිඞ්ඝානිකා, ලසිකා, මුත්තං, මත්ථකෙ මත්ථලුඞ්ගන්ති.

(ව්‍යාමමාත්‍ර සඩබ්‍යාත වූ) මේ ශරීරයෙහි, කේසයෝ ඇත, මේ ශරීරයෙහි, ලෝමයෝ ඇත, (එසේම) (දෙඅත් දෙකෙහි විසි) නිය පොත්තෝ ද, දන්තයෝ ද, සමෙක් ද, මස්පිඬු ද, නහර ද, ඇට ද, ඇටමිදුලු ද, වකුගඩුවක් ද, හෘදයමාංසයෙක් ද, අක්මාවෙක් ද, දලබෙක් ද, බඩදිවෙක් ද, පපුවෙක් ද, බඩවැලෙක් ද, (ඒ බඩවැල බැඳ සිටිනා) අතුණු බහනෙක් ද, (කෑ ආහාර සිටිනා උදරයෙක් හෙවත්) නොපැසුනු ආහාරය ද, අහර මල ය, පිත ය, සෙම් ය, පූයා (හෙවත්) සැරව ය, ලෙහෙ ය, සෝදිය ය, මේදතෙල ය, කඳුලු ය, වුරුණු තෙල ය, කෙල ය, මුකුණු ය (හෙවත්) සොටු ය, (සන්ධි අතුරෙහි සිටිනා) සඳමිදුලු ය, මුත්‍ර ය, හිසමුදුනෙහි හිස් මොලය යි (යන මේ දෙතිස් කොටස් කුණපයෝ මේ සිරුරෙහි ඇත්තාහ.)

5. පච්චවෙක්ඛණා

පස් විකුම්

පටිසඞ්ඛායොනිසො චීවරං පටිසෙවාමි, යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකසවාතාතපසිරිංසප සම්ඵස්සානං පටි ඝාතාය, යාවදෙව හිරි කොපීන පටිච්ඡාදනත්ථං

නුවණින් පරීක්ෂා කොට (හෙවත් සීත නැසීම් ආදී වූ ඒ ඒ ප්‍රයෝජන වෙන් වෙන් කොට සලකා) සිවුරු වළඳමි. යම්තාක් (ඇතුළත් හි ධාතුකුපිතතාවකින් හෝ පිටත ඍතුපරිණාමයකින් හෝ උපන්) සීත නසන පිණිස, (එබඳු වූ) උෂ්ණ නසන පිණිස, (ඩැහැලේබොන) ඇටමැසි ය, (විද ලේ බොන) මදුරු ය, සුළඟ ය, අවුව ය, (සර්පාදීවූ) දීඝජාතිය, යන මොවුන් සම්බන්ධි වූ, ස්පර්ශයන්ගේ, නසන පිණිස (හෙවත් මෙකී උවදුරු පැමිණිවිට නසනු පිණිස, යම් තාක් ම, (හෙවත් හැමවේලෙහිම) ලජ්ජා නසන තැන මුවහ කරන පිණිස (සිවුරු වැළඳගනිමි.)

පටිසඞ්ඛායොනිසො පිණ්ඩපාතං පටිසෙවාමි, නෙව දවාය, න මදය, න මණ්ඩනාය, න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා, යාපනාය, විහිංසූපරතියා, බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණං ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි යාත්‍රා ච මෙ භවිස්සති, අනවජ්ජතා ච ඵාසුවිහාරොචාති.

නුවණින් පරීක්ෂා කොට (හෙවත් ආහාර වැළඳීමෙන් වන ඒ ඒ ප්‍රයෝජන වෙන් වෙන් කොට සලකා) පිඬු වළඳමි. (ගම් දරුවන් සේ) කෙළනා සඳහා නො වළඳමි, බල මද පුරුෂමද වඩනා පිණිස ද නො වළඳමි, අලඞ්කාර පිණිස නො වළඳමි, සැරසීම පිණිස නො වළඳමි. යම්තාක් ම මේ ශරීර ප්‍රතිබද්ධ වූ ජීවිතයාගේ ස්ථිතිය පිණිස, යාපනය පිණිස, සාපෙළ හරණා පිණිස, බඹසර සපයන පිණිස, මේ ආහාර වළඳමි. මෙසේ (නොවැළඳීමෙන් වන) පරණදුක් වේදනාව නසන්නෙමි. (වඩා වැළඳුම්පසයෙන් උපදනා) අලුත් දුක්වේදනාව, නොඋපදවන්නෙමි. මට මේ සතර ඉරියව් සෙමෙහි පැවැත්ම ද, නිවරද බැව් ද, (සැප අහර පමණ දැන වැළඳීමෙන් කායබල ලදිත්) යෙහෙන් විසීම ද, වන්නේය යි (සලකා මේ අහර වළඳමි.)

පටිසඞ්ඛායොනිසො සෙනාසනං පටිසෙවාමි, යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකස වාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං.

නුවණින් සීත නැසීම ආදී ඒ ඒ ප්‍රයෝජන වෙන් වෙන් කොට සලකා, මේ සෙනසුන්, වැළඳ ගනිමි. යම්තාක් (සීගතු ආදී) සීත පීඩා නසන පිණිස, (ගිනිරුස් ආදී) උෂ්ණ පීඩා නසන පිණිස, ඩැහැ ලේ බොන මැස්සෝ, විද ලේ බොන මදුරුවෝ, සුළඟ, අව්ව, දීඝජාති සර්පාදීහු ය, යන මෙකීවුවන්ගේ, දුක්පහස් නසන පිණිස හැම වේලෙහිම ගිම් වැසි හිම වලායෙන් ඇති සෘතුදු, (සිංහව්‍යාඝ්‍රාදි භය ද) රාගද්වේෂාදි උපද්‍රව ද, නසන පිණිස, සිත එකඟ කිරීමෙහි ඇලෙන පිණිස, සෙනසුන් වැළඳගනිමි.

පටිසඞ්ඛායොනිසො ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරං පටිසෙවාමි, යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය, අබ්‍යාපජ්ඣපරමතායාති.

නුවණින් ඒ ඒ ප්‍රයෝජන වෙන් වෙන් කොට සලකා, (මේ) ගිලන්පස බෙහෙත් පිරිකර වළඳමි. හැම වේලෙහිම උපන් සිරුරු පෙළෙන්නා වූ, දුක්වේදනාවන් නසනු පිණිස, නිරෝගිබැව් උතුම් බැවින් (මේ ගිලන්පස බෙහෙත් පිරිකර වැළඳගනිමි.

6. දස ධම්ම සුත්තං

දස ධම්ම සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා★සාවත්ථියං විහරති පෙතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ★තත්‍ර බො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති★භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච★දස ඉමෙ භික්ඛවෙ ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බා★කතෙම දස★

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජතෙම සැවැත් නුවර සමීපයෙහි වූ ජේත නම් රාජකුමාරයාගේ උයන්හි කරණා ලද බැවින් පෙතවන නම් වූ අනේපිඬු මහ සිටාණන්ගේ අරමිහි වැඩවාසය කර වදාරණා සේක. එකල්හි බුදුරජතෙම මහණොනියි කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කර වදාළ සේක.
ඒ භික්ෂූහු ස්වාමීන් වහන්සැයි කියා භාග්‍යවත්හට ප්‍රතිවචන දුන්නාහුය.
භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රය වදාළ සේක. මහණොනි, මෙම දස ධර්මයෝ ගිහි ගෙය හැර පැවිදි වූවහු විසින් එක්වන් නුවණින් සැලකිය යුත්තාහු ය.

වෙවණ්ණියම්හි අජ්ඣූපගතොති★පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං★

මෙම විවර්ණ භාවයට පැමිණියෙමි යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතුයි.

පරපටිබද්ධා මෙ ජීවිකාති★පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං★

මා ගේ දිවි පැවැත්ම අනුන් අයත්යැ යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතුයි.

අඤ්ඤෙදා මෙ ආකප්පො කරණීයොති★පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං★

මා විසින් අන්‍ය වූ ආකල්පයක් කටයුතුයැ යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතුයි.

කච්චි නු බො මෙ අත්තා සීලතො න උපවදතීති★පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං★

කිමෙක් ද? මා ගේ සිත සීලයෙන් උපවාද නො ලබාදැ යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතුයි.

කච්චි නු බො මං අනුවිච්ච විඤ්ඤූ★සබ්‍රහ්මචාරී සීලතො න උපවදන්තීති★ පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං★

කිමෙක් ද? නුවණැති සබ්‍රම්සරුන් වහන්සේලා මා ගැන සීලයෙන් පරිහව නො කෙරෙත්දැ යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතුයි.

සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවොති★පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං★

ප්‍රිය වූ මනවඩන්නා වූ සියල්ලෙන් නොහොත් හැමදෙනා කෙරෙන් මාගේ ජාතියෙන් නානාභාවය මරණයෙන් විනාශභාවය හෙවත් වෙනස්වීම වේ ය යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතුයි.

කම්මස්සකොම්හි කම්මදායාදො කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණොා★යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා, පාපකං වා තස්ස දායාදො භවිස්සාමීති★පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛි තබ්බං★

මම කර්මය අයත් කොට ඇත්තෙක් වෙමි. කර්මය දායාද කොට ඇත්තෙක් වෙමි. කර්මය ම යෝනි කොට ඇත්තෙක් වෙමි. කර්මය පිළිසරණ කොට ඇත්තෙක් වෙමි. යහපත් වූ හෝ අයහපත් වූ යම් කර්මයක් කෙරෙම් ද, එයට හිමිවෙමි යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතුයි.

කථම්භූතස්ස මෙ රත්තිංදිවා වීතිපතන්තීති★පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛි තබ්බං★

කෙසේ වූ මට රෑදාවල් දෙක ඉක්මේදෝ හෝ යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතුයි.

කච්චි නුබොහං සුඤ්ඤාගාරෙ අභිරමාමීති★පබ්බජිතෙන අභිණාහං පච්ච වෙක්ඛිතබ්බං★

කිමෙක් ද? මම සුන්‍යාගාරයෙක්හි හෙවත් මහජනයා ගෙන් හිස් වූ පෙදෙසක සියලු ඉරියව්යෙහි හුදෙකලාව ඇලෙම්දෝහෝ යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතුයි.

අත්ථි නුබො මෙ උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සන විසෙසො අධිගතො, සොහං පච්ඡිමෙ කාලෙ සබ්‍රහ්මචාරීහි

පුට්ඨො න මඞ්කු භවිස්සාමීති★පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං★

මා සතන්හි උතුරු මිනිස් දම්ගුණ ඇත් ද, මා විසින් ආර්‍යභාවයට සුදුසු ඥාන දර්ශන විශේෂයක් ලබන ලදදැ යි මා මරණ මඤ්චකයෙහි හොත් කල්හි සබ්‍රහ්මචාරීන් විසින් විචාරණ ලද්දෙම් තේජස් රහිත නොවෙම්දැ යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතුයි.

ඉමෙ බො භික්ඛවෙ දස ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බාති★
ඉදමවොච භගවා★අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති★

මහණෙනි, මේ දශධර්මයෝ ගිහිගෙය හැර මහණ වූවහු විසින් නිතර එක්වන්ව සැලකිය යුත්තාහ. භාග්‍යවතුන් වහන්සේ මේ දේශනාව මෙසේ වදාළසේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනාව අසා විශේෂයෙන් සතුටු වූහ.

7. මහා මංගල සූත්‍රය

මහා මංගල සූත්‍රය

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ අථ බො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඕභාසෙත්වා යෙන භගවා තෙනු'පසංකමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි එකමන්තං ඨිතා බො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි:-

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේ පිඬු මහ සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි එක්තරා දෙවියෙක් රෑ ඉක්මවා ගිය කල්හි විශිෂ්ඨ ශෝභා ඇත්තේ සියලු දෙවිරම් වෙහෙර ස්වකීය ශරීර ශෝභාවෙන් බබුලුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. එකත් පසක සිටි ඒ දේවි තෙම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් (මෙසේ) කීය.

බහූ දෙවා මනුස්සා ච - මංගලානි අචින්තයුං
ආකංඛමානා සොත්ථානං - බ්‍රූහි මංගල මුත්තමං

මෙලොව පරලොව සැප කැමති වන්නා වූ බොහෝ දෙවියෝ ද, මනුෂ්‍යයෝ ද දියුණුවට හිත කරුණු සිතූහ. වැඩ සලසන ඒ උතුම් මගුල් අපට අනුකම්පාවෙන් වදාළ මැනවි.

අසෙවනා ච බාලානං - පණ්ඩිතානං ච සෙවනා
පූජා ච පූජනීයානං - එතං මංගල මුත්තමං

බාලයන්ගේ නොහොත් අසත් පුරුෂයන් ගේ සේවනය නොකිරීමද, පණ්ඩිතයන් නොහොත් සත් පුරුෂයන් සේවනය කිරීමද, පිදිය යුත්තන් පිදීම ද (යන) මෙය උතුම් මංගල්‍යකි.

පතිරූප දෙස වාසෝ ච - පුබ්බෙ ච කත පුඤ්ඤතා
අත්ත සම්මා පණිධි ච - එතං මංගල මුත්තමං

සුදුසු දේශයක විසීම ද, පෙර කරන ලද පින් ඇති බවද, සිත මනා දහම්හි පිහිටුවීම ද (යන) මෙය උතුම් මංගල්‍යකි.

බාහුසච්චඤ්ච සිප්පඤ්ච - විනයෝ ච සුසික්ඛිතෝ
සුභාසිතා ච යා වාචා - එතං මංගල මුත්තමං

බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව ද, ශිල්ප දැනීමද, මනාකොට හික්මුණු විනය ඇති බව ද, යම් වචනයක් මොනවට කියන ලද ද සුබැසි වචනයන් ද (යන) මෙය උතුම් මංගල්‍යකි.

මාතා පිතූ උපට්ඨානං - පුත්ත දාරස්ස සංගහෝ
අනාකුලා ච කම්මන්තා - එතං මංගල මුත්තමං

මවුට උපස්ථාන කිරීමද, පියාට උපස්ථාන කිරීම ද, අඹුදරුවන්ට සංග්‍රහ කිරීමද, නිරවුල් කර්මාන්ත ඇති බවද (යන) මෙය උතුම් මංගල්‍යකි.

දානං ච ධම්ම චරියා ච - ඤාතකානඤ්ච සංගහෝ
අනවජ්ජානි කම්මානි - එතං මංගල මුත්තමං

දන් දීම ද, දස කුසල්කම්හි හැසිරීමද, නෑයන්ට සැලකීමද, නිවැරදි ක්‍රියා ද (යන) මෙය උතුම් මංගල්‍යකි.

ආරති විරති පාපා - මජ්ජ පානා'ච සඤ්ඤමෝ
අප්ප මාදෝ ච ධම්මෙසු - එතං මංගල මුත්තමං

පව්කම්වල නොඇලීම ද, අකුශල ක්‍රියා වලින් වැළකීම ද මත්පැන් බීමෙන් වැළකීම ද, සියලු කුසල් දහම්හි පමා නොවීමද (යන) මෙය උතුම් මංගල්‍යකි.

ගාරවෝ ච නිවාතෝ ච - සන්තුට්ඨි ච කතඤ්ඤුතා
කාලෙන ධම්ම සවණාං - එතං මංගල මුත්තමං

ගරු කටයුත්තන්ට ගරු කිරීම ද, නිහතමානී බව ද, ලද දෙයින් සතුටු වන බව ද, කෙළෙහි ගුණ දන්නා බව ද, සුදුසු කාලයෙහි බණ ඇසීම ද (යන) මෙය උතුම් මංගල්‍යකි.

ඛන්තී ච සොවචස්සතා - සමණානඤ්ච දස්සනං
කාලෙන ධම්ම සාකච්ඡා - එතං මංගල මුත්තමං

ඉවසීම ද, කීකරු බව ද, ශ්‍රමණයන් දැකීම ද, සුදුසු කල්හි ධර්මසාකච්ඡාව ද (යන) මෙය උතුම් මංගල්‍යකි.

තපෝ ච බ්‍රහ්මචරියඤ්ච - අරිය සච්චාන දස්සනං
නිබ්බාන සච්ඡිකිරියා ච - එතං මංගල මුත්තමං

තපස ද, උතුම් හැසිරීම ද, ආර්‍ය්‍ය සත්‍යයන් නුවණින් දැකීම ද, නිවන් අවබෝධ කිරීමද (යන) මෙය උතුම් මංගල්‍යකි.

ඵුට්ඨස්ස ලොක ධම්මෙහි - චිත්තං යස්ස න කම්පති
අසොකං විරජං ඛෙමං - එතං මංගල මුත්තමං

අටලෝ දහමින් ස්පර්ශ කරන ලද, යමෙකු ගේ සිත නොසැලේ ද, ශෝක රහිත ද, රාගාදී රජස් රහිත ද, නිර්භය ද (යන) මෙය උතුම් මංගල්‍යකි.

එතා දිසානි කත්වාන - සබ්බත්ථ මපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති - තං තෙසං මංගල මුත්තමන්'ති

(අසත් පුරුෂයන් සේවනය නොකිරීම ආදී) මෙබඳු මංගලයන් කොට සෑම තන්හි උවදුරු නැත්තේ වෙයි. සෑම තන්හි සැපවත් බවට යෙත්. ඔවුනට ඒ කරුණු තිස්අටම උතුම් මංගල කරුණු වේ.

8. රතන සුත්තං

රතන සූත්‍රය

යානීධ භූතානි සමාගතානි
භූම්මානි වා යානිව අන්තලික්ඛෙ
සබ්බෙ'ව භූතා සුමනා භවන්තු
අථො'පි සක්කච්ච සුණාන්තු භාසිතං

මෙතැන්හි රැස්වූ පොළොවෙහි වූ හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, අහසෙහි වූද, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, ඒ සියලු අමනුෂ්‍යයෝ ම සතුටු සිතැත්තෝ වෙත්වා. තව ද මාගේ වචනය සතුටින් අසත්වා.

තස්මා හි භූතා නිසාමෙථ සබ්බෙ
මෙත්තං කරොථ මානුසියා පජාය
දිවා ච රත්තො ච හරන්තියෙ බලිං
තස්මාහි නෙ රක්ඛථ අප්පමත්තා

භූතයිනි, එබැවින් සියලු තෙපි (මා ගේ වචනය) අසවු. මනුෂ්‍ය ප්‍රජාවට මෛත්‍රී කරවු. යම් කෙනෙක් දහවල් ද, රෑ ද පුදා පඬුරු පූජාවන් කෙරෙත් ද එහෙයින් ඔවුන් නොපමාව රකිවු.

යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගෙසු වා'යං රතනං පණීතං
න නො සමං අත්ථි තථාගතෙන
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

මේ මිනිස් ලොව හෝ නා ලෝ ආදී අන් ලොවක හෝ යම් ධනයෙක් වේ ද, ස්වර්ගයෙහි හෝ යම්කිසි උතුම් රත්නයක් වේ ද (ඔවුන් අතුරෙහි) තථාගතයන් හා සම වූ කෙනෙක් නොමැත. බුදුරදුන් කෙරෙහි මේ රත්න බව ද උතුම්ය. මේ සත්‍යය බලයෙන් සෙත් වේවා.

බයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො
න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

එකඟ වූ සිත් ඇති තථාගතයන් වහන්සේ (කෙලෙසුන් දුරු කරන හෙයින්) ක්ෂය නම් වූ, (රාගයෙන් වෙන් වීමට නිමිති වූ) විරාග නම් වූ, වූද, (මරණයක් නැති හෙයින්) අමත නම් වූ, යම් නිවණක් අවබෝධ කළේ ද? ඒ ධර්මය හා සම වූ කිසිවක් නොමැත. ධර්මයෙහි මේ රත්න භාවය ද උතුම් ය. මේ සත්‍යය බලයෙන් සෙත් වේවා.

යම්බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තෙන සමො න විජ්ජති
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

උතුම් වූ බුදුරජ තෙමේ පිරිසිදු වූ යම් ආර්ය මාර්ගයක් වර්ණනා කළේ ද, ඉතා පිරිසිදු වූ ඒ මාර්ගය ආනන්තරික සමාධියයි. යම් මාර්ගයක් (බුද්ධාදී ආර්යයෝ) දේශනා කරද්ද ඒ සමාධිය හා සම වූ සමාධියක් නැත. ධර්මයෙහි මේ රත්න භාවය ද උතුම් ය. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි එතානි යුගානි හොන්ති
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
එතෙසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

සත් පුරුෂයන් විසින් පසස්නා ලද යම් ආර්ය පුද්ගලයෝ අට දෙනෙක් වෙත් ද, නොහොත් ප්‍රශස්ත වූ යම් එකසිය අටක් ආර්ය පුද්ගලයෝ වෙත් ද මොහු හැමදෙන සතර යුග කෙනෙක් වෙති. සුගත් බුදුරදුන්ගේ සවු වූ උන්වහන්සේලා සිව් පසය පිළිගැණීමට සුදුස්සෝ වෙති. මේ බුදු සවුවන් කෙරෙහි දෙන ලද දානයෝ මහත් ඵල ඇත්තෝ වෙත්. මේ කරුණින් ද බුද්ධ ශ්‍රාවක සංඝ තෙමේ උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන
නික්ඛාමිනො ගොතම සාසනම්හි
තෙ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

ගෞතම බුද්ධ ශාසනයෙහි වූ සුවිශුද්ධ කායවාක් කර්ම සංඛ්‍යාත ශීලස්කන්ධයෙන් යුක්ත වූ ස්ථිර සිතින් යුක්ත වූ ප්‍රඥාව කරණ කොටගෙන සියලු කෙලෙසුන් ගෙන් නික්මුණා වූ යම් පුද්ගල කෙනෙක් වෙත් ද, ඔහු තුමු නිවනට බැසගෙන නොමිලයේ ම රහත්ඵල සමවත ලැබගෙන එය විඳින්න හු වෙති. මේ කරුණින් ද ආර්ය සංඝයා උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

යථීන්දඛීලෝ පඨවිංසිතෝ සියා
චතුබ්භි වාතෙහි අසම්පකම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි
යෝ අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථී හොතු

යම් සේ පොළොව තුළ වැද ගෙන සිටි ඉන්ද්‍රඛීලය සිවු දිගින් හමන සුළඟින් සෙලවිය හැකි නොවේ ද, චතුරාර්‍ය්‍ය සත්‍ය නුවණින් දකින උතුම් පුරුෂයා (සෝවාන් පුද්ගලයා) එබන්දකු කොට කියමි. මේ කරුණින් ද ආර්ය සංඝයා උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

යෙ අරියසච්චානි විභාවයන්ති
ගම්භීරපඤ්ඤෙන සුදෙසිතානි
කිඤ්චාපි තෙ හොන්ති භූසප්පමත්තා
න තෙ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථී හොතු

යම් සෝවාන් පුද්ගල කෙනෙක් ගැඹුරු නුවණැති බුදුන්වහන්සේ දෙසූ ආර්ය සත්‍යයන් තමනට ප්‍රකට කෙරෙත් ද ඔහු බෙහෙවින් පමාවූවාහු නමුත් අටවැනි උත්පත්තියක් නොගනී.
මේ කරුණින් ද ආර්ය සංඝයා උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

සහාවස්ස දස්සන සම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨි විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වා'පි යදත්ථී කිඤ්චි
චතූහපායෙහි ච විප්පමුත්තෝ
ඡාභිඨානානි අභබ්බෝ කාතුං
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථී හොතු

මේ සෝවාන් පුද්ගලයාගේ සෝවාන් මග නුවණ පහළවීම සමගම සත්කාය දෘෂ්ඨියද (කය පිළිබඳ විසි අයුරකින් පැවති), (බුද්ධාදී අටතැන්හි) සැකයද යම් මිතථ්‍යාශීල ව්‍රත කෙනෙක් වූහු නම් ඒ සියල්ල ද යන මේ තුන් සංයෝජනයෝ දුරු කරණ ලද්දෝ වෙත්. හෙතෙම සතර අපායන් කෙරෙන් මිදුනේ වේ. ආනන්තර්ය කර්ම පසත් මිත්ථ්‍යාදෘෂ්ටියත් යන බැරෑරුම් පව් සය කරන්නට ද හේ අභය්‍යය. වැදෑරුම් මහ පව් කිරීමට නොයෙදේ.
මේ කරුණින් ද ආර්ය සංඝයා උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

කිඤ්චාපි සො කම්මං කරොති පාපකං
කායෙන වාචා උද චෙතසා වා
අභබ්බො සො තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථී හොතු

ඒ සෝවාන් පුද්ගල තෙම කයින් හෝ වචනයෙන් හෝ නැතහොත් සිතින් හෝ ප්‍රඥප්ති මාත්‍ර වූ කිසිවරදක් කරන්නේ නමුදු හේ එය සඟවන්නට නො හැක්කේ ය. දක්නා ලද නිර්වාන පදය ඇති සෝවාන් පුද්ගලයාගේ (වරද සැඟවීමේ) අවශ්‍ය බව බුදුරදුන් විසින් වදාරණ ලද්දේය. මේ කරුණින් ද ආර්ය සංඝයා උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ
ගිම්හානමාසෙ පඨමස්මිං ගිම්හෙ
තථූපමං ධම්ම වරං අදෙසයී
නිබ්බානගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථී හොතු

වන ලැහැබ තෙමේ ග්‍රීෂ්ම ඍතුවේ පළමු වන මාසයෙහි හෙවත් බක් මස සුපිපි අක් ඇත්තේ යම්සේ ද, එසේ වූ නිවන් පුර පමුණුවන උතුම් ලොව්තුරා ධර්‍ම රත්නය, ලෝසතුන්ගේ හිත පිණිස බුදුරදුන් දේශනා කළ සේක. මේ කරුණින් ද බුදුරජ තෙමේ උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

වරො වරඤ්ඤූ වරදො වරාහරො
අනුත්තරො ධම්ම වරං අදෙසයි
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථී හොතු

උතුම් වූ නිවන දන්නා වූ උතුම් වූ නිවන දෙන්නා වූ උතුම් නිවන් මග ගෙනහැර පාන්නා වූ අනුත්තර වූ බුදුරජාණන් වහන්සේ උතුම් වූ දහමක් දෙසූ සේක.
මේ කරුණින් ද බුදුරජ තෙමේ උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

බීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං
තෙ බීණබීජා අවිරුළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායං පදීපො
ඉදම්පි සංඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

යම් කෙනෙකුගේ පුරාතන කර්ම රහත් මගින් ක්ෂීණ වූයේ ද අලුත් කර්මයන් ගේ පහළ වීමකුත් නැද්ද, මතු භවයක් කෙරෙහි නො ඇලුණු සිතැති, ක්ෂීණ වූ ප්‍රතිසන්ධි විඥාන සංඛ්‍යාත සංස්කාර වෘද්ධිය කෙරෙහි කැමැත්තක් නැති, ධෛර්යය සම්පන්න වූ ඒ රහත්හු මේ පහන සේ අවසන් සිත නිරුද්ධ වීමෙන් පිරිනිවෙත්. මේ කරුණින් ද ආර්ය සංඝයා උතුම් රුවනකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

යානීධ භූතානි සමාගතානි
භූම්මානි වා යානි'ව අන්තලික්ඛෙ
තථාගතං දේවමනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හොතු

පොළොවෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙතැන් රැස්වූහු ද, ඔහු ද මම ද දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත බුදුරජාණන් වහන්සේ නමදිමු. සත්ව ප්‍රජාවට සෙත්වේවා.

යානීධ භූතානි සමාගතානි
භූම්මානි වා යානි'ව අන්තලික්ඛෙ
තථාගතං දේවමනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හොතු

පොළොවෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙතැන් රැස්වූහු ද, ඔහු ද මම ද දෙව් මිනිසුන් විසින් පුදන ලද බුද්ධාදීන් විසින් අවබෝධ කරන ලද බැවින් තථාගත වූ ධර්මය නමදිමු. සත්ව ප්‍රජාවට සෙත්වේවා.

යානීධ භූතානි සමාගතානි
භූම්මානි වා යානි'ව අන්තලික්ඛෙ
තථාගතං දේවමනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හොතු

පොළොවෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙතැන් රැස්වූහු ද, ඔහු ද මම ද දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත වූ සංඝයා නමදිමු. සත්ව ප්‍රජාවට සෙත්වේවා.

9. කරණීය මෙත්ත සුත්තං

කරණීය මෙත්ත සූත්‍රය

කරණීය මත්ථකුසලෙන - යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කෝ උජූ ච සූජූ ච - සුවචෝ ච'ස්ස මුදු අනතිමානී

යම් ඒ ශාන්තිපද සංඛ්‍යාත නිර්වාණයක් වේ ද, එයට පැමිණි නොහොත් එය අවබෝධ කොට වසනු කැමැති අභිවෘද්ධිය සලසා ගැනීමෙහි දක්ෂයා විසින් එයට සුදුසු දෙය කළ යුතුය. නිවණට පැමිණ වසනු කැමැත්තේ සත්‍ය ප්‍රතිවේධය පිණිස පිළිපදින්නට නොහොත් කිසුණු පිරියම් කිරීම් වත් සමාදන්වීම් ආදී සියලු කාර්යයන් කරන්නට දක්ෂයෙක් වන්නේ ය. සෘජු වන්නේ ය. මනා කොට සෘජු වන්නේ ය. ය අන්‍යයන් ගේ අවවාද මනා කොට පිළි ගැනීම් වශයෙන් සුවච වන්නේය. මෘදු වන්නේ ය. අතිමාන ඇත්තේ නොවන්නේ ය.

සන්තුස්සකෝ ච සුභරෝ ච - අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච-අප්පගබ්භෝ කුලෙසු අනනුගිද්ධෝ

ලද දෙයින් සතුටු වන්නෙක් ද, පෝෂණය කළ හැකිකෙනක් වීම ද, සැහැල්ලු පැවැතුම් ඇත්තෙක් ද, සන්සුන් ඉඳුරන් ඇත්තෙක් ද, ප්‍රඥා ඇත්තෙක් ද,හැඩි දැඩි අසංවර ගති නැත්තෙක් ද කුලයන් කෙරෙහි නොඇලුනෙක් ද වන්නේ ය.

න ච බුද්දං සමාචරෙ කිඤ්චි-යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං
සුඛිනෝ වා බෙමිනෝ හොන්තු සබ්බෙ සත්තා භවන්තු
සුඛිතත්තා

නුවණැති අන්‍යයන් නින්දා කරණා සුලු වරදක්වත් නොකරන්නේ ය. සියලු සත්වයෝ සැප ඇත්තෝ වෙත්වා. භය නැත්තෝ වෙත්වා. සුඛිත සිත් ඇත්තෝ වෙත්වා යි ද

යෙ කෙචි පාණ භූතත්ථි - තසා වා ථාවරා වා අනවසෙසා
දීඝා වා යෙ මහන්තා වා - මජ්ඣිමා රස්සකාණුක ථූලා

තෘෂ්ණා භය සහිත හෙයින් තැති ගන්නා සුලුවූ ද, තෘෂ්ණා භය ප්‍රහීන කළ හෙයින් ස්ථාවරවූ ද, යම් කිසි සත්වයෝ ඇත්තාහු නම්, ඒ සියලු දෙනා ද, දිඝ ශරීර ඇත්තෝ ද, මහත් ශරීර ඇත්තෝ ද, මධ්‍යම ශරීර ඇත්තෝ ද, මිටි ශරීර ඇත්තෝ ද, ඉතා සියුම් ශරීර ඇත්තෝ ද, ස්ථූල ශරීර ඇත්තෝ ද,

දිට්ඨා වා යෙව අදිට්ඨා - යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ
භූතා වා සම්භවෙසී වා - සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා

ඇස් හමුවට පැමිණීම් වසයෙන් දුටු සත්තු ද, ඈත සිටි හෙයින් නුදුටු සත්තු ද, දුරත් ළඟත් වසන සත්තු ද, ඉපදීම අවසන් කළ සත්වයෝ ද, ඉපදිමින් සිටින සත්වයෝ ද, යන මේ සියලු සත්වයෝ සුඛිත වෙත්වා යි ද මෙත් වඩන්නේය.

න පරෝ පරං නිකුබ්බෙථ
නාතිමඤ්ඤෙථ කත්ථ චි නං කඤ්චි
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛ මිච්ඡෙය්‍ය

එකෙක් අනෙකෙකු නොරවටන්නේ ය. අනිකෙකුට අවමන් නො කරන්නේය. කය හා වචනය පිළිබඳ විකෘතියෙන් ද මනෝවිකාරයෙන් ද එකෙක් අනෙකකුට දුකක් නො කැමති වන්නේ ය.

මාතා යථා නියං පුත්තං - ආයුසා එකපුත්ත මනුරක්ඛෙ
එවම්පි සබ්බභූතෙසු - මානසං භාවයෙ අපරිමාණං

මව යම් සේ තමාගේ එකම පුතා ජීවිත පරිත්‍යාගයෙන් වුවත් රක්නේ ද එපරිද්දෙන් ම සියලු සත්වයන් කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රී සහගත සිත වඩන්නේය.

මෙත්තං ච සබ්බලොකස්මිං - මානසං භාවයෙ අපරිමාණං
උද්ධං අධො ච තිරියඤ්ච - අසම්බාධං අවෙරං අසපත්තං

උඩ ද යට ද සරස ද සීමාවකුදු නැතිව අතරතුරවත් වෛර චේතනා පහළවීමක් නැතිව, සතුරන් රහිතව සියලු ලෝක සත්වයා කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රී සහගත සිත වඩන්නේ ය.

තිට්ඨං චරං නිසින්නො වා
සයානො වා යාවත'ස්ස විගතමිද්ධො
එතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්ම'මෙතං විහාරං ඉධමාහු

සිටින්නේ හෝ ඇවිදින්නේ හෝ උන්නේ හෝ නිදන්නේ හෝ යම්තාක් මෛත්‍රී සහගත සිහිය වඩනු කැමැත්තේ ද, ඒ තාක් පහවූ මිද්ධය අලස බව ඇතිව අධිෂ්ඨාන කරන්නේ ය. මෛත්‍රී විහරණය මේ බුද්ධ ශාසනයෙහි ශ්‍රේෂ්ඨ විහරණයෙකැයි ප්‍රකාශ කළහ.

දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා - දස්සනෙන සම්පන්නො
කාමෙසු විනෙය්‍ය ගෙධං -න හි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙති'ති

මිත්ථ්‍යා දෘෂ්ඨියට නො පැමිණ සිල්වත් වූයේ වස්තු කාමයන් හි ගිජු බව දුරුකොට ඒකාන්තයෙන් ම නැවත ගර්භයෙක් හි විසීමට නොපැමිණෙන්නේ ය. (ශුද්ධාවාසයක) ඉපිද එහිදී ම රහත් බවට පැමිණ පිරිනිවන් පාන්නේ ය.

10. බන්ධ පරිත්තං

බන්ධ පරිත්ත සූත්‍රය

**එවං මෙ සුතං එකං සමයං භගවා★සාවත්ථියං විහරති
ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ★තෙන බො පන
සමයෙන සාවත්ථියං අඤ්ඤතරො භික්ඛු අහිනා දට්ඨො
කාලකතො හොති★අථබො සම්බහුලා භික්ඛු★යෙන භගවා
තෙනුප සඞකමිංසු උපසඞකමිත්වා★භගවන්තං අභිවාදෙත්වා
එකමන්තං නිසීදිංසු★එකමන්තං නිසින්නා බො තෙ භික්ඛු
භගවන්තං එතදවොචුං★**

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඬු මහ සිටහු විසින් කරවා පිළිගන්වන ලද ජේතවන නම් වූ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි සැවැත් නුවර එක්තරා භික්ෂු නමක් නයෙකු විසින් දෂ්ඨ කරන ලදුව කලුරිය කෙළේය. එකල්හි බොහෝ භික්ෂූන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එතැනිහි එළඹී සේක. එළඹ බුදුරදුන් වැඳ එකත් පසෙක සිටින්නා වූ, ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් දැන් වූ සේක. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මේ සැවැත් නුවර එක්තරා භික්ෂු නමක් සර්පයෙකු විසින් දෂ්ඨ කිරීමෙන් කාලක්‍රියා කළේය.'' යනුයි.

**ඉධ භන්තෙ සාවත්ථියං අඤ්ඤතරො භික්ඛු අහිනා දට්ඨො
කාලකතො ති★
නහනූන සො භික්ඛවෙ භික්ඛු★චත්තාරි අහිරාජකුලානි
මෙත්තෙන චිත්තෙන එරී★
සචෙ හි සො භික්ඛවෙ භික්ඛු චත්තාරි අහිරාජකුලානි
මෙත්තෙන චිත්තෙන එරෙය්‍ය★නහි සො භික්ඛවෙ
භික්ඛු★අහිනා දට්ඨො කාලං කරෙය්‍ය**

''මහණෙනි, ඒ මහණාතෙම මේ සතර සර්ප රාජ කුලයන් කෙරෙහි ඒකාන්තයෙන් මෙත්‍රී සිතින් නො පැතිරවී ය. මහණෙනි, ඉදින් ඒ භික්ෂු නම මේ සතර සර්ප රාජ කුලයන් කෙරේ මෙත් සිත් පැතිරවී නම්, නාගයෙකු දෂ්ඨ කිරීමෙන් කලුරිය නොකරන්නේ ය.''

**කතමානි චත්තාරි අහිරාජකුලානි★විරූපක්ඛං
අහිරාජකුලං★එරාපථං අහිරාජකුලං★ ඡබ්‍යාපුත්තං
අහිරාජකුලං★කණ්හාගොතමකං අහිරාජකුලං★
නහ නූන සො භික්ඛවෙ භික්ඛු ★ ඉමානි චත්තාරි
අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන එරී★ සචෙ හි සො**

භික්ඛවෙ භික්ඛූ★ඉමානි චත්තාරි අහිරාජකුලානි★මෙත්තෙන චිත්තෙන එරෙය්‍ය★නහි සො භික්ඛවෙ භික්ඛූ★අහිනා දට්ඨො කාලං කරෙය්‍ය★ අනුජානාමි භික්ඛවෙ ඉමානි චත්තාරි අහිරාජකුලානි★මෙත්තෙන චිත්තෙන එරිතුං★ අත්තගුත්තියා අත්තරක්ඛාය අත්තපරිත්තායාති★ඉදමවොච භගවා★ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා★ ,

ඒ සර්ප රාජකුලයෝ සතර කවරහුද? විරූපාක්ෂ නම් සර්පරාජ කුලය, ඒරාපථ නම් සර්පරාජ කුලය, ඡබ්‍යාපුත්ත නම් සර්පරාජ කුලය, කණ්හාගෝතමක නම් සර්පරාජ කුලය යන මේ සතරයි. මහණෙනි, ඒ මහණ තෙම ඒකාන්තයෙන් මේ සතර නාගරාජ කුලයන් (කෙරෙහි)මෙත් සිත නො පැතිර වීය. ඉදින් මහණෙනි, ඒ මහණ තෙම මේ සතර නාගරාජ කුලයන් (කෙරෙහි)මෙත් සිත පැතිරවී නම්, නාගයෙකු දෂ්ඨ කිරීමෙන් කලුරිය නොකරන්නේ ය.''

මහණෙනි, මේ සතර නාගරාජ කුලයන් කෙරෙහි මෙත් සිත පතුරුවන්නට අවසර දෙමි. (කුමක් හෙයින් ද යත්?) තමා ගේ සංවරණය පිණිස, තම හට ආරක්ෂාව පිණිස ද, තමහට මෙත් පිරිත් සඳහාය යි. භාග්‍යවතුන් වහන්සේ මෙය (මෙසේ) වදාළ සේක. සුගත නම් වූ ශාස්තෘන් වහන්සේ මෙය (මෙසේ) වදාරා, යළිත් මත්තෙහි (ගාථා වශයෙන් ද) වදාළ සේක.

විරූපක්ඛෙහි මෙ මෙත්තං★
මෙත්තං එරාපථෙහි මෙ★
ඡබ්‍යාපුත්තෙහි මෙ මෙත්තං★
මෙත්තං කණ්හාගොතමකෙහි ච★

මාගේ මෛත්‍රිය විරූපාක්ෂ නම් සර්පකුලයන් සමග ය.
මාගේ මෛත්‍රිය ඒරාපථ නම් සර්පකුලයන් සමග ය.
මාගේ මෛත්‍රිය ඡබ්‍යාපුත්ත නම් සර්පකුලයන් සමග ය.
මාගේ මෛත්‍රිය කණ්හාගෝතමක නම් සර්පකුලයන් සමග ය.

අපාදකෙහි මෙ මෙත්තං★
මෙත්තං දිපාදකෙහි මෙ★
චතුප්පදෙහි මෙ මෙත්තං★
මෙත්තං බහුප්පදෙහි මෙ★

මාගේ මෛත්‍රිය අපාදක වූ දීඝජාතීන් (නාග, පිඹුරු) සමග ය.
මාගේ මෛත්‍රිය දිපාදක වූ මනුෂ්‍යයන් හා පක්ෂීන් සමග ය.
මාගේ මෛත්‍රිය චතුප්පදික වූ හස්ති අශ්වාදීන් සමග ය.
මාගේ මෛත්‍රිය ගෝනුසු ආදී වූ බොහෝ පාද ඇත්තවුන් සමග ය.

මා මං අපාදකො හිංසී★
මා මං හිංසි දිපාදකෝ★
මා මං චතුප්පදො හිංසි★
මා මං හිංසි බහුප්පදො★

අපාදක සතෙක් මා නොපෙළා වා. (හිංසා නො කෙරේවා),
දිපාදක සතෙක් මා නොපෙළා වා.
සිව් පා සතෙක් මා නොපෙළා වා.
බොහෝ පා ඇති සතෙක් මා නොපෙළා වා.

සබ්බෙ සත්තා සබ්බෙ පාණා★
සබ්බෙ භූතා ච කේවලා★
සබ්බෙ භද්‍රානි පස්සන්තු★
මා කඤ්චි පාප මාගමා★

හැම සත්හු ද, හැම ප්‍රාණීහු ද, සියලු භූතයෝ ද, යන හැම දෙනෙක් ම යහපත දකීවා. මොවුන් කෙරෙන් කිසිවකු කරාත් දුකක් නො පැමිණේවා.

අප්පමාණෝ බුද්ධෝ අප්පමාණෝ ධම්මෝ අප්පමාණෝ සඞ්ඝෝ★පමාණවන්තානි සිරිංසපානි අහිවිච්ඡිකා සතපදි උණ්ණානාභි ★සරබූ මූසිකා කතා මෙ රක්ඛා කතා මෙ පරිත්තා★පටික්කමන්තු භූතානි සෝ හං නමෝ භගවතෝ නමෝ සත්තන්නං සම්මා සම්බුද්ධානත්ති★

බුදුරුවන්හි ගුණ අප්‍රමාණයි. දහම් ගුණ අප්‍රමාණයි. සඟ ගුණ අප්‍රමාණයි. ප්‍රමාණකර ක්ලේශයොගයෙන් ද අප්‍රමාණ ගුණයන් නැති හෙයින් ද, සර්පයන්, ගෝනුස්සන්, මකුළුවන්, සිකනලුන්, මීයෝ යන මේ සත්වයෝ තෙරුවන් ගුණ සිහිකිරීමෙනුදු මා විසින් ආරක්ෂා කරන ලද්දාහුය. මා විසින් පරිත්‍රාණයෝ කරන ලද්දාහු ය. මා කෙරෙහි අදහස් ඇති සත්වයෝ ඉවත් වෙත්වා.

මම භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරමි. සත් බුදුවරුන්ට ද නමස්කාර කරමි.

11. මෙත්තානිසංස සුත්තං

මෙත්තානිසංස සූත්‍රය

**එවං මෙ සුතං එකං සමයං භගවා★සාවත්ථියං විහරති
ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ★තත්‍ර බො භගවා භික්ඛූ
ආමන්තෙසි භික්ඛවොති★භදන්තෙති තෙ භික්ඛූ භගවතො
පච්චස්සොසුං භගවා එතදවොච★**

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු මහ සිටුහු ගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස යැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා★ආසෙවිතාය භාවිතාය
බහුලීකතාය★යානී කතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය
සුසමාරද්ධාය★එකාදසානිසංසා පාටිකඞ්ඛා★ කතමෙ එකාදස★**

මහණෙනි, ආදරයෙන් සෙවිනා ලද්දා වූ, එසේ ම භාවිත ව වඩනා ලද්දා වූ, නැවත නැවත වැඩීම වශයෙන් පුරුදු කරන ලද්දා වූ, යොදා තිබූ යානාවක් මෙන් කරන ලද්දා වූ, නැවත නැවතත් උපද වන ලද්දා වූ සියලු අන්දමින් ම පුරුදු කරන ලද්දා වූ, මොනවට පටන් ගන්නා ලද්දා වූ මෛත්‍රී චෙතෝ විමුක්තිය පිළිබඳ අනුසස් එකොළොසක් කැමති විය යුත්තාහ. කවර එකොළොස් අනුසස් ද යත්?

**සුඛං සුපති සුඛං පටිබුජ්ඣති★න පාපකං සුපිනං පස්සති
මනුස්සානං පියො හොති අමනුස්සානං පියො හොති★දෙවතා
රක්ඛන්ති★නාස්ස අග්ගි වා විසං වා සත්ථංවා කමති★තුවටං
චිත්තං සමාධියති මුඛවණ්ණො විප්පසීදති★අසම්මූළ්හො කාලං
කරොති ★උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො
හොති★**

1. සැපසේ නිදයි. 2. සැපසේ පුබුදියි. 3. නපුරු සිහිනයක් නො දකියි. 4. මිනිසුන්ට ප්‍රිය වෙයි. 5. අමනුෂ්‍යයනට ද ප්‍රිය වෙයි. 6. දෙවියෝ රකිති. 7. මේ මෛත්‍රී විහරණා ඇති පුද්ගලයා ගේ ශරීරයෙහි ගිනි හෝ විස හෝ සැත් හෝ නො වදියි. 8. වහාම සිත එකඟ වෙයි. 9. මුහුණ පැහැපත් වෙයි. 10. නො මුලාව කලුරිය කරයි. 11. මෛත්‍රී සමවතින් මතු රහත් වන්නට නො හැකි වී නම් මරණින් මතු බඹ ලොව උපදියි.

මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා★ආසෙවිතාය භාවිතාය බහුලීකතාය★යානී කතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය★ඉමෙ එකාදසානි සංසාපාටිකඞ්ඛාති★ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති★

මහණෙනි, ආදරයෙන් සෙවිනා ලද, මෛත්‍රී චෙතෝ විමුක්තිය අසෙවිත භාවිත බහුලීකෘත කළ කල්හි යානාවක් මෙන් වස්තුවක් මෙන් කළ කල්හි එළඹ සිටි කල්හි පුරුදු කළ කල්හි මොනවට පටන් ගත් කල්හි මේ එකොළොස් ආනිසංසයෝ කැමති විය යුත්තාහු ය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාවට කැමති වූහ.

12. මිත්තානිසංස සුත්තං

මිත්තානිසංස

1. පහූතභක්ඛොභවති - විප්පවුත්ථොසකාඝරා බහූනං උපජීවන්ති - යොමිත්තානං නදූහති

යම් පුද්ගලයෙක් මිත්‍ර ද්‍රෝහි නොවේ නම් හෙතෙම තමාගේ ගෙයින් බැහැර යම් තැනෙකට ගියේ නම් බොහෝ කන බොන දේ ලබයි. බොහෝ දෙනෙක් ඔහු ඇසුරු කොට ජීවත් වෙති.

2. යං යං ජනපදං යාති - නිගමෙ රාජධානියො සබ්බත්ථ පූජිතොහොති - යොමිත්තානං නදූහති

යම් පුද්ගලයෙක් මිත්‍ර ද්‍රෝහි නොවේ නම් හෙතෙම යම් යම් රටකට ගියේ ද, නියම් ගමකට නුවරකට ගියේද ඒ හැමතැන ම හේ පුදනු ලැබේ.

3. නාස්ස චොරා පසහන්ති - නාතිමඤ්ඤෙදුති බත්තියො සබ්බෙ අමිත්තෙ තරති - යොමිත්තානං නදූහති

යම් පුද්ගලයෙක් මිත්‍ර ද්‍රෝහි නොවේ නම් ඔහුට සොරු ළං නොවෙති. රජතෙමේ අවමන් නොකෙරෙයි. ඔහු හැම සතුරන් මැඩ පවත්වති.

4. අක්කුඩ්ඩො සඝරං එති - සහාය පටිනන්දිතො ඤාතීනං උත්තමොහොති - යොමිත්තානං නදූහති

යම් පුද්ගලයෙක් මිත්‍ර ද්‍රෝහි නොවේ නම් හෙතෙම නොගැටුනු සිත් ඇතිව තමා ගේ ගෙට එයි. මිත්‍ර ද්‍රෝහි නොවන පුද්ගලයා ගේ අපමණ වූ ගුණ සභායෙහි පවා කියති. හෙතෙම නෑයිනට උතුම් වෙති.

5. සක්කත්වා සක්කතෝ හොති - ගරු හොති සගාරවෝ
වණ්ණාකිත්තිභතෝ හොති - යෝ මිත්තානං න දූභති

යම් පුද්ගලයෙක් මිත්‍ර ද්‍රෝහි නො වේ නම් හෙතෙම අනුනට සත්කාර කොට අනුන් ගෙන් සත්කාර ලබන්නෙක් වෙයි. අනුන් කෙරෙහි ගෞරව සහිත වූයේ ඔවුන් විසින් ගරු කරනු ලබන්නේ ද වෙයි. ලෝකයා තමා ගේ ගුණ වැණුම හා යසස උසස් කොට නගා ලන්නේ ද වෙයි.

6. පූජකෝ ලභතෙ පූජං - වන්දකෝ පටිවන්දනං
යසෝ කිත්තිඤ්ච පප්පොති - යෝ මිත්තානං න දූභති

මිත්‍රයා පුදන තැනැත්තා ඔවුන් විසින් පුදනු ලබන්නේ ද වෙයි. බුද්ධාදී කල්‍යාණ මිත්‍රයනට වඳින තැනැත්තා තෙමේ ද වැඳුම් ලබන්නෙක් වෙයි. හෙතෙම කීර්තියට ද පැමිණෙයි.

7. අග්ගි යථා පජ්ජලති - දෙවතාව විරොචති
සිරියා අජ්ඣිතෝ හොති - යෝ මිත්තානං න දූභති

යම් පුද්ගලයෙක් මිත්‍ර ද්‍රෝහි නො වේ නම් හෙතෙම දිලිසෙන ගිනි මෙන් යස ඉසුරු පිරිවර සැපතින් උජ්වලිත වෙයි. දෙවියෙකු මෙන් බබලයි. ශ්‍රී කාන්තාව විසින් අත් නොහරින ලද්දේ වෙයි.

8. ගාවෝ තස්ස පජායන්ති - බෙත්තෙ වුත්තං විරූහති
පුත්තානං ඵලමස්නාති - යෝ මිත්තානං න දූභති

යම් පුද්ගලයෙක් මිත්‍ර ද්‍රෝහි නොවේ නම් ගවයෝ ඔහුට පල ප්‍රයෝජන දෙති. ක්ෂේත්‍රයෙහි වපුල තාක් පැළ හටගනිති.

9. දරිතෝ පබ්බතාතෝ වා - රුක්ඛාතෝ පතිතෝ නරෝ
චුතෝ පතිට්ඨං ලභති - යෝ මිත්තානං න දූභති

යම් පුද්ගලයෙක් මිත්‍ර ද්‍රෝහි නොවේ නම් දැදුරෙන් (කඳු මුදුනක් බඳු උස් තැනකින්) පර්වතයෙන් ගසින් හෝ යමකින් ගිලිහුනේ නම් පිහිට ලබයි.

10. විරූළ්හමූලසන්තානං - නිග්‍රොධමිව මාලුතෝ
අමිත්තා නප්පසහන්ති - යෝ මිත්තානං න දූභති

යම් පුද්ගලයෙක් මිත්‍ර ද්‍රෝහි නො වේ නම් වැඩුණු මුල් හා නුග අරළු ඇති නුගරුකක් සුළඟින් සොලවා (බිම)හෙලන්නට නො හැක්කා සේ සතුරන් විසින් ඔහු මඬනට නොහැකි වෙත්.

13. මොර පරිත්තං

මොර පිරිත

1. උදෙතයං චක්ඛුමා එකරාජා හරිස්ස වණ්ණෝ පඨවිප්පභාසෝ★ තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං තයජ්ජ ගුත්තා විහරෙමු දිවසං★

ලොව අඳුරු දුරු කොට ලෝ වැස්සනට ඇස් පාදාදෙන හෙයින් ඇස් ඇති, ලොවට එළිය දෙන්නාවුන් අතරෙහි එකම රජෙක් වූ, රන්වන් සිරුර ඇති, මහ පොළොව බබළු වන්නා වූ මේ සූයශීයා නැගෙයි, රන්වන් ඒ හිරුට වඳිමි. ඔබගෙන් ආරක්ෂාව ලැබූ අපි මේ දවස සතර ඉරියව්වෙන් ම යුක්තව සැපසේ වෙසෙමු.

2. යෙ බ්‍රාහ්මණා වෙදගූ සබ්බ ධම්මෙ තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු★ නමත්ථු බුද්ධානං නමත්ථු බොධියා නමො විමුත්තානං නමො විමුත්තියා★ ඉමං සො පරිත්තං කත්වා මොරො චරති එසනා★

සවාසනා සකල ක්ලේශයන් දුරු කළ යම් බුදු කෙනෙක් සියලු දත යුතු ධර්මයන් දැන බුද්ධත්වය අවබෝධ කළාහු ද, උන් වහන්සේලාට මා ගේ නමස්කාරය වේවා. උන් වහන්සේලා ද මා ආරක්ෂා කරන සේක්වා. අතීත බුදුවරයන් වහන්සේලාට ද මගේ නමස්කාරය වේවා. උන්වහන්සේලාගේ නව ලොව්තුරා බෝධිගුණයට ද මා ගේ නමස්කාරය වේවා. ඒ මයුර තෙම මෙම පිරිත කියා ගොදුරු සෙවීමෙහි හැසිරෙයි.

3. අපෙතයං චක්ඛුමා එකරාජා හරිස්ස වණ්ණෝ පඨවිප්පභාසෝ★ තං තං නමස්සාමි හරිස්ස වණ්ණං පඨවිප්පභාසං තයජ්ජ ගුත්තා විහරෙමු රත්තිං★

ලොව අඳුරු දුරු කොට ලෝ වැස්සනට ඇස් පාදාදෙන හෙයින් ඇස් ඇති, ලොවට එළිය දෙන්නාවුන් අතරෙහි එකම රජෙක් වූ, රන්වන් සිරුර ඇති, මහ පොළොව බබළු වන්නා වූ මේ සූයශීයා අප අතරින් ඉවත් වෙයි. රන්වන් ඒ හිරුට වඳිමි. ඔබගෙන් ආරක්ෂාව ලත් අපි (මුළු රැයෙහිම) සුවසේ වෙසෙමු.

4. යෙ බ්‍රාහ්මණා වෙදගූ සබ්බ ධම්මෙ තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු★ නමත්ථු බුද්ධානං නමත්ථු බොධියා නමො විමුත්තානං නමො විමුත්තියා★ ඉමං සො පරිත්තං කත්වා මොරො වාසමකප්පයීති★

සවාසනා සකල ක්ලේශයන් දුරු කළ යම් බුදු කෙනෙක් සියලු දත යුතු ධර්මයන් දැන බුද්ධත්වය අවබෝධ කළාහු ද, උන්වහන්සේලාට මා ගේ නමස්කාරය වේවා. උන් වහන්සේලා ද මා ආරක්ෂා කරන සේක්වා. අතීත බුදුවරයන් වහන්සේලාට ද මගේ නමස්කාරය වේවා. උන්වහන්සේලාගේ නව ලොව්තුරා බෝධිගුණයට ද මාගේ නමස්කාරය වේවා.
ඒ මයුර තෙම මෙම පිරිත කියා විසීම කෙළේ යි.

14. චන්ද පරිත්තං
චන්ද පරිත්තය

**එවං මෙ සුතං එකං සමයං භගවා★සාවත්ථියං විහරති
ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ★තෙන ඛො පන
සමයෙන, චන්දිමා දෙවපුත්තො රාහුනා අසුරින්දේන ගහිතො
හොති අථ ඛො චන්දිමා දේවපුත්තො භගවන්තං අනුස්සර
මානො තායං වෙලායං ඉමං ගාථං අභාසි**

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේත නම් රාජ කුමාරයාගේ උයන්හි අනේපිඬු මහ සිටුහු විසින් කරවන ලද ආරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි චන්ද්‍ර දිව්‍ය පුත්‍ර තෙම රාහු අසුරේන්ද්‍රයා විසින් අල්වා ගන්නා ලද්දේ විය. ඉක්බිති චන්ද්‍ර දිව්‍යපුත්‍ර තෙම එවේලෙහි බුදුරදුන් සිහි කරමින් මේ ගාථාව කීයේ ය.

**නමො තෙ බුද්ධවීරත්ථු
විප්පමුත්තොසි සබ්බධී
සම්බාධපටිපන්නොස්මි
තස්ස මෙ සරණං භවාති**

බුද්ධ වීරයන් වහන්ස, නුඹ වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් විශේෂයෙන් මිදුණු සේක. එසේ වූ ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා. මම කරදරයට වැටී සිටිමි. ඒ මට පිළිසරණ වුව මැනව.

**අථ ඛො භගවා චන්දිමං දෙව පුත්තං ආරබ්භ රාහුං
අසුරින්දං ගාථාය අජ්ඣභාසි**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සඳු දෙව් පුත් අරබයා රාහු අසුරේන්ද්‍රයාට මේ ගාථාවෙන් මෙසේ වදාළ සේක.

**තථාගතං අරහන්තං
චන්දිමා සරණං ගතො
රාහු චන්දං පමුඤ්චස්සු
බුධා ලොකානුකම්පකාති**

රාහු අසුරේන්ද්‍රය, දිව්‍ය පුත්‍ර තෙමේ නික්ලෙශිවූ තථාගතයන් වහන්සේ සරණ ගියේ ය. බුදුවරයෝ වනාහි ලොවට අනුකම්පා කරන්නෝ ය. එහෙයින් සඳු අත්හරුවයි වදාළ සේක.

අථ බො රාහු අසුරින්දො චන්දිමං දේවපුත්තං
මුඤ්චිත්වා තරමානරූපො යෙන වෙපචිත්ති අසුරින්දො
තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා සංවිග්ගො ලොමහට්ඨජාතො
එකමන්තං අට්ඨාසි එකමන්තං ඨිතං බො රාහුං අසුරින්දං
වෙපචිත්ති අසුරින්දො ගාථාය අජ්ඣභාසි

ඉක්බිති රාහු අසුරේන්ද්‍ර තෙම සඳු දෙව් පුත් අතහැර වේගයෙන් වේපචිත්ති අසුරිඳු යම් තැනෙක ද එතන්හි එළඹියේ ය. එළඹ හටගත් සංවේග ඇතිව ලොමු දැහැගත් සිරුරු ඇතිව එකත් පසෙක සිටියේ ය. එසේ සිටියා වූ රාහු අසුරේන්ද්‍රයාට වේපචිත්ති අසුරේන්ද්‍රයා ගාථාවකින් මෙසේ කීයේ ය.

කින්නු සන්තරමානොව
රාහු චන්දං පමුඤ්චසි
සංවිග්ගරූපො ආගම්ම
කින්නු භීතොව තිට්ඨසී ති

එම්බල රාහු අසුරේන්ද්‍රය, ඉක්මන් වූවකු මෙන් සඳු අත්හැරියේ කුමකට ද? කැළඹුණු සිත් ඇත්තෙක්ව අවුත් බිය වූවකු මෙන් කුමක් හෙයින් සිටින්නෙහි ද?

සත්තධා මෙ ඵලෙ මුද්ධා
ජීවන්තො න සුඛං ලභෙ
බුද්ධගාථාභිගීතොම්හි
නො චෙ මුඤ්චෙය්‍ය චන්දිමන්ති

බුදුරදුන් විසින් සඳු අත්හරුවයි ගාථාවකින් අස්වන ලද්දෙමි. ඉදින් සඳු අත් නොහැරියෙමි නම් මාගේ හිස සත් කඩක්ව පැළෙයි. ජීවත් වුව ද සැපයක් නොලබමි.

15. සුරිය පරිත්තං

සුරිය පරිත්තය

**එවං මෙ සුතං එකං සමයං භගවා★සාවත්ථියං විහරති
පෙතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ★තෙන ඛො පන
සමයෙන★සුරියො දෙවපුත්තො රාහුනා අසුරින්දේන ගහිතො
හොති අථ ඛො සුරියො දෙවපුත්තො භගවන්තං අනුස්සර
මානො තායං වෙලායං ඉමං ගාථං අභාසි★**

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේත නම් රාජ කුමාරයාගේ උයන්හි අනේපිඬු මහ සිටුහු විසින් කරවන ලද ආරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි සූයශ් දිව්‍ය රාජතෙම රාහු අසුරේන්ද්‍රයා විසින් අල්වා ගන්නා ලද්දේ ය. එකල්හි හිරු දිව්‍යපුත්‍ර තෙම බුදුරදුන් සිහි කරමින් මේ ගාථාව කීයේ ය.

**නමො තෙ බුද්ධවීරත්ථු
විප්පමුත්තොසි සබ්බධි★
සම්බාධපටිපන්නොස්මි
තස්ස මෙ සරණං භවාති★**

බුද්ධ වීරයන් වහන්ස, ඔබට නමස්කාර වේවා. ඔබ වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් මිදුණු සේක. මම කරදරයට වැටුණොමි. ඒ මට පිළිසරණ වුව මැනවි.

**අථ ඛො භගවා සුරියං දෙව පුත්තං ආරබ්භ★රාහුං
අසුරින්දං ගාථාය අජ්ඣභාසි★**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හිරු දෙව් පුත් අරබයා රාහු අසුරේන්ද්‍රයාට මේ ගාථාවෙන් මෙසේ වදාළ සේක.

**තථාගතං අරහන්තං
සුරියො සරණං ගතො★
රාහු සුරියං පමුඤ්චස්සු
බුධා ලොකානුකම්පකාති★**

රාහු අසුරේන්ද්‍රය, හිරු දිව්‍ය පුත්‍ර තෙමේ අර්හත් වූ තථාගතයන් වහන්සේ සරණ ගියේ ය. එහෙයින් ඔහු මුදව. බුදුවරයෝ ලොවට අනුකම්පා කෙරෙති.

යො අන්ධකාරෙ තමසී පහංකරො★
වෙරොචනො මණ්ඩලී උග්ගතෙජො★
මා රාහු ගිලී චරං අන්තලික්ඛෙ
පජං මම රාහු පමුඤ්ච සූරියන්ති★

යම් සූර්‍යයෙක් ගණාදුරු දුරුහැර එළිය කෙරේ ද? බබළන මඩුලු ඇත්තේ ද මහා තේජස් ඇත්තේ ද එම්බල රාහු එසේ වූ අහස හැසිරෙන හිරු නොගිල. එම්බා රාහු, මාගේ පුත්‍ර වූ සූර්‍යයා මුදව.

අථ බො රාහු අසුරින්දො සුරියං දේවපුත්තං
මුඤ්චිත්වා තරමානරූපො★යෙන වෙපචිත්ති අසුරින්දො
තෙනුපසඞ්කමි★උපසඞ්කමිත්වා සංවිග්ගො ලොමහට්ඨජාතො
එකමන්තං අට්ඨාසි★එකමන්තං ඨිතං බො රාහුං අසුරින්දං
වෙපචිත්ති අසුරින්දො ගාථාය අජ්ඣභාසි★

ඉක්බිති රාහු අසුරේන්ද්‍රයා හිරු දෙව් පුත් අතහැර වේගයෙන් වේපචිත්ති අසුරිඳු යම් තැනෙක ද එතන්හි එළඹියේ ය. එළඹ කලකිරුණු සිත් ඇතිව බියෙන් තැති ගත්තෙක් ව එකත් පසෙක සිටියේ ය. එසේ සිටියා වූ රාහු අසුරේන්ද්‍රයාට වේපචිත්ති අසුරේන්ද්‍රයා ගාථාවකින් මෙසේ කීයේ ය.

කින්නු සන්තරමානොව★
රාහු සුරියං පමුඤ්චසි★
සංවිග්ගරූපො ආගම්ම★
කින්නු භීතොව තිට්ඨසී ති★

එම්බා රාහු අසුරේන්ද්‍රය, කිමෙක් ද? ඉක්මන් වූවකු මෙන් හිරු අත්හැරියෙහි ද? කුමක් හෙයින් කලකිරුණු ගතියෙන් යුක්තව මෙහි පැමිණ තැති ගත්තෙකු මෙන් සිටින්නෙහි ද?

සත්තධා මෙ ඵලෙ මුධා★ ජීවන්තො න සුඛං ලභෙ★
බුද්ධගාථාභිගීතොම්හි නො වෙ මුඤ්චෙය්‍ය සූරියන්ති★

බුදුරදුන් විසින් වදාළ ගාථා දෙකක් ඇසීමි. ඒ තථාගත වචනය ඉක්මවා ඉඳින් හිරු අත් නොහැරියෙමි නම් මාගේ හිස සත් කඩකට පැලෙන්නේය. ජීවත් වුව ද සැපයක් නොලබමි.

16. ධජග්ග පරිත්තං
ධජග්ග පිරිත

**එවං මෙ සුතං එකං සමයං භගවා★සාවත්ථියං විහරති
ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ★තත්‍ර බො භගවා භික්ඛූ
ආමන්තෙසි භික්ඛවොති ★භදන්තෙති තෙ භික්ඛූ භගවතො
පච්චස්සොසුං භගවා එතදවොච★**

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමිහි වැඩ වසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි,යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු වහන්සැයි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

**භූතපුබ්බං භික්ඛවෙ දෙවාසුර සඞ්ගාමො සමූපබ්බූළ්හො
අහොසි ★අථ බො භික්ඛවෙ සක්කො
දේවානමින්දො★දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි★සචෙ මාරිසා
දේවානං සඞ්ගාමගතානං උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං
වා ලොමහංසො වා★ මමෙව තස්මිං සමයෙ ධජග්ගං
උල්ලොකෙය්‍යාථ ★මමං හි වො ධජග්ගං උල්ලොකයතං ★යං
භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො
පහීයිස්සති★**

මහණෙනි, පෙර වූවක් කියමි. දෙවියන්ගේ හා අසුරයන්ගේ යුද්ධයක් විය. මහණෙනි, එකල්හි සක්දෙව් රජ තවුතිසා වැසි දෙවියන් ඇමතීය. භවත්නි, ඉදින් යුද්ධයට ගිය දෙවියනට බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් උපදනේ නම්, මාගේ ධ්වජාග්‍රය බලව්. මාගේ ධ්වජාග්‍රය බලන්නා වූ තොපට යම් බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුඩැහැ ගැන්මෙක් හෝ වන්නේ නම් එය පහවන්නේය.

**නො චෙ මෙ ධජග්ගං උල්ලොකෙය්‍යාථ★අථ පජාපතිස්ස දෙව
රාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ ★පජාපතිස්ස හි වො දෙව
රාජස්ස ධජග්ගං උල්ලොකයතං★යං භවිස්සති භයං වා
ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති★**

ඉදින් මාගේ ධිවජාග්‍රය නොදක්නහු නම්, එකල්හි ප්‍රජාපතී දෙව් රජුගේ ධිවජාග්‍රය බලව, ප්‍රජාපති දෙව් රජුගේ ධිවජාග්‍රය දක්නා තොපට යම් බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමු දැහැගැන්මෙක් වන්නේ නම්, එය පහවන්නේ ය.

නො වෙ පජාපතිස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ ★අථ වරුණස්ස දෙව රාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ ★වරුණස්ස හි වො දෙව රාජස්ස ධජග්ගං උල්ලොකයතං★යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති★

ඉදින් ප්‍රජාපති දෙව් රජුගේ ධිවජාග්‍රය නොදක්කනහු නම්, එකල්හි වරුණ දෙව් රජුගේ ධිවජාග්‍රය බලව්. වරුණ දෙව් රජුගේ ධිවජාග්‍රය දක්නා තොපට යම් බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ වන්නේ නම් එය පහවන්නේය.

නො වෙ වරුණස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ ★අථ ඊසානස්ස දෙව රාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ ★ඊසානස්ස හි වො දෙව රාජස්ස ධජග්ගං උල්ලොකයතං★යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති★

ඉදින් වරුණ දෙව් රජුගේ ධිවජාග්‍රය නො දක්නහු නම්, එකල්හි ඊසාන දෙව් රජුගේ ධිවජාග්‍රය බලව්. ඊසාන දෙව් රජුගේ ධිවජාග්‍රය දක්නා වූ තොපට යම් බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහ වන්නේ ය.

තං බො පන භික්ඛවෙ සක්කස්සවා දෙවානමින්දස්ස ධජග්ගං උල්ලොකයතං★ පජාපතිස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං★වරුණස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං★ඊසානස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං★යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයෙථාපි නොපි පහීයෙථ ★තං කිස්ස හේතු

මහණෙනි, සක්දෙව් රජුගේ ධිවජාග්‍රය බලන්නවුන්ට හෝ, ප්‍රජාපති දෙව් රජු ගේ ධිවජාග්‍රය බලන්නවුනට හෝ වරුණ දෙව් රජුගේ ධිවජාග්‍රය බලන්නවුනට හෝ ඊසාන දෙව්රජු ගේ ධිවජාග්‍රය බලන්නවුනට හෝ යම් බියක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ වන්නේ නම් පහවන්නේ හෝ වෙයි. පහ නොවන්නේ හෝ වෙයි. ඒ කවර හෙයින් ද යත්?

සක්කො භික්ඛවෙ දෙවානමින්දො අවීතරාගො★අවීතදොසො අවීතමොහො★ භීරුච්ඡම්හි උත්‍රාසි පලායිති★අහං ච ඛො භික්ඛවෙ එවං වදාමි★ස චෙ තුම්හාකං භික්ඛවෙ අරඤ්ඤගතානං වා රුක්ඛමූලගතානං වා සුඤ්ඤාගාරගතානං වා★ උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා★මමෙව තස්මිං සමයෙ අනුස්සරෙය්‍යාථ ★

මහණෙනි, සක්දෙව් රජ පහ නො වූ රාග ඇත්තේය. පහ නො වූ ද්වේෂ ඇත්තේය. පහ නො වූ මෝහ ඇත්තේය. බියවන සුළුය. තැතිගන්නා සුළුය. පලායන සුළුය. මහණෙනි, මම තොපට මෙසේ කියමි. මහණෙනි, ඉදින් අරණ්‍යකට ගියා වූ හෝ රුක් මුලකට ගියා වූ හෝ ශූන්‍යාගාරයකට ගියා වූ හෝ තොපට බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ උපදනේ නම් එකල්හි මා ම සිහි කරව්. (කෙසේ ද)

ඉතිපිසො භගවා අරහං සම්මා සම්බුද්ධො★විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ★අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති★ මමං හි වො භික්ඛවෙ අනුස්සරතං★යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති★

ඒ භාග්‍යවත් තෙමේ මේ කාරණයෙනුදු රහත් ය, සියලු ධර්මයන් මනා කොට දත, විද්‍යාචරණ සම්පන්නය, සුගතය, ලොකවිදූය, අනුත්තර පුරිසදම්මසාරථිය, දෙව් මිනිසුන්ට ශාස්තෘය, බුද්ධය, භගවත් යයි මාම සිහිකරව. මහණෙනි, මා සිහිකරන්නා වූ තොපට යම් බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහව යන්නේය.

නො චෙ මං අනුස්සරෙය්‍යාථ ★අථ ධම්මං අනුස්සරෙය්‍යාථ. ස්වාක්ඛාතො භගවතා ධම්මො★සන්දිට්ඨිකො අකාලිකො එහි පස්සිකො ඔපනයිකො★පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. ධම්මං හි වො භික්ඛවෙ අනුස්සරතං★යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති★

ඉදින් මා සිහි නො කරන්නාහු නම්, එකල්හි ධර්මය සිහි කරව්. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මයතෙමේ මනාකොට කියන ලදි, තමා විසින් ප්‍රත්‍යවෙක්ෂා ඥානයෙන් දැක්ක යුතු ය, තමාගේ ඉපදීමට අනතුරුව ම ඵල දෙනුයේ ය, අවුත් මේ බලව යන විධියට සුදුසු ය, ඵළඹීමට සුදුසු ය, නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දත යුත්තේ යැයි ධර්මය සිහිකරව. මහණෙනි, ධර්මය සිහි කරන්නා වූ තොපට හැම බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහව යන්නේය.

නො වෙ ධම්මං අනුස්සරෙය්‍යාථ ★අථ සඞ්ඝං අනුස්සරෙය්‍යාථ ★සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො★උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො★ ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො★සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො★යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො★ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිනෙය්‍යා අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති★ සඞ්ඝං හි වො භික්ඛවෙ අනුස්සරතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති තං කිස්ස හෙතු★

ඉදින් ධර්මය සිහි නොකරන්නාහු නම්, ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝ තෙමේ මනාව පිළිපන්නේය, භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝ තෙමේ ඉදිව මැදුම් පිළිවෙතින් පිළිපන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝ තෙමේ නිවන් සඳහා පිළිපන්නේ ය, භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝ තෙමේ නිවනට අනුකූල වූ පිළිවෙත පිළිපන්නේ ය. (ඔහු කවරහුද යත්) (සෝවාන් මග පිහිටියෝ ද සෝවාන් පලෙහි පිහිටියෝ ද එක් සඟළෙක) යන මේ පුරුෂ යුග සතරක් වේද, ඒ අට පුරුෂ පුද්ගලයෝ කෙනෙක් වෙද්ද, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ දුරිනුදු ගෙනහැර දියයුතු ප්‍රත්‍යයට සුදුසු ය, අමුතු පඬුරු පිළිගන්නට සුදුසු ය, දක්ෂිණාවට සුදුසු ය, සියලු ලෝ වැස්සන් විසින් දොහොත් මුදුනෙහි තබා කරන නමස්කාරයට සුදුසු ය, ලෝකයාගේ උතුම් වූ පින් කෙත යැයි සංඝයා සිහි කරව. මහණෙනි, සංඝයා සිහි කරන්නා වූ තොපට යම් බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුඩැහැගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහව යන්නේ ය. ඒ කවර හෙයින් ද යත්?

තථාගතො භික්ඛවෙ අරහං සම්මා සම්බුද්ධො★වීතරාගො වීතදොසො වීතමොහො★ අභීරු අච්ඡම්භි අනුත්‍රාසි අපලායීති★ඉදමවොච භගවා★ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා★

මහණෙනි, අර්හත් වූ සම්මා සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ නසන ලද රාග ඇත්තේ ය, නසන ලද ද්වේෂ ඇත්තේ ය, නසන ලද මොහ ඇත්තේ ය, භය නැත්තේ ය. තැති ගැනීම් නැත්තේ ය. චිත්තෙත්‍රාසයක් නැත්තේ ය. භයින් නො පලායන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මෙසේ වදාරා මේ ගාථා ද වදාළ සේක.

අරඤ්ඤෙ රුක්ඛමූලෙ වා - සුඤ්ඤාගාරෙව භික්ඛවො★ අනුස්සරෙථ සම්බුද්ධං - භයං තුම්හාක නො සියා★

මහණෙනි, ආරණ්‍යයෙහි දී හෝ රුක් මුල දී හෝ ශූන්‍යාගාරයේ දී හෝ බුදුරජාණන් වහන්සේ සිහි කරන්නේය (එවිට) තොපට බියෙක් නොවන්නේය.

නො චෙ බුද්ධං සරෙයය්‍යාථ★ - ලොකජෙට්ඨං නරාසභං
අථ ධම්මං සරෙයය්‍යාථ★ - නීයය්‍යානිකං සුදෙසිතං

ඉදින් ලෝක ජ්‍යෙෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ සිහි නොකරන්නහු නම්, එකල්හි නෛය්‍යානික වූ සුදේශිත වූ ධර්මය සිහි කරන්නේය.

නො චෙ ධම්මං සරෙයය්‍යාථ - නීයය්‍යානිකං සුදෙසිතං★
අථ සඞ්ඝං සරෙයය්‍යාථ - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං★

ඉදින් නෛය්‍යානික වූ සුදේශිත වූ ධර්මය සිහි නො කරන්නාහු නම්, එකල්හි නිරුත්තර වූ පුණ්‍යක්ෂේත්‍ර වූ සංඝයා සිහි කරන්නේය.

එවං බුද්ධං සරන්තානං - ධම්මං සඞ්ඝඤ්ච භික්ඛවො★
භයං වා ඡම්භිතත්තං වා - ලොමහංසො න හෙස්සති ති★

මහණෙනි, මෙසේ බුදුරජාණන් වහන්සේ ද, ධර්මයද, සංඝයාද සිහි කරන්නවුනට බියෙක් හෝ තැති ගැන්මෙක් හෝ ලොමුඩැහැගැන්මෙක හෝ නොවන්නේය.

17. මහා කස්සපත්ථෙර බොජ්ඣඞ්ගං
මහා කස්සප තෙරුන්ට වදාළ බොජ්ඣඞ්ග දෙසුම

එවං මෙ සුතං එකං සමයං භගවා ★රාජ්ගහෙ විහරති
වෙළුවනෙ කලන්දක නිවාපෙ★ තෙන බො පන සමයෙන★
ආයස්මා මහා කස්සපො පිප්ඵලිගුහායං විහරති★ ආබාධිකො
දුක්ඛිතො බාළ්හගිලානො★

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක් හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් වූ වෙළුවන මහා විහාරයෙහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් මහා කස්සප ස්ථවිර තෙමේ පීඩිතව දුකට පත් දැඩි ගිලන්ව පිප්ඵලි ගුහාවෙහි වෙසෙයි.

අථබො භගවා සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතො ★
යෙනායස්මා මහා කස්සපො තෙ'නුපසඞ්කමි උපසඞ්කමිත්වා
පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි★

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි එල සමවතින් නැගිට ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් වහන්සේ යම් තැනක වෙසේ ද, එතැනට එළඹ පැන වූ ආසනයෙහි වැඩහුන් සේක. එසේ වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් වහන්සේට මෙසේ වදාළ සේක.

නිසජ්ජ බො භගවා ආයස්මන්තං මහා කස්සපං එතදවොච★ කච්චි තෙ කස්සප ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි දුක්ඛා වේදනා පටික්කමන්ති? නො අභික්කමන්ති★ පටික්කමොසානං පඤ්ඤායති? නො අභික්කමො?'ති★

කිමෙක් ද? කස්සප, ඔබට ඉවසිය හැකි ද? කිම යැපිය හැකි ද? හෙවත් ඔබගේ ශරීරය පවත්වන්නට හැකි ද? කිම දුක්ඛ වේදනාවෝ පිරිහෙත් ද? අඩුවෙත් ද? කිම දියුණු නොවෙත් ද? ඒ දුක්ඛ වේදනාවන් ගේ කෙළවරක් පෙනේ ද? වැඩිවීමක් නො පෙනේදැ යි මෙසේ විචාළ සේක.

න මෙ භන්තෙ ඛමනීයං, න යාපනීයං. බාළ්හා මෙ දුක්ඛා වේදනා★ අභික්කමන්ති නො පටික්කමන්ති★ අභික්කමෝසානං පඤ්ඤායති නො පටික්කමො'ති

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට ඉවසිය නොහැකි යි. සිව් ඉරියව්වෙහි සිරුර පැවැත්විය නොහැකි යි. මාගේ දුක්ඛ වේදනාවෝ බලවත් හ. දියුණු වනු මිස අඩු නොවෙත්. වැඩිවනු මිස අඩුවක් නොපෙනේ යයි පිළිතුරු දුන්හ.

සත්තිමෙ කස්සප බොජ්ඣඞ්ගා★ මයා සම්මදක්ඛාතා, භාවිතා, බහුලීකතා★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තන්ති
කතමෙ සත්ත?★

කස්සප, මේ සත් වැදෑරුම් බොධ්‍යඞ්ග ධර්මයෝ මා විසින් මනා කොට කියන ලදහ. භාවිතා කරන ලදහ. බොහෝ කරන ලදහ. ඒ ධර්මයෝ චතුස්සත්‍ය ධර්මයන් විශිෂ්ඨඥානයෙන් දැන ගැනීම පිණිස චතුස්සත්‍යාගේ අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්.

ඒ සප්ත බොධ්‍යඞ්ගයෝ කවරහුදයත්?

සති සම්බොජ්ඣඞ්ගො බො කස්සප★ මයා සම්මදක්ඛාතො, භාවිතො, බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

කස්සප, සති සම්බොධ්‍යඞ්ග ය මා විසින් මනා කොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ

විශිෂ්ට දැනීම පිණිස ඔවුන් ගේ ම අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො බො කස්සප★ මයා සම්මදක්ඛාතො, භාවිතො, බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

කස්සප, ධම්මවිචය සම්බොධ්‍යඞ්ග ය මා විසින් මනා කොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන්ගේ ම අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

විරිය සම්බොජ්ඣඞ්ගො බො කස්සප★ මයා සම්මදක්ඛාතො, භාවිතො, බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

කස්සප, වීර්‍යසම්බොධ්‍යඞ්ග ය මා විසින් මනා කොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන්ගේ ම අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

පීති සම්බොජ්ඣඞ්ගො බො කස්සප★ මයා සම්මදක්ඛාතො, භාවිතො, බහුලීකතො★ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති★

කස්සප, ප්‍රීති සම්බොධ්‍යඞ්ගය මා විසින් මනාකොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන්ගේ අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො බො කස්සප★ මයා සම්මදක්ඛාතො, භාවිතො, බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

කස්සප, පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය මා විසින් මනාකොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන් ගේ ම අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

සමාධි සම්බොජ්ඣඞ්ගො බො කස්සප★ මයා සම්මදක්ඛාතො, භාවිතො, බහුලීකතො★ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති★

කස්සප, සමාධි සම්බොධ්‍යඞ්ගය මා විසින් මනා කොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන්ගේම අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො බො කස්සප★ මයා සම්මදක්ඛාතො, භාවිතො, බහුලීකතො★ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති★

කස්සප, උපේක්ෂා සම්බොධ්‍යඞ්ගය මා විසින් මනා කොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන්ගේ ම අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

ඉමෙ බො කස්සප සත්ත බොජ්ඣඞ්ගා★ මයා සම්මදක්ඛාතා, භාවිතා, බහුලීකතා, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තන්ති'ති★

කස්සප, මෙම සප්තබොධ්‍යඞ්ග ධර්මයෝ මා විසින් මැනවින් කියන ලදහ. වැඩි වශයෙන් පුරුදු කරන ලදහ. නැවත නැවතත් පුරුදු කරන ලදහ. ඒ සප්ත ධර්මයෝ විශිෂ්ට ඥානය පිණිස චතුස්සත්‍යාවබොධය පිණිස නිවන් පිණිස පවත්නාහ.

තග්ඝ භගව බොජ්ඣඞ්ගා තග්ඝ සුගත බොජ්ඣඞ්ගා'ති ★ ඉදමවොච භගවා★ අත්තමනො ආයස්මා මහාකස්සපො භගවතො භාසිතං අභිනන්දි★ උට්ඨාහි චායස්මා මහා කස්සපෝ තම්හා ආබාධා★ තථා පහිනො චායස්මතො මහාකස්සපස්ස සො ආබාධො අහෝසිති★

ඉක්බිති මහා කස්සප ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්ස, බොධ්‍යඞ්ග ධර්මයෝ නම් මැනවි. බොධ්‍යඞ්ග ධර්මයෝ ඒකාන්තයෙන් මැනවැයි සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය වදාළ සේක. එයට සතුටු වූ ආයුෂ්මත් මහා කස්සප ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනාව පිළි ගත්තේ ය. ආයුෂ්මත් කස්සප ස්ථවිරය තෙමේ ඒ අසනීපයෙන් නැගිට්ටේ ය. ආයුෂ්මත් කස්සප ස්ථවිරයන් වහන්සේගේ ඒ රෝගය නැවත නූපදනා පරිද්දෙන් නැතිවුයේ ය.

18. මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣඞ්ගං

මහා මොග්ගල්ලාන තෙරුන්ට වදාළ බොජ්ඣඞ්ග දෙසුම

එවං මෙ සුතං එකං සමයං භගවා ★රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දක නිවාපෙ★ තෙන බො පන සමයෙන★ ආයස්මා මහා මොග්ගල්ලානො ගිජ්ඣකූටෙ පබ්බතෙ විහරති★ ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො★

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් වූ වෙළුවන මහා විහාරයෙහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේ පීඩිතව දුකට පත් දැඩි ගිලන්ව ගිජුකුළු පව්වෙහි වෙසෙයි.

අථ බො භගවා සායන්හසමයං පතිසල්ලානා වුට්ඨිතො★ යෙනායස්මා මහා මොග්ගල්ලානො තෙනුපසඞ්කමි★ උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි★ නිසජ්ජ බො භගවා ආයස්මන්තං මහා මොග්ගල්ලානං එතදවොච★

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි ඵල සමවතින් නැගිට ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ යම් තැනක වෙසේ ද, එතැනට එළඹ පැන වූ ආසනයෙහි වැඩහුන් සේක. එසේ වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙසේ වදාළ සේක.

කච්චි තෙ මොග්ගල්ලාන ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි දුක්ඛා වේදනා★ පටික්කමන්ති? නො අභික්කමන්ති?★ පටික්කමොසානං පඤ්ඤායති? නො අභික්කමො?'ති★

මොග්ගල්ලාන, ඔබට ඉවසිය හැකි ද? කිම යැපිය හැකි ද? කිම දුක්ඛ වේදනාවෝ පිරිහෙත් ද? අඩුවෙත් ද? ඒ දුක් වේදනාවන් ගේ කෙළවරක් පෙනේ ද? වැඩිවීමක් නො පෙනේදැ යි මෙසේ විචාළ සේක.

න මෙ භන්තෙ ඛමනීයං න යාපනීයං බාළ්හා මෙ දුක්ඛා වේදනා★ අභික්කමන්ති නො පටික්කමන්ති★ අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමො'ති

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මට ඉවසිය නො හැකි යි. සිරුර පැවැත්විය නො හැකි යි. මා ගේ දුක්ඛ වේදනාවෝ බලවත් හ. දියුණු වනු මිස අඩු නො වෙත්. වැඩිවනු මිස අඩුවක් නො පෙනේ යයි පිළිතුරු දුන්හ.

සත්තිමෙ මොග්ගල්ලාන, බොජ්ඣඞ්ගා මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තන්ති★ කතමෙ සත්ත? ★

මොග්ගල්ලාන, මේ සත් වැදෑරුම් බොධ්‍යඞ්ග ධර්මයෝ මා විසින් මනාකොට කියන ලදහ. වඩන ලදහ. නැවත නැවතත් වඩන ලදහ. ඒ ධර්මයෝ චතුස්සත්‍ය ධර්මයන් විශිෂ්ඨ ඥානයෙන් දැන ගැනීම පිණිස චතුස්සත්‍යාගේ අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්. ඒ සප්ත බොධ්‍යඞ්ගයෝ කවරහුදයත්?

සති සම්බොජ්ඣඞ්ගො බො මොග්ගල්ලාන★ මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

මොග්ගල්ලාන, සති සම්බොධ්‍යඞ්ගය මා විසින් මනා කොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන් ගේ ම අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො බො මොග්ගල්ලාන★ මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

මොග්ගල්ලාන, ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය මා විසින් මනාකොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන් ගේ ම අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

විරිය සම්බොජ්ඣඞ්ගො බො මොග්ගල්ලාන★ මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

මොග්ගල්ලාන, වීර්‍යසම්බොධ්‍යඞ්ගය මා විසින් මනාකොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන් ගේ ම අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

පීති සම්බොජ්ඣඞ්ගො බො මොග්ගල්ලාන★ මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

මොග්ගල්ලාන, ප්‍රීති සම්බොධ්‍යඞ්ගය මා විසින් මනාකොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන්ගේ අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො බො මොග්ගල්ලාන★ මයා සම්මදක්ඛාතො භාවිතො★ බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

මොග්ගල්ලාන, පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය මා විසින් මනාකොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන්ගේ ම අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

සමාධි සම්බොජ්ඣඞ්ගො බො මොග්ගල්ලාන★ මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

මොග්ගල්ලාන, සමාධි සම්බොධ්‍යඞ්ගය මා විසින් මනාකොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන්ගේ ම අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො බො මොග්ගල්ලාන★ මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

මොග්ගල්ලාන, උපේක්ෂා සම්බොධ්‍යඞ්ගය මා විසින් මනාකොට කියන ලද්දේය. භාවිතා කරන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට දැනීම පිණිස ඔවුන්ගේ ම අවබෝධය පිණිස නිවන් අවබෝධය පිණිස පවතියි.

ඉමෙ බො මොග්ගල්ලාන සත්ත බොජ්ඣඞ්ගා★ මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්’ති★

මොග්ගල්ලාන, මෙම සප්තබොධ්‍යඞ්ග ධර්මයෝ මා විසින් මැනවින් කියන ලදහ. වැඩි වශයෙන් පුරුදු කරන ලදහ. නැවත නැවතත් පුරුදු කරන ලදහ. ඒ සප්ත ධර්මයෝ විශිෂ්ට ඥානය පිණිස චතුස්සත්‍යාවබෝධය පිණිස නිවන් පිණිස පවත්නාහ.

තග්ඝ භගව බොජ්ඣඞ්ගා තග්ඝ සුගත බොජ්ඣඞ්ගා'ති★ ඉදමවොච භගවා අත්තමනෝ ආයස්මා මහා මොග්ගල්ලානෝ භගවතෝ භාසිතං අභිනන්දි★

භාග්‍යවතුන් වහන්ස, බොධ්‍යඞ්ග ධර්මයෝ නම් මැනවි. බොධ්‍යඞ්ග ධර්මයෝ ඒකාන්තයෙන් මැනවැයි සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය වදාළ සේක. එයට සතුටු වූ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනාව පිළි ගත්තේය.

වුට්ඨාහි චායස්මා මහා මොග්ගල්ලානෝ තම්හා ආබාධා★ තථා පහීනෝ චායස්මතෝ මහා මොග්ගල්ලානස්ස සෝ ආබාධෝ අහොසීති★

ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙමේ ඒ අසනීපයෙන් නැගිට්ටේය. ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේගේ ඒ රෝගය එයින්ම දුරු වූයේය.

19 මහා චුන්දත්ථෙර බොජ්ඣඞ්ගං

මහා චුන්දත්ථෙර බොජ්ඣඞ්ග පිරිත

එවං මෙ සුතං එකං සමයං භගවා★ රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දක නිවාපෙ★ තෙන ඛො පන සමයෙන★ භගවා ආබාධිකෝ හොති දුක්ඛිතෝ බාළ්හගිලානෝ★

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් වූ වෙළුවන මහා විහාරයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ගිලන් වූයේ, දුක් වූයේ බලවත් ලෙස ගිලන් බවට පැමිණි සේක.

අථඛො ආයස්මා මහා චුන්දෝ★ සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතෝ★ යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා★ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි★ එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං මහා චුන්දං භගවා එතදවොච★ පටිහන්තු තං චුන්ද බොජ්ඣඞ්ගාති★

ඉක්බිති ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිර තෙම සවස් කාලයෙහි ඵල සමවතින් නැගී සිටියේ, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එතැනට වැඩියේය. එළඹ

භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නේය. එකත් පසෙක සිටි ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.
චුන්දය ඔබට බොධ්‍යඞ්ග ධර්මයෝ වැටහෙත්වා.

සත්තිමෙ භන්තෙ බොජ්ඣඞ්ගා★ භගවතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා★ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තන්ති★ කතමේ සත්ත? ★

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ සත් වැදෑරුම් බොධ්‍යඞ්ග ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් මනා කොට වදාරන ලදහ. වඩන ලදහ. නැවත නැවතත් පුරුදු කරන ලදහ. ඔවුහු විශිෂ්ඨ ඥානය පිණිස සම්‍යක් සම්බෝධිය පිණිස පවතියි.
ඒ කවර සතක් ද යත්?

සති සම්බොජ්ඣඞ්ගො බො භන්තෙ★ භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

ස්වාමීනී, සති සම්බොධ්‍යඞ්ගය භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවි වදාරණ ලද්දේය. වඩන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. එය මනාව දැනීම පිණිස යහපත් අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්.

ධම්ම විචය සම්බොජ්ඣඞ්ගො බො භන්තෙ★ භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

ස්වාමීනී, ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවි වදාරණ ලද්දේය. වඩන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. එය මනාව දැනීම පිණිස යහපත් අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්.

විරිය සම්බොජ්ඣඞ්ගො බො භන්තෙ★ භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

ස්වාමීනී, වීර්‍යසම්බොධ්‍යඞ්ගය භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවි වදාරණ ලද්දේය. වඩන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. එය මනාව දැනීම පිණිස යහපත් අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්.

පීති සම්බොජ්ඣඞ්ගො බො භන්තෙ★ භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

ස්වාමීනී, ප්‍රීති සම්බොධ්‍යඞ්ගය භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවි වදාරණ ලද්දේය. වඩන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. එය මනාව දැනීම පිණිස යහපත් අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්.

පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො බො භන්තෙ★ භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

ස්වාමීනී, පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවි වදාරණ ලද්දේය. වඩන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. එය මනාව දැනීම පිණිස යහපත් අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්.

සමාධි සම්බොජ්ඣඞ්ගො බො භන්තෙ★ භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

ස්වාමීනී, සමාධි සම්බොධ්‍යඞ්ගය භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවි වදාරණ ලද්දේය. වඩන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. එය මනාව දැනීම පිණිස යහපත් අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්.

උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො බො භන්තෙ★ භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො★ අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

ස්වාමීනී, උපේක්ෂා සම්බොධ්‍යඞ්ගය භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවි වදාරණ ලද්දේය. වඩන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේය. එය මනාව දැනීම පිණිස යහපත් අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්.

ඉමෙ බො භන්තේ සත්ත බොජ්ඣඞ්ගා★ භගවතා සම්මදක්ඛාතා★ භාවිතා බහුලීකතා★අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති★

ස්වාමීනී, මෙම සප්තබොධ්‍යඞ්ග ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවි වදාරණ ලද්දාහුය. වඩන ලද්දාහුය. නැවත නැවතත් පුරුදු කරන ලද්දාහු ය. එය මනාව දැනීම පිණිස යහපත් අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්නාහ.

තග්ඝ චුන්ද බොජ්ඣඞ්ගා තග්ඝ චුන්ද බොජ්ඣඞ්ගාති★ ඉදමවොචා යස්මා මහා චුන්දො සමනුඤ්ඤෙථා සත්ථා අහොසි★
චුට්ඨාහිච භගවා තම්හා ආබාධා★ තථා පහිනො ච භගවතො සො ආබාධො අහෝසී ති★

චුන්දය, බොධ්‍යඞ්ග ධර්මයෝ ඒකාන්තයෙන් සත්‍යය, චුන්දය, බොධ්‍යඞ්ග ධර්මයෝ ඒකාන්තයෙන් සත්‍යය යි වදාළහ. ආයුෂ්මත් චුන්ද ස්ථවිරයන් වහන්සේ මේ ධර්මය ප්‍රකාශ කළ සේක. භාග්‍යවතුන් වහන්සේ එය පිළිගත්හ. භාග්‍යවතුන් වහන්සේ එම අසනීපයෙන් නැගි සේක. උන්වහන්සේගේ රෝගාබාධය එයින් ම සුව වූයේ ය.

20. ගිරිමානන්ද සුත්තං
ගිරිමානන්ද තෙරුන්ට වදාළ දෙසුම

එවං මෙ සුතං එකං සමයං භගවා★ සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ★ තෙන බො පන සමයෙන★ ආයස්මා ගිරිමානන්දො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො★ අථ බො ආයස්මා ආනන්දො★ යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා★ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි★ එකමන්තං නිසින්නො බො ආයස්මා ආනන්දො★ භගවන්තං එතදවොච★

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුතුමාගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් ගිරිමානන්දයන් ස්ථවිර තෙමේ ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩි ගිලන් බව ඇත්තේ වෙයි. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පස්ව හුන්නේය. එකත්පස්ව සිටි ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය.

ආයස්මා භන්තෙ ගිරිමානන්දො★ ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො★ සාධු භන්තෙ භගවා යෙනායස්මා ගිරිමානන්දො★ තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා තී★ සචෙ බො ත්වං ආනන්ද ගිරිමානන්දස්ස භික්ඛුනො★ උපසඞ්කමිත්වා දසසඤ්ඤා භාසෙය්‍යාසි★ ඨානං බො පනෙතං විජ්ජති යං ගිරිමානන්දස්ස භික්ඛුනො★

දසසඤ්ඤා සුත්වා සො ආබාධො ඨානසො පටිප්පස්සම්භෙය්‍ය★

භාග්‍යවතුන් වහන්ස, ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිර තෙමේ උපන් ආබාධ ඇත්තේ, පැමිණි දුක් ඇත්තේ දැඩිව ගිලන් වූයේ වෙයි. භාග්‍යවතුන් වහන්ස, අනුකම්පා උපදවා ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන් කරා වැඩම කරන සේක් නම් මැනවි. ආනන්දයෙනි, ඉදින් තෙපි ගිරිමානන්ද මහණහු වෙත එළඹ දශ සංඥා කියහු නම්, යම් හෙයකින් දශ සංඥා අසා ගිරිමානන්ද මහණහුගේ ඒ ආබාධය හේතු වශයෙන් සංසිඳෙන්නේ ය.

කතමෙ දස?★ අනිච්චසඤ්ඤා, අනත්තසඤ්ඤා,★ අසුභසඤ්ඤා, ආදීනවසඤ්ඤා,★ පහානසඤ්ඤා, විරාගසඤ්ඤා,★ නිරොධසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතසඤ්ඤා,★ සබ්බසඞ්ඛාරෙසු අනිච්ඡාසඤ්ඤා, ආනාපානසති★

කවර දශයෙක් ද යත්? අනිත්‍ය සංඥාය, අනාත්ම සංඥාය, අශුභ සංඥාය, ආදීනව සංඥාය, ප්‍රහාණ සංඥාය, විරාග සංඥාය, නිරොධ සංඥාය, සියලු ලෝකයෙහි කලකිරීම් සංඛ්‍යාත සංඥාය, සියලුසංස්කාරයන්හි අනිත්‍ය සංඥාය, ආනාපාන සතිය යන දශයයි.

කතමා චා'නන්ද අනිච්චසඤ්ඤා? ඉධා'නන්ද භික්ඛූ★ අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා★ ඉති පටිසඤ්චික්ඛති★ රූපං අනිච්චං, වෙදනා අනිච්චා,★ සඤ්ඤා අනිච්චා, සඞ්ඛාරා අනිච්චා,★ විඤ්ඤාණං අනිච්චන්'ති.★ ඉති ඉමෙසු පඤ්චසුපාදානක්ඛන්ධෙසු අනිච්චානුපස්සී විහරති★ අයං වුච්චතානන්ද, අනිච්චසඤ්ඤා.★

ආනන්දයෙනි, අනිත්‍ය සංඥා කවරීද? ආනන්දය, මාගේ මේ සස්නෙහි මහණ තෙම ආරණ්‍යකට ගියේ හෝ රුක් මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ මෙසේ මේ ආකාරයෙන් නුවණින් සලකන්නේය. රූපස්කන්ධය අනිත්‍යය. වේදනාස්කන්ධය අනිත්‍යය. සංඥාස්කන්ධය අනිත්‍යය. සංස්කාරස්කන්ධය අනිත්‍යය. විඥානස්කන්ධය අනිත්‍යය කියායි. මෙසේ මේ උපාදානස්කන්ධ පඤ්චකයෙහි අනිත්‍ය ලක්ෂණය නැවත නැවත දකිමින් වාසය කෙරේද ආනන්දය, මේ අනිත්‍ය සංඥාය යි කියනු ලැබේ.

කතමා චා'නන්ද අනත්තසඤ්ඤා?★ ඉධා'නන්ද භික්ඛූ අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා★ ඉති පටිසඤ්චික්ඛති★ චක්ඛුං අනත්තා, රූපං අනත්තා,★ සොතං අනත්තා, සද්දා අනත්තා,★ ඝාණං අනත්තා, ගන්ධා

අනත්තා,★ ජිව්හා අනත්තා, රසා අනත්තා,★ කායෝ අනත්තා, ඵොට්ඨබ්බා අනත්තා,★ මනෝ අනත්තා, ධම්මා අනත්තා'ති.★ ඉති ඉමෙසු ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු★ අනත්තානුපස්සී විහරති★ අයං වුච්චතානන්ද අනත්තසඤ්ඤා.

ආනන්දය, අනාත්ම සංඥා කවරීද? ආනන්දය, මාගේ මේ සස්නෙහි මහණ තෙම ආරණ්‍යකට ගියේ හෝ රුක් මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට් ගියේ හෝ මෙසේ මේ ආකාරයෙන් නුවණින් සලකන්නේය. ඇස අනාත්මය. රූප අනාත්මය. කණ අනාත්මය. ශබ්දයෝ අනාත්මය. නාසය අනාත්මය. ගන්ධයෝ අනාත්මය. දිව අනාත්මය. රසයෝ අනාත්මය. කය අනාත්මය. පහස අනාත්මය. මනස අනාත්මය. ධර්‍මය අනාත්මයහ යි මෙසේ ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද ෂඩායතනයන් කෙරෙහි අනාත්ම ලක්‍ෂණය නැවත නැවත බලමින් වාසය කෙරේද, ආනන්දය මේ අනාත්ම සංඥාය යි කියනු ලැබේ.

කතමා චා'නන්ද අසුභසඤ්ඤා?★ ඉධා'නන්ද භික්ඛූ ඉමමෙව කායං උද්ධං පාදතලා අධෝ කෙසමත්ථකා★ තවපරියන්තං පූරං නානාප්පකාරස්ස★ අසුචිනෝ පච්චවෙක්ඛති අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචෝ මංසං නහාරු අට්ඨී අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බෝ ලොහිතං සෙදෝ මෙදෝ අස්සු වසා ඛෙළෝ සිඞ්ඝානිකා ලසිකා මුත්තං මත්ථකෙ මත්ථලුඞ්ග'ති ඉති ඉමස්මිං කායෙ අසුභානුපස්සී විහරති. අයං වුච්චතානන්ද අසුභසඤ්ඤා.★

ආනන්දය, අසුභ සංඥා කවරීද? ආනන්දය, මේ සස්නෙහි මහණ තෙම, පත්ලෙන් උඩ කෙස් මතුයෙන් යට සම කෙළවර කොට ඇති මේ ශරීරය නානාප්‍රකාර වූ අසුචියෙන් පිරුණෝ යයි ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේය. මේ ශරීරයෙහි කෙසයෝ ය, ලොමයෝ ය, නිය ය, දත් ය, සම ය, මස් ය, නහර ය, ඇට ය, ඇට මිදුලු ය, වකුගඩු ය, හදවත ය, අක්මාව ය, දළබුව ය, බඩදිව ය, පපුව ය, බඩවැල ය, අතුණුබහන ය, අමු අහර ය, අසුචි ය, පිත ය, සෙම ය, සැරව ය, ලේ ය, ඩහදිය ය, මෙදතෙලය, කඳුලු ය, වුරුණු තෙල් ය, කෙළ ය, සොටු ය, සඳමිදුලුය, මූත්‍ර නිස් මොළය ද යන මොවුහු ඇත්තාහු යයි මෙසේ මේ ශරීරයෙහි අසුභ ලක්‍ෂණ බලමින් වාසය කරයි. ආනන්දය, මේ අසුභ සංඥාව යයි කියනු ලැබේ.

කතමා චා'නන්ද ආදීනවසඤ්ඤා?★ ඉධා'නන්ද භික්ඛූ★ අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ

වා★ ඉති පටිසඤ්චික්ඛති★බහු දුක්ඛෝ ඛෝ අයං කායෝ බහු ආදීනවෝ?★ ඉති ඉමස්මිං කායෙ විවිධා ආබාධා

උප්පජ්ජන්ති★ සෙය්‍යථීදං★ චක්ඛුරොගො, සොතරොගො,★ ඝාණරොගො, ජිව්හාරොගො,★ කායරොගො, සීසරොගො,★ කණ්ණරොගො, මුඛරොගො, දන්තරොගො,★ කාසො, සාසො, පිණාසො, ඩහො, ජ්‍රෝ, කුච්ඡිරොගො,★ මුච්ඡා, පක්ඛන්දිකා, සූලා, විසූචිකා,★ කුට්ඨං, ගණ්ඩෝ, කිලාසෝ, සොසෝ, අපමාරෝ,★ දද්දු, කණ්ඩු, කච්ඡු, රඛසා, විතච්ඡිකා, ලොහිතංපිත්තං, මධුමේහෝ,★ අංසා, පිළකා, භගන්දළා,★ පිත්තසමුට්ඨානා ආබාධා,★ සෙම්හසමුට්ඨානා ආබාධා,★ වාතසමුට්ඨානා ආබාධා,★ සන්නිපාතිකා ආබාධා,★ උතුපරිණාමජා ආබාධා,★ විසමපරිහාරජා ආබාධා,★ ඔපක්කමිකා ආබාධා,★ කම්මවිපාකජා ආබාධා,★ සීතං, උණ්හං, ජිඝච්ඡා, පිපාසා, උච්චාරෝ, පස්සාවෝ'ති★ ඉති ඉමස්මිං කායෙ ආදීනවානුපස්සී විහරති★ අයං වුච්චතානන්ද ආදීනවසඤ්ඤා★

ආනන්දය, ආදීනවසංඥා කවරීද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම ආරණ්‍යකට ගියේ හෝ රුක් මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරන්නේය. මේ ශරීරයතෙම බොහෝ දුක් ඇත්තේ වේ. බොහෝ ආදීනව ඇත්තේ වේ. මෙසේ මේ ශරීරයෙහි අනේකප්‍රකාර වූ ආබාධයෝ උපදිත්. ඒ කවරහු ද? ඇසේ උපදිනා රෝග ය, කණේ උපදිනා රෝග ය, නාසයෙහි උපදිනා රෝග ය, දිවෙහි උපදිනා රෝග ය, කයෙහි උපදිනා රෝග ය, හිසේ උපදිනා රෝග ය, කණෙහි පිටත උපදිනා රෝග ය, මුඛයෙහි උපදිනා රෝග ය, දන්ත උපදිනා රෝග ය, ක්ෂය රෝගය, ශ්වාස ය, පීනස ය, දාහ ය, උණ ය, කුසේ උපදිනා රෝග ය, සිහි මූර්ඡා වීම ය, ලේ අතීසාර ය, අර්ශස් ය, කොලරා ය, කුෂ්ඨ ය, ගඩුය, හමේ රෝගයන් ය, ස්වාශ රෝගයන් ය, අපස්මාර රෝගයන් ය, දද රෝගයන් ය, කඩුවේගන්, කැසීමෙන් ගෙඩි හට ගත් රෝග, කැසීම්, පණුහොරි, රත්පිත්, දියවැඩියා, අංශභාග, පිළිකා, භගන්දළා, පිත නිසා හටගන්නා රෝගයෝ ය, සෙම නිසා හටගන්නා රෝගයෝ ය, වාතය නිසා හටගන්නා රෝගයෝ ය,තුන් දොස් කිපීමෙන් හටගන්නා රෝගයෝ ය, සෘතු විපර්යාස නිසා හටගන්නා රෝගයෝ ය, වැරදි ලෙස කය පරිහරණයෙන් හටගන්නා රෝගයෝ ය, (අන් අයගේ)උපක්‍රමයෙන් නිසා හටගන්නා රෝගයෝ ය, කර්ම විපාක නිසා හටගන්නා රෝගයෝ ය, ශීත ය, උෂ්ණ ය, කුසගින්න ය, පිපාසය ය, මලපහ ය, මුත්‍රය නිසා හටගන්නා රෝගයෝය යි, මෙසේ මේ ආදීනවයන් නුවණින් අනුව බලමින් වාසය කෙරේද? ආනන්දය, මේ ආදීනවසංඥා යයි කියනු ලැබේ.

කතමාචා'නන්ද පහානසඤ්ඤා? ඉධානන්ද භික්ඛු★ උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති★ විනොදෙති බ්‍යන්තිකරොති අනභාවං ගමෙති★ උප්පන්නං

ව්‍යාපාදවිතක්කං නාධිවාසෙති පජහති★ විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති ★උප්පන්නං විහිංසාවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති ★උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ★ නාධිවාසෙති පජහති ★විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති ★අයං වුච්චතානන්ද පහානසඤ්ඤා★

ආනන්දය, ප්‍රහාණ (පස් වැදෑරුම් ප්‍රහාණය අරමුණු කොට උපදනා) සංඥා කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණොක් තෙමේ උපන්නා වූ කාමවිතර්කය නො ඉවසා ද, අත්හරී ද, දුරු කෙරේ ද, නැති කෙරේ ද, අභාවයට පමුණුවාද උපන්නා වූ ව්‍යාපාදවිතර්කය නො ඉවසා ද, අත්හරී ද, දුරු කෙරේ ද, නැති කෙරේ ද, අභාවයට පමුණුවාද, උපන්නා වූ විහිංසාවිතර්කය නො ඉවසා ද, අත්හරී ද, දුරු කෙරේ ද, නැති කෙරේ ද, අභාවයට පමුණුවාද, උපන්නා වූ ලාමක අකුශල ධර්මයන් නො ඉවසා ද, අත්හරී ද, දුරු කෙරේ ද, නැති කෙරේ ද, අභාවයට පමුණුවාද, ආනන්දය, මේ ප්‍රහාණ සංඥා යයි කියනු ලැබේ.

කතමා චා'නන්ද විරාගසඤ්ඤා?★ ඉධානන්ද භික්ඛු★ අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා★ ඉති පටිසඤ්චික්ඛති ★එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාර සමථො★ සබ්බූපධි'පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිබ්බානන්'ති★ අයං වුච්චතානන්ද විරාගසඤ්ඤා★

ආනන්දය, විරාග සංඥා කවරදයත්? ආනන්දය, මාගේ මේ සස්නෙහි මහණ තෙම ආරණ්‍යකට ගියේ හෝ රුක් මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ මෙසේ මේ ආකාරයෙන් නුවණින් සලකන්නේය. සර්ව සංස්කාරයන් ගේ යම්බඳු සමථයෙක් සර්වොපධීන් ගේ දුරලීමෙක් තෘෂ්ණාක්ෂයෙක් විරාගයෙක් නිර්වාණයෙක් වේ නම් එය ශාන්ත ය. එය ප්‍රණීතය. ආනන්දයෙනි, මේ විරාග සංඥාය යි කියනු ලැබේ.

කතමා චා'නන්ද නිරොධසඤ්ඤා?★ ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා★ ඉති පටිසඤ්චික්ඛති★ එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො★ සබ්බූපධි'පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්'ති★ අයං වුච්චතානන්ද නිරොධසඤ්ඤා★

ආනන්දයෙනි, නිරොධ සංඥා කවරයත්? ආනන්දය, මාගේ මේ සස්නෙහි මහණ තෙම ආරණ්‍යකට ගියේ හෝ රුක් මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ මෙසේ මේ ආකාරයෙන් නුවණින් සලකන්නේය. සර්ව සංස්කාරයන් ගේ යම්බඳු සමථයෙක් සර්වොපධීන් ගේ දුරලීමෙක් තෘෂ්ණාක්ෂයෙක් විරාගයෙක් නිරොධයෙක්

නිර්‍ාණයෙක් වේ නම් එය ශාන්ත ය. ආනන්දයෙනි, මේ නිරොධ සංඥාය යි කියනු ලැබේ.

කතමා චා'නන්ද සබ්බලොකෙ අනභිරතසඤ්ඤා?★ ඉධානන්ද භික්ඛූ★ යෙ ලොකෙ උපායුපාදානාචෙතසො අධිට්ඨානා'භිනිවෙසානුසයා★ තෙ පජහන්තො විරමති න උපාදියන්තො★ අයං වුච්චතානන්ද සබ්බලොකෙ අනභිරතසඤ්ඤා★

ආනන්දයෙනි, සර්‍වලෝකයෙහි අනභිරත සංඥා කවර ද යත්? ආනන්දයෙනි, මේ සස්නෙහි භික්‍ෂුනමක් ලෝකයෙහි පඤ්චස්ඛන්ධය පිළිබඳ දැඩි ගැනීමක් හෝ සිත පිළිබඳ අරමුණු අනුව ඇතිවන කෙලෙස් හෝ වෙත් නම් ඔවුන් දුරු කරන්නේ වේ ද? දැඩිව අල්ලා නොගන්නේ වේ ද, ආනන්දයෙනි, මෙය ලෝකයෙහි කලකිරීම් සහගත හැඟීම යයි කියනු ලැබේ.

කතමා චා'නන්ද සබ්බසඞ්ඛාරෙසු අනිච්චසඤ්ඤා?★ ඉධානන්ද භික්ඛූ සබ්බසඞ්ඛාරෙහි අට්ටීයති හරායති ජිගුච්ඡති★අයං වුච්චතානන්ද සබ්බසඞ්ඛාරෙසු අනිච්චසඤ්ඤා★

ආනන්දයෙනි, සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍යසංඥාව කවරයත්? ආනන්දයෙනි, මේ සසුනෙහි මහණ තෙම හැම ප්‍රත්‍යුත්පන්න ධර්‍මයන් ගෙන් පෙළෙයි. ලජ්ජා වෙයි. පිළිකුල් කෙරෙයි. ආනන්දයෙනි,මේ සර්‍ව සංස්කාරයන් ගේ අනිත්‍ය සංඥාව යයි කියනු ලැබේ.

කතමා චා'නන්ද ආනාපානසති?★ ඉධානන්ද භික්ඛූ★ අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා★ නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා★ උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා★ සො සතො'ව අස්සසති සතො පස්සසති★

ආනන්දය, ආනාපානසතිය යනු කුමක් ද?
ආනන්දය, මාගේ මේ සස්නෙහි මහණ තෙම ආරණ්‍යකට ගියේ වේව යි හෝ රුක් මුලට ගියේ වේව යි හෝ ශූන්‍යාගාරයට ගියේ වේව යි කය සෘජුකොට තබා සිහි පෙරට කොට එළවා පලක් බැඳ හිඳියි. හේ සිහි ඇති සේම ආශ්වාස කෙරෙයි. සිහි ඇති සේම ප්‍රශ්වාස කෙරෙයි.

දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති★ දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති★

දීර්‍ඝ කොට ආශ්වාස කරනුයේ හෝ දීර්‍ඝ කොට ආශ්වාස කෙරෙමියි දනී. දීර්‍ඝ කොට ප්‍රශ්වාස කරනුයේ හෝ දීර්‍ඝ කොට ප්‍රශ්වාස කෙරෙමියි දනී.

රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති★
රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති★

ලුහුඬු කොට ආශ්වාස කරනුයේ හෝ ලුහුඬු කොට ආශ්වාස කෙරෙමියි දනී.
ලුහුඬු කොට ප්‍රශ්වාස කරනුයේ හෝ ලුහුඬු කොට ප්‍රශ්වාස කෙරෙමියි දනී.

සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති.★
සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති.★

සියලු ආශ්වාසකය දැන ආශ්වාස කරමි යි හික්මෙන්නේ ය.
සියලු ප්‍රශ්වාසකය දැන ප්‍රශ්වාස කරමි යි හික්මෙන්නේ ය.

පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති.★
පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති.★

මහත්වූ කාය සංස්කාරය සන්සිඳු වන්නෙම් ආශ්වාස කරමියි දැන හික්මෙන්නේ ය.
මහත්වූ කාය සංස්කාරය සන්සිඳු වන්නෙම් ප්‍රශ්වාස කරමි යි දැන හික්මෙන්නේ ය.

පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති.★
පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති.★

ප්‍රීති විඳිමින් ආශ්වාස කරමි යි (දැන) හික්මෙන්නේ ය.
ප්‍රීති විඳිමින් ප්‍රශ්වාස කරමි යි (දැන) හික්මෙන්නේ ය.

සුඛපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති.★
සුඛපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති.★

සුව විඳිමින් ආශ්වාස කරමි යි (දැන) හික්මෙන්නේ ය.
සුව විඳිමින් ප්‍රශ්වාස කරමි යි (දැන) හික්මෙන්නේ ය.

චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති.★
චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති.★

චිත්ත සංස්කාරය විඳිමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.
චිත්ත සංස්කාරය විඳිමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති.★
පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති.★

ඖදාරික චිත්ත සංස්කාරය සන්සිඳුවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.
ඖදාරික චිත්ත සංස්කාරය සන්සිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

චිත්තපටිසංවේදී අස්සසිස්සාමීති සික්ඛති ★
චිත්තපටිසංවේදී පස්සසිස්සාමීති සික්ඛති.★

(චතුර්විධ ධ්‍යානයන්ගේ වශයෙන්) සිත් පහළකරමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.
(චතුර්විධ ධ්‍යානයන්ගේ වශයෙන්) සිත් පහළකරමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති.★
අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති.★

සමාධි විදර්ශනා දෙකින් ම සිත අතිශයින් සතුටු කෙරෙමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.
සමාධි විදර්ශනා දෙකින් ම සිත අතිශයින් සතුටු කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති.★
සමාදහං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති.★

ධ්‍යානාදීන්ගේ වශයෙන් අරමුණෙහි සිත පිහිටුවමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.
ධ්‍යානාදීන්ගේ වශයෙන් අරමුණෙහි සිත පිහිටුවමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති.★
විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති.★

ප්‍රථම ධ්‍යානයෙන් නීවරණයන් කෙරෙන්) සිත මුදමින් ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.
ප්‍රථම ධ්‍යානයෙන් නීවරණයන් කෙරෙන්) සිත මුදමින් ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති.★
අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති.★

(රූපාදියෙහි) අනිත්‍යලක්ෂණ නැවත නැවත දකින ස්වභාව ඇත්තෙක්ව ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.
(රූපාදියෙහි) අනිත්‍යලක්ෂණ නැවත නැවත දකින ස්වභාව ඇත්තෙක්ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

විරාගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති.★
විරාගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති.★

දෙවැදෑරුම් විරාගය නැවත නැවත දක්නා ස්වභාව ඇත්තෙක්ව ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.
දෙවැදෑරුම් විරාගය නැවත නැවත දක්නා ස්වභාව ඇත්තෙක්ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

නිරොධානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති.★
නිරොධානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති.★

දෙවැදෑරුම් නිරොධය නැවත නැවත දක්නා ස්වභාව ඇත්තෙක්ව ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.
දෙවැදෑරුම් නිරොධය නැවත නැවත දක්නා ස්වභාව ඇත්තෙක්ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති.★
පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති.★

(විදර්‍ශනා මාර්ග දෙකින්) නැවත නැවත ක්ලේශයන් හැරීම දක්නා ස්වභාව ඇත්තෙක්ව ආශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.
(විදර්‍ශනා මාර්ග දෙකින්) නැවත නැවත ක්ලේශයන් හැරීම දක්නා ස්වභාව ඇත්තෙක්ව ප්‍රශ්වාස කරන්නෙමි යි හික්මෙන්නේ ය.

අයං වුච්චානානන්ද ආනාපානසති★

ආනන්දය, මේ තෙමේ ආනාපානස්මෘතිය යයි කියනු ලැබේ.

සචෙ බො ත්වං ආනන්ද ගිරිමානන්දස්ස භික්ඛුනො★ උපසඞ්කමිත්වා ඉමා දසසඤ්ඤා භාසෙය්‍යාසි★ ඨානං බො පනෙතං විජ්ජතියං ගිරිමානන්දස්ස භික්ඛුනො★ ඉමා

දසසඤ්ඤා සුත්වා සො ආබාධො ඨානසො පටිප්පස්සම්භෙය්‍ය ති★

ආනන්දය, ඉදින් ඔබ ගිරිමානන්ද මහණහු වෙත ගොස් මේ දශ සංඥාවන් කියන්නෙහි නම්, ගිරිමානන්ද නම් භික්ෂුව හට මේ දශ සංඥාවන් අසා ඒ ආබාධය සැණින් සන්සිඳෙන්නේ ය යන යමක් වේ ද මේ කාරණය ඇත.

අථ බො ආයස්මා ආනන්දො★ භගවතො සන්තිකෙ ඉමා දසසඤ්ඤා උග්ගහෙත්වා★ යෙනායස්මා ගිරිමානන්දො තෙ'නුපසකමි★ උපසඞ්කමිත්වා ආයස්මතො ගිරිමානන්දස්ස ඉමා දසසඤ්ඤා අහාසි★ අථ බො ආයස්මතො ගිරිමානන්දස්ස★ ඉමා දසසඤ්ඤා සුත්වා සො ආබාධො ඨානසො පටිප්පස්සම්හි වුට්ඨාහි චා යස්මා ගිරිමානන්දො තම්හා ආබාධා★ තථා පහීනො ච පනායස්මතො ගිරිමානන්දස්ස සො ආබාධො අහොසිති★

ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිර භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ දශ සංඥාවන් ඉගෙන යම් තැනක ඇවැත් ගිරිමානන්ද මහණ ද එතැනට එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ගිරිමානන්ද මහණ හට මේ දශසංඥාවන් වදාළේය. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන් වහන්සේ ගේ ඒ ආබාධය මේ දශසංඥාවන් අසා සැණින් සන්සිඳුනේ ය. ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිර තෙමේ ද ඒ ආබාධයෙන් නැගී සිටි සේක. ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන් වහන්සේ ගේ වනාහි ඒ ආබාධය නැවත නූපදී ද එසේ ම ප්‍රහීණ විය.

21. ඉසිගිලි සුත්තං

ඉසිගිලි සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා★ රාජගහෙ විහරති ඉසිගිලිස්මිං පබ්බතෙ★ තත්‍ර බො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති★ භදන්තෙ ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච★

මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ඉසිගිලි පර්වතයෙහි වැඩ වාසය කරන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක. ඒ භික්ෂූහු පින්වතුන්

වහන්සේ යි කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ මතු ප්‍රකාශ වන ධර්මය වදාළ සේක.

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ එතං වෙහාරං පබ්බත'න්ති★ එවං භන්තෙ ★ එතස්සපි බො භික්ඛවෙ වෙහාරස්ස පබ්බතස්ස★ අඤ්ඤාව සමඤ්ඤා අහොසි අඤ්ඤා පඤ්ඤත්ති.★

"මහණෙනි, තෙපි මේ වෙහාරපර්වතය දක්නහු ද?""එසේය ස්වාමීනි," මහණෙනි, මේ වෙහාර පර්වතයටද (එම නාම ව්‍යවහාරයට පෙර) අනික් නමෙක්ම විය. අනික් පැණවීමෙක් විය.

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ එතං පණ්ඩවං පබ්බත'න්ති★ එවං භන්තෙ★ එතස්සපි බො භික්ඛවෙ පණ්ඩවස්ස පබ්බතස්ස★ අඤ්ඤදත්ථු සමඤ්ඤා අහොසි, අඤ්ඤා පඤ්ඤත්ති.★

"මහණෙනි, තෙපි මේ පාණ්ඩව පර්වතය දක්නහු ද?""එසේය ස්වාමීනි," මහණෙනි, මේ පාණ්ඩව පර්වතයටද (එම නාම ව්‍යවහාරයට පෙර) අනික් නමෙක්ම විය. අනික් පැණවීමෙක් විය.

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ එතං වෙපුල්ලං පබ්බත'න්ති★ එවං භන්තෙ ★ එතස්සපි බො භික්ඛවෙ වෙපුල්ලස්ස පබ්බතස්ස★ අඤ්ඤදත්ථු සමඤ්ඤා අහොසි අඤ්ඤා පඤ්ඤත්ති.★

"මහණෙනි, තෙපි මේ වෙපුල්ල පර්වතය දක්නහු ද?""එසේය ස්වාමීනි," මහණෙනි, මේ වෙපුල්ල පර්වතයටද (එම නාම ව්‍යවහාරයට පෙර) අනික් නමෙක්ම විය. අනික් පැණවීමෙක් විය.

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ එතං ගිජ්ඣකූටං පබ්බත'න්ති★ එවං භන්තෙ ★ එතස්සපි බො භික්ඛවෙ ගිජ්ඣකූටස්ස පබ්බතස්ස★ අඤ්ඤදත්ථු සමඤ්ඤා අහොසි අඤ්ඤා පඤ්ඤත්ති.★

"මහණෙනි, තෙපි මේ ගිජ්ඣකූට පර්වතය දක්නහු ද?""එසේය ස්වාමීනි," මහණෙනි, මේ ගිජ්ඣකූට පර්වතයටද (එම නාම ව්‍යවහාරයට පෙර) අනික් නමෙක්ම විය. අනික් පැණවීමෙක් විය.

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ ඉමං ඉසිගිලිං පබ්බත'න්ති★ එවං භන්තෙ ★ ඉමස්සපි බො භික්ඛවෙ ඉසිගිලිස්ස පබ්බතස්ස★ එසා'ව සමඤ්ඤා අහොසි එසා පඤ්ඤත්ති.★

"මහණෙනි, තෙපි මේ ඉසිගිලි පර්වතය දක්නහු ද?""එසේය ස්වාමීනි," මහණෙනි, මේ ඉසිගිලි පර්වතයට වූකලී මේ නාමයම විය. මේ ප්‍රඥප්තිය ම විය.

භූතපුබ්බං භික්ඛවෙ පඤ්ච පච්චෙකබුද්ධසතානි★ ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසිනො අහෙසුං.★ තෙ ඉමං

පබ්බතං පවිසන්තා දිස්සන්ති, පවිට්ඨා න දිස්සන්ති.★ තමෙනං මනුස්සා දිස්වා එවමාහංසු★ අයං පබ්බතෝ★ ඉමෙ ඉසී ගිලතී ති ඉසිගිලි ඉසිගිලි ත්වෙව සමඤ්ඤා උදපාදි.★

"මහණෙනි, පෙර වූවක් කියමි. පන්සියයක් පසේ බුදු වරයෝ මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කාලයක් වැඩ විසූහ. මෙම පර්වතයට පිවිසෙන්නාවූ උන්වහන්සේලා දක්නා ලැබෙති. පිවිසියාවූ උන්වහන්සේලා දක්නා නොලැබෙත්. ඒ මේ කාරණය මනුෂ්‍යයෝ දැක මෙසේ කීවාහු ය.' මේ පර්වතය තෙමේ මේ ප්‍රත්‍යෙකබුද්ධ ඍෂීන් ගිලෙයි කියා යි'. එහෙයින් 'ඉසිගිලි' ඉසිගිලි' යන නම පහළ විය.

ආචික්ඛිස්සාමි භික්ඛවෙ පච්චෙකබුද්ධානං නාමානි,★ කිත්තයිස්සාමි භික්ඛවෙ පච්චෙකබුද්ධානං නාමානි,★ දෙසිස්සාමි භික්ඛවෙ පච්චෙකබුද්ධානං නාමානි,★ තං සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමී ති.★ එවං භන්තෙ ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතද වොච★

"මහණෙනි, පසේ බුදුවරුන්ගේ නම් පවසන්නෙමි. මහණෙනි, පසේ බුදුවරුන්ගේ නම් කීර්තනය කරන්නෙමි. මහණෙනි, පසේ බුදුවරුන්ගේ නම් දෙසන්නෙමි. ඒ අසවු, මැනවින් මෙනෙහි කරව්. කියන්නෙමියි" වදාළසේක. "එසේය ස්වාමීනි"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

අරිට්ඨො නාම, භික්ඛවෙ පච්චෙකසම්බුද්ධො★ ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි.★

මහණෙනි, 'අරිට්ඨ' නම් පසේ බුදු තෙමේ
මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කල් විසූයේ විය.

උපරිට්ඨො නාම, භික්ඛවෙ පච්චෙකසම්බුද්ධො ★ ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි.★

මහණෙනි, 'උපරිට්ඨ' නම් පසේ බුදු තෙමේ
මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කල් විසූයේ විය.

තගරසිඛී නාම, භික්ඛවෙ පච්චෙකසම්බුද්ධො ★ ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි.★

මහණෙනි, 'තගරසිඛී' නම් පසේ බුදු තෙමේ
මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කල් විසූයේ විය.

යසස්සී නාම, භික්ඛවෙ පච්චෙකසම්බුද්ධො ★
ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි.★

මහණෙනි, 'යසස්සී' නම් පසේ බුදු තෙමේ
මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කල් විසූයේ විය.

සුදස්සනො නාම, භික්ඛවෙ පච්චෙකසම්බුද්ධො ★
ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි.★

මහණෙනි, 'සුදස්සන' නම් පසේ බුදු තෙමේ
මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කල් විසූයේ විය.

පියදස්සී නාම, භික්ඛවෙ පච්චෙකසම්බුද්ධො ★
ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී
අහොසි.★

මහණෙනි, 'පියදස්සී' නම් පසේ බුදු තෙමේ
මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කල් විසූයේ විය.

ගන්ධාරො නාම, භික්ඛවෙ පච්චෙකසම්බුද්ධො ★
ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි.★

මහණෙනි, 'ගන්ධාර' නම් පසේ බුදු තෙමේ
මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කල් විසූයේ විය.

පිණ්ඩොලො නාම, භික්ඛවෙ පච්චෙකසම්බුද්ධො ★
ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි.★

මහණෙනි, 'පිණ්ඩොල' නම් පසේ බුදු තෙමේ
මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කල් විසූයේ විය.

උපාසහො නාම, භික්ඛවෙ පච්චෙකසම්බුද්ධො ★
ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි.★

මහණෙනි, 'උපාසහ' නම් පසේ බුදු තෙමේ
මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කල් විසූයේ විය.

නීථො නාම, භික්ඛවෙ පච්චෙකසම්බුද්ධො ★
ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි.★

මහණෙනි, 'නීථ' නම් පසේ බුදු තෙමේ
මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කල් විසූයේ විය.

තථෝ නාම, භික්ඛවෙ පච්චෙකසම්බුද්ධෝ ★
ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි.★

මහණෙනි, 'තථෝ' නම් පසේ බුදු තෙමේ
මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කල් විසූයේ විය.

සුතවා නාම, භික්ඛවෙ පච්චෙකසම්බුද්ධෝ ★
ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි.★

මහණෙනි, 'සුතවා' නම් පසේ බුදු තෙමේ
මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කල් විසූයේ විය.

භාවිතත්තෝ නාම, භික්ඛවෙ පච්චෙකසම්බුද්ධෝ ★
ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි ති★

මහණෙනි, 'භාවිතත්ත' නම් පසේ බුදු තෙමේ
මේ ඉසිගිලි පර්වතයෙහි කල් විසූයේ විය.

යෙ සත්තසාරා අනිඝා නිරාසා
පච්චේකමෙවජ්ඣගමුං සුබොධිං★
තෙසං විසල්ලානං නරුත්තමානං
නාමානි මෙ කිත්තයතෝ සුණාථ ★

දුක් නැත්තාවූ එහෙයින් ම තෘෂ්ණාව ක්ෂය කළාවූ යම් සත්පුරුෂෝත්තම කෙනෙක්
වෙන් වශයෙන් සම්‍යක්සම්බෝධිය අවබෝධ කළාහු ද
හෙවත් නිවන් පැමිණියෝ ද කෙලෙස් හුල් උදුරා දැමූ ඒ
නරෝත්තමයන්ගේ නම් ප්‍රකාශ කරන මාගේ තෙපුල් අසව්.

අරිට්ඨෝ උපරිට්ඨෝ තගරසිඛී යසස්සී
සුදස්සනෝ පියදස්සී ච බුද්ධෝ★
ගන්ධාරෝ පිණ්ඩෝලෝ උපාසභෝ ච
නීථෝ තථෝ සුතවා භාවිතත්තෝ★

අරිට්ඨ ය, උපරිට්ඨ ය, තගරසිඛී ය, යසස්සී ය,
සුදස්සන ය, ප්‍රියදර්ශී ය නම් වූ බුද්ධ ය,
ගන්ධාර ය, පිණ්ඩෝල ය, උපාසභ ය,
නීථ ය, තථ ය, සුතවන්තු ය, භාවිතත්ත ය.

සුම්භො සුභො මෙතුලො අට්ඨමො ච
අථස්සුමෙඛො අනිඛො සුදාඨො★
පච්චෙකබුද්ධා භවනෙත්තිඛීණා
හිඞ්ගූ ච හිඞ්ගො ච මහානුභාවා★

සුම්භ ය, සුභය, මෙටුල ය, අට්ඨම ය
තවද මෙඛ ය, අනීඛ ය, සුදාඨ ය
යන භවතෘෂ්ණාක්ෂණය කළාවූ මේ පසේ බුදුහු ද
ආනුභාව ඇති හිඞ්ගූ, හිඞ්ග ය.

ද්වෙජාලිනො මුනිනො අට්ඨකො ච
අථ කොසලො බුද්ධො අථො සුබාහු★
උපනෙමිසො නෙමිසො සන්තචිත්තො
සච්චො තථො විරජො පණ්ඩිතො ච★

චුල්ලජාලි ය, මහාජාලි ය බුදුවරු දෙනම ද, අට්ඨක බුද්ධ ය,
තව ද කොසල බුද්ධ ය, තව ද සුබාහු ය,
උපනෙමිස ය, නෙමිස ය, සන්ත චිත්ත ය,
සච්ච ය, තථ ය, විරජ ය, පණ්ඩිත ය,

කාලූපකාළා විජිතො ජිතො ච
අඞ්ගො ච පඞ්ගො ච ගුතිජ්ජිතො ච★
පස්සි ජහි උපධිං දුක්ඛමූලං
අපරාජිතො මාරබලං අපෙසි★

කාල ය, උපකාල ය, විජිත ය, ජිත ය,
අඞ්ග ය, පඞ්ග ය, ගුතිජ්ජිත ය,
දුකට මුල්වූ උපධි නම් කෙලෙස් කඳ හැරියා වූ පස්සි ය,
මාරබල ජය ගත් අපරාජිති ය,

සත්ථා පවත්තා සරභඞ්ගො ලොමහංසො
උච්චඞ්ගමායො අසිතො අනාසවො★
මනොමයො මානච්ඡිදො ච බන්ධුමා
තදාධිමුත්තො විමලො ච කෙතුමා★

සත්ථා ය, පවත්තා ය, සරභඞ්ග ය, ලොමහංස ය,
උච්චඞ්ගමාය ය, අසිත ය, අනාසව ය,
මනොමය ය, මානච්ඡේදනය කළා වූ බන්ධුමන්තු ය,
නම් පසේබුදුය, තදාධිමුත්ත ය, විමල ය, කෙතු-මන්තු ය,

කෙතුම්භරාගෝ ච මාතඞ්ගෝ අරියෝ
අථච්චුතෝ අච්චුතගාමබ්‍යාමකෝ★
සුමඞ්ගලෝ දබ්බිලෝ සුපතිට්ඨිතෝ
අසය්හෝ බෙමාහිරතෝ ච සොරතෝ★

කෙතුම්බ රාග ය, මාතඞ්ග ය, අරිය ය,
අච්චුත ය, අච්චුතගාමබ්‍යාමක ය,
සුමඞ්ගල ය, දබ්බිල ය, සුප්පතිට්ඨිත ය,
අසය්හ ය, බෙමාහිරත ය, සොරත ය,

දූරන්නයෝ සඞ්ඛෝ අථොපි උච්චයෝ
අපරෝ මුනී සය්හෝ අනොමනික්කමෝ★
ආනන්ද නන්දෝ උපනන්දෝ ද්වාදස
භාරද්වාජෝ අන්තිමදෙහධාරී★

දුරන්නය ය, සඞ්ඛ ය, උච්චය ය,
අපර මුනි වූ අලාමකවීර්ය ඇති සය්හ ය,
ආනන්ද ය, නන්ද ය, උපනන්ද ය, යන සතර නම බැගින් වූ
දොළොස් බුදුහු ද, අවසාන පඤ්චස්කන්ධධාරී වූ භාරද්වාජ ය,

බොධි මහානාමෝ අථොපි උත්තරෝ
කෙසී සිබී සුන්දරෝ භාරද්වාජෝ★
තිස්සූපතිස්සා භවබන්ධනච්ඡිදා
උපසීදරී තණ්හච්ඡිදෝ ච සීදරී★

බොධි ය, මහානාම ය, නැවත ද උත්තර ය,
කෙසී ය, සිබී ය, සුන්දර ය, භාරද්වාජ ය,
භව බන්ධන කැපූ තිස්ස ය, උපතිස්ස ය, යන දෙනම ය.
උපසීදරී ය, තෘෂ්ණාච්ඡේදනය කළා වූ සීදරී ය,

බුද්ධෝ අහු මඞ්ගලෝ වීතරාගෝ
උසභච්ඡිදා ජාලිනිං දුක්ඛමූලං★
සන්තං පදං අජ්ඣගමූපනීතෝ
උපොසථෝ සුන්දරෝ සච්චනාමෝ★

පහ කරන ලද කෙලෙස් ඇති මංගල නම් බුදුවරයෙක් විය.
උසභ නම් බුද්ධ තෙමේ ජාලිනී නම් ලද දුක් මුල කැපී ය.
උපනීත බුද්ධ තෙමේ සාන්ත පද නම් ලද නිවන් පැමිණියේ ය.
උපොසථ ය, සුන්දර ය, සච්චනාම ය,

ජේතො ජයන්තො පදුමො උප්පලො ච
පදුමුත්තරො රක්ඛිතො පබ්බතො ච★
මානත්ථද්ධො සොභිතො වීතරාගො
කණ්හො ච බුද්ධො සුවිමුත්තචිත්තො★

ජේත ය, ජයන්ත ය, පදුම ය, උප්පල ය,
පියුමතුරා ය, රක්ඛිත ය, පබ්බත ය,
මානත්ථද්ධ ය, සොභිත ය, මොනවට කෙලෙසුන් කෙරෙන්
මිදුණු සිත් ඇති කණ්හ නම් බුද්ධ ය.

එතෙ ච අඤ්ඤෙ ච මහානුභාවා
පච්චෙකබුද්ධා භවනෙත්තිඛීණා★
තෙ සබ්බසඞ්ගාතිගතෙ මහෙසී
පරිනිබ්බුතෙ වන්දථ අප්පමෙය්‍යෙති★

මෙකී පසේබුදුහු ද මෙහි නො කී මහානුභාව ඇති අන්‍ය වූ පසේ බුදුවරයෝ ද
ක්ෂය කරන ලද භවතෘෂ්ණා ඇත්තාහු වෙත්. මහර්ෂී වූ සියලු රාගාදී සඞ්ගයන්
ඉක්ම වූ අපමණ ගුණාවත් වූ පිරිනිවි පසේ බුදුවරුන් වඳිව්.
යන භව ගමන වැළැක්වූ මහත් ආනුභාව ඇති සියළු කෙලෙස්
බැඳුම් සිඳදැමූ මහර්ෂිවූ පිරිනිවණට පැමිණි මේ පසේබුදුවරයන්
වහන්සේලාද, අන්‍යවූ අප්‍රමාණ පසේබුදුවරයන් වහන්සේලාද වඳිව්.”

22. ධම්මචක්කප්පවත්තන සුත්තං

දම්සක් පැවතුම් සූත්‍රය

(බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රථම ධර්ම දේශනාව)

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

භාග්‍යවත් වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.

එවං මෙ සුතං එකං සමයං භගවා★ බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ★ තත්‍ර බො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ ආමන්තෙසි★

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර සමීපයෙහි වූ මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පස්වග භික්ෂූන්ට ඇමතූහ.

ද්වෙමෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා.★ යො චායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො★ හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො★ යො චායං අත්තකිලමථානුයොගො★ දුක්ඛො අනරියො අනත්ථසංහිතො.★

මහණෙනි, පැවිද්දා විසින් සේවනය නොකළ යුතු මේ දෙකෙළවරකි. (එනම්) ලාමක වූ ගැමියන්ට අයත් වූ පෘථග්ජනයන්ට අයත් වූ උතුම් නොවූ අනර්ථය පිණිස පවතින්නා වූ වස්තු කාමයන් හි ක්ලෙශ කාමය කරණකොට යම් ඇලී වාසය කිරීමක් වේද දුක්වූ ලාමක වූ අනර්ථය පිණිස පවත්නා වූ යම් ඒ කයට දුක් ගෙන දෙන පිළිවෙතක යෙදීමක් වේ ද යන මේ අන්ත දෙකය.

එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා★ චක්ඛුකරණී ඤාණකරණී★ උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

මහණෙනි, ඒ මේ දෙකෙළවරට නොපැමිණ තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද ප්‍රඥාවක්ෂුව ඇති කරන්නා වූ, ඥානය ඇති කරන්නා වූ මධ්‍යම ප්‍රතිපදාව කෙලෙසුන්ගේ සංසිඳීම පිණිස චතුස්සත්‍යය දැනීම පිණිස චතුස්සත්‍යය අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්.

කතමා ච සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා★ චක්ඛුකරණී ඤාණකරණී★ උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★ අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො★ සෙය්‍යථීදං සම්මාදිට්ඨි

සම්මාසඞ්කප්පෝ★ සම්මාවාචා සම්මාකම්මන්තෝ සම්මාආජීවෝ★ සම්මාවායාමෝ සම්මාසති සම්මාසමාධි★

මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද්දා වූ ප්‍රඥා චක්ෂුව ඇති කරන්නා වූ, ඥානය ඇති කරන්නා වූ කෙලෙසුන්ගේ සංසිඳීම පිණිස චතුස්සත්‍යයාගේ දැනීම පිණිස චතුස්සත්‍යය අවබෝධය පිණිස නිවන් පිණිස පවතින්නා වූ ඒ මධ්‍යම ප්‍රතිපදාව කවරිද? මේ ආර්‍ය්‍ය අෂ්ටංගික මාර්ගයයි. ඒ කවරේද යත්, සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මොහුයි.

අයං බො සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා★ චක්ඛුකරණී ඤාණකරණී★ උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති★

මහණෙනි, මේ වනාහි තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද ප්‍රඥා චක්ෂුස ඇති කරන්නා වූ, ඥානය ඇති කරන්නා වූ කෙලෙසුන්ගේ සංසිඳීම පිණිස චතුස්සත්‍යයාගේ දැනීම පිණිස චතුස්සත්‍යය අවබෝධය පිණිස නිවන් පිණිස පවතින්නා වූ ඒ මධ්‍යම ප්‍රතිපදාව වෙයි.

ඉදං බො පන භික්ඛවෙ දුක්ඛං අරියසච්චං★ ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා★ ව්‍යාධිපි දුක්ඛෝ මරණම්පි දුක්ඛං★ අප්පියෙහි සම්පයොගෝ දුක්ඛෝ පියෙහි විප්පයොගෝ දුක්ඛෝ★ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං★ සංඛිත්තෙන පඤ්චූපාදානක්ඛන්ධා දුක්ඛා★

මහණෙනි, මේ වනාහි දුක්ඛාර්‍ය්‍ය සත්‍යයයි. ඉපදීම දුකය, ජරාව ද දුකය, රෝගය ද දුකය, මරණය ද දුකය, අප්‍රියයන් හා එක්වීම දුකය, ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකය, කැමති යමක් නොලැබේද එයද දුකය, සැකෙවින් පඤ්ච උපාදානස්කන්ධයෝම දුක් වන්නාහුය.

ඉදං බො පන භික්ඛවෙ දුක්ඛසමුදයං අරියසච්චං★ යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී★ සෙය්‍යථීදං★ කාමතණ්හා භවතණ්හා විභවතණ්හා★

මහණෙනි, මේ වනාහි දුක්ඛ සමුදයාර්ථයීය සත්‍යයයි. නැවත නැවත ඉපදීම ඇති කරන්නා වූ නන්දිරාගය හා එක්වූ ඒ ඒ ආත්මභාවයෙහි ඇලෙන්නාවූ යම් ඒ තෘෂ්ණාවක් වේද, ඒ කවරේද යත්. කාම තෘෂ්ණාවය, භව තෘෂ්ණාවය, විභව තෘෂ්ණාවයි යන මොව්හුයි.

ඉදං බො පන භික්ඛවෙ දුක්ඛනිරොධං අරියසච්චං★ යො තස්සායෙව තණ්හාය★ අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො★

මහණෙනි, මේ වනාහි දුක්ඛ නිරෝධ ආර්‍ය්‍ය සත්‍යය වේ. යම් ඒ තෘෂ්ණාවගේ ඉතිරි නොකොට නිරුද්ධ කිරීමක් වේද, දුරු කිරීමක් වේ ද, නැති කිරීමක් වේද, මිදීමක් වේද, ආලය අත්හැරීමක් වේ ද එයයි.

ඉදං බො පන භික්ඛවෙ දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං★ අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො★ සෙය්‍යථීදං★ සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො★ සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො★ සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි★

මහණෙනි, මේ වනාහි දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්‍ය්‍යසත්‍යය වේ. එනම් ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගමැයි. හේ කවරේද යත්? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මොහුයි.

ඉදං දුක්ඛං අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු★ චක්ඛුං උදපාදි ඤාණං උදපාදි★ පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි★

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන්හි මට මේ දුක්ඛ ආර්‍ය්‍ය සත්‍යයයි. නුවණැස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

තං බො පනිදං දුක්ඛං අරියසච්චං★ පරිඤ්ඤෙය්‍යන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු★ චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි★

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන්හි මට ඒ මේ දුක්ඛාර්‍ය්‍ය සත්‍යය පිළිසිඳ දත යුතුයයි නුවණැස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

තං බො පනිදං දුක්ඛං අරියසච්චං★ පරිඤ්ඤාතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු★චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි★

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන්හි මට ඒ මේ දුක්ඛ ආර්‍ය්‍ය සත්‍යය පිළිසිඳ දැනගන්නාලදැයි නුවණැස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඉදං දුක්ඛසමුදයං අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු★ චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන්හි මේ දුක්ඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යයයි නුවණැස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

තං බො පනිදං දුක්ඛසමුදයං අරියසච්චං★ පහාතබ්බන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු★ චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි★

මහණෙනි, මට පෙර නොඇසූවිරූ ධර්මයන්හි මේ දුක්ඛ සමුදයාර්‍ය්‍ය සත්‍යය පහකළ යුතුයයි නුවණැස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

තං බො පනිදං දුක්ඛසමුදයං අරියසච්චං★ පහීනන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු★ චක්ඛුං උදපාදි ඤාණං උදපාදි★ පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි★

මහණෙනි, මට පෙර නොඇසූවිරූ ධර්ම ඒ මේ දුක්ඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යය ප්‍රහීන කරනලදැයි නුවණැස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

ඉදං දුක්ඛනිරොධං අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු★ චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි★

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයෙහි මට මේ දුක්ඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යයයි නුවණැස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

තං බො පනිදං දුක්ඛනිරොධං අරියසච්චං★ සච්ඡිකාතබ්බන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි

ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි

මහණෙනි, මට පෙර නොඇසූවිරූ ධර්මයන්හි මේ දුක්ඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කළ යුතුයැයි නුවණැස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

තං බො පනිදං දුක්ඛනිරොධං අරියසච්චං★ සච්ඡිකතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු★ චක්ඛුං උදපාදි ඤාණං උදපාදි★ පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි★

මහණෙනි, මට පෙර නොඇසූවිරූ ධර්මයෙහි මේ දුක්ඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කරන ලදැයි මට නුවණැස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු★ චක්ඛුං උදපාදි ඤාණං උදපාදි★ පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි★

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි මට මේ දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ආර්‍ය්‍ය සත්‍යයයි නුවණැස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

තං බො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං★ භාවෙතබ්බන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු★ චක්ඛුං උදපාදි ඤාණං උදපාදි★ පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි★

මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මය විෂයෙහි මේ දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ආර්‍ය්‍ය සත්‍යය වැඩිය යුතු යයි නුවණැස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

තං බො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං★ භාවිතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු★ චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි★

මහණෙනි, පෙර නොඅසන ලද ධර්මයන්හි මට දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ආර්‍ය සත්‍යය වඩන ලදැයි නුවණැස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

යාවකීවඤ්ච මෙ භික්ඛවෙ ඉමෙසු චතූසු අරියසච්චෙසු★ එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහොසි★ නෙව තාවාහං භික්ඛවෙ★ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ★ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය★ අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොපච්චඤ්ඤාසිං★

මහණෙනි, මට යම්තාක් කල් මෙසේ තුන් පැවැත්මක් (තිපරිවට්ට) ඇති, දොළොස් ආකාරයක් ඇති, මේ චතුස්සත්‍යයන්හි යථාභූතඥාන දර්ශනය මනාව පිරිසිඳ නොවීද, මහණෙනි, ඒතාක් කල් මම දෙවියන් සහිතවූ බඹුන් සහිතවූ සත්වලෝකයෙහිද මහණ බඹුන් සහිතවූ දෙවි මිනිසුන් සහිත ප්‍රජාව අතරෙහිද අනුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබෝධ කෙළෙමියි ප්‍රතිඥා නොකෙළෙමි.

යතො ච ඛො මෙ භික්ඛවෙ ඉමෙසු චතූසු අරියසච්චෙසු★ එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි★ අථාහං භික්ඛවෙ★ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ★ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය★ අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොපච්චඤ්ඤාසිං★

මහණෙනි, මට වනාහි යම් අවස්ථාවක මෙසේ තුන් පැවැත්මක් (තිපරිවට්ට) ඇති, දොළොස් ආකාරයක් ඇති, මේ චතුරාර්‍ය සත්‍යයන්හි යථාභූතඥාන දර්ශනය මනාව පිරිසිඳ වූයේද, මහණෙනි, මම එකල්හි දෙවියන් සහිත බඹුන් සහිත ලෝකයෙහිද මහණ බමුණන් ඇතුළු දෙවි මිනිසුන් සහිත වූ ප්‍රජාවෙහිද අනුත්තරවූ සම්‍යක් අවබොධිය අවබෝධ කෙළෙමියි ප්‍රතිඥා කෙළෙමි.

ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි★ අකුප්පා මෙ චෙතොවිමුත්ති අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවොති★ ඉදමවොච භගවා★ අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතොභාසිතං අභිනන්දුන් ති★

මට වනාහි ඥාන දර්ශනය පහළ විය. මාගේ අර්හත් ඵල විමුක්තිය වෙනස් කළ නොහැකිය. මේ අන්තිම ජාතිය වන්නීය. දැන් මට නැවත ඉපදීමක් නැත. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.සතුටු සිත් ඇති පස්වග භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්හ.

ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ★ ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස★ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි★ යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති★

මේ සූත්‍රය දේශනා කරනු ලැබීමෙහිදී ආයුෂ්මත් අඤ්ඤා කොණ්ඩඤ්ඤ භික්ෂුවට කෙලෙස් රජස් නැති පහවූ කෙළෙස් මල ඇති ධර්මචක්ෂුස හෙවත් ශ්‍රොතාපත්ති මාර්ග ඥානය පහළ වූයේය.(කෙසේ ද? යම් කිසිවක් ඇතිවීම ස්වභාව කොට ඇත්තේ ද, ඒ සියල්ල නැතිවීමද ස්වභාවය කොට ඇත්තේ ය. කියායි.)

පවත්තිතෙ ච පන භගවතා ධම්මචක්කෙ භුම්මා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

භාගවතුන් වහන්සේ විසින් ධර්මචක්‍රය පැවැත්වූ කල්හි වනාහි භූමිය ඇසුරුකොට වසන දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි මේ අනුත්තර වූ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

භුම්මානං දෙවානං සද්දං සුත්වා★ චාතුම්මහාරාජිකා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

බූමාටු දෙවියන්ගේ ශබ්දය අසා චාතුර්මහාරාජික දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

චාතුම්මහාරාජිකානං දෙවානං සද්දං සුත්වා★ තාවතිංසා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

චාතුර්මහාරාජික දෙවියන්ගේ ශබ්දය අසා තාවතිංස දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

තාවතිංසානං දෙවානං සද්දං සුත්වා★ යාමා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

තාවතිංස දෙවියන්ගේ ශබ්දය අසා යාමා දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

යාමානං දෙවානං සද්දං සුත්වා★ තුසිතා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

යාමා දෙවියන්ගේ ශබ්දය අසා තුසිතා දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

තුසිතානං දෙවානං සද්දං සුත්වා★ නිම්මාණරතී දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

තුසිතා දෙවියන්ගේ ශබ්දය අසා නිම්මාණරති දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

නිම්මාණරතීනං දෙවානං සද්දං සුත්වා★ පරනිම්මිතවසවත්තිනෝ දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙ ා වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

නිම්මාණරතී දෙවියන්ගේ ශබ්දය අසා පරනිම්මිතවසවත්තී දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

පරනිම්මිතවසවත්තීනං දෙවානං සද්දං සුත්වා★ බ්‍රහ්මපාරිසජ්ජා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

පරනිම්මිතවසවත්ති දෙවියන්ගේ ශබ්දය අසා බ්‍රහ්මපාරිසජ්ජා දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං සද්දං සුත්වා★ බ්‍රහ්මපුරොහිතා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

බ්‍රහ්මපාරිසජ්ජ දෙවියන්ගේ ශබ්දය අසා බ්‍රහ්මපුරොහිත දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

බ්‍රහ්මපුරොහිතානං දෙවානං සද්දං සුත්වා★ මහාබ්‍රහ්මා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★

සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

බ්‍රහ්මපුරොහිත දෙවියන්ගේ ශබ්දය අසා මහාබ්‍රහ්ම දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

මහාබ්‍රහ්මානං දෙවානං සද්දං සුත්වා★ පරිත්තාභා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

මහාබ්‍රහ්ම දෙවියන්ගේ ශබ්දය අසා පරිත්තාභා දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

පරිත්තාභානං දෙවානං සද්දං සුත්වා★ අප්පමාණාභා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

පරිත්තාභ දෙවියන්ගේ ශබ්දය අසා අප්පමාණාභ දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

අප්පමාණාභානං දෙවානං සද්දං සුත්වා★ ආභස්සරා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

අප්පමාණාභ දෙවියන්ගේ ශබ්දය අසා ආභස්සර දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ ෙම් ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

ආභස්සරානං දෙවානං සද්දං සුත්වා★ පරිත්තසුභා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

ආභස්සර දෙවියන්ගේ ශබ්දය අසා පරිත්තසුභ දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

පරිත්තසුභානං දෙවානං සද්දං සුත්වා★ අප්පමාණසුභා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

පරිත්තසුභ දෙවියන්ගේ ශබ්දය අසා අප්පමාණසුභ දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

අප්පමාණසුභානං දෙවානං සද්දං සුත්වා★ සුභකිණ්හකා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

අප්පමාණසුභ දෙවියන්ගේ ශබ්දය අසා සුභකිණ්හක දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

සුභකිණ්හකානං දෙවානං සද්දං සුත්වා★ වෙහප්ඵලා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

සුභකිණ්හක දෙවියන්ගේ ශබ්දය අසා වෙහප්ඵල දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

වෙහප්ඵලානං දෙවානං සද්දං සුත්වා★ අවිහා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

වෙහප්ඵල දෙවියන්ගේ ශබ්දය අසා අවිහ දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

අවිහානං දෙවානං සද්දං සුත්වා★ අතප්පා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

අවිහ දෙවියන්ගේ ශබ්දය අසා අතප්ප දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

අතප්පානං දෙවානං සද්දං සුත්වා★ සුදස්සා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

අතප්ප දෙවියන්ගේ ශබ්දය අසා සුදස්ස දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

සුදස්සානං දෙවානං සද්දං සුත්වා★ සුදස්සී දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

සුදස්ස දෙවියන්ගේ ශබ්දය අසා සුදස්සී දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

සුදස්සීනං දෙවානං සද්දං සුත්වා★ අකණිට්ඨකා දෙවා සද්දමනුස්සාවෙසුං★ එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති★

සුදස්සී දෙවියන්ගේ ශබ්දය අසා අකණිට්ඨක දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයේ දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි උතුම් වූ මේ ධර්මචක්‍රය පවත්වන ලදැයි සාධු නාද පැවැත්වූහ.

ඉතිහ තෙන ඛණෙන තෙන මුහුත්තෙන★ යාව බ්‍රහ්මලොකා සද්දොඅබ්භුග්ගච්ඡි★ අයඤ්ච දසසහස්සි ලොකධාතු★ සඞ්කම්පි සම්පකම්පි සම්පවෙධි★ අප්පමාණොච උළාරොඔභාසොලොකෙ පාතුරහොසි අතික්කම්ම දෙවානං දෙවානුභාවන්ති★

මෙසේ ඒ ක්ෂණයකින් ඒ මොහොතින් බඹලොව දක්වා (සාධුකාර) ශබ්දය පැන නැංගේය. මේ දසසහශ්‍ර ලෝක ධාතුව කම්පාවිය. අතිශයින් කම්පාවිය. මහත් සේ වෙව්ලා ගියේ ය. දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා අප්‍රමාණ වූ පහන් වූ ආලෝකයක් ලෙව්හි පහළවූයේ ය.

අථ බො භගවා උදානං උදානෙසි★ අඤ්ඤාසි වත හො කොණ්ඩඤ්ඤ අඤ්ඤාසි වත හො කොණ්ඩඤ්ඤොති★ ඉති හිදං ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස★ අඤ්ඤාකොණ්ඩඤ්ඤොත්වෙව නාමං අහොසීති★

එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පින්වත්නි, කොණ්ඩඤ්ඤතෙම ඒකාන්තයෙන් අවබෝධ කෙළේය. පින්වත්නි, කොණ්ඩඤ්ඤතෙම ඒකාන්තයෙන් අවබෝධ කෙළේයයි ප්‍රීතිවාක්‍යයක් පහළ කෙළේය. මෙය නිමිතිකොට ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේට අඤ්ඤා කොණ්ඩඤ්ඤ යන නාමය වූයේ ය.

23. මහා සමය සුත්තං

මහා සමය සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා★ සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං මහාවනෙ★ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි ★දසහි ච ලොකධාතුහි දෙවතා යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය භික්ඛුසඞ්ඝඤ්ච★

මාගේ ඇසීම මෙසේය: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි වූ කිඹුල්වත් පුරය සමීපයෙහි වූ මහ වනයෙහි සියල්ලම රහත් වූ පන්සියයක් භික්ෂූන්ගෙන් යුක්ත වූ මහත් භික්ෂු සංඝයා සමග වාසය කරනසේක. දස දහසක් ලෝක ධාතුවලින් දෙවියෝ බුදුරජුන් ද භික්ෂු සංඝයා දැකීම ද පිණිස බොහෝ සෙයින් රැස්වූවෝ වෙත්.

අථ බො චතුන්නං සුද්ධාවාසකායිකානං දෙවානං එතදහොසි★ අයං බො භගවා★ සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං මහාවනෙ★ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි★ දසහි ච ලොකධාතුහි දෙවතා★ යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය භික්ඛුසඞ්ඝඤ්ච.★ යංනූන මයම්පි යෙන භගවා තෙනුපසඞ්කමෙය්‍යාම උපසඞ්කමිත්වා භගවතො සන්තිකෙ පච්චෙක ගාථං භාසෙය්‍යාමාති.★

ඉක්බිත්තෙන් ශුද්ධාවාස බ්‍රහ්ම ලෝකයෙහි වසන්නා වූ බ්‍රහ්මයන් සතර දෙනෙකුට මේ අදහස පහළ විය. '' මේ භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් පුරය සමීපයෙහි වූ මහ වනයෙහි සියල්ල රහත් වූ පන්සියයක් භික්ෂූන්ගෙන් යුක්ත වූ මහත්

භික්ෂු සංඝයා සමග වාසය කරනසේක. දස දහසක් ලොක ධාතුවලින් ද දෙවියෝ බුදුරජුන් ද භික්ෂු සංඝයා ද දැකීමට බොහෝ සෙයින් රැස්වූවෝ වෙත්. අපිත් යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද එතැනට පැමිණෙන්නෙමු නම් පැමිණ බුදුන් හමුයෙහි එකි එකී ගාථාවක් කියන්නෙමු නම් ඉතා යෙහෙකැයි'' කියායි.

අථ බො තා දෙවතා★ සෙය්‍යථාපි නාම බලවා පුරිසෝ★ සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය★ පසාරිතං වා බාහං සම්මිඤ්ජේය්‍ය★එවමෙවං සුද්ධාවාසෙසු දෙවෙසු අන්තරහිතා භගවතෝ පුරතෝ පාතුරහංසු★ අථ බො තා දෙවතා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු★

එවිට ඒ දෙවියෝ ශක්තිමත් පුරුෂයෙක් හකුලන ලද අත යම්සේ දිගු කරන්නේද, දිගු කරන ලද අත යම්සේ හකුළුවන්නේද එපරිද්දෙන්ම ශුද්ධාවාස බඹලොව දෙවියන් අතුරෙන් අතුරුදහන් වූවාහු භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි පහළ වූහ. ඉක්බිති ඒ දෙවියෝ බුදුරජාණන් වහන්සේට නමස්කාර කොට එක්පැත්තක සිටියහ.

එකමන්තං ඨිතා බො එකා දෙවතා★ භගවතෝ සන්තිකෙ ඉමං ගාථං අභාසි★

එකත්පසෙක සිටියාවූ එක් දෙවියෙක් බුදුරජාණන් වහන්සේ හමුයෙහි මේ ගාථාව කීය.

1. **මහාසමයෝ පවනස්මිං,**
   දෙවකායා සමාගතා★
   ආගතම්හ ඉමං ධම්මසමයං,
   දක්ඛිතායෙ අපරාජිතසඞ්ඝන්ති.★

''මේ මහ වනයෙහි මහා සමාගමක් විය. දිව්‍ය සමූහයෝ රැස් වූහ. කෙලෙස් මරුන් විසින් නොපරදවන ලද සංඝයා දක්නා පිණිස මේ ධර්ම සමාගමට ආම්හයි'' කියායි.

අථ බො අපරා දෙවතා★ භගවතෝ සන්තිකෙ ඉමං ගාථං අභාසි★

එවිට අනික් දෙවි කෙනෙක් බුදුරජුන් හමුවෙහි මේ ගාථාව කීය.

2. **තත්‍ර භික්ඛවෝ සමාදහංසු, චිත්තං අත්තනෝ උජුකමකංසු★**
   සාරථීව නෙත්තානි ගහෙත්වා, ඉන්ද්‍රියානි රක්ඛන්ති
   පණ්ඩිතා'ති.★

''ඒ මහා සමූහයෙහි භික්ෂූහු තමන්ගේ සිත සමාධියෙහි පිහිටවූහ. සෘජු කළාහුය. ලනුවෙන් ගෙන රියැදුරා රථය හසුරුවන්නාක් මෙන් නුවණ ඇති අය පසිඳුරන් රකිත්යයි'' කීය.

අථ බො අපරා දෙවතා★ භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි★

එවිට අනික් දෙවි කෙනෙක් බුදුරජුන් හමුවෙහි මේ ගාථාව කීය.

3. ඡෙත්වා බීලං ඡෙත්වා පලිඝං, ඉන්දඛීලං ඌහච්ච මනෙජා★
තෙ චරන්ති සුද්ධා විමලා, චක්ඛුමතා සුදන්තා
සුසුනාගා'ති.★

''(කෙලෙස් නැමති) නුල් කපා (කෙලෙසුන් නමැති) පලිඝය සිඳ ඉන්ද්‍රඛීලය උදුරා තෘෂ්ණා රහිතවූ පිරිසිදුවූ (කෙලෙස්) කසට නැති පසැස් ඇති බුදුරජාණන් වහන්සේ විසින් හොඳින් දමනය කරන ලද්දාවූ ඒ තරුණ රහත්හු හැසිරෙත්.''යයි කීය.

අථ බො අපරා දෙවතා★ භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි★

ඉක්බිති තවත් දේවතාවෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

4. යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ, න තෙ ගමිස්සන්ති
අපායං
පහාය මානුසං දෙහං, දෙවකායං පරිපූරෙස්සන්ති'ති

''යම් කිසිවෙක් බුදුන් සරණ ගියෝ ද ඒ සත්වයෝ අපායට නොයත්, මිනිස් සිරුර හැර දිව්‍ය ශරීර සම්පූර්ණ කරන්නාහු (දෙවි බවට පැමිණෙත්)'' යයි කීය.

අථ බො භගවා භික්ඛූ ආමන්තෙසි - යෙහුයේ‍යන, භික්ඛවෙ, දසසු ලොකධාතූසු දෙවතා සන්නිපතිතා තථාගතං දස්සනාය භික්ඛුසඞ්ඝඤ්ච★ යෙ'පි තෙ භික්ඛවෙ, අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා★ තෙසම්'පි භගවන්තානං එතපරමායෙව දෙවතා සන්නිපතිතා අහෙසුං★ සෙය්‍යථාපි මය්හං එතරහි. ★

යෙ'පි තෙ භික්ඛවෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා★ තෙසම්'පි භගවන්තානං එතපරමායෙව දෙවතා සන්නිපතිතා භවිස්සන්ති★සෙය්‍යථාපි මය්හං එතරහි.★

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථා කළ සේක. ''මහණෙනි, දස දහසක් ලෝක ධාතුවෙහි දෙවියෝ තථාගතයන් ද භික්ෂු සංඝයා ද දැකීමට බොහෝ සෙයින් රැස් වූහ. මහණෙනි, යටගිය කාලයෙහි අර්හත්වූ යම් ඒ සම්‍යක් සම්බුදුවරයෝ වූවාහුද, ඒ භාග්‍යවතුන් වහන්සේලාට ද මෙපමණම දෙවියෝ රැස්වූහ. දැන් මා දැක්මට යම් පමණක් රැස්වූවෝද, එතරම් ය. මහණෙනි, මතු කාලයෙහි අර්හත්වූ යම් ඒ සම්‍යක් සම්බුදුවරයෝ වන්නාහුද, ඒ භාග්‍යවතුන් වහන්සේලාට ද මෙපමණම දෙවියෝ රැස්වන්නාහුය. දැන් මා දැක්මට යම් පමණක් රැස්වූවෝද, එතරම් ය.

ආචික්ඛිස්සාමි, භික්ඛවෙ, දෙවකායානං නාමානි★ කිත්තයිස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි★ දෙසිස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි★ තං සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමී'ති★ 'එවං භන්තෙ' ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච★

''මහණෙනි, දිව්‍ය සමූහයන්ගේ නම් කියන්නෙමි. මහණෙනි, දිව්‍ය සමූහයන්ගේ නම් පහළ කරන්නෙමි. මහණෙනි, දිව්‍ය සමූහයන්ගේ නම් දේශනා කරන්නෙමි. එය අසව්, මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමියි'' කීවෝය. ''එසේ ය ස්වාමීනි යි'' ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

5. සිලොකමනුකස්සාමි, යත්ථ භුම්මා තදස්සිතා★
යෙ සිතා ගිරිගබ්භාරං පහිතත්තා සමාහිතා★
පුථුසීහා'ව සල්ලීනා ලොමහංසාභි සම්භුනොා★
ඔදාතමනසා සුද්ධා විප්පසන්නමනාවිලා★

(අක්ෂරපද නියමිත) ගාථා කියන්නෙමි. යම් මේ තැනෙක්හි බූමාටු දෙවියෝ වෙසෙද්ද රහත් වූ ඒ ඒ තැන ඇසුරු කරන්නෝය. (භාවනාවට) යවන ලද සිත් ඇත්තාවූ ලොමුඩැහැගැනීම මැඩපැවැත්වූ පිරිසිදු සිත් ඇත්තාවූ ශුද්ධවූ වෙසෙසින් පැහැදුනු, නොකැළඹුනු සිත් ඇත්තාවූ සිංහරාජයන් මෙන් සැඟවුනාවූ යම් බොහෝ රහත්හු පර්වත ගුහා ඇසුරු කළාහුය.

6. භියේ‍යා පඤ්චසතෙ ඛදත්වා වනෙ කාපිලවත්ථවෙ★
තතො ආමන්තයී සත්ථා, සාවකෙ සාසනෙ රතෙ ★

නැවත ශාස්තෘන් වහන්සේ කිඹුල්වත් පුරයට නුදුරුවූ මහ වනයෙහි සස්නෙහි ඇලුනාවූ පන්සියයකට වැඩිවූ ශ්‍රාවකයන් දැක, අඬගා වදාළ සේක.

7. දෙවකායා අභික්කන්තා තෙ විජානාථ භික්ඛවොා★
තෙ ච ආතප්පමකරුං සුත්වා බුද්ධස්ස සාසනං★

''මහණෙනි, දිව්‍ය සමූහයා රැස් වූවෝය. ඒ දිව්‍ය සමූහයන් දනිව්'' කියායි. ඒ රහත්හුද බුදුරජාණන් වහන්සේගේ වචනය අසා වීර්‍යය කළාහුය.

8. තෙසං පාතුරහූ ඤාණං අමනුස්සානදස්සනං★
අප්පෙකෙ සතමද්දක්ඛුං සහස්සං අථ සත්තතිං★

ඒ භික්ෂූන්ට (දෙවාදි) අමනුෂ්‍යයන් දක්නාවූ දිව්‍ය ඥානය පහළ විය. ඇතැම් රහත්හු (අමනුෂ්‍යයන්) සියයක් දුටහ. ඇතැම් රහත්හු දහසක් ද තවත් සමහරු සැත්තෑ දහසක් ද, දුටුවාහුය.

9. සතං එකෙ සහස්සානං අමනුස්සානමද්දසුං★
අප්පෙකෙ'නන්තමද්දක්ඛුං දිසා සබ්බා ඵුටා අහූ★

ඇතැම් රහත්හු ලක්ෂයක් ද දුටහ. ඇතැම් රහත්හු කෙළවරක් නැති දෙවි බඹුන් දුටුවාහුය. සියලු දිශාවෝ (දෙවි බඹුන්ගෙන්) පිරුණාහුය.

10. තඤ්ච සබ්බං අභිඤ්ඤාය, වවක්ඛිත්වාන චක්ඛුමා★
තතො ආමන්තයී සත්ථා, සාවකෙ සාසනෙ රතෙ.★

පසැස් ඇත්තාවූ ශාස්තෘවරයන් වහන්සේ ඒ සියල්ලම උතුම් නුවණින් දැන වෙන් කොට නැවත සසුන්හි ඇලුනාවූ ශ්‍රාවකයන්ට අඬගා වදාළහ.

11. දෙවකායා අභික්කන්තා, තෙ විජානාථ භික්ඛවො★
යෙ වො'හං කිත්තයිස්සාමි, ගිරාහි අනුපුබ්බසො★

''මහණෙනි, දිව්‍ය සමූහයා රැස්වූහ. මම තොපට යම් දිව්‍ය සමූහයක් නම්වලින් පිළිවෙළින් ප්‍රකාශ කරම්ද, ඒ දිව්‍ය සමූහයන් දනිව්.

12. සත්තසහස්සා යක්ඛා, භුම්මා කාපිලවත්ථවා★
ඉද්ධිමන්තො ජුතීමන්තො, වණ්ණවන්තො යසස්සිනො★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

කිඹුල්වත් පුරයෙහි වාසය කරන්නාවූ සෘද්ධි ඇත්තාවූ බැබලීම් ඇත්තාවූ ශරීර වර්ණය ඇත්තාවූ දිව්‍යමය යසස් ඇත්තාවූ සත් දහසක් බූමාටු දෙවියෝද සතුටුවෙමින් රහත් භික්ෂු සමූහයා දැක්මට මහ වනයට පැමිණියාහුය.

13. ඡ සහස්සා හෙමවතා, යක්ඛා නානත්තවණ්ණිනො★
ඉද්ධිමන්තො ජුතීමන්තො, වණ්ණවන්තො යසස්සිනො★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

හිමාලයෙහි වසන්නාවූ නොයෙක් පැහැයෙන් යුක්තවූ සෘද්ධි ඇත්තාවූ බැබලීම් ඇත්තාවූ ශරීර වර්ණය ඇත්තාවූ දිව්‍යමය යසස් ඇත්තාවූ සය දහසක් දෙවියෝද සතුටුවෙමින් රහත් භික්ෂූන් සමූහයා දැක්මට මහ වනයට පැමිණියාහ.

14. සාතාගිරා තිසහස්සා, යක්ඛා නානත්තවණ්ණිනෝ★
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ, වණ්ණවන්තෝ යසස්සිනෝ★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

සාතාගිරි පර්වතවාසීවූ නොයෙක් පැහැයෙන් යුක්තවූ සෘද්ධි ඇත්තාවූ බැබලීම් ඇත්තාවූ ශරීර වර්ණය ඇත්තාවූ දිව්‍යමය යසස් ඇත්තාවූ තුන් දහසක් දෙවියෝ සතුටුවෙමින් රහත් භික්ෂූන් සමූහයා දැක්මට මහ වනයට පැමිණියාහ.

15. ඉච්චෙතෙ සොළසසහස්සා, යක්ඛා නානත්තවණ්ණිනෝ★
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ, වණ්ණවන්තෝ යසස්සිනෝ★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

මෙසේ නොයෙක් ආලෝක ඇත්තාවූද සෘද්ධි ඇත්තාවූ බැබලීම් ඇත්තාවූ ශරීර වර්ණය ඇත්තාවූ දිව්‍යමය යසස් ඇත්තාවූ මේ දහසය දහසක් දෙවියෝ ද සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහයා දැක්මට මහ වනයට පැමිණියාහ.

16. වෙස්සාමිත්තා පඤ්චසතා, යක්ඛා නානත්තවණ්ණිනෝ★
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ, වණ්ණවන්තෝ යසස්සිනෝ★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

වෙස්සාමිත්ත නම් පර්වතයෙහි වැසි නොයෙක් ආලෝක ඇත්තාවූද සෘද්ධි ඇත්තාවූ ද බැබලීම් ඇත්තාවූ ද ශරීර වර්ණය ඇත්තාවූ ද දිව්‍යමය යසස් ඇත්තාවූ ද පන්සියයක් දෙවියෝ සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහයා දැක්මට මහ වනයට පැමිණියාහ.

17. කුම්භීරෝ රාජගහිකෝ, වෙපුල්ලස්ස නිවෙසනං★
භියේ‍යා නං සතසහස්සං යක්ඛානං පයිරුපාසති★
කුම්භීරෝ රාජගහිකෝ සොපාග සමිතිං වනං★

රජගහනුවර උපන්නාවූ කුම්භීර නම් යක් සෙනෙවියෙක් විය. ඔහුගේ වාසස්ථානය වෙපුල්ල පර්වතය වන්නේ ය. ඔහු ලක්ෂයකට වැඩි යක්ෂ පිරිසක් ආශ්‍රය කරයි. රජගහ නුවර උපන් ඒ කුම්භීර නම් යක් සෙනවියා ද රහත් භික්ෂූ සමූහයා දක්නට මහ වනයට ආයේය.

18. පුරිමඤ්ච දිසං රාජා, ධතරට්ඨෝ තං පසාසති★
ගන්ධබ්බානං ආධිපති, මහාරාජා යසස්සිසෝ★
පුත්තාපි තස්ස බහවෝ, ඉන්දනාමා මහබ්බලා★
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ, වණ්ණවන්තෝ යසස්සිනෝ★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

පෙරදිග්හි රජවූ ධ්‍රතරාෂ්ට්‍ර වරම් රජතෙමේ ඒ පෙර දිගට අනුශාසනා කරයි. ගන්ධර්වයන්ට අධිපතිවූ යසස් ඇති ඒ ධ්‍රතරාෂ්ට්‍ර නම් මහරජ තෙමේද ඒ වරම් රජහුගේ ඉන්ද්‍ර යන නම් ඇත්තාවූ ද, මහත් ශක්ති ඇත්තාවූ සෘද්ධි ඇත්තාවූ ද බැබලීම් ඇත්තාවූ ද ශරීර වර්ණය ඇත්තාවූ ද දිව්‍යමය යසස් ඇත්තාවූ ද බොහෝ පුත්‍රයෝ ද සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහයා දැක්මට මහ වනයට පැමිණියාහ.

19. දක්ඛිණඤ්ච දිසං රාජා, විරූළ්හෝ තං පසාසති★
කුම්භණ්ඩානං ආධිපති, මහාරාජා යසස්සිසෝ★
පුත්තාපි තස්ස බහවෝ ඉන්දනාමා මහබ්බලා★
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ, වණ්ණවන්තෝ යසස්සිනෝ★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

දකුණු දෙසට රජවූ විරූඪ නම් වරම් රජතෙමේද ඒ දිසාවට අනුශාසනා කරයි. කුම්භාණ්ඩයින්ට අධිපතිවූ යසස් ඇත්තාවූ ඒ විරූඪ නම් මහරජ තෙමේ ද සෘද්ධි ඇත්තාවූ ද බැබලීම් ඇත්තාවූ ද ශරීර වර්ණය ඇත්තාවූ ද දිව්‍යමය යසස් ඇත්තාවූ ද ඉන්ද්‍ර යන නම් ඇති ඔහුගේ බොහෝ පුත්‍රයෝ ද සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහයා දැක්මට මහ වනයට පැමිණියාහ.

20. පච්ඡිමඤ්ච දිසං රාජා, විරූපක්ඛෝ තං පසාසති★
නාගානං ආධිපති, මහාරාජා යසස්සිසෝ★
පුත්තාපි තස්ස බහවෝ ඉන්දනාමා මහබ්බලා★
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ, වණ්ණවන්තෝ යසස්සිනෝ★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

බටහිර දික්හි රජවූ විරූපාක්ෂ නම් වරම් රජතෙමේ ඒ දිශාවට අනුශාසනා කරයි. නයින්ට අධිපතිවූ යසස් ඇත්තාවූ ඒ විරූපාක්ෂ නම් මහරජ තෙමේ ද ඔහුගේ ඉන්ද්‍ර යන නම් ඇති බල ඇත්තාවූ ද සෘද්ධි ඇත්තාවූ ද බැබලීම් ඇත්තාවූ ද ශරීර වර්ණය ඇත්තාවූ ද දිව්‍යමය යසස් ඇත්තාවූ ද බොහෝ පුත්‍රයෝ ද සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහයා දැක්මට මහ වනයට පැමිණියාහ.

21. උත්තරඤ්ච දිසං රාජා, කුවේරෝ තං පසාසති★
යක්ඛානං ආධිපති, මහාරාජා යසස්සිසෝ★
පුත්තාපි තස්ස බහවෝ ඉන්දනාමා මහබ්බලා★
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ, වණ්ණවන්තෝ යසස්සිනෝ★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

උතුරු දිග්හි රජවූ වෛශ්‍රවණ නම් වරම් රජතෙමේ ඒ දිශාවට අනුශාසනා කරයි. යකුන්ට අධිපතිවූ යසස් ඇත්තාවූ ඒ වෛශ්‍රවණ නම් මහරජ තෙමේ ද ඉන්ද්‍ර යන නම් ඇති මහත් බල ඇත්තාවූ ද සෘද්ධි ඇත්තාවූ ද බැබලීම් ඇත්තාවූ ද ශරීර වර්ණය ඇත්තාවූ ද දිව්‍යමය යසස් ඇත්තාවූ ද ඔහුගේ බොහෝ පුත්‍රයෝ ද සතුටුවෙමින් අර්හත් භික්ෂු සමූහයා දැක්මට මහ වනයට පැමිණියාහ.

22. පුරිමං දිසං ධතරට්ඨො, දක්ඛිණෙන විරූළ්හකො★
පච්ඡිමෙන විරූපක්ඛො, කුවෙරො උත්තරං දිසං★
චත්තාරො තෙ මහාරාජා, සමන්තා චතුරො දිසා★
දද්දළ්හමානා අට්ඨංසු, වනෙ කාපිලවත්ථවෙ★

නැගෙනහිර දික් හි ධ්‍රතරාෂ්ට්‍ර නම් වරම් රජ්ද, දකුණු දික්හි විරූඨ නම් වරම් රජ්ද, බටහිර දික්හි විරූපාක්ෂ නම් වරම් රජ්ද, උතුරු දිග්හි වෛශ්‍රවණ නම් වරම් රජ්ද, මෙකී සිව්වරම් මහරජදරුවෝ හාත්පසින් සිව්දිසාවන්හි කිඹුල්වත් පුරයට සමීප මහවනයෙහි දිලිසෙමින් සිටියාහ.

23. තෙසං මායාවිනො දාසා, ආගූ වඤ්චනිකා සඨා★
මායා කුටෙණ්ඩු වෙටෙණ්ඩු විටුච්ච විටුඩො සහ★

ඒ සිව්වරම් දෙවි රජුන්ගේ මායා ඇත්තාවූ වංචා කරන්නාවූ කෙරාටිකවූ දාසයෝද, මායාකාරවූ කුටෙණ්ඩුය, වෙටෙණ්ඩුය, විටූච්චය, විටූඩය යන මොවුහූද ඔවුන් සමග ආවාහුය.

24. චන්දනො කාමසෙට්ඨො ච, කින්නුඝණ්ඩු නිඝණ්ඩු ච★
පනාදො ඔපමඤ්ඤෙදා ච, දෙවසූතො ච මාතලි★

චන්දනය, කාමසෙට්ඨය, කින්නුඝණ්ඩුය, නිඝණ්ඩුය, පනාදය, ඔපමඤ්ඤදය, මාතලී දෙවිපුත්ය, යන මොවුහූද ඔවුන් සමග ආවාහුය.

25. චිත්තසෙනො ච ගන්ධබ්බො, නළොරාජා ජනෙසභො★
ආගූ පඤ්චසිඛො චෙව, තිම්බරූ සුරියවච්චසා★

ගාන්ධර්වවූ චිත්‍රය, සේනය යන දෙදෙනා ද නළකාර නම් දෙවි රජ්ද ජනෙසභ නම් දෙවිපුත් ද පඤ්චසිඛ දෙවිපුත්ද තිම්බරූ නම් ගාන්ධර්වයාද සුරියවච්චසා නම් දෙවිදුවද ආවාහුය.

26. එතෙ චඤ්ඤෙ ච රාජානො, ගන්ධබ්බා සහ රාජූහි★
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං★

මෙකී ගාන්ධර්ව රජදරුවෝද අන් ගාන්ධර්වයෝද තමන්ගේ රජුන් හා සතුටුවෙමින් රහත් භික්ෂු සමූහයා දක්නට මහ වනයට පැමිණියාහ.

27. අථාගූ නාභසා නාගා, වෙසාලා සහ තච්ඡකා★
කම්බලස්සතරා ආගූ, පායාගා සහ ඤාතිහි.★

එවිට නාහස නම් නාගයෝ ද විසාලී නාලොව වැසි නාගයෝද තච්ඡක නම් නාග පිරිස හා ආවෝය. කම්බල අස්සතර යන කුල දෙක්හි නාගයෝද පායාග නම් නාලොව වැසි නාගයෝද නෑයන් හා ආවෝය.

28. යාමුනා ධතරට්ඨා ච, ආගූ නාගා යසස්සිනෝ★
එරාවණෝ මහානාගෝ, සොපාග සමිතිං වනං★

යමුනා නම් ගඟ වැසි නාගයෝද ධ්‍රුතරාෂ්ට්‍ර කුලයෙහි උපන් නාගයෝද යසස් ඇත්තාවූ නාගයෝද ආවෝය. ඓරාවණ නම් මහා නාග තෙමේද අර්හත් භික්ෂු සමූහය දක්නට මහ වනයට ආය.

29. යෙ නාගරාජෙ සහසා හරන්ති,
දිබ්බා දිජා පක්ඛි විසුද්ධචක්ඛූ★
වෙහාසයා තෙ වනමජ්ඣපත්තා,
චිත්‍රා සුපණ්ණා ඉති තෙසං නාමානි★

දිව්‍යානුභාවය ඇත්තාවූ ද්විජ නම්වූ පිරිසිදු ඇස් ඇත්තාවූ යම් ගරුඬ පක්ෂීහූ නාරජුන් වහා ගෙනයද්ද ඒ පක්ෂීහු මහවනයට අහසින් පැමිණියාහුය. චිත්‍රය, සුපණ්ණය යනු ඔවුන්ගේ නාමයෝයි.

30. අභයං තදා නාගරාජානමාසි,
සුපණ්ණතො බෙමමකාසි බුද්ධෝ★
සණ්හාහි වාචාහි උපච්චයන්තා,
නාගා සුපණ්ණා සරණමකංසු බුද්ධං★

එකල්හි නා රජුන්ට භය නැති විය. සර්වඥයන් වහන්සේ ගුරුළන් කෙරෙන් භය නැති කළ සේක. නාගයෝද ගුරුළෝද මොළොක් වචනයෙන් කෑදවනු ලබන්නෝ බුදුන් සරණ ගියාහුය.

31. පිතා වපිරහත්ථෙන, සමුද්දං අසුරාසිතා★
භාතරෝ වාසවස්සෙතෙ, ඉද්ධිමන්තෝ යසස්සිනෝ★
කාලකඤ්ඣා මහාහිංසා අසුරා දාන වෙඝසා★
වෙපචිත්ති සුචිත්තී ච, පහාරාදෝ නමුචී සහ★
සතඤ්ච බලිපුත්තානං සබ්බෙ වෙරොච නාමකා★
සන්නය්හිත්වා බලිං සෙනං රාහුභද්දමුපාගමුං★
සමයොදානි භද්දන්තෙ, භික්ඛූනං සමිතිං වනං★

සක්දෙව් රජහු විසින් ජයගන්නා ලද මුහුදු ආශ්‍රය කරන්නාවූ සක්දෙව් රජහුගේ සහෝදරවූ සෘද්ධි ඇත්තාවූ යසස් ඇත්තාවූ මේ අසුරයෝද, මහත් බියකරුවූ කාලකඤ්ජ නම් අසුරයෝද, දානවේඝ නම් අසුරයෝද, වෙපචිත්ති නම්

අසුරේන්ද්‍රයාද, සුචිත්ති නම් අසුරේන්ද්‍රයාද, පහාරා නම් අසුරේන්ද්‍රයාද, වසවත් මරු සමග ආවෝය. සියල්ලෝම වෙරොව යන නම් ඇති බලී නම් අසුරයාගේ පුත්‍රයෝ සිය දෙනෙක්ද බලසෙනග ගෙන සැරසී රාහු අසුරිඳු කරා පැමිණියාහුය. ''නුඹවහන්සේට යහපත් වේවා. දැන් රහත් භික්ෂු සමූහය දක්නට මහ වනයට යාමට කල් වන්නේය.''

32. ආපො ච දෙවා පඨවී ච, තෙජෝ වායො තදාගමුං★
වරුණා වාරුණා දෙවා, සොමෝ ච යසසා සහ★
මෙත්තා කරුණාකායිකා, ආගු දෙවා යසස්සිනෝ★
දසෙතෙ දසධා කායා, සබ්බෙ නානත්තවණ්ණිනෝ★
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ, වණ්ණවන්තෝ යසස්සිනෝ★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

එකල්හි අපො කසිණ (සමාපත්තියෙන් උපන්) දෙවියෝද එසේම තෙජෝ කසිණ (සමවතින්) උපන් දෙවියෝද වායො කසිණ සමවතින් උපන් දෙවියෝ ද ආවෝය. වරුණය, වාරුණය යන දෙවියෝද සොම නම් දෙවියාද යස නම් දෙවියන් සමග ආවාහුය. යසස් ඇත්තාවූ මෙත්තා කායික, කරුණා කායික දෙවියෝද ආවෝය. සියල්ලෝම නොයෙක් පැහැවත්වූ දස ආකාරයකින් යුක්තවූ සියල්ලෝම සෘද්ධි ඇත්තාවූද බැබලීම් හා වර්ණවත්වූද යසස් ඇත්තාවූද මේ දේව සමූහ දසය සතුටු වෙමින් අර්හත් භික්ෂු සමූහය දක්නට ආවාහුය.

33. වෙණ්හූ ච දෙවා සහලී ච, අසමා ච දුවෙ යමා★
චන්දස්සූපනිසා දෙවා චන්දමාගු පුරක්ඛත්වා★
සුරියස්සූපනිසා දෙවා සුරියමාගු පුරක්ඛත්වා★
නක්ඛත්තානි පුරක්ඛත්වා ආගු මන්දවලාහකා★
වසූනං වාසවෝ සෙට්ඨෝ, සක්කොපාග පුරින්දදෝ★
දසෙතෙ දසධා කායා, සබ්බෙ නානත්තවණ්ණිනෝ★
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ, වණ්ණවන්තෝ යසස්සිනෝ★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

වෙණ්හූය, සහලීය, අසමය, යමය නම් දෙවියෝ දෙදෙනද, සඳ දෙවියන් ඇසුරු කරන්නාවූ දෙවියෝ සඳ දෙවියන් පෙරටුකොට ද ආවෝය. හිරු දෙවියන් ඇසුරු කරන්නාවූ දෙවියෝ හිරු දෙවියන් පෙරටුකොට ද නැකත් දෙවියන් (තරු) ඇසුරු කරන්නාවූ දෙවියෝ නැකත් දෙවියන් පෙරටුකොට ද ආවාහුය. මන්දවළාහක නම් දෙවියෝ ද ආවෝය. වසු දෙවියන්ට අධිපති හෙයින් වාසව නම්වූද, පුරින්දද නම්වූද ශක්‍රයාත් ආයේය. දස ආකාරයකින් නොයෙක් පැහැ ඇත්තාවූ ද සෘද්ධි ඇත්තාවූද බැබලීම් හා වර්ණවත්වූද යසස් ඇත්තාවූද මේ දේව සමූහ දසය සතුටු වෙමින් අර්හත් භික්ෂු සමූහය දක්නට ආවාහුය.

34. අථාගු සහභූ දෙවා ජලමග්ගි සිඛාරිව★
අරිට්ඨකා ච රොජා ච, උම්මාපුප්ඵනිභාසිනෝ★
වරුණා සහ ධම්මා ච, අච්චුතා ච අනෙජකා★

සූලෙය්‍යරුචිරා ආගූ ආගූ වාසවනෙසිනෝ★
දසෙතෙ දසධා කායා, සබ්බෙ නානත්තවණ්ණිනෝ★
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ, වණ්ණවන්තෝ යසස්සිනෝ★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

නැවත සහභූ නම් දෙවියෝ ගිනි සිළු මෙන් බබලමින් ආවෝය. අරිට්ඨක නම් දෙවියෝද රොජ නම් දෙවියෝද (දිය බෙරලිය මල් පැහැයෙන්) බබලන උම්මාපුප්ඵ නම් දෙවියෝ ද වරුණය, සහධම්මය, අච්චුතය, අනෙකජය, සූලෙය්යය රුචිරය, යන දෙවියෝද ආවාහුය. වාසවනෙසී නම් දෙවියෝද ආවාහුය. දස ආකාරයකින් යුක්තවූ සියල්ලෝම නොයෙක් පැහැ ඇත්තාවූ ද සෘද්ධි ඇත්තාවූද බැබලීම් හා වර්ණවත්වූද යසස් ඇත්තාවූද මේ දේව සමූහ දසය සතුටු වෙමින් අර්හත් භික්ෂු සමූහය දක්නට ආවාහුය.

35. සමානා මහාසමානා. මානුසා මානුසුත්තමා★
බිඩ්ඩාපදූසිකා ආගූ ආගූ මනොපදූසිකා★
අථාගූ හරයෝ දෙවා, යෙ ච ලොහිතවාසිනෝ★
පාරගා මහාපාරගා, ආගූ දෙවා යසස්සිනෝ★
දසෙතෙ දසධා කායා, සබ්බෙ නානත්තවණ්ණිනෝ★
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ, වණ්ණවන්තෝ යසස්සිනෝ★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

සමානය, මහා සමානය, මානුසය, මානුසුත්තමය, බිඩ්ඩාපදූසිකය යන දෙවියෝ ද ආවෝය. නැවත හරිනම් දෙවියෝද රත්ගල් වැසිවූ යම් දෙවිකෙනෙක් වෙද්ද ඔව්හූද, පාරග නම්වූද, මහාපාරග නම්වූද යසස් ඇත්තාවූ දෙවියෝද ආවාහුය. දස ආකාරයකින් යුක්තවූ සියල්ලෝම නොයෙක් පැහැ ඇත්තාවූ ද සෘද්ධි ඇත්තාවූද බැබලීම් හා වර්ණවත්වූද යසස් ඇත්තාවූද මේ දේව සමූහයෝ දස දෙන සතුටු වෙමින් අර්හත් භික්ෂු සමූහය දක්නට ආවාහුය.

36. සුක්කා කරුම්හා අරුණා, ආගූ වෙඝනසා සහ★
ඔදාතගය්හා පාමොක්ඛා, ආගූ දෙවා විචක්ඛණා★
සදාමත්තා හාරගජා, මිස්සකා ච යසස්සිනෝ★
ථනයං ආගූ පජ්ජුන්නෝ, යො දිසා අභිවස්සති★
දසෙතෙ දසධා කායා, සබ්බෙ නානත්තවණ්ණිනෝ★
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ, වණ්ණවන්තෝ යසස්සිනෝ★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

සුක්කාය, කරුම්හාය, අරුණය, යන දෙවියන් සමග වෙඝනසා නම් දෙවියෝද ආවෝය. ප්‍රධාන වූ ඔදාතගය්හ නම් වූ දෙවියෝ ද විචක්ඛණ නම් දෙවියෝද ආවෝය. සදාමත්ත නම් දෙවියෝද, හාරගජ නම් දෙවියෝද, යසස් ඇත්තාවූ මිස්සක නම් දෙවියෝද යම් දෙවියෙක් දිශාවන්හි වැසි කෙරේද, ඒ පජ්ජුන්න නම් දෙවි තෙමේද

මේඝනාද කරමින් ආයේය. දස ආකාරයකින් යුක්තවූ සියල්ලෝම නොයෙක් පැහැ ඇත්තාවූ ද සෘද්ධි ඇත්තාවූද බැබලීම් හා වර්ණවත්වූද යසස් ඇත්තාවූද මේ දේව සමූහයෝ දස දෙන සතුටු වෙමින් අර්හත් භික්ෂු සමූහය දක්නට ආවාහුය.

37. බෙමියා තුසිතා යාමා, කට්ඨකා ච යසස්සිනෝ★
ලම්බීතකා ලාමසෙට්ඨා, ජෝතිනාමා ච ආසවා★
නිම්මානරතිනෝ ආගූ, අථාගූ පරනිම්මිතා★
දසෙතෙ දසධා කායා, සබ්බෙ නානත්තවණ්ණිනෝ★
ඉද්ධිමන්තෝ ජුතීමන්තෝ, වණ්ණවන්තෝ යසස්සිනෝ★
මොදමානා අභික්කාමුං, භික්ඛූනං සමිතිං වනං★

බෙමිය නම් දෙවියෝද තුසී (පුර වැසි) දෙවියෝද යාම නම් (දෙව්ලොව) වැසි දෙවියෝද යසස් ඇත්තාවූ කට්ඨක නම් දෙවියෝද ලම්බීතක නම් දෙවියෝද ලාමසෙට්ඨ නම් දෙවියෝද ජෝති නම් දෙවියෝද ආසව නම් දෙවියෝද නිර්මාණරති නම් (දෙව්ලොව වැසි) දෙවියෝද ආවාහුය. නැවත පරනිර්මිතවසවර්ති (දෙව්ලොව වැසි) නම් දෙවියෝද ආවෝය. දස ආකාරයකින් යුක්තවූ සියල්ලෝම නොයෙක් පැහැ ඇත්තාවූ ද සෘද්ධි ඇත්තාවූද බැබලීම් හා වර්ණවත්වූද යසස් ඇත්තාවූද මේ දේව සමූහයෝ දස දෙන සතුටු වෙමින් අර්හත් භික්ෂු සමූහය දක්නට ආවාහුය.

38. සට්ඨෙ තෙ දෙවනිකායා, සබ්බෙ නානත්තවණ්ණිනෝ★
නාමන්වයෙන ආගච්ඡුං, යෙ චඤ්ඤෙ සදිසා සහ★

මේ සැටක් දෙවි සමූහයෝ සියල්ලෝම නොයෙක් පැහැයෙන් යුක්තවූවෝම තම තමන්ගේ නම් ගොත් වශයෙන් ආවාහුය. යම් සෙසු දෙවියෝද නම් ආදියෙන් සමාන වෙත් නම් ඔවුන් සමග ආවාහුය.

39. පවුත්ථජාතිං අබිලං ඔඝතිණ්ණමනාසවං★
දක්ඛෙමොඝතරං නාගං චන්දංව අසිතාතිගං★

පහවූ ජාති ඇත්තාවූ රාගාදි උල්රහිත වූ චතුරොඝයෙන් එතරවූ කෙලෙස් නැති කළාවූ නාග නම්වූ කෘෂ්ණ භාවය ඉක්මවා ගියාවූ පූර්ණචන්ද්‍රයා වැනිවූ බුදු රජුන් දක්නෙමු.

40. සුබ්‍රහ්මා පරමත්ථෝ ච, පුත්තා ඉද්ධිමතෝ සහ★
සනඞ්කුමාරෝ තිස්සෝ ච, සොපාග සමිතිං වනං★

සෘද්ධි ඇත්තාවූ ආර්‍ය්‍ය පුත්‍රවූ සුබ්‍රහ්ම නම්වූ ද පරමත්ත නම්වූ බ්‍රහ්මයෝ ද සනං කුමාර නම් මහා බ්‍රහ්මයාද තිස්ස නම් මහා බ්‍රහ්මයාද සිය පිරිස් සමග අර්හත් භික්ෂු සමූහය දක්නට මහ වනයට ආවාහුය.

41. සහස්සං බ්‍රහ්මලොකානං මහාබ්‍රහ්මාභිතිට්ඨති★

උපපන්නො ජුතිමන්තො, හිස්මාකායො යසස්සි සො

බඹලෝ දහසකින් බ්‍රහ්මයන් දහසක් ද ආයේය. බඹලොව උපන්නාවූ ශෝභාවත්වූ, මහත් කයක් ඇත්තාවූ, යසස් ඇත්තාවූ මහා බ්‍රහ්මයෙක් ද සිටින්නේය.

42. දසෙත්ථ ඉස්සරා ආගු, පච්චෙකවසවත්තිනො
තෙසඤ්ච මජ්ඣතො ආග, හාරිතො පරිවාරිතො

මේ බඹ පිරිසෙහි වෙන වෙනම තම තමන්ගේ පිරිස් වසඟයෙහි පවත්වන්නාවූ ප්‍රධාන වූ බඹුන් දස දෙනෙක් ආවෝය. ඒ මහ බඹුන්ගේ මධ්‍යයෙහි බඹුන් විසින් පිරිවරණ ලද්දා වූ හාරිත නම් බඹරජ තෙමේද ආයේය.

43. තෙ ච සබ්බෙ අභික්කන්තෙ, ස ඉන්දෙ දෙවෙ සබ්‍රහ්මකෙ
මාරසේනා අභික්කාමුං, පස්ස කණ්හස්ස මන්දියං

මහ වනයට රැස්වූ ශක්‍රයා සහිත වූ, බඹුන් සහිතවූ, ඒ සියලු දෙවියන් කරා මාර සේනාවෝ පැමිණියාහුය.

44. එථ ගණ්හථ බන්ධථ, රාගෙන බද්ධමත්ථු වෙ
සමන්තා පරිවාරෙථ, මා වො මුඤ්චිත්ථ කොචි නං

මාරයාගේ අඥානකම බලව. එව්, අල්වා ගනිව්, සිය දිව්‍ය සමූහයා රාගයෙන් බඳනාලද්දේ වේවා, හාත්පසින් පිරිවරව්, තෙපි කිසිවෙක් ඒ දිව පිරිසෙන් එකෙකුදු නොමුදව්.

45. ඉති තත්ථ මහාසෙනො, කණ්හසෙනං අපෙසයි
පාණිනා තලමාහච්ච, සරං කත්වාන හෙරවං
යථා පාවුස්සකො මෙඝො, ථනයන්තො සවිජ්ජුකො
තදා සො පච්චුදාවත්ති, සඞ්කුද්ධො අසයංවසී

මෙසේ කියා මහත් සේනාවක් ඇති ඒ වසවත් මරුතෙමේ අත්ලෙන් පොළොතලයට ගසා විදුලිය සහිතවූ වැසි කල්හිවූ හෙවත් වර්ෂා කරන්නාවූ මෙඝයෙක් තෙමේ යම්සේ ගර්ජනා කරන්නේද එමෙන් බියජනක නාද කොට මර සෙනග ඒ දිව පිරිස මැදට යැවීය. එසමයෙහි ඒ වසවර්තිමාර තෙමේ දෙව් පිරිස තම වසඟයෙහි පවත්වාගත නොහැකිවූයේ අතිශයින් කිපුනෙක්ව ආපසු හැරී ගියේය.

46. තඤ්ච සබ්බං අභිඤ්ඤාය, වවක්ඛිත්වාන චක්ඛුමා
තතො ආමන්තයී සත්ථා, සාවකෙ සාසනෙ රතෙ
මාරසේනා අභික්කන්තා තෙ විජානාථ භික්ඛවො
තෙ ච ආතප්පමකරුං, සුත්වා බුද්ධස්ස සාසනං

වීතරාගෙහ'පක්කාමුං නෙසං ලොමම්පි ඉඤ්ජයුං
සබ්බෙ විජිතසඞ්ගාමා භයාතීතා යසස්සිනො
මොදන්ති සහ භූතෙහි සාවකා තෙ ජනෙසුතා ති

ඉක්බිත්තෙන් නුවණ නැමැති ඇස් ඇති බුදුරජාණන් වහන්සේ ඒ සියල්ල දැන ව්‍යවස්ථා කොට සස්නෙහි ඇලුනාවූ ශ්‍රාවකයන්ට කථාකර මෙසේ කීවෝය. ''මහණෙනි, මාර සේනාවෝ පැමිණියාහුය. ඒ මරුන් දනිව්'' ඒ භික්ෂුද බුදුන්ගේ ධර්ම වචනය අසා කෙලෙස් තැවීමට වීර්‍ය්‍ය කළාහුය. වීතරාගීවූ දෙව් බඹුන් කෙරෙන් පහව ගියාහුය. ඒ වීතරාගීන්ගේ රෝමයකුදු කම්පා නොකළාහුය. ජයගත් මාර යුද්ධය ඇති ඉක්මවන ලද බිය ඇති යසස් ඇත්තාවූ ජනයන් අතුරෙහි ප්‍රකටවූ ඒ සිය බුදු සව්වෝම දේව බ්‍රහ්මාදී ආර්‍ය්‍ය ශ්‍රාවකයන් හා සතුටුවෙත්.

24. ආළවක සුත්තං

ආළවක සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා★ ආළවියං විහරති ආළවකස්ස යක්ඛස්ස භවනෙ★ අථ බො ආළවකො යක්ඛො★ යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච★

මා විසින් මෙසේ අසනලදි. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ අළවි නුවර අළවි යකුගේ භවනයෙහි වැඩවසන සේක. ඉක්බිති ආළවක යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට,

''නික්ඛම, සමණා''ති★ ''සාධාවුසො''ති භගවා නික්ඛමි★
''පවිස සමණා''ති★ ''සාධාවුසො''ති භගවා පාවිසි★

''මහණ, නික්මෙව'' යි කීය. ''මැනවි, ඇවැත්නි,'' යි භාග්‍යවතුන් වහන්සේ නික්මුණු සේක.
''මහණ, ඇතුල්වෙව'' (යි ආළවකයා කීය.)''ඇවැත්නි මැනවැ'' යි භාග්‍යවතුන් වහන්සේ ඇතුල්වූ සේක.

දුතියම්පි බො ආළවකො යක්ඛො භගවන්තං එතදවොච★
''නික්ඛම, සමණා''ති★ ''සාධාවුසො''ති භගවා නික්ඛමි★
''පවිස සමණා''ති★ ''සාධාවුසො''ති භගවා පාවිසි★

දෙවෙනුවත් ආළවක යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේට ''මහණ, නික්මෙව'' යි කීය. ''ඇවැත්නි මැනවැ'' යි භාග්‍යවතුන් වහන්සේ නික්මුණු සේක. ''මහණ, ඇතුල්වෙව'' (යි ආළවකයා කීය.)
''ඇවැත්නි මැනවැ'' යි භාග්‍යවතුන් වහන්සේ ඇතුල්වූ සේක.

තතියම්පි බො ආළවකො යක්ඛො භගවන්තං එතදවොච★
''නික්ඛම, සමණා''ති★ ''සාධාවුසො''ති භගවා නික්ඛමි★
''පවිස සමණා''ති★ ''සාධාවුසො''ති භගවා පාවිසි★

තුන්වෙනුව ද ආළවක යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේට ''මහණ, නික්මෙව'' යි කීය. ''ඇවැත්නි මැනවැ'' යි භාග්‍යවතුන් වහන්සේ නික්මුණු සේක. '''මහණ, ඇතුල්වෙව'' (යි ආළවකයා කීය.)
''ඇවැත්නි මැනවැ'' යි භාග්‍යවතුන් වහන්සේ ඇතුල්වූ සේක.

චතුත්ථම්පි බො ආළවකො යක්ඛො භගවන්තං එතදවොච★
''නික්ඛම, සමණා''ති★
'' නඛ්වාහං ආවුසො, නික්ඛමිස්සාමි★ යං තෙ කරණීයං තං කරොහී''ති★

සතරවෙනුව ද ආළවක යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේට ''මහණ, නික්මෙව'' යි කීය. ''ඇවැත්නි, මම නොනික්මෙමි. තා විසින් යමක් කටයුතු නම් එය කරව'' (යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.)

''පඤ්හං තං සමණ, පුච්ඡිස්සාමි★ සචෙ මෙ න ව්‍යාකරිස්සසි, චිත්තං වා තෙ බ්‍යිපිස්සාමි★ හදයං වා තෙ ඵාලෙස්සාමි★ පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගායං බ්‍යිපිස්සාමී''ති★

''මහණ, තා අතින් ප්‍රශ්නයක් අසමි. ඉදින් එය මට නොවිසඳියේ නම් තාගේ සිත හෝ කළඹන්නෙමි. තාගේ හෘදය හෝ පළන්නෙමි. පාදයෙන් අල්ලා ගඟින් එතර හෝ දමන්නෙමි'' (යි ආළවකයා කීය.)

'' නඛ්වාහං තං ආවුසො, පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ★ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය★ යො මෙ චිත්තං වා බ්‍යිපෙය්‍ය★ හදයං වා ඵාලෙය්‍ය★ පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය බ්‍යිපෙය්‍ය★ අපි ච ත්වං, ආවුසො, පුච්ඡ යදා කඞ්ඛසී''ති ★

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)
''ඇවැත්නි, දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, බමුණන් සහිත ලොව දේව මනුෂ්‍ය ප්‍රජාවෙහි යමෙක් මාගේ සිත කළඹන්නේ හෝ හෘදය පළන්නේ හෝ පාදයෙන් ගෙන මහ ගඟින් එතර දමන්නේ හෝ වේද, එබන්දකු මම නොදකිමි. එසේ වුවද, ඇවැත්නි, තෝ යමක් කැමැත්තෙහි නම් එය අසව.''

අථ බො ආළවකො යක්ඛො භගවන්තං ගාථාය අජ්ඣභාසි★

ඉක්බිති ආළවක යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කීය.

''කිංසූධ විත්තං පුරිසස්සසෙට්ඨං?
කිංසූ සුචිණ්ණෝ සුඛමාවහාති?★
කිංසූ හවෙ සාධුතරං රසානං?
කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨං?ති''★

''මේ ලෝකයෙහි පුරුෂයා හට කවර නම් වස්තුවක් ශ්‍රේෂ්ඨ වේ ද?
මනා කොට පුරුදු කරන ලද කවර නම් ධර්මයක් සැප ගෙන දෙන්නේද?
ඒකාන්තයෙන් කවර නම් රසයක් අතිශයින් මනොඥ වේ ද?
කෙසේ දිවි පවත්වන්නකුගේ ජීවිතය ශ්‍රේෂ්ඨ යයි කියනු ලැබේද?''

''සද්ධීධ විත්තං පුරිසස්සසෙට්ඨං,
ධම්මෝ සුචිණ්ණෝ සුඛමාවහාති★
සච්චං හවෙ සාදුතරං රසානං,
පඤ්ඤාජීවිං ජීවිතමාහු සෙට්ඨං''ති★

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)

''මේ ලෝකයෙහි ශ්‍රද්ධා තොමෝ පුරුෂයා හට ශ්‍රේෂ්ඨ වූ ධනය වේ.
මනා කොට පුරුදු කරන ලද කුශල ධර්මය සැප ගෙන දෙයි.
රසයන් අතුරෙන් සත්‍යය වචනය ඒකාන්තයෙන් අතිශයින් මනොඥ වේ.
ප්‍රඥාවෙන් ජීවත් වන්නහුගේ ජීවිතය ශ්‍රේෂ්ඨ යයි (ආර්‍යයෝ) කියත්.''

''කථංසු තරතී ඔඝං?
කථංසු තරතී අණ්ණවං?★
කථංසු දුක්ඛං අච්චෙති?
කථංසු පරිසුජ්ඣති?''★

(ආළවකයා මෙසේ කීය.)

සසර නමැති සැඩ පහර කොයි පරිද්දෙකින් තරණය කෙරේද?
සසරසයුර කෙසේ තරණය කෙරේද?
දුක කෙසේ ඉක්මවාද?
(සත්ත්වයා) කෙසේ පිරිසිදු වේද?

''සද්ධාය තරතී ඔඝං
අප්පමාදෙන අණ්ණවං★
විරියෙන දුක්ඛං අච්චෙති
පඤ්ඤාය පරිසුජ්ඣති''★

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) ''ශ්‍රද්ධාව කරණකොට ගෙන
ඕඝය තරණය කරයි.
අප්‍රමාදයෙන් සසරසයුර තරණය කරයි.
වීර්‍යයෙන් දුක ඉක්මවයි.
ප්‍රඥාව කරණකොට ගෙන පිරිසිදුවේ.''

''කථංසු ලභතෙ පඤ්ඤං?
කථංසු වින්දතෙ ධනං?★
කථංසු කිත්තිං පප්පොති?
කථං මිත්තානි ගන්ථති?★
අස්මා ලොකා පරං ලොකං, කථං පෙච්ච න සොචති?''★

(ආළවකයා මෙසේ කීය.) ''ප්‍රඥාව කවරාකාරයෙකින් ලබයිද?
ධනය කවර ආකාරයෙකින් ලබයිද?
කීර්තියට කවර කාරණයෙකින් පැමිණේද?
මිත්‍රයන් කවර කාරණයෙකින් තමා කෙරෙහි බැඳගනීද?
මෙලොවින් පරලොවට පැමිණ කවර කාරණයෙකින් ශෝක නොකෙරේද?''

''සද්දහානො අරහතං ධම්මං නිබ්බානපත්තියා★සුස්සූසා ලභතෙ
පඤ්ඤං, අප්පමත්තො විචක්ඛණො★
පතිරූපකාරීධුරවා, උට්ඨාතා වින්දතෙ ධනං★
සච්චෙනකිත්තිං පප්පොති★
දදං මිත්තානි ගන්ථති★
යස්සෙතෙ චතුරො ධම්මා, සද්ධස්ස ඝරමෙසිනො★
සච්චං දමො ධිති චාගො, ස වෙ පෙච්ච න සොචති★.
අස්මා ලොකා පරං ලොකං, ස වෙ පෙච්ච න සොචති''★

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)
''නුවණැත්තාවූ, ප්‍රමාදනුවූ ජනතෙම, රහතුන්ගේ සද්ධර්මය අදහන්නේ, මනාව ඇසීම හේතුකොටගෙන නිර්වාණයට පැමිණීම පිණිස ප්‍රඥාව ලබයි.
සුදුසු කටයුත්තෙහි යෙදුනු, ඉසිලියයුතු බර උසුලන වීර්‍ය සම්පන්න ජනතෙම ධනය ලබයි. සත්‍යය කරණකොට ගෙන කීර්තියට පැමිණෙයි.
ත්‍යාගවත් ජනතෙම මිත්‍රයන් බැඳගනී.''ගිහිගෙයි වසන්නාවූ ශ්‍රද්ධා ඇති, යම් ගිහියකුහට සත්‍යයත්, ඉන්ද්‍රිය දමනයත්, වීර්‍යයත්, ත්‍යාගයත් යන මේ ධර්ම සතර වෙත් නම් හෙතෙම මෙලොවින් පරලොව ගොස් ඒකාන්තයෙන් ශෝක නොකෙරේ.''

''ඉඞ්ඝ අඤ්ඤෙද'පි පුච්ඡස්සු පුථු සමණබ්‍රාහ්මණෙ★
යදි සච්චා දමා චාගා, ඛන්ත්‍යා භියෝ‍්‍යා න විජ්ජති''★

''එව, සත්‍යයටත්, ඉන්ද්‍රිය දමනයටත්, ත්‍යාගයටත්, ඉවසීමටත් වඩා උසස් වූවක් මෙලොව ඇත්දැයි අන්‍ය බොහෝවූ මහණ බමුණන්ගෙන් ද විචාරව.''

''කථංනු'දානි පුච්ඡෙය්‍යං, පුථු සමණබ්‍රාහ්මණෙ?★
සො'හං අජ්ජ පජානාමි, යො චත්ථො සම්පරායිකො''★

(ආළවකයා මෙසේ කීය.)
''මෙලොව අභිවෘද්ධියද පරලොව සුගතිය ද පිණිස යමක් වේ නම් ඒ කාරණය මම අද පටන් දනිමි. (එහෙයින්) දැන් ඒ මම බොහෝ වූ ශ්‍රමණ බමුණන් කුමකට විචාරම්ද?''

''අත්ථාය වත මෙ බුද්ධො, වාසායාලවිමාගමී★
සො'හං අජ්ජ පජානාමි, යත්ථ දින්නං මහප්ඵලං''★

''යමෙකුහට දෙන ලද දාන වස්තුව මහත් අනුසස් ඇත්තේද මම ඒ අද පටන් දනිමි. සර්වඥයන් වහන්සේ වාසය පිණිස මේ අළවි නුවරට වැඩවදාළේ ඒකාන්තයෙන් මගේම අභිවෘද්ධිය පිණිසය.''

''සො අහං විචරිස්සාමි, ගාමා ගාමං පුරා පුරං★
නමස්සමානො සම්බුද්ධං ධම්මස්ස ච සුධම්මත''න්ති★

''ඒ මම බුදුන්ද, බුදුන් විසින් මැනවින් වදාරණ ලද ධර්මයද වඳිමින් ගමින් ගම ද නුවරින් නුවරද ඇවිදින්නෙමි.

එවං වුත්තෙ ආළවකො යක්ඛො භගවන්තං එතදවොච★

අථ බො අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම★
සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය
පටිච්ඡන්නං වා විවරෙය්‍ය★ මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය★
අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය★ චක්ඛුමන්තො රූපානි
දක්ඛින්ති'ති★
එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො
පකාසිතො★ එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි
ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච★ උපාසකං මං භවං ගොතමො
ධාරෙතු★ අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්'ති★

''පින්වත් ගෞතමයන් වහන්ස, ධර්මදේශනය ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, දම් දෙසුම ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරන්නේ යම්සේද, වැසුනක් විවෘත කරන්නේ යම්සේද, මංමුලා වූවෙකුට මඟ කියන්නේ යම්සේද, ඇස් ඇත්තෝ රූපයන් දකින්වායි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේ යම්සේද, එපරිද්දෙන් භාග්‍යවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේය. මේ මම භාග්‍යවතුන් වහන්සේද ධර්මයද සංඝයාද සරණ ගියාවූ උපාසකයකු කොට දරා ගන්නා සේක්වා.

25. කසීභාරද්වාජ සුත්තං

කසීභාරද්වාජ සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා★ මගධෙසු විහරති දක්ඛිණාගිරිස්මිං එකනාළායං බ්‍රාහ්මණගාමෙ★ තෙන බො පන සමයෙන★ කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පඤ්චමත්තානි නඞ්ගලසතානි පයුත්තානි හොන්ති වප්පකාලෙ ★

මවිසින් මෙසේ අසන ලදි. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ මගධ දනව්වෙහි ඒකානාලා නම් බමුණු ගම්හි දක්ඛිනගිරි විහාරයෙහි වැඩවසන සේක. ඒ කාලයෙහි කසීභාරද්වාජ නම් බ්‍රාහ්මණයා විසින් වප් කල්හි පන්සියයක් නඟුල් යොදන ලද්දාහු වෙත්.

අථ බො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය★ යෙන කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස කම්මන්තො තෙනුපසඞ්කමි★ තෙන බො පන සමයෙන★කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පරිවෙසනා වත්තති★

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරව පා සිවුරු ගෙන කසීභාරද්වාජ බමුණා හෝජනය ගන්නේ යම් තැනකද එතැනට පැමිණි සේක. එකල කසීභාරද්වාජ බමුණා ආහාර අනුභවය කරමින් සිටියේය.

අථ බො භගවා යෙන පරිවෙසනා තෙනුපසඞ්කමි★ උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි★ අද්දසා බො කසීභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං පිණ්ඩාය ඨිතං★ දිස්වාන භගවන්තං එතදවොච★ ''අහං බො සමණ, කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමි★ ත්වම්පි, සමණ කසස්සු ච වපස්සු ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජස්සූ''ති★

බුදුරජාණන් වහන්සේ අනුභවය යම්තැනෙක පවතී ද එතැනට පැමිණියේය. පැමිණ එකත්පසෙක සිටියේය. කසීභාරද්වාජ බමුණු පිඬු පිණිස හුන් භාග්‍යවතුන් වහන්සේ දැක්කේය. දැක උන්වහන්සේට මෙය කීයේය. ''මහණ මම වනාහි සී සාමි. වපුරමි. සී සා වපුරා අනුභව කරමි. නුඹද මහණ සීසාව, වපුරව, සීසා වපුරා අනුභව කරව.''

''අහම්පි බො බ්‍රාහ්මණ, කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමී''ති★

'' මමද බමුණ සාමි, වපුරමි. සා වපුරා වළඳමි''යි වදාළ සේක.

න බො පන මයං පස්සාම හොතො ගොතමස්ස යුගං වා නඞ්ගලං වා ඵාලං වා පාචනං වා බලිවද්දෙ වා★ අථ ච පන භවං ගොතමො එවමාහ★ අහම්පි බො බ්‍රාහ්මණ, කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමී''ති★

''භවත් ගෞතමයන්ගේ වියදඬක් හෝ නඟලක් හෝ සී වැලක් හෝ කැවිටක් හෝ ගොනුන් හෝ නොම දකිමු. එතකුදු වුවත් භවත් ගෞතමතෙම මෙසේ කියයි. මම ද බමුණ, සාමි, වපුරමි, සා වපුරා වළඳමි''යි.

අථ බො කසීභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං ගාථාය අජ්ඣභාසි★

ඉක්බිති කසීභාරද්වාජ බමුණු භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් කීයේය.

කස්සකො පටිජානාසි - න ච පස්සාම තෙ කසිං★
කසිං නො පුච්ඡිතො බ්‍රූහි - යථා ජානෙමු තෙ කසිං ති★

''සාන්නෙකැයි ප්‍රතිඥා කෙරෙහිය. ඔබගේ කෘෂි භාණ්ඩ නොදකිමු. අප විසින් විචාරණලදි. යම්පරිද්දකින් ඔබගේ ඒ උපකරණ දැන ගන්නෙමු ද කියනු මැනවි.''

සද්ධා බීජං තපො වුට්ඨී - පඤ්ඤා මෙ යුගනඞ්ගලං★
හිරි ඊසා මනො යොත්තං - සති මෙ ඵාලපාචනං★

''ශ්‍රද්ධාතොමෝ බිජුවටය, තපස වර්ෂාවය, මාගේ ප්‍රඥාව විය හා නඟුල්ය. ලජ්ජාව නඟුලිසය, සිත යොතය, ස්මෘතිය මාගේ සීවැල හා කැවිටයි.''

කායගුත්තො වචීගුත්තො - ආහාරෙ උදරෙ යතො★
සච්චං කරොමි නිද්දානං - සොරච්චං මෙ පමොචනං★

''රක්ෂාකරණ ලද කාය සුචරිතය ඇත්තෙක්මි. වාක් සුචරිතය ඇත්තෙක්මි. සිවුපසෙහි ආහාරයෙහි සංයතයෙමි. සත්‍යයෙන් තෘෂ්ණා නැති කරමි. අර්හත්ඵල විමුක්තිය මාගේ මිදීමයි.''

විරියං මෙ ධුරධොරය්හං - යොගක්ඛෙමාධිවාහනං★
ගච්ඡති අනිවත්තන්තං - යත්ථ ගන්ත්වා න සොචති★

''මාගේ වියධුර ඉසිලීම් සංඛ්‍යාත (කායික චෛතසික) වීර්යය නිවන දක්වා පවතී. යම් තැනකට ගොස් ශෝක නොකෙරේද ඒ දක්වා නොනැවතී යයි.''

එවමෙසා කසී කට්ඨා - සා හොති අමතප්ඵලා★
එතං කසිං කසිත්වාන - සබ්බදුක්ඛා පමුච්චති නි

මෙසේ මේ සීය (මා විසින්) සාන ලදි. ඒ සීය අමෘතඵල ඇතිවේ. මේ සීය සා සියලු දුකින් මිදේ.''

අථ බො කසීභාරද්වාජෝ බ්‍රාහ්මණෝ★ මහතියා කංසපාතියා පායාසං★ වඩ්ඪෙත්වා භගවතෝ උපනාමෙසි★ භුඤ්ජතු භවං ගොතමෝ පායාසං★ කස්සකෝ භවං ගොතමෝ යං හි භවං ගොතමෝ★ අමතප්ඵලං කසිං කසතී ති★

ඉක්බිති කසීභාරද්වාජ බමුණුතෙම මහත් රන් තලියෙක්හි කිරිබත් බහා ''යම් හෙයකින් පින්වත් ගෞතම තෙම අමෘතඵල ඇති සීයක් සායිද එහෙයින් පින්වත් ගෞතමයන් වහන්සේ කිරිබත වළඳනසේක්වායි'' භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වූයේය.

ගාථාභිගීතං මෙ අභොජනෙය්‍යං★
සම්පස්සතං බ්‍රාහ්මණ නෙස ධම්මෝ★
ගාථාභිගීතං පනුදන්ති බුද්ධා★
ධම්මෙ සති බ්‍රාහ්මණ වුත්තිරෙසා★

'' මා විසින් ගාථා කියා ලබන ලද භෝජනය වැළඳියයුතු නොවේ. බමුණ, මනා දිවිපැවැත්ම දන්නාවූ බුදුවරුන්ගේ මේ ගී කියා වැළඳීම ධර්මය නොවේ, බුදුවරයෝ ගී කියා ලැබූ භෝජනය බැහැර කෙරෙත්. බමුණ ආර්යධර්මය ඇති කල්හි මේ ජීවිකා වෘත්තියයයි.''

ඛීණාසවං කුක්කුච්ච වූපසන්තං★
අඤ්ඤෙන ච කෙවලීනං මහෙසිං
අන්නෙන පානෙන උපට්ඨහස්සු
බෙත්තං හි තං පුඤ්ඤපෙක්ඛස්ස හොති.★

''සියලු ගුණයෙන් සම්පූර්ණවූ මහර්ෂිවූ ආශ්‍රව කුකුස් සන්සිඳුවූ ක්ෂිණාශ්‍රවයන් අන්‍යවූ ආහාරපානයෙන් උපස්ථානකරව. රහත් සමූහයා වනාහි පින් කැමැත්තවුන්ට කෙතක් වෙයි.''

අථකස්ස චාහං භො ගොතම, ඉමං පායසං දම්මී ති?★

''එසේ නම් පින්වත් ගෞතමයන් වහන්ස, කවරෙකුට මේ බත දෙන්නදැයි'' (විචාළේය).

න බ්‍රාහ්මණ, පස්සාමි★ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය★ යස්ස සො පායසො භුත්තො සම්මා පරිණාමං ගච්ඡෙය්‍ය★ අඤ්ඤත්‍ර තථාගතස්ස වා තථාගත සාවකස්ස වා★ තෙන හි ත්වං, බ්‍රාහ්මණ, තං පායසං අප්පහරිතෙ වා ඡඩ්ඩෙහි★ අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙහී ති.★

''බමුණ දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ අවකාශ ලෝකයෙහි ද ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ සත්වලෝකයෙහි ද තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයකු හැර ඉන් පිටත් යමකු විසින් ඒ කිරිබත වළඳන ලද්දේ මනා දිරීමට යන්නේ ද එබන්දකු මම නොදකිමි. එසේ නම් බමුණ ඒ කිරිබත නිල් තණ රහිත තැනෙක්හි දමව. ඉන් මරණයට පැමිණෙන සතුන් නැති ජලයෙහි හෝ විසුරුවා හරින්නැයි'' වදාළ සේක.

අථබො කසීභාරද්වාජො බ්‍රාහ්මණො තං පායසං අප්පාණකෙ උදකෙ ඔපිලාපෙසි★ අථ බො සො පායාසො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති චිටිචිටායති සන්ධූපායති සම්පධූපායති★ සෙය්‍යථාපි නාම ඵාලො දිවසන්තත්තො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති චිටිචිටායති සන්ධූපායති සම්පධූපායති★ එවමෙව සො පායාසො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති චිටිචිටායති සන්ධූපායති සම්පධූපායති★

ඉක්බිති කසීභාරද්වාජ බ්‍රාහ්මණතෙම ඒ පායාසය ප්‍රාණීන් රහිත ජලයෙක්හි පාකොට හැරියේය. ඒ කිරිබත ජලයෙහි දමන විට චිච්චිට යන ශබ්ද කෙරේ. හාත්පසින් දුම්නගී. (කෙසේද) දවස මුළුල්ලේ රත් වූ නඟුල්තලය දියෙහි දමන ලද්දේ යම් සේ චිච්චිට යන ශබ්ද කෙරේද, චිටිචිට යන ශබ්ද කෙරේද, හාත්පසින් දුම් දමා, අතිශයින් දුම් නගයිද, එපරිද්දෙන් ඒ පායාසය දියෙහි ලන ලද්දේ චිච්චිට ශබ්දකෙරේ. චිටිචිට ශබ්ද කෙරේ. හාත්පසින් දුම් නගී. අතිශයින් දුම් නගී.

අථ බො කසීභාරද්වාජො බ්‍රාහ්මණො සංවිග්ගො ලොමහට්ඨජාතො යෙන භගවා තෙනුපසඞ්කමි★ උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච★

ඉක්බිති කසීභාරද්වාජ බ්‍රාහ්මණතෙම සංවේගයට පැමිණියේ ලොමුදැහැගත්තේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ පාමුල වැඳ වැටී උන්වහන්සේට මෙසේ සැළකෙළේය.

''අභික්කන්තං හො ගොතම, අභික්කන්තං හො ගොතම★ සෙය්‍යථාපි හො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය

පටිච්ඡන්නං වා විවරෙය්‍ය★ මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය★ අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය★ චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති'ති★
එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො★ එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච★ ලභෙය්‍යාහං භොතො ගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පද''න්ති★

''පින්වත් ගෞතමයන් වහන්ස, ධර්මදේශනය ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, දම් දෙසුම ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරන්නේ යම්සේද, වැසුනක් විවෘත කරන්නේ යම්සේද, මංමුලාවූවෙකුට මඟ කියන්නේ යම්සේද, ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේ යම්සේද, එපරිද්දෙන් භාග්‍යවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේය. මේ මම භාග්‍යවතුන් වහන්සේද ධර්මයද සංඝයාද සරණයෙමි. භවත් ගෞතමයන් වහන්සේ සමීපයෙහි මම පැවිද්ද ලබන්නෙමි. උපසම්පදාවද ලබන්නෙමි.

අලත්ථ බො කසීභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො සන්තිකෙ පබ්බජ්ජං අලත්ථ උපසම්පදං★ අචිරූපසම්පන්නො බො පනායස්මා භාරද්වාජො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො★ න'චිරස්සෙව යස්ස'ත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති★ තදනුත්තරං බ්‍රහ්මචරිය පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි★ ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා ති අබ්භඤ්ඤාසි★ අඤ්ඤතරො ච බො පනායස්මා භාරද්වාජො අරහතං අහොසීති.★

ඉක්බිත්තෙන් කසීභාරද්වාජතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලැබුයේය. උපසම්පදාව ලැබුයේය. උපසම්පන්නයෙන් නොබෝ කල්වූ ආයුෂ්මත් භාරද්වාජතෙම හුදකලාවූයේ වෙන්වූයේ ප්‍රමාද නොවූයේ කෙලෙස් තවන වීර්යය ඇත්තේ පමණට මෙහෙයන ලද සිත් ඇතිව වාසය කරන්නේ නොබෝ කලකින්ම යමක් පිණිස කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවෙද්ද, ඒ උතුම් වූ රහත්ඵලය මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය ක්ෂයකරණ ලදි. බ්‍රහ්මචරියාව වැසනිමවන ලදි. කටයුතු කොට නිමවන ලදි. කෙලෙසුන් නැසීම පිණිස තවත් භාවනාවක් නැතැයි දැනගත්තේය. ආයුෂ්මත් භාරද්වාජ ස්ථවිරයන් වහන්සේ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ.

26. පරාභව සුත්තං
පරාභව සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා★ සාවත්ථියං විහරති★
ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ★ අථ බො අඤ්ඤතරා
දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා★
කේවලකප්පං ජේතවනං ඕභාසෙත්වා යෙන භගවා★
තෙනු'පසඞ්කමි උපසඞ්කමිත්වා★ භගවන්තං අභිවාදෙත්වා
එකමන්තං අට්ඨාසි★ එකමන්තං ඨිතා බො සා දෙවතා
භගවන්තං ගාථාය අජ්ඣභාසි★

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩවසන සේක. එකල එක්තරා දෙවියෙක් රෑ පෙරයම ඉක්ම ගිය කල්හි විශිෂ්ට වර්ණ ඇත්තේ සියළු ජේතවනයම එකලූ කෙරෙමින් භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේය. එළැඹී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව සිටියේය. එකත්පස්ව සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ සැළ කළේය.

1. **පරාභවන්තං පුරිසං, - මයං පුච්ඡාම ගොතමං★**
භගවන්තං පුට්ඨුමාගම්ම, - කිං පරාභවතො මුඛං★

අපි හැමදෙනම පිරිහෙන්නාවූ පුරුෂයා ගෞතමයන් වහන්සේ ගෙන් අසා දැනගන්නා පිණිස ආවෙමු. පිරිහෙන්නාවූ සත්වයාට ඊට හේතු කවරේද? යි විචාළේය.

2. **සුවිජානො භවං හොති - සුවිජානො පරාභවො★**
ධම්මකාමො භවං හොති - ධම්මදෙස්සී පරාභවො★

වැඩෙන්නාවූ පුරුෂතෙම ධර්මකාමී ප්‍රතිපත්තිවල හැසිරෙනු දැකීමෙන් හා ඇසීමෙන් සුවසේ දතහැකි වන්නේය. පිරිහෙන්නාවූ පුරුෂතෙම ධර්මයට වෛරකරණ ප්‍රතිපත්ති දර්ශනයෙන් හා ශ්‍රමණයෙන් සුවසේ දත හැකි වන්නේය. දශ කුශල කර්මපථ ධර්මය අසා පිළිපදනේ වැඩෙයි. ඒ දශ කුශල ධර්මයට ද්වේෂව නොකැමතිව අසා නොපිළිපදනේ පිරිහෙන්නේය.

3. **ඉති හෙතං විජානාම - පඨමො සො පරාභවො★**
දුතියං භගවා බ්‍රූහි - කිං පරාභවතො මුඛං★

මේ පිරිහෙන පළමුවන කාරණය වදාළ පරිද්දෙන්ම දනුම්හ. භාග්‍යවතුන් වහන්ස, දෙවනි පිරිහෙන කාරණය වදාළ මැනවි. පිරිහීමට කාරණය කවරේද?

4. **අසන්තස්ස පියා හොන්ති - සන්තෙ න කුරුතෙ පියං**
අසතං ධම්මං රොචෙති - තං පරාභවතෝ මුඛං

සද්ධර්මයට කැමති නොවීමෙන් පිරිහීමට පැමිණෙන පුරුෂයා හට පූරණකාශ්‍යපාදී මිසදිටු ගත් අසත්පුරුෂයෝ ප්‍රියවෙති. ඒ පිරිහීමට පැමිණෙන පුරුෂතෙම බුද්ධාදී සත් පුරුෂයන් ප්‍රිය නොකරන්නේය. යට කියන ලද නිවටුන්ගේ අසත්පුරුෂ ධර්මයන් රුචිකරන්නේය. අසත් පුරුෂයන් කෙරෙහි ප්‍රියවීම, සත් පුරුෂයන් අප්‍රිය වීම, අසත්පුරුෂයන් ගේ අසද්ධර්මයට කැමති වීමය යන මේ තුන පිරිහීමට කාරණයයි.'' වදාළ සේක.

5. **ඉති හෙතං විජානාම - දුතියෝ සෝ පරාභවෝ★**
තතියං භගවා බ්‍රූහි - කිං පරාභවතෝ මුඛං★

මේ පිරිහෙන දෙවන කාරණය වදාළ පරිද්දෙන්ම දනුම්හ. භාග්‍යවතුන් වහන්ස, තෙවැනි පිරිහෙන කාරණය වදාළ මැනවි. පිරිහීමට කාරණය කවරේද?

6. **නිද්දාසීලී සභාසීලී - අනුට්ඨාතා ච යෝ නරෝ★**
අලසෝ කොධපඤ්ඤාණෝ - තං පරාභවතෝ මුඛං★

යම්කිසි සත්වයෙක් තෙම නිතර නිදන්නේ ද, බොහෝ දෙන රැස්ව කථාකරණ තැනට එළඹ කථාවෙහි ඇලුනේ වේද, වීර්ය තේජස් නැත්තේද, අලස ද, ක්‍රොධයම ලකුණු කොට ඇත්තේ ද, යන මේ කරුණු පිරිහීමට කාරණයයි වදාළ සේක.

7. **ඉති හෙතං විජානාම - තතියෝ සෝ පරාභවෝ★**
චතුත්ථං භගවා බ්‍රූහි - කිං පරාභවතෝ මුඛං★

මේ පිරිහෙන තෙවැනි කාරණය වදාළ පරිද්දෙන්ම දනුම්හ. භාග්‍යවතුන් වහන්ස, සතරවෙනි පිරිහෙන කාරණය වදාළ මැනවි. පිරිහීමට කාරණය කවරේද?

8. **යෝ මාතරං වා පිතරං වා - ජිණ්ණකං ගතයොබ්බනං★**
පහූ සන්තෝ න භරති තං පරාභවතෝ මුඛං★

යම්කිසිවෙක් ජරාවට ගිය තරුණ බව ඉක්ම වූ වැදූ මෑණියන් හෝ පියාණන් හෝ (තමා) පොහොසත් වූයේ පෝෂණය නොකෙරේද එය පිරිහීමට කාරණයයි වදාළ සේක.

9. **ඉති හෙතං විජානාම - චතුත්ථෝ සෝ පරාභවෝ★**
පඤ්චමං භගවා බ්‍රූහි - කිං පරාභවතෝ මුඛං★

මේ පිරිහෙන සතරවෙනි කාරණය වදාළ පරිද්දෙන්ම දනුම්හ. භාග්‍යවතුන් වහන්ස, පස්වෙනි පිරිහෙන කාරණය වදාළ මැනවි. පිරිහීමට කාරණය කවරේද?

10. **යො බ්‍රාහ්මණං වා සමණං වා - අඤ්ඤං වාපි වනිබ්බකං★**
මුසාවාදෙන වඤ්චෙති - තං පරාභවතො මුඛං★

ක්ෂත්‍රියාදී යම් කිසිවෙක් බැහැර කරන ලද පවු ඇති , ක්ෂීණාශ්‍රවවූ බ්‍රාහ්මණයෙකු හෝ සන්සිඳුවන ලද පව ඇති එබඳු ශ්‍රමණයෙකු හෝ අපි නැවත අන්කිසිවක් ඉල්වන යාචකයෙකු හෝ බොරුකීමෙන් වංචා කෙරේද දෙලොවින්ම පිරිහීමට කාරණයයි වදාළ සේක.

11. **ඉති හෙතං විජානාම - පඤ්චමො සො පරාභවො★**
ඡට්ඨමං භගවා බ්‍රූහි - කිං පරාභවතො මුඛං★

මේ පිරිහෙන පස්වෙනි කාරණය වදාළ පරිද්දෙන්ම දනුම්හ. භාග්‍යවතුන් වහන්ස, සයවැනි පිරිහෙන කාරණය වදාළ මැනවි. පිරිහීමට කාරණය කවරේද?

12. **පභූතවිත්තො පුරිසො - සහිරඤ්ඤෙදා සභොජනො★**
එකො භුඤ්ජති සාදූනි - තං පරාභවතො මුඛං★

බොහෝ පොහොසත් රන්රිදී මිණිරුවන් ඇති බොහෝ කහවනු සහිත වූ නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්ත බොජුන් ඇති පුරුෂයෙක් තෙම මියුරු රස ඇති භෝජන තම අඹුදරුවන්ටත් නොදී තනිවම අනුභව කෙරේද එය දෙලොවින්ම පිරිහීමට කාරණයයි වදාළ සේක.

13. **ඉති හෙතං විජානාම - ඡට්ඨමො සො පරාභවො★**
සත්තමං භගවා බ්‍රූහි - කිං පරාභවතො මුඛං★

මේ පිරිහෙන සයවැනි කාරණය වදාළ පරිද්දෙන්ම දනුම්හ. භාග්‍යවතුන් වහන්ස, සත්වෙනි පිරිහෙන කාරණය වදාළ මැනවි. පිරිහීමට කාරණය කවරේද?

14. **ජාතිත්ථද්ධො ධනත්ථද්ධො -ගොත්තත්ථද්ධො ච යො නරො**
සඤ්ඤාතිං අතිමඤ්ඤෙති - තං පරාභවතො මුඛං★

යම් සත්වයෙක් ජාතිය කරණකොට ගෙන තද මානය ඇත්තේ වේද ධනය හේතුකොට ගෙන තද මානය ඇත්තේ වේද ගොත්‍රය හේතුකොට ගෙන තද මානය ඇත්තේ වේද තමාගේ අවශේෂ නෑයන් ජාතිධන ගොත්‍ර වශයෙන් පහත් කොට සිතා ද ඒ සිය නෑයන් යටත් කොට දැකීම ඒ සත්වයාහට පිරිහීමට කාරණයයි වදාළ සේක.

15. **ඉති හෙතං විජානාම - සත්තමො සො පරාභවො★**
අට්ඨමං භගවා බ්‍රූහි - කිං පරාභවතො මුඛං★

මේ පිරිහෙන සත්වෙනි කාරණය වදාළ පරිද්දෙන්ම දනුම්හ. භාග්‍යවතුන් වහන්ස, අටවැනි පිරිහෙන කාරණය වදාළ මැනවි. පිරිහීමට කාරණය කවරේද?

16. ඉත්ථිධුත්තො සුරාධුත්තො - අක්ඛධුත්තො ච යො නරො★
ලද්ධං ලද්ධං විනාසෙති - තං පරාභවතො මුඛං★

යම් සත්වයෙක් තෙම පර ස්ත්‍රීන් සේවනය කෙරේද සුරාබීමෙහි ලොල්වූයේද දූ කෙළියෙහි ලද ලද යම් වස්තුවක් නසා ද එය පිරිහීමට කාරණයයි වදාළ සේක.

17. ඉති හෙතං විජානාම - අට්ඨමො සො පරාභවො★
නවමං භගවා බ්‍රූහි - කිං පරාභවතො මුඛං★

මේ පිරිහෙන **අටවැනි** කාරණය වදාළ පරිද්දෙන්ම දනුම්හ. භාග්‍යවතුන් වහන්ස, නවවැනි පිරිහෙන කාරණය වදාළ මැනවි. පිරිහීමට කාරණය කවරේද?

18. සෙහිදාරෙහි සන්තුට්ඨො - වෙසියාසු පදිස්සති★
දිස්සති පරදාරෙසු - තං පරාභවතො මුඛං★

තම තමන්ගේ භාර්යාවන් හේතුකොට ගෙන නොසතුටුවූ යමෙක් වෙශ්‍යාවන් කෙරෙහි දක්නා ලැබෙයිද පරස්ත්‍රීන් කෙරෙහි දක්නා ලැබේද එය පිරිහීමට කාරණයයි වදාළ සේක.

19. ඉති හෙතං විජානාම - නවමො සො පරාභවො★
දසමං භගවා බ්‍රූහි - කිං පරාභවතො මුඛං★

මේ පිරිහෙන නවවැනි කාරණය වදාළ පරිද්දෙන්ම දනුම්හ. භාග්‍යවතුන් වහන්ස, දසවැනි පිරිහෙන කාරණය වදාළ මැනවි. පිරිහීමට කාරණය කවරේද?

20. අතීතයොබ්බනො පොසො - ආනෙති තිම්බරුත්ථනිං★
තස්සා ඉස්සා න සුපති - තං පරාභවතො මුඛං★

ඉක්ම ගිය යෞවන වයස් ඇති පුරුෂයෙක් තෙම තිඹිරි ඵල වැනි තන ඇති තරුණියක් සරණ පාවාගෙන ඇය තරුණ පුරුෂයකු පතාදෝ යන ඊර්ෂ්‍යාවෙන් රාත්‍රියෙහි නොනිදා ද එය පිරිහීමට කාරණයයි වදාළ සේක.

21. ඉති හෙතං විජානාම - දසමො සො පරාභවො★
එකාදසමං භගවා බ්‍රූහි - කිං පරාභවතො මුඛං★

මේ පිරිහෙන දසවැනි කාරණය වදාළ පරිද්දෙන්ම දනුම්හ. භාග්‍යවතුන් වහන්ස, එකලොස්වෙනි පිරිහෙන කාරණය වදාළ මැනවි. පිරිහීමට කාරණය කවරේද?

22. ඉත්ථී සොණ්ඩිං විකිරණිං - පුරිසං වාපි තාදිසං★
ඉස්සරියස්මිං ඨපාපෙති - තං පරාභවතෝ මුඛං★

මත්ස්‍ය මාංශ හා සුරාවෙහි ලොල්වූ ඒ මාංශාදිය නිෑ සම්පත් විසුරුවන සුලුවූ ස්ත්‍රියක හෝ එබඳුවූ පුරුෂයෙකු හෝ භාණ්ඩාගාරාදිය බාරදී එකීදෙයෙහි නියුක්ත කෙරේද එය පිරිහීමට කාරණයයි වදාළ සේක.

23. ඉතිහෙතං විජානාම - එකාදසමෝ සෝ පරාභවෝ★
ද්වාදසමං භගවා බ්‍රූහි - කිං පරාභවතෝ මුඛං★

මේ පිරිහෙන එකලොස්වෙනි කාරණය වදාළ පරිද්දෙන්ම දනුම්හ. භාග්‍යවතුන් වහන්ස, දොලොස්වෙනි පිරිහෙන කාරණය වදාළ මැනවි. පිරිහීමට කාරණය කවරේද?

24. අප්පභොගෝ මහාතණ්හෝ - ඛත්තියෙ ජායතෙ කුලෙ ★
සෝ ච රජ්ජං පත්ථයති - තං පරාභවතෝ මුඛං★

මද වූ වස්තු ඇති තෘෂ්ණා ඇත්තෙක් ක්ෂත්‍රිය කුලයෙහි උපදිද ඒ ක්ෂත්‍රිය ජාති ඇති අල්පභොග මහා තෘෂ්ණා ඇත්තේ වනාහි තමා සතුවූ හෝ තමාට නොලැබෙන අනුන් සතු වූ හෝ රාජ්‍යය ප්‍රාර්ථනා කෙරේද එය පිරිහීමට කාරණයයි වදාළ සේක.

25. එතෙ පරාභවෙ ලොකෙ - පණ්ඩිතෝ සමවෙක්ඛිය★
අරියෝ දස්සනසම්පන්නෝ - ස ලොකං භජතෙ සිව''න්ති★

ප්‍රඥා ඇති පුද්ගලතෙම මේ සත්වලොකයෙහි වූ යථොක්තවූ තෙවිසි පරිහානි කාරණයන් නුවණැසින් පරීක්ෂා දැන එහි ආදීනව දත් ඒ ප්‍රඥාවන්තවූ පුද්ගල තෙම දිව්‍ය ලෝකය සේවනය කරන්නේ යයි වදාළ සේක.

27. වසල සුත්තං
වසල සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා★ සාවත්ථියං විහරති
ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ★ අථ ඛො භගවා
පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථියං
පිණ්ඩාය පාවිසි★ තෙන ඛො පන සමයෙන★
අග්ගිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනෙ අග්ගි පජ්ජලිතො
හොති ආහුති පග්ගහිතා★

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවන නම්වූ විහාරයෙහි වැඩවාසය කරන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුවේලෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන සැවත් නුවරට පිඬු පිණිස වැඩිසේක. එසමයෙහි වනාහි අග්ගික භාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ ගෙයි ගිනි දල්වන ලද්දේ බැබළුණේ වෙයි, අග්නි හෝමය පටන් ගන්නා ලද්දේය.

අථ බො භගවා සාවත්ථියං සපදානං පිණ්ඩාය චරමානො★ යෙන අග්ගිකභාරද්වාජස්ස බ්‍රහ්මණස්ස නිවෙසනං තෙනුපනසඞ්කමි.★ අද්දසා බො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං දූරතොව ආගච්ඡන්තං.★ දිස්වාන භගවන්තං එතදවොච★ ''තත්‍රෙව, මුණ්ඩක තත්‍රෙව, සමණක තත්‍රෙව, වසලක තිට්ඨාහී''ති.★

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ගෙපිළිවලින් පිඬු පිණිස හැසිරෙන සේක්, අග්ගික භාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ ගෙය යම් තැනෙක්හිද එතැනට වැඩිසේක.අග්ගික භාරද්වාජ නම් බ්‍රාහ්මණ තෙම වැඩමවන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදීම දුටුයේමය. දැක භාග්‍යවතුන් වහන්සේට මේ වචනය කීයේය. ''මුණ්ඩකය, එහිම සිටුව, නින්දිත (සැඩොල) මහණ එහිම සිටුවයි''

එවං වුත්තෙ, භගවා අග්ගිකභාරද්වාජං බ්‍රාහ්මණං එතදවොච★ ''ජානාසි පන ත්වං, බ්‍රාහ්මණ, වසලං වා වසලකරණෙ වා ධම්මෙ''ති★

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ අග්ගික භාරද්වාජ නම් බ්‍රාහ්මණයාට මෙසේ වදාළ සේක. '' බමුණ, නුඹ සැඩොලා හෝ සැඩොල් බවට පමුණුවන කාරණයන් හෝ කිමෙකැයි දන්නෙහිද''

''න ඛ්වාහං, භො ගොතම, ජානාමි වසලං වා වසලකරණෙ වා ධම්මෙ★ සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු යථාහං ජානෙය්‍යං වසලං වා වසලකරණෙ වා ධම්මෙ''ති★

''වසලයා හෝ වසල බවට පමුණුවන ධර්මය හෝ නොදනිමි. භවත් ගෞතමතෙම වසලයා හෝ වසල බවට පමුණුවන කාරණයන් යම්සේ මම දැනගනිම්ද, මට එසේ දහම් දෙසන සේක්වා'' යි සැළකෙළේය.

''තෙන හි බ්‍රාහ්මණ සුණාහි සාධුකං මනසි කරොහි භාසිස්සාමී'' ති ''එවං භො'' ති බො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි★ භගවා එතදවොච

''බමුණ, එසේවීනම් අසව, මනාකොට මෙනෙහි කරව, කියන්නෙමියි'' වදාළසේක. ''පින්වත, එසේයයි'' කියා අග්ගික භාරද්වාජ නම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

1. **කොධනො උපනාහී ච - පාපමක්ඛී ච යො නරො★**
විපන්නදිට්ඨී මායාවී - තං ජඤ්ඤා වසලො ඉති★

යම් මනුෂ්‍යයෙක් කිපෙන ස්වභාව ඇත්තේ වේද, ෛ ඇත්තේද, අනුන් ගුණ නසන පවිටු ස්වභාව ඇත්තේ වේද, විපර්යාසවූ දෘෂ්ටි ඇත්තේ ද (හෙවත් සම්‍යක් දෘෂ්ටියෙන් තොරවූයේ ද) මායාව ප්‍රයෝග ඇත්තේ වේද ඔහු වසලයයි දැනගත යුතුයි.

2. **එකජං වා ද්විජං වාපි - යොධ පාණානි හිංසති★**
යස්ස පාණෙ දයා නත්ථි - තං ජඤ්ඤා වසලො ඉති★

මේ ලෝකයෙහි යම් පුද්ගලයෙක් පක්ෂීන්ට හා සෙසු සතුන්ට හිංසා කෙරේද, (හෙවත් දිවි තොර කෙරේද) යමෙක් හට සත්වයා කෙරෙහි දයාවක් නැත්තේද, ඔහු වසලයා යයි දැනගත යුතුයි.

3. **යො හන්ති පරිරුන්ධති - ගාමානි නිගමානි ච★**
නිග්ගාහකො සමඤ්ඤාතො - තං ජඤ්ඤා වසලො ඉති★

යමෙක් තෙම ගම් හා නියම් ගම් ද විනාශ කෙරේද, සේනාව ලවා වටලාද නිග්‍රහ කරන්නෙකැයි ප්‍රසිද්ධවේ ද ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

4. **ගාමෙ වා යදි වා රඤ්ඤෙ - යං පරෙසං මමායිතං★**
ථෙය්‍යා අදින්නං ආදියති - තං ජඤ්ඤා වසලො ඉති★

ගමෙහි හෝ ඉදින් වනයෙහි හෝ අනුන්ගේ මමත්වය ඇති යම් වස්තුවක් සොරසිතින් ගනී ද ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

5. **යො හවෙ ඉණමාදාය - චුජ්ජමානො පලායති★**
න හි තෙ ඉණමත්ථීති - තං ජඤ්ඤා වසලො ඉති★

යමෙක්තෙම ඒකාන්තයෙන් ණය රැගෙන චෝදනා කරනු ලබන්නේ 'ඔබට ණයක් නැත්තේයයි' බැහැරයා ද ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

6. **යො වෙ කිඤ්චික්ඛකම්‍යතා - පන්ථස්මිං වජතං ජනං★**
හන්ත්වා කිඤ්චික්ඛමාදෙති - තං ජඤ්ඤා වසලො ඉති★

යමෙක් ඒකාන්තයෙන් කිසි වස්තුවක් කැමැත්තේ මාර්ගයෙහි යන්නාවූ ජනයා නසා කිසි වස්තුවක් පැහැර ගනී ද ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

7. **යො අත්තහෙතු පරහෙතු - ධනහෙතු ච යො නරො★**
සක්ඛිපුට්ඨො මුසා බ්‍රූති - තං ජඤ්ඤා වසලො ඉති★

යම් මනුෂ්‍යයෙක් සාක්ෂි විචාරණ ලද්දේ තමා හේතුකොට ගෙන හෝ අනුන් හේතුකොට ගෙන හෝ යම් ධනයක් හේතුකොට ගෙන හෝ බොරු කියාද, ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

8. යො ඤාතීනං සඛානං වා - දාරෙසු පටිදිස්සති
සහසා සම්පියෙන වා - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් නෑයන්ගේ හෝ යහලුවන්ගේ හෝ භාර්යාවන් කෙරෙහි බලහත්කාරයෙන් එකක්හුගේ ප්‍රේමයෙන් හෝ උභය ප්‍රේමයෙන් හෝ දක්නා ලැබේද්දෙ හෙවත් අනාචාරයෙහි හැසිරේද, එබඳු පුද්ගලයා වසලයෙකැයි දත යුතුයි.

9. යො මාතරං වා පිතරං වා - ජිණ්ණකං ගතයොබ්බනං★
පහූ සන්තො න භරති - තං ජඤ්ඤා වසලො ඉති★

යමෙක් තෙම බොහෝ ධනධාන්‍ය ඇත්තේ ජරාපත් වූ පහවගිය යෞවන බව ඇති මව හෝ පියා හෝ පෝෂණය නොකෙරේද ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

10. යො මාතරං වා පිතරං වා - භාතරං භගිනිං සසුං★
හන්ති රොසෙති වාචාය - තං ජඤ්ඤා වසලො ඉති★

යමෙක් තෙම මවට හෝ පියාට හෝ සහෝදර සහෝදරියන් හා නැදිමයිලන්ට හෝ හිංසා කෙරේද, වචනයෙන් ක්‍රොධ කෙරේද, ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

11. යො අත්ථං පුච්ඡිතො සන්තො - අනත්ථමනුසාසති★
පටිච්ඡන්නෙන මන්තෙති - තං ජඤ්ඤා වසලො ඉති★

යමෙක්තෙම විචාරණ ලද්දේම අනර්ථයක්ම ප්‍රකාශ කෙරේද සැඟවීම වශයෙන් යම් යම් දේ කථා කෙරේද, ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

12. යො කත්වා පාපකං කම්මං - මා මං ජඤ්ඤාති ඉච්ඡති★
යො පටිච්ඡන්නකම්මන්තො - තං ජඤ්ඤා වසලො ඉති★

යමෙක් තෙම පව්කම්කොට මා නොදනීවායි කැමති වේද, යමෙක් තෙම අනුන් නොදන්වා සඟවා කරන ලාමක ක්‍රියා ඇත්තේද, ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

13. යො වෙ පරකුලං ගන්ත්වා - භුත්වාන සුචිභොජනං★
ආගතං න පටිපූජෙති - තං ජඤ්ඤා වසලො ඉති★

යමෙක්තෙමේ මේ ඤාතිමිත්‍රාදී අන්ගෙයකට ගොස් යහපත් භෝජනයක් අනුභව කොට පසුව තමාගේ ගෙට පැමිණි ඔවුන්ට ආහාර පානයක් නොදේද, ඔහු ඒකාන්තයෙන් වසලයෙකැයි දැනගත යුතුයි.

14. යො බ්‍රාහ්මණං වා සමණං වා - අඤ්ඤං වාපි වනිබ්බකං★
මුසාවාදෙන වඤ්චෙති - තං ජඤ්ඤා වසලො ඉති★

යමෙක් තෙම බ්‍රාහ්මණයකු හෝ ශ්‍රමණයකු හෝ අන්කිසි යාචකයකු හෝ තමාගේ ගෙට පැමිණි කල්හි බොරුකියා වඤ්චා කෙරේද ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

15. යො බ්‍රාහ්මණං වා සමණං වා - භත්තකාලෙ උපට්ඨිතෙ ★
රොසෙති වාචා න ච දෙති - තං ජඤ්ඤා වසලො ඉති★

යමෙක්තෙම බ්‍රාහ්මණයකු හෝ ශ්‍රමණයකු හෝ පෙරවරු වේලෙහි පැමිණිකල්හි කිසිවක් නොදේද නුසුදුසු වචන කියමින් රොස් උපදවාද, ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

16. අසතං යොධ පබ්‍රූති - මොහෙන පලිගුණ්ඨිතො★
කිඤ්චික්ඛං නිජිගිංසානො - තං ජඤ්ඤා වසලො ඉති★

මේ ලෝකයෙහි යමෙක්තෙම මෝහයෙන් වැසෙන ලද්දේ ද කිසියම් දෙයක් නොදී වළකමින් අසත්පුරුෂ වචන කියාද ඔහු වසලයයි දත යුතුයි.

17. යො චත්තානං සමුක්කංසෙ - පරං ච මවජානාති★
නිහීනො සෙන මානෙන - තං ජඤ්ඤා වසලො ඉති★

යමෙක් තෙම ස්වකීය උඩඟු මානයෙන් පිරිහුනේ තමන් උඩඟු කෙරේද අන්‍යයාට නින්දා කෙරේද හෙවත් හෙලා දකීද, ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

18. රොසකො කදරියො ච - පාපිච්ඡො මච්ඡරී සඨො★
අහිරිකො අනොත්තාපී - තං ජඤ්ඤා වසලො ඉති★

යමෙක් අනුන්ට ක්‍රොධ කෙරේද තද මසුරු සිත් ඇත්තේද නැති ගුණයෙන් පෙනී සිටීද ලජ්ජා නැත්තේද පවට බිය නැත්තේද ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

19. යො බුද්ධං පරිභාසති - අථ වා තස්ස සාවකං★
පරිබ්බාජං ගහට්ඨං වා - තං ජඤ්ඤා වසලො ඉති★

යමෙක් තෙම බුදුන්ටද උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට ද පරිබ්‍රාජකයන්ට ද ගෘහස්ථයන්ට ද පිරිහෙලා කථා කෙරේද ඔහු වසලයෙකැයි දැනගත යුතුයි.

20. යො වෙ අනරහා සන්තො - අරහං පටිජානාති★
චොරො සබ්‍රහ්මකෙ ලොකෙ - එස බො වසලාධමො★
එතෙ බො වසලා වුත්තා - මයා වො යෙ පකාසිතා★

යමෙක් තෙම රහත් නූවූයේම රහත්යයි හඟවාද බ්‍රහ්මයන් සහිතවූ ලෝකයෙහි මෙතෙම ඒකාන්තයෙන් පළමුවෙනි මහසොරා වේ. මේ තෙමේ චණ්ඩාලයන්ගෙන් අධම වේ. මා විසින් තොපට යම් වසල කෙනෙක් ප්‍රකාශ කරන ලද්දාහු ද ඒ වසලයෝ ආයතීධම්මවශයෙන් කියන ලද්දාහුය.

21. න ජච්චා වසලො හොති - න ජච්චා හොති බ්‍රාහ්මණො★
කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණො★

ජාතිය හේතුකොට ගෙන චණ්ඩාලයෙක් නොවේ. ජාතිය හේතුකොට ගෙන බ්‍රාහ්මණ ද නොවේ. අධම ක්‍රියාව හේතුකොට ගෙන චණ්ඩාල වේ. යහපත් ක්‍රියාව හේතුකොට ගෙන බ්‍රාහ්මණ ද වේ.

22. තදමිනාපි විජානාථ - යථාමෙදං නිදස්සනං★
චණ්ඩාලපුත්තො සොපාකො - මාතඞ්ගො ඉති විස්සුතො★

යම්සේ මාගේ මේ උපමා දැන්වීමක් ඇද්ද ජාතිය හේතුකොට ගෙන සැඩොල් නොවන බව මෙයින් ද දැන ගනිව්. සැඩොල් පුත් වූ සෝපාක යයි කියන ලද මාතංගයයි ප්‍රසිද්ධ වූ

23. සො යසං පරමං පත්තො - මාතඞ්ගො යං සුදුල්ලභං★
ආගච්ඡුං තස්සුපට්ඨානං - බත්තියා බ්‍රාහ්මණා බහූ★

ඒ මාතඞ්ග තෙමේ ඉතා දුකසේ ලැබිය යුතු වූ උතුම් යසසට පැමිණියේය. ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද බොහෝ දෙන ඔහු හට උපස්ථානයට ආවාහුය.

24. සො දෙවයානමාහිරුය්හ - විරජං සො මහාපථං★
කාමරාගං විරාජෙත්වා - බ්‍රහ්මලොකූපගො අහූ★

ඒ සෝපාක තෙරුන් වහන්සේ මේ රාගාදී රජස් රහිත වූ මහතුන්ගේ මහාමාර්ගයවූ ඒ අෂ්ටසමාපත්ති නම් දිව්‍ය යානාවට නැගී කාමරාගය පහකොට උත්පත්ති වශයෙන් බ්‍රහ්මලෝකයට පැමිණියේ විය.

25. න නං ජාති නිවාරෙසි - බ්‍රහ්මලොකූපපත්තියා★
අජ්ඣායකාකුලෙ ජාතා - බ්‍රාහ්මණා මන්තබන්ධුනො★
තෙ ච පාපෙසු කම්මෙසු - අභිණ්හමුපදිස්සරෙ★

දිට්ඨෙව ධම්මෙ ගාරය්හා - සම්පරායෙ ච දුග්ගතිං★
න තෙ ජාති නිවාරෙති - දුග්ගච්චා ගරහාය වා★

ජාතිය ඔහු බඹලොව ඉපදීමෙන් නොවැළක්විය. මන්ත්‍ර අධ්‍යයනයෙන් කල්යවන ප්‍රසිද්ධ බ්‍රාහ්මණ කුලයෙහි උපන්නාවූ වේදයම නොහොත් මන්ත්‍රයම පිහිටකොට ඇති බ්‍රාහ්මණයෝ පව් කිරීමෙහි නිතර පව් කරන බව දක්නා ලැබෙද්ද, ඒ බ්‍රාහ්මණයෝ මෙලොවදීම නින්දාවට පැමිණෙන්නෝ වෙත්. පරලොවහිදී දුගති නම්වූ සතර අපායට පැමිණෙන්නෝ වෙත්. ජාතිය ඒ සත්වයන් පරලොව අපායෙන් හෝ මෙලොව නින්දාවෙන් හෝ නොනවත් වන්නේය.

26. න ජච්චා වසලො හොති - න ජච්චා හොති බ්‍රාහ්මණ්‍ො★
කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණ්‍ො ති

ජාතිය හේතුකොට ගෙන වසලයෙක් නොවන්නේය. ජාතිය හේතුකොට ගෙන බ්‍රාහ්මණයෙක් ද නොවන්නේය. ක්‍රොධ ඊර්ෂ්‍යා මානාදී හීනවූ පාප ක්‍රියාවෙන් වසලයෙක් වන්නේය. ක්‍රොධාදී පාපකර්මයෙන් තොරවූ කරුණාදී යහපත් ක්‍රියාවෙන් උතුම් ජාතිය වූ බ්‍රාහ්මණයෙක් වන්නේ යයි වදාළ සේක.

එවං වුත්තෙ අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණ්‍ො භගවන්තං
එතදවොච

''අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම★
සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය
පටිච්ඡන්නං වා විවරෙය්‍ය★ මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය★
අන්ධකාරෙ වා තෙල පජ්ජොතං ධාරෙය්‍ය★ චක්ඛුමන්තො රූපානි
දක්ඛින්ති'ති★ එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන
ධම්මො පකාසිතො★ එසාහං භගවන්තං ගොතමං
සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච★ උපාසකං මං භවං
ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්'ති★

මෙසේ වදාළ කල්හි අග්ගික භාරද්වාජ නම් බ්‍රාහ්මණ තෙම බුදුරජාණන් වහන්සේට මෙසේ සැළ කෙළේය.

''පින්වත් ගෞතමයන් වහන්ස, ධර්මදේශනය ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, දම් දෙසුම ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරන්නේ යම්සේද, වැසුනක් විවෘත කරන්නේ යම්සේද, මංමුලාවූවෙකුට මඟ කියන්නේ යම්සේද, ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේ යම්සේද, එපරිද්දෙන් භාග්‍යවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේය. මේ මම භාග්‍යවතුන් වහන්සේද ධර්මයද සංඝයාද සරණයෙමි. අද පටන් දිවිහිමියෙන් සරණ ගියාවූ උපාසකයෙකු කොට මා දරා ගන්නා සේක්වා.''

28 සච්ච විභඞ්ග සුත්තං

සච්ච විභඞ්ග සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා★ බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ★ තත්‍ර බො භගවා භික්ඛූ ආමන්තෙසි★ භික්ඛවො ති★ භදන්තෙ ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච★

මා විසින් මෙසේ අසන ලදි. එක් කලෙක්හි, භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර සමීපයෙහි මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ''මහණෙනි, කියා ආමන්ත්‍රණය කළ සේක. ''පින්වතුන් වහන්සැ''යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

තථාගතෙන, භික්ඛවෙ, අරහතා සම්මාසම්බුද්ධෙන★ බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා★ දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං★ යදිදං චතුන්නං අරියසච්චානං★ ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං★

''මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ විසින් බරණැස්නුවර සමීපයෙහිවූ මිගදාය නම් ඉසිපතනාරාමයෙදී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලෝකයෙහි කිසිවෙකු විසිනුත් නොපැවැත්විය හැකි නිරුත්තරවූ ධර්මචක්‍රය පවත්වන ලදි. එනම් චතුරාර්‍ය සත්‍යයන්ගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය.

කතමෙසං චතුන්නං?★ දුක්ඛස්ස අරියසච්චස්ස★ ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං,★ දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස★ ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං,★ දුක්ඛනිරොධස්ස★ අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං,★ දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චස්ස★ ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.★

කවර චතුරාර්‍ය සත්‍යයන්ගේ ද දුක්ඛ නම් ආර්‍ය සත්‍යයාගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය. දුක්ඛ සමුදය

නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය. දුක්ඛ නිරොධ නම් ආර්‍ය්‍ය සත්‍යයන්ගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය. දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදා නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය (යන සතරයි).

තථාගතෙන, භික්ඛවෙ, අරහතා සම්මාසම්බුද්ධෙන★ බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා★ දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං★ යදිදං ඉමෙසං චතුන්නං අරියසච්චානං★ ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.★

''මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ විසින් බරණැස්නුවර සමීපයෙහිවූ මිගදාය නම් ඉසිපතනාරාමයෙහිදී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලෝකයෙහි කිසිවෙකු විසිනුත් නොපැවැත්විය හැකි නිරුත්තරවූ ධර්මචක්‍රය පවත්වන ලදි. එනම් මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය.

සෙවථ, භික්ඛවෙ, සාරිපුත්තමොග්ගල්ලානෙ★ භජථ, භික්ඛවෙ, සාරිපුත්තමොග්ගල්ලානෙ.★ පණ්ඩිතා භික්ඛූ අනුග්ගාහකා සබ්‍රහ්මචාරීනං.★ සෙය්‍යථාපි, භික්ඛවෙ, ජනෙත්ති එවං සාරිපුත්තෝ★සෙය්‍යථාපි ජාතස්ස ආපාදෙතා එවං මොග්ගල්ලානෝ.★ සාරිපුත්තෝ, භික්ඛවෙ, සත්තෙ සොතාපත්තිඵලෙ විනෙති★ මොග්ගල්ලානෝ. උත්තමත්ථෙ විනෙති සාරිපුත්තෝ, භික්ඛවෙ, පහොති චත්තාරි අරියසච්චානි විත්ථාරෙන ආචික්ඛිතුං දෙසෙතුං පඤ්ඤපෙතුං පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානීකාතුං'ති★ ඉදමවොච භගවා ඉදං වත්වා සුගතෝ උට්ඨායාසනා විහාරං පාවිසි★

''මහණෙනි, ශාරිපුත්‍ර මොග්ගල්ලායනයන් සේවනය කරව්. මහණෙනි, ශාරිපුත්‍ර මොග්ගල්ලානයන් භජනය කරව්. පණ්ඩිත වූ (ඒ) භික්ෂූහු බඹසර ඇත්තවුන්ට අනුග්‍රහ කරන්නාහුය. මහණෙනි, වැදූ මව යම්සේද ශාරිපුත්‍ර තෙමේ එමෙනි උපන්නහුගේ පෝෂණය කරන්නාවූ මව යම්සේද මොග්ගල්ලාන තෙමේ එවැනි වේ. මහණෙනි ශාරිපුත්‍ර තෙමේ සෝවාන් ඵලයෙහි නික්මවයි. මොග්ගල්ලාන තෙමේ ඉහළ ඵලයන්හි නික්මවයි. මහණෙනි, ශාරිපුත්‍ර තෙමේ චතුරාර්‍ය්‍ය සත්‍යයන් විස්තර වශයෙන් කියන්ට දේශනා කරනට පනවනට පිහිටුවන්ට විවරණය කරන්ට විභාග කරන්ට ප්‍රකට කරනට සමර්ථවේයයි.'' භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සුගතයන් වහන්සේ මෙය වදාරා හුනස්නෙන් නැගිට විහාරයට වැඩිසේක.

තත්‍ර බො ආයස්මා සාරිපුත්තො★ අච්රපක්කන්තස්ස භගවතො භික්ඛූ ආමන්තෙසි★ ආවුසො භික්ඛවො'ති★ ආවුසො'ති බො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං★ ආයස්මා සාරිපුත්තො එතදවොච★

එකල්හි වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ බැහැර ගිය නොබෝ කල්හි භික්ෂූන්ට '' ඇවැත් මහණෙනි යි'' ආමන්ත්‍රණය කළ සේක. ''ඇවැත්නි''කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ට උත්තර දුන්හ. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙමේ මෙය ප්‍රකාශ කෙළේය.

තථාගතෙන ආවුසො අරහතා සම්මාසම්බුද්ධෙන★ බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා★ දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං★ යදිදං චතුන්නං අරියසච්චානං★ ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.★

''ඇවැත්නි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ විසින් බරණැස්නුවර මිගදාය නම් ඉසිපතනාරාමයේදී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලෝකයෙහි කිසිවෙකු විසිනුත් නොපැවැත්විය හැකි නිරුත්තරවූ ධර්මචක්‍රය පවත්වන ලදී. එනම් චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ කීමයි, දෙසීමයි, පැනවීමයි, පිහිටුවීමයි, ප්‍රකාශ කිරීමයි, විභාග කිරීමයි, ප්‍රකට කිරීමයි.

කතමෙසං චතුන්නං?★ දුක්ඛස්ස අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං,★ දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස★ ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං, දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස★ ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං,★ දුක්ඛනිරොධගාමිනී පටිපදාය අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.★

කවර චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ ද? දුක්ඛ නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය. දුක්ඛ සමුදය නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය. දුක්ඛ නිරොධ නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය. දුක්ඛ

නිරොධගාමිනී ප්‍රතිපදා නම් ආර්‍ය්‍ය සත්‍යයාගේ කීමය, දෙසීමය, පැනවීමය, පිහිටුවීමය, ප්‍රකාශ කිරීමය, විභාග කිරීමය, ප්‍රකට කිරීමය (යනුයි).

කතමඤ්ච්චාවුසො දුක්ඛං අරියසච්චං?★ ජාති'පි දුක්ඛා, ජරා'පි දුක්ඛා, ව්‍යාධි'පි දුක්ඛෝ★ මරණම්'පි දුක්ඛං,★ සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා දුක්ඛා,★ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං,★ සංඛිත්තෙන පඤ්චූපාදානක්ඛන්ධා දුක්ඛා.★

''ඇවැත්නි, දුක්ඛ නම් ආර්‍ය්‍ය සත්‍යය කවරේද? ඉපදීම ද දුක්වේ. ජරාව හෙවත් දිරීම ද දුක්වේ. මරණය ද දුක්වේ. ශෝක කිරීමය, වැලපීමය, කායික දුක්ය, දොම්නසය, දැඩි වෙහෙසය, යන මොහු ද දුක්වෙත්. කැමති වන්නාවූ යමක් නොලැබේද එය ද දුක්වේ. කොටින්, පස්වැදෑරුම් උපාදාන ස්කන්ධයෝ දුක්වෙත්.

කතමා චා'වුසො ජාති?★ යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ★ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති බන්ධානං පාතුභාවො ආයතනාං පටිලාභෝ★ අයං වුච්චතාවුසො ජාති★

ඇවැත්නි, ඉපදීම නම් කවරීද? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව වර්ගයෙහි යම් ඉපදීමක්, හටගැනීමක්, පිළිසිඳීමක්, ස්කන්ධයන්ගේ පහළවීමක්, ආයතනයන්ගේ ප්‍රතිලාභයක් වේද ඇවැත්නි, මෙය ජාතියයි කියනු ලැබේ. (ඉපදීමයයි කියනු ලැබේ).

කතමා චා'වුසො ජරා? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා බණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකෝ★ අයං වුච්චතාවුසො ජරා★

ඇවැත්නි, ජරාව නම් කවරීද? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව වර්ගයෙහි යම් ජරාවක්, දිරණ බවක්, කැඩෙන බවක්, පැසෙන බවක්, රැලි වැටුනු සිවිය ඇති බවක්, ආයුෂයාගේ පිරිහීමක්, ඉන්ද්‍රියන්ගේ මේරීමක් වේද, ඇවැත්නි, මෙය ජරාව යයි කියනු ලැබේ.

කතමාඤ්චා'වුසො මරණං?★ යා තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා හෙදෝ අන්තරධානං මච්චු මරණං කාලකිරියා බන්ධානං හෙදෝ කළෙබරස්ස නික්ඛෙපෝ★ ඉදං වුච්චතාවුසො මරණං.★

ඇවැත්නි, මරණය නම් කවරේද? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව වර්ගයෙන් යම් චුතවීමක්, චුතවන බවක්, බිඳීමක්, අතුරුදන්වීමක්, මරණයක්, කළුරිය කිරීමක්,

ස්කන්ධයන්ගේ බිඳීමක්, ශරීරයාගේ බහාතැබීමක් වේද, ඇවැත්නි මේ මරණයයි කියනු ලැබේ.

කතමො චා'වුසො සොකො?★ යො බො, ආවුසො, ඤඤ්ඤතරඤඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස ඤඤ්ඤතරඤඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස★ සොකො සොචනා සොචිතත්තං අන්තොසොකො අන්තොපරිසොකො★ අයං වුච්චතාවුසො සොකො.★

ඇවැත්නි, ශෝක කිරීම නම් කවරේද? ඇවැත්නි, එක්තරා එක්තරා විනාශයකින් යුක්තවූවහුට එක්තරා එක්තරා දුක් ස්වභාවයක් පැමිණියහුට යම් ශෝකයක්, තැවීමක්, තැවීම් ඇතිබවක්, ඇතුළත තැවීමක්, ඇතුළත අතිශයින් තැවීමක්, වේද මේ ශෝකයයි කියනු ලැබේ.

කතමො චා'වුසො පරිදෙවො?★ යො බො ආවුසො ඤඤ්ඤතරඤඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස ඤඤ්ඤතරඤඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස★ ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං★ අයං වුච්චතාවුසො පරිදෙවො★

ඇවැත්නි, වැළපීම කවරේද? ඇවැත්නි, එක්තරා එක්තරා විනාශයකින් යුක්තවූවහුගේ එක්තරා දුක් ස්වභාවයක් පැමිණියහුගේ යම් ආදෙවයක්, පරිදෙවයක්, හැඬීමක්, වැළපීමක්, හැඬීම ඇතිබවක්, වැළපෙන ස්වභාවයක් වේද, ඇවැත්නි, මේ වැළපීම යයි කියනු ලැබේ.

කතමඤ්ච'වුසො දුක්ඛං?★ යං බො ආවුසො කායිකං දුක්ඛං කායිකං අසාතං★ කායසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං★ ඉදං වුච්චතාවුසො දුක්ඛං★

ඇවැත්නි, දුක නම් කවරේද? ඇවැත්නි, යම් කයෙහි හටගන්නාවූ දුකක්, කයෙහි හටගන්නාවූ නොසැපයක්, කයේ වැදීමෙන් හටගන්නාවූ දුකක් නොසැපයක්, විඳ ගැනීමක් වේද, ඇවැත්නි, මේ දුඃඛ යයි කියනු ලැබේ.

කතමඤ්ච'වුසො දොමනස්සං?★ යං බො ආවුසො චෙතසිකං දුක්ඛං අසාතං මනොසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං★ ඉදං වුච්චතාවුසො දොමනස්සං★

ඇවැත්නි, දොම්නස කවරේද? ඇවැත්නි, යම් සිතෙහි හටගන්නාවූ දුකක් වේද, සිතෙහි හටගන්නාවූ නොසැපවූ විඳ ගැනීමක් වේද, මනෝ සම්ඵස්සයෙන්

හට ගන්නාවූ දුකක් නොසැපවූවක් විඳගැනීමක් වේද, ඇවැත්නි, මෙය දොම්නසයයි කියනු ලැබේ.

කතමෝ චා'වුසෝ උපායාසෝ?★ යෝ ඛෝ ආවුසෝ අඤ්ඤතරඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස★ ආයාසෝ උපායාසෝ ආයාසිතත්තං උපායාසිතත්තං★ අයං වුච්චතාවුසෝ උපායාසෝ.★

ඇවැත්නි, දැඩිවූ වෙහෙස (උපායාස) කවරේද? ඇවැත්නි, එක්තරා එක්තරා විනාශයකින් යුක්තවූවහුට එක්තරා එක්තරා දුක් ස්වභාවයක් පැමිණියාහුට යම් වෙහෙසක්, දැඩිවූ ශෝකයක්,වෙහෙසට පැමිණි බවක්, දැඩිවූ ශෝක ඇති බවක් වේද, ඇවැත්නි, මෙය උපායාසයයි කියනු ලැබේ.

කතමඤ්චා'වුසෝ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං?★ ජාති ධම්මානං ආවුසෝ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති★ අහෝ වත මයං න ජාතිධම්මා අස්සාම න ච වත නෝ ජාති ආගච්ඡෙය්‍යාති★ න ඛෝ පනෙතං ඉච්ඡාය පත්තබ්බං★ ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං★ ජරා ධම්මානං ආවුසෝ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති★ අහෝ වත මයං න ජරාධම්මා අස්සාම න ච වත නෝ ජරා ආගච්ඡෙය්‍යාති★ න ඛෝ පනෙතං ඉච්ඡාය පත්තබ්බං★ ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං★ ව්‍යාධි ධම්මානං ආවුසෝ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති★ අහෝ වත මයං න ව්‍යාධිධම්මා අස්සාම න ච වත නෝ ව්‍යාධි ආගච්ඡෙය්‍යාති★න ඛෝ පනෙතං ඉච්ඡාය පත්තබ්බං★ ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං★ මරණ ධම්මානං ආවුසෝ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති★ අහෝ වත මයං න මරණාධම්මා අස්සාම★ න ච වත නෝ මරණං ආගච්ඡෙය්‍යාති★ න ඛෝ පනෙතං ඉච්ඡාය පත්තබ්බං★ ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං★ සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාස ධම්මානං ආවුසෝ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති★ අහෝ වත මයං න සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාස ධම්මා අස්සාම★ න ච වත නෝ සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා ආගච්ඡෙය්‍යුන්ති★ න ඛෝ පනෙතං ඉච්ඡාය පත්තබ්බං★ ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං★

ඇවැත්නි, කැමතිවූ යමක් නොලබාද එයද දුක් වේ යනු කවරේද? ඇවැත්නි, ඉපදීම ස්වභාවකොට ඇත්තාවූ සත්වයන්ට මෙබඳු කැමැත්තක් පහළවේ. අපි ඉපදීම ස්වභාව කොට ඇත්තාහු නොවන්නෙමු නම්, ඒකාන්තයෙන් අපට ඉපදීම නොපැමිණෙන්නේ නම් යහපතැයි කියායි. මේ වනාහි කැමැත්තෙන් නොපැමිණිය යුත්තකි. මෙයද කැමති යමක් නොලබා නම් එයද දුක්වේ.
ඇවැත්නි, දිරීම ස්වභාවකොට ඇති සත්වයන්ට මෙබඳු කැමැත්තක් පහළවේ. අපි දිරීම ස්වභාව කොට ඇත්තාහු නොවන්නෙමු නම්, ඒකාන්තයෙන් අපට දිරීම නොපැමිණෙන්නේ නම් යහපතැයි කියායි. මේ වනාහි කැමැත්තෙන් නොපැමිණිය යුත්තකි. මෙයද කැමති යමක් නොලබා නම් එයද දුක්වේ.
ඇවැත්නි, ව්‍යාධිය ස්වභාවකොට ඇති සත්වයන්ට මෙබඳු කැමැත්තක් පහළ වේ. අපි ව්‍යාධිය ස්වභාව කොට ඇත්තාහු නොවන්නෙමු නම්, ඒකාන්තයෙන් අපට ව්‍යාධිය නොපැමිණෙන්නේ නම් යහපතැයි කියායි. මේ වනාහි කැමැත්තෙන් නොපැමිණිය යුත්තකි. මෙයද කැමති යමක් නොලබා නම් එයද දුක්වේ.
ඇවැත්නි, මරණය ස්වභාවකොට ඇති සත්වයන්ට මෙබඳු කැමැත්තක් පහළ වේ. අපි මරණය ස්වභාව කොට ඇත්තාහු නොවන්නෙමු නම්, ඒකාන්තයෙන් අපට මරණය නොපැමිණෙන්නේ නම් යහපතැයි කියායි. මේ වනාහි කැමැත්තෙන් නොපැමිණිය යුත්තකි. මෙයද කැමති යමක් නොලබා නම් එයද දුක්වේ.
ඇවැත්නි, ඇතුළත තැවීමය, වැළපීමය, කායික දුකය, චෛතසික දුකය, දැඩිවූ ආයාසය යන මොවුන් ස්වභාව කොට ඇති සත්වයන්ට මෙබඳු කැමැත්තක් උපදියි. අපි ඇතුළත තැවීමය, වැළපීමය, කායික දුකය, චෛතසික දුකය, දැඩිවූ ආයාසය යන මොවුන් ස්වභාව කොට ඇත්තෝ නොවන්නෙමු නම්, අපට ඒකාන්තයෙන් ශෝක පරිදෙව, දුක්, දොම්නස් යන මොහු නොපැමිණෙන්නාහු නම් යහපති, කියායි. මෙය වනාහි කැමැත්තෙන් නොපැමිණිය යුතුයි. මෙය ද කැමති යමක් නොලබයි ද, එයද දුක් වේ.

කතමා චා'වුසො සංඛිත්තෙන පඤ්චූපාදානක්ඛන්ධා දුක්ඛා?★ සෙය්‍යථීදං★ රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො ඉමෙ වුච්චන්තාවූසො සංඛිත්තෙන පඤ්චූපාදානක්ඛන්ධා දුක්ඛා★
ඉදං වුච්චතාවුසො දුක්ඛං අරියසච්චං★

ඇවැත්නි, සැකෙවින් පඤ්ච උපාදාන ස්කන්ධයෝ දුක් වෙති, යනු කවරහුද? එනම් රූපොපාදාන ස්කන්ධය, වේදනොපාදාන ස්කන්ධය, සංඥාපාදාන ස්කන්ධය, සංස්කාරොපාදාන ස්කන්ධය, විඥානොපාදාන ස්කන්ධය, යන මොහුයි. ඇවැත්නි, මොහු සැකෙවින් පඤ්චොපාදාන ස්කන්ධයෝ දුක් වෙත්යයි කියනු ලැබෙත්.

ඇවැත්නි, මේ දුක්ඛාර්‍යසත්‍යයයි කියනු ලැබේ.

කතමඤ්චා'වුසො දුක්ඛසමුදයං අරියසච්චං?★ යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී★ සෙය්‍යථීදං කාමතණ්හා භවතණ්හා විභවතණ්හා★ ඉදං වුච්චතාවුසො දුක්ඛසමුදයං අරියසච්චං★

ඇවැත්නි, දුක්ඛසමුදය නම් ආර්‍යසත්‍යය කවරේද? නැවත භවය ගෙනදෙන්නාවූ සතුටු වීමයයි කියන ලද ඇල්මෙන් යුක්තවූ ඒ ඒ තන්හි ඇළුම් කරන්නාවූ යම් මේ තෘෂ්ණාවක් වේද, එනම් කාම තෘෂ්ණාවය, භව තෘෂ්ණාවය, විභව තෘෂ්ණාවය යන මොහුයි. ඇවැත්නි, මේ දුක්ඛසමුදය නම් ආර්‍යසත්‍යයයි කියනු ලැබේ.

කතමඤ්ච'වුසො දුක්ඛනිරොධං අරියසච්චං?★ යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො★ ඉදං වුච්චතාවුසො දුක්ඛනිරොධං අරියසච්චං★

ඇවැත්නි, දුක්ඛ නිරොධ නම් ආර්‍යසත්‍යය කවරේද? ඒ තෘෂ්ණාවගේම ශේෂ රහිතව (ඉතිරිවීමක් නැතිව) නොඇලීමෙන් යම් නිරොධයක්, ත්‍යාගයක්, දුරලීමක්, මිදීමක් ඇළුම් රහිත බවක් වේද, ඇවැත්නි, මෙය දුක්ඛනිරොධ නම් ආර්‍යසත්‍යයයි කියනු ලැබේ.

කතමඤ්ච'වුසො දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං?★ අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො★ සෙය්‍යථීදං★ සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්පො★ සම්මාවාචා සම්මා කම්මන්තො, සම්මාආජීවො,★ සම්මාවායාමො, සම්මාසති, සම්මාසමාධි.★

ඇවැත්නි, දුක් නිරුද්ධකිරීම පිණිස ගමන් කරන්නාවූ ප්‍රතිපදාව නම් ආර්‍යසත්‍යය කවරේද? මේ ආර්‍ය අෂ්ටාංගික මාර්ගය මැයි. එනම් සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් ක්‍රියා, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යනු මොහුයි.

කතමාචා'වුසො සම්මාදිට්ඨි?★ යං ඛො ආවුසො දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං★ දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං★ අයං වුච්චතාවුසො සම්මාදිට්ඨි★

ඇවැත්නි, සම්‍යක් දෘෂ්ටිය නම් කවරීද? ඇවැත්නි, දුක්ඛ සත්‍යයෙහි යම් දැනීමක් වේද, දුක්ඛ සමුදය සත්‍යයෙහි යම් දැනීමක් වේද, දුක්ඛ නිරොධ සත්‍යයෙහි යම් දැනීමක් වේද, දුක් නිරුද්ධ කිරීම පිණිස පිළිපදින්නාවූ මාර්ග සත්‍යයෙහි යම් දැනීමක් වේද, ඇවැත්නි, මෙය සම්‍යක් දෘෂ්ටියයි කියනු ලැබේ.

කතමාචා'වුසො සම්මාසඞ්කප්පො?★ නෙක්ඛම්මසඞ්කප්පො, අව්‍යාපාදසඞ්කප්පො, අවිහිංසාසඞ්කප්පො,★ අයං වුච්චතාවුසො සම්මාසඞ්කප්පො★

ඇවැත්නි, සම්‍යක් සංකල්පය නම් කවරීද? කාමයන්ගෙන් සිත බැහැර කිරීමෙහි සංකල්පනාවය, ක්‍රොධ නොකිරීම පිළිබඳ සංකල්පනාවය, හිංසා නොකිරීම පිළිබඳ සංකල්පනාවය, යන මොහුයි. ඇවැත්නි, මේ සම්‍යක් සංකල්පයයි කියනු ලැබේ.

කතමාචා'වුසො සම්මාවාචා?★ මුසාවාදා වෙරමණී, පිසුණාවාචා වෙරමණී, ඵරුසාවාචා වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී,★ අයං වුච්චතාවුසො සම්මාවාචා.★

ඇවැත්නි, සම්‍යක් වචනය නම් කවරේද? බොරු කීමෙන් වැළකීමය, කේලාම් කීමෙන් වැළකීමය, රළු වචන කීමෙන් වැළකීමය, හිස් කථාවෙන් වැළකීමය, යන මොහුයි. ඇවැත්නි, මේ සම්‍යක් වචනයයි කියනු ලැබේ.

කතමාචා'වුසා සම්මාකම්මන්තෝ?★ පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසුමිච්ඡාචාරා වෙරමණී,★ අයං වුච්චතාවුසො සම්මාකම්මන්තෝ★

ඇවැත්නි, සම්‍යක් ක්‍රියා නම් කවරේද? සතුන් මැරීමෙන් වැළකීමය, සොරකම් කිරීමෙන් වැළකීමය, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීමය, යන මොහුයි. ඇවැත්නි, මේ සම්‍යක් ක්‍රියා යයි කියනු ලැබේ.

කතමෝ චා'වුසෝ සම්මාආජීවෝ?★ ඉධාවුසෝ අරියසාවකෝ මිච්ඡාආජීවං පහාය සම්මාආජීවෙන ජීවිකං කප්පෙති★ අයං වුච්චතාවුසෝ සම්මාආජීවෝ★

ඇවැත්නි, සම්‍යක් ආජීවය නම් කවරේද? ඇවැත්නි, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙම වැරදි වූ ජීවිකාව හැර යහපත්වූ දිවි පැවැත්ම කෙරේද ඇවැත්නි, මේ සම්‍යක් ආජීවයයි කියනු ලැබේ.

කතමෝ චා'වුසෝ සම්මාවායාමෝ?★ ඉධාවුසෝ භික්ඛූ අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති★ උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානය★ ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති★ අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය★ ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති★ උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භියෝභාවාය වෙපුල්ලාය භාවනාව පාරිපූරියා★ ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති★ අයං වුච්චතාවුසෝ සම්මාවායාමෝ.★

ඇවැත්නි, සම්‍යක් ව්‍යායාමය නම් කවරේද? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම නූපන්නාවූ ලාමක වූ අකුශල ධර්‍මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවයි. ව්‍යායාම කරයි. වීර්‍ය්‍ය පටන් ගනියි. සිත දැඩිකර ගනියි. උත්සාහ කරයි. උපන්නාවූ ලාමක වූ අකුශල ධර්‍මයන්ගේ දුරු කිරීම පිණිස කැමැත්ත උපදවයි. ව්‍යායාම කරයි. වීර්‍ය්‍ය පටන් ගනියි. සිත දැඩිකර ගනියි. උ ාහ කරයි. නූපන්නාවූ කුශල ධර්‍මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවයි. ව්‍යායාම කරයි. වීර්‍ය්‍ය පටන් ගනියි. සිත දැඩිකර ගනියි. උත්සාහ කරයි. උපන්නාවූ කුශල ධර්‍මයන්ගේ පැවැත්ම පිණිස මුළා නොවීම පිණිස වැඩිවීම පිණිස මහත්වීම පිණිස භාවනාවෙන් සම්පූර්ණ කිම පිණිස කැමැත්ත උපදවයි. ව්‍යායාම කරයි. වීර්‍ය්‍ය පටන් ගනියි. සිත දැඩිකර ගනියි. උත්සාහ කරයි. ඇවැත්නි, මේ සම්‍යක් ව්‍යායාමයයි කියනු ලැබේ.

කතමා චා'වුසො සම්මාසති?★ ඉධාවුසො භික්ඛූ කායෙ කායානුපස්සී විහරති★ ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං වෙදනාසු වෙදනානුපස්සී විහරති★ ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං★ චිත්තෙ චිත්තානුපස්සී විහරති★ ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං★ ධම්මෙසු ධම්මානුපස්සී විහරති★ ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං★ අයං වුච්චතාවුසො සම්මාසති★

ඇවැත්නි, සම්‍යක් ස්මෘතිය නම් කවරේද? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, මනා දැනුම් ඇත්තේ, සිහි ඇත්තේ, ලෝකයෙහි ලෝභය හා දෝෂය දුරු කොට කයෙහි කය අනුව බලමින් වාසය කරයි. වේදනාවන්හි වේදනාවන් අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, මනා දැනුම් ඇත්තේ, සිහි ඇත්තේ, ස්කන්ධ ලෝකයෙහි ලෝභය හා දෝෂය දුරු කොට වාසය කරයි. සිතෙහි සිත අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, මනා දැනුම් ඇත්තේ, සිහි ඇත්තේ, ලෝකයෙහි ලෝභය හා දෝෂය දුරු කොට වාසය කරයි. කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, මනා දැනුම් ඇත්තේ, සිහි ඇත්තේ, ලෝකයෙහි ලෝභය හා දෝෂය දුරු කොට ධර්මයන්හි ධර්මය අනුව දකිමින් වාසය කරයි. ඇවැත්නි, මෙය සම්‍යක් ස්මෘතිය නම් කියනු ලැබේ.

කතමො චා'වුසො සම්මාසමාධි?★ ඉධාවුසො භික්ඛූ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි★ සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමඣානං උපසම්පජ්ජ විහරති★ විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං★ අවිතක්කං අවිචාරං සමාධිජං පීති සුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති★ පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති★ සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙති★ යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති★ තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති★ සුඛස්ස ච

පහානා දුක්ඛස්ස ච පහානා★ පුබ්බේ'ව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛා සතිපාරිසුධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති★ අයං වුච්චතාවුසො සම්මාසමාධි

ඉදං වුච්චතාවුසො දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං★

ඇවැත්නි, සම්‍යක් සමාධිය නම් කවරේද? ඇවැත්නි, මේ ශාසනයෙහි භික්ෂුතෙම කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත වූ විචාර සහිතවූ විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිත පිළිබඳ එකඟ බැව් ඇත්තාවූ, විතර්ක සහිත වූ, විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. සිහියෙන් යුක්තවූයේ කයින් සැප විඳියි. යම් ධ්‍යානයක් උපේක්ෂා ඇත්තේ, සිහියෙන් යුක්තවූයේ, සැප විහරණය ඇත්තේ යයි ආර්‍යයෝ කියත්ද ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. සැපය නැති කිරීමෙන් දුක් නැති කිරීමෙන් කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන් දුක් නැත්තාවූද සැප නැත්තාවූද උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයි. ඇවැත්නි, මේ සම්‍යක් සමාධියයි කියනු ලැබේ.

ඇවැත්නි, මේ දුක් නිරුද්ධ කිරීම පිණිස ගමන් කරන්නාවූ මාර්ගය නම්, ආර්‍යසත්‍යයයි කියනු ලැබේ.

තථාගතෙන ආවුසො, අරහතා සම්මාසම්බුද්ධෙන★ බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ★ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං★ සමණෙන වා බ්‍රාහ්මණෙන වා★ දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං ති★ යදිදං ඉමෙසං චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්ම'න්ති.★ ඉදමවොච ආයස්මා සාරිපුත්තො අත්තමනා තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දුන්ති.★

ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ විසින් බරණැස්නුවර සමීපයෙහිවූ මිගදාය නම් ඉසිපතනාරාමයෙහිදී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලෝකයෙහි කිසිවෙකු විසිනුත් නොපැවැත්විය හැකි නිරුත්තරවූ ධර්මචක්‍රය පවත්වන ලදි. එනම් මේ චතුරාර්‍යය සත්‍යයන්ගේ කීම, දෙසීම, පැනවීම, පිහිටුවීම, ප්‍රකාශ කිරීම, විභාග කිරීම, ප්‍රකට කිරීම යනුයි.

ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරතෙමේ මෙය ප්‍රකාශ කෙළේය. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ගේ වචනය සතුටින් පිළිගත්තාහුයි.

29. ආටානාටිය සුත්තං

ආටානාටිය සූත්‍රය

පඨමක භාණවාරෝ

එවං මෙ සුතං එකං සමයං භගවා★ රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ ★
අථ බො චත්තාරො මහාරාජා★ මහතියා ච යක්ඛ සෙනාය★ මහතියා ච ගන්ධබ්බ සෙනාය★ මහතියා ච කුම්භණ්ඩසෙනාය මහතියා ච නාගසෙනාය★ චතුද්දිසං රක්ඛං ඨපෙත්වා★ චතුද්දිසං ගුම්බං ඨපෙත්වා★ චතුද්දිසං ඔවරණං ඨපෙත්වා★ අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා★ කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා★යෙන භගවා තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා★ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.★

මා විසින් මෙසේ අසන ලදි. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි වූ ගිජ්ඣකූට පර්වතයෙහි වැඩ වාසය කරති. එකල්හි සතරවරම් මහ රජ දරුවෝ මහත් වූ යක්ෂ සේනාවෙන් ද, මහත් වූ ගාන්ධර්ව සේනාවෙන් ද, මහත් වූ කුම්භණ්ඩ සේනාවෙන් ද, මහත් වූ නාග සේනාවෙන් ද, සතර දිසාවෙහි ආරක්ෂා පිහිටුවා, සතර දිසාවෙහි බල සෙනග පිහිටුවා, සතර දිසාවෙහි රැකවල් දමා, රාත්‍රියේ ප්‍රථම භාගය ඉක්ම ගිය කල්හි (තමන්ගේ) ශරීර ආලෝකයෙන් හාත්පස ගිජ්ඣකූට පර්වතය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එතනට පැමිණියාහුය.

තෙපි බො යක්ඛා★ අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා★ එකමන්තං නිසීදිංසු.★
අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු,★ සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු,★ අප්පෙකච්චෙ යෙන භගවා★ තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු,★ අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු,★ අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු.★

පැමිණ භාග්‍යවතුන් වහන්සේට හොඳාකාර වැඳ එක පැත්තකින් හුන්නාහුය. ඒ යක්ෂයෝ ද සමහර කෙනෙක් භාග්‍යවතුන් වහන්සේට වැඳ එක පැත්තක හුන්නාහුය. සමහර කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූවාහුය. සතුටු වියයුතු, සිහිකටයුතු කථාව නිමකර එක පැත්තකින් හුන්නාහුය. සමහර කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ දෙසට දොහොත් මුදුන් දී වැඳ එක පැත්තකට වී හුන්නාහුය. සමහර කෙනෙක් නාම ගොත්‍රය කියා එක පැත්තක හුන්නාහුය.

එකමන්තං නිසින්නො බො වෙස්සවණ්‍ණො මහාරාජා★ භගවන්තං එතදවොච★ ''සන්ති හි භන්තෙ, උළාරා යක්ඛා භගවතො අප්පසන්නා.★ සන්ති හි භන්තෙ, උළාරා යක්ඛා භගවතො පසන්නා.★ සන්ති හි භන්තෙ, මජ්ඣිමා යක්ඛා භගවතො අප්පසන්නා.★ සන්ති හි භන්තෙ, මජ්ඣිමා යක්ඛා භගවතො පසන්නා.★ සන්ති හි භන්තෙ, නීචා යක්ඛා භගවතො අප්පසන්නා.★ සන්ති හි භන්තෙ, නීචා යක්ඛා භගවතො පසන්නා.★

එක පැත්තක හුන්නාවූ වෛශ්‍රවණ නම් වූ මහරජ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීයේය. ''ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේට අසතුටු වූ උසස් (බලවත්) යක්ෂයෝ ද ඇත්තාහුය. ''ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේට සතුටු වූ උසස් (බලවත්) යක්ෂයෝ ද ඇත්තාහුමය. ''ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේට අසතුටු වූ මධ්‍යම ආනුභාව ඇත්තාවූ යක්ෂයෝ ද ඇත්තාහුමය. ''ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේට සතුටු වූ මධ්‍යම ආනුභාව ඇත්තාවූ යක්ෂයෝ ද ඇත්තාහුමය. ''ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේට අසතුටු වූ පහත් වූ යක්ෂයෝ ද ඇත්තාහුමය. ''ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේට සතුටු වූ පහත් වූ යක්ෂයෝ ද ඇත්තාහුමය.

යෙහුය්‍යෙන බො පන, භන්තෙ, යක්ඛා★ අප්පසන්නා යෙව භගවතො.★ තං කිස්ස හෙතු? ★ භගවා හි, භන්තෙ, පාණාතිපාතා වෙරමණියා ධම්මං දෙසෙති,★ අදින්නාදානා වෙරමණියා ධම්මං දෙසෙති,★ කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ධම්මං දෙසෙති, මුසාවාදා වෙරමණියා ධම්මං දෙසෙති,★ සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණියා ධම්මං දෙසෙති.★

''ස්වාමීනී, බොහෝ සෙයින් යක්ෂයෝ භාග්‍යවතුන් වහන්සේට අසතුටු වූවාහුමය. එයට හේතු කවරේද? ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ වනාහි සතුන් මැරීමෙන් වැළකීම පිණිස ධර්මය දේශනා කරන්නාහ. සොරකම් කිරීමෙන් වැළකීම පිණිස ධර්මය දේශනා කරන්නාහ. කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීම පිණිස ධර්මය දේශනා කරන්නාහ. බොරු කීමෙන් වැළකීම පිණිස ධර්මය දේශනා කරන්නාහ. මත් බවට හා ප්‍රමාදයට කාරණා වූ සුරා පානයෙන් වැළකීම පිණිස ධර්මය දේශනා කරන්නාහ.

යෙහුය්‍යෙන බො පන, භන්තෙ, යක්ඛා★ අප්පටිවිරතා යෙව පාණාතිපාතා,★ අප්පටිවිරතා අදින්නාදානා,★ අප්පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා,★ අප්පටිවිරතා මුසාවාදා,★ අප්පටිවිරතා සුරාමෙරය මජ්ජපමාදට්ඨානා.★ තෙසං තං හොති අප්පියං අමනාපං.★

''ස්වාමීනි, බොහෝ සෙයින් යක්ෂයෝ සතුන් මැරීමෙන් නොවැළක්කාහුමය. සොරකම් කිරීමෙන් නොවැළක්කාහුමය. කාමයන්හි වරදවා හැසිරීමෙන් නොවැළක්කාහුමය. බොරු කීමෙන් නොවැළක්කාහුමය. මත් බවට හා ප්‍රමාදයට කාරණා වූ සුරා පානයෙන් නොවැළක්කාහුමය. ඒ යක්ෂයන්ට ඒ ධර්ම දේශනාව අප්‍රිය වේ. හිත් සතුටුවන්නේ නොවේ.

සන්ති හි භන්තෙ භගවතො සාවකා★ අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති★ අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලාන සා රුප්පානි.★

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවකයෝ කැලෑවෙහි වූ ද ගම් සීමාව ඉක්මවූ වන සේනාසන වූ ද (කැලෑවෙහි) ඉතා දුරවූ නිශ්ශබ්ද වූ ද කලබල නැත්තා වූ ද මිනිසුන්ගෙන් තොර වූ සුලඟ ඇත්තා වූ ද මනුෂ්‍යයන් ගේ රහස් කටයුතු වලට යොග්‍ය වූ ද, හිත එකඟ කර ගැනීමට සුදුසු වූ ද, සේනාසනයන් (වසන තැන්) සේවනය කරති.

තත්ථ සන්ති උළාරා යක්ඛා නිවාසිනො,★ යෙ ඉමස්මිං භගවතො පාවචනෙ අප්පසන්නා,★ තෙසං පසාදාය★ උග්ගණ්හාතු, භන්තෙ, භගවා★ ආටානාටියං රක්ඛං★ භික්ඛූනං භික්ඛුණීං★ උපාසකානං උපාසිකානං★ ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසු විහාරාය''ති.★ අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන★ අථ ඛො වෙස්සවණ්ණො මහාරාජා භගවතො අධිවාසනං විදිත්වා★ තායං වෙලායං ඉමං ආටානාටියං රක්ඛං අභාසි★

ඒ තන්හි නිතර වාසය කරන්නා වූ මහා බලසම්පන්න වූ යක්ෂයෝ ඇත්තාහුය. යම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාවෙහි නො සතුටු වන්නාහු ද ඔවුන් ගේ සතුට පිණිස ස්වාමීනි භික්ෂූන් ගේ ද භික්ෂුණීන් ගේ ද උපාසකවරුන් ගේ ද උපාසිකාවන් ගේ ද පාලනය පිණිස ද ආරක්ෂාව පිණිස ද වෙහෙස නොවන පිණිස ද පහසු හැසිරීම පිණිස ද භාග්‍යවතුන් වහන්සේ (ආටානාට නම් නගරයෙහි බඳින ලද හෙයින්) මේ ආටානාටිය (නම් වූ) පිරිත පිළිගත මැනව.''යි දැන්වූයේ ය. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව පිළිගත්හ. එවිට වෙසවුණු මහරජ තෙම භාග්‍යවතුන් වහන්සේ ගේ පිළිගැණීම දැන ඒ වේලාවෙහි මේ ආටානාටිය පිරිත කීයේය.

විපස්සිස්ස නමත්ථු, චක්ඛුමන්තස්ස සිරීමතො★
සිඛිස්ස'පි නමත්ථු, සබ්බභූතානුකම්පිනො★
වෙස්සභුස්ස නමත්ථු, නහාතකස්ස තපස්සිනො★
නමත්ථු කකුසන්ධස්ස, මාරසෙනා පමද්දිනො★
කොණාගමනස්ස නමත්ථු, බ්‍රාහ්මණස්ස වුසීමතො★
කස්සපස්ස නමත්ථු, විප්පමුත්තස්ස සබ්බධි★

අඞ්ගීරසස්ස නමත්ථු, සක්‍යපුත්තස්ස සිරීමතෝ★
යෝ ඉමං ධම්මමදෙසෙසි සබ්බදුක්ඛාපනූදනං★
යෙචාපි නිබ්බුතා ලොකෙ, යථාභූතං විපස්සිසුං★
තෙ ජනා අපිසුණා මහන්තා වීතසාරදා★
හිතං දෙවමනුස්සානං, යං නමස්සන්ති ගොතමං★
විජ්ජාචරණසම්පන්නං, මහන්තං වීතසාරදං★

පසැස් ඇත්තා වූ සොභාමත් වූ විපස්සි නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.
සියලු සත්වයන් කෙරෙහි පතළ කරුණාවෙන් යුක්ත වූ සිඛී නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා. කෙලෙස් විනාස කළාවූ කෙලෙසුන් තවන වීර්යය ඇති වෙස්සභූ නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.
මාරයන් යටත් කළාවූ කකුසඳ නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.
සියලු පව් අහක කළාවූ වැස නිමවන ලද බ්‍රහ්මචර්‍යය ඇති කොනාගමන නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.
සිය කෙලෙසුන්ගෙන් මිදුනාවූ කාශ්‍යප නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.
යම් තථාගත කෙනෙක් සියලු සංසාර දුක්දුරු කරන්නාවූ මේ ධර්මය දේශනා කළාහුද ශ්‍රීමත් වූ ද ශාක්‍ය පුත්‍ර වූ ඒ ගෞතම සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.
ලෝකයෙහි යම් රහත් කෙනෙක් පිරිනිවියාහුද තත්වූ පරිද්දෙන් දැක වදාළාහු ද ඒ රහත් වූ පිසුණු (අර්ථ නැති වචන) නොකියන්නාහ. මහත් බවට පැමිණියාහ. භය නැති කළහ. උන් වහන්සේලාට නමස්කාර වේවා. අෂ්ට විද්‍යා පසළොස්චරණයන්ගෙන් (නුවණ අට සහ චරණ පසලොසින්) යුක්ත වූ මහත් බවට පැමිණියාවූ භය නැති කළාවූ දෙවි මිනිසුන්ට හිතවූ යම් ගෞතම සර්වඥයන් වහන්සේ කෙනෙකුට නමස්කාර කෙරෙද්ද උන්වහන්සේට ද නමස්කාර වේවා.

යතො උග්ගච්ඡති සුරියො, ආදිච්චො මණ්ඩලි මහා★
යස්සවුග්ගච්ඡමානස්ස, සංවරීපි නිරුජ්ඣති★
යස්සවුග්ගතෙ සුරියෙ, දිවසො ති පවුච්චති★
රහදොපි තත්ථ ගම්හීරො, සමුද්දො සරිතොදකො★
එවං නං තත්ථ ජානන්ති, සමුද්දො සරිතොදකො★
ඉතො සා පුරිමා දිසා, ඉති නං ආචික්ඛති ජනො★

දිලිසෙන මහත් මණ්ඩල ඇති, සූර්‍යය තෙම යම් තැනකින් උදාවේද, යමෙක් උදාවන කල්හි රාත්‍රිය ද අන්තර්ධානවේද,
යම් දිසාවකින් හිරු උදාවූ කල්හි දවස යයි කියනු ලැබේද, එහි ගැඹුරු වූ පැතුරුණා වූ ජලය ඇති සමුද්‍රයයි කියන ලද දිය විලෙක් ද ඇත්තේය.
ඒ ස්ථානයෙහි පැතුරුණාවූ ජලය ඇති ඒ දිය විල සමුද්‍රයයි, මෙසේ දනිත්. මේ නිසා ඒ දිසාවට නැගෙනහිර දිසාව යයි ජනයා කියන්නේය.

යං දිසං අභිපාලෙති, මහාරාජා යසස්සි සො★
ගන්ධබ්බානං ආධිපති, ධතරට්ඨො ඉති නාම සො★
රමතී නච්චගීතෙහි, ගන්ධබ්බෙහි පුරක්ඛතො★
පුත්තා'පි තස්ස බහවො, එකනාමා'ති මෙ සුතං★

අසීතිං දස එකො ච, ඉන්දනාමා මහබ්බලා★
තෙ චාපි බුද්ධං දිස්වාන, බුද්ධං ආදිච්චබන්ධුනං★
දූරතො'ව නමස්සන්ති, මහන්තං වීතසාරදං★
නමො තෙ පුරිසාජඤ්ඤ, නමො තෙ පුරිසුත්තම★

යස පිරිවර ඇත්තාවූ ඒ මහරජ තෙම යම් දිසාවක් ආරක්ෂා කෙරේද, ගාන්ධර්වයන්ට අධිපති වූ ඔහු ධතරාෂ්ට්‍රය නම් වන්නේය. ඒ මහරජ තෙම ගාන්ධර්වයන් විසින් පිරිවරණ ලද්දේ නැටුම් ගී කීම්වලින් සිත් අලවා වෙසෙයි. ඉන්ද්‍රය යන නම් ඇත්තාවූ මහත් බල ඇත්තා වූ අනූඑක්දෙනෙක් පමණ වූ ඔහුගේ සමාන නම් ඇත්තාවූ බොහෝ පුත්‍රයෝ ද ඇත්තාහයි මා විසින් අසන ලදි.
ඔවුහු ද මහත් බවට පැමිණියාවූ විශාරද බුද්ධ නම්වූ (සූයම්වංශයෙහි උපන් හෙයින්) ආදිච්චබන්ධු නම්වූ සර්වඥයන් වහන්ස, ශ්‍රේෂඨ පුරුෂයන් වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවයි කියා දුරදීම නමස්කාර කරති.

කුසලෙන සමෙක්ඛසි, අමනුස්සාපි තං වන්දන්ති★
සුතං නෙ'තං අභිණ්හසො, තස්මා එවං වදෙමසෙ★
පීනං වන්දථ ගොතමං, පීනං වන්දාම ගොතමං★
විජ්ජාචරණසම්පන්නං, බුද්ධං වන්දාම ගොතමං★

දක්ෂවූ සර්වඥතාඥානයෙන් මහජනයා බලන්නෙහි යයි කියා අමනුෂ්‍යයෝ ද නුඹවහන්සේට වදිති. මේ වැඳීම අප විසින් නැවත නැවත අසන ලදි. එහෙයින් මෙසේ කියමිහ. ගෞතම නම් වූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරවුදැයි (අප විසින් විචාරණ ලද යක්ෂයෝ) ගෞතම සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හයි (කියති.) විද්‍යාචරණ (නුවණ හා සීල සමාධි) ගුණයෙන් යුක්ත වූ ගෞතම බුදුන් වහන්සේට අපි නමස්කාර කරම්හයි (කීවාහුය.)

යෙන පෙතා පවුච්චන්ති, පිසුණා පිට්ඨිමංසිකා★
පාණාතිපාතිනො ලුද්දා, චොරා නෙකතිකා ජනා★
ඉතො සා දක්ඛිණා දිසා, ඉති නං ආචික්ඛති ජනො★
යං දිසං අභිපාලෙති, මහාරාජා යසස්සි සො★
කුම්භණ්ඩානං ආධිපති, විරූළ්හො ඉති නාම සො★
රමති නච්චගීතෙහි, කුම්භණ්ඩෙහි පුරක්ඛතො★
පුත්තා'පි තස්ස බහවො, එකනාමා'ති මෙ සුතං★
අසීතිං දස එකො ච, ඉන්දනාමා මහබ්බලා★
තෙ චාපි බුද්ධං දිස්වාන, බුද්ධං ආදිච්ච බන්ධුනං★
දූරතො'ව නමස්සන්ති, මහන්තං වීතසාරදං★
නමො තෙ පුරිසාජඤ්ඤ, නමො තෙ පුරිසුත්තම★

යම් දිශාවකින් මළමිනී ගෙන යනු ලැබෙත් ද? පිසුණු (කේලාම්) කියන්නාවූ ඉදිරිපිට නැති තැන නින්දා කරන්නාවූ, ප්‍රාණඝාත කරන ගත ඇති රෞද්‍ර වූ සොරසිත්

ඇත්තාවූ වඤ්චාකාරී වූ ජනයෝ (යම් දිශා භාගයකින් ගෙන යනු ලැබෙතියි කියත් ද) යස පිරිවර ඇත්තාවූ ඒ මහරජ තෙම යම් දිශාවක් ආරක්ෂා කෙරේද ජන තෙම ඒ දිශාවට දකුණු දිශාව යයි කියන්නේය. මෙයින් ඒ දිශාව දකුණු දිශා නම් වන්නීය. කුම්භාණ්ඩයන්ට අධිපති වූ ඔහු විරූඪ නම් වන්නේය. ඒ මහරජ තෙම කුම්භාණ්ඩයන් විසින් පිරිවරණ ලද්දේ නැටුම් ගී කීම්වලින් සිත් අලවා වෙසෙයි. ඒ රජහුගේ එක නම් ඇති බොහෝ වූ පුත්‍රයෝ ද ඇත්තාහයි මා විසින් අසන ලදි. මහත් බල ඇති ඉන්ද්‍ර යන නම් ඇත්තාවූ ඔව්හූද අනූඑක්දෙනෙක් වන්නාහ. ඒ පුත්‍රයෝ ද ආදිච්චබන්ධු වූ මහත් බවට පැමිණියාවූ පහවූ භය ඇති සර්වඥයන් වහන්සේ දැක දුරදීම පුරුෂ ශ්‍රේෂඨයන් වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවා, පුරුෂ උත්තමයන් වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවා, යි කියා නමස්කාර කරති.

කුසලෙන සමෙක්ඛසි,★ අමනුස්සාපි තං වන්දන්ති සුතං නෙ'තං අභිණ්හසො,★
තස්මා එවං වදෙමසෙ★ජිනං වන්දථ ගොතමං,★ ජිනං වන්දාම ගොතමං★
විජ්ජාචරණසම්පන්නං, බුද්ධං වන්දාම ගොතමං★

සර්වඥතාඥානයෙන් ලෝකයා බලන සේක (එහෙයින්) අමනුෂ්‍යයෝ ද නුඹවහන්සේට වඳිති. මේ වචනය අප විසින් නැවත නැවත අසන ලදි. එහෙයින් මෙසේ කියමිහ. ගෞතම නම් වූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරවුදැයි (අසම්හ එසේ අප විසින් විචාරණ ලද යක්ෂයෝ) ගෞතම සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හයි (කියති.) විද්‍යාචරණ (නුවණ හා සීල සමාධි) ගුණයෙන් යුක්ත වූ ගෞතම බුදුන් වහන්සේට අපි නමස්කාර කරම්හයි (කීවාහුය.)

යත්ථ වොග්ගච්ඡති සුරියො, ආදිච්චො මණ්ඩලි මහා★
යස්ස වොග්ගච්ඡමානස්ස, දිවසො'පි නිරුජ්ඣති★
යස්ස වොග්ගතෙ සුරියෙ, සංවරී'ති පවුච්චති★
රහදොපි තත්ථ ගම්භීරො, සමුද්දො සරිතොදකො★
එවං නං තත්ථ ජානන්ති, සමුද්දො සරිතොදකො★
ඉතො සා පච්ඡිමා දිසා, ඉති නං ආචික්ඛති ජනො★

යම් දිශාවෙක්හි දිලිසෙන මහත් මණ්ඩල ඇති, සූයෑයා බැසයයිද, සූයෑයා බැස ගිය කල්හි දවල් කාලය නැතිවේද, යම් සූයෑයෙකු බැස ගිය කල්හි රාත්‍රියයි කියනු ලැබේද, ඒ සූයෑයා බැස ගිය තන්හි (ඇත්තාවූ) ඒ විල ගැඹුරු වූ පැතුරුණා වූ ජලය ඇති සමුද්‍රය නම් වන්නේය. ඒ සූයෑයා බැස ගිය තන්හි (ඇත්තාවූ) ඒ විල පැතුරුණාවූ ජලය ඇත්තා වූ සමුද්‍රයයි දනිති. මෙයින් ඒ දිශාව බස්නාහිර දිශාව යයි ජනයා කියන්නේය.

යං දිසං අභිපාලෙති, මහාරාජා යසස්සි සො★
නාගානං ආධිපති, විරූපක්ඛො ඉති නාම සො★
රමති නච්චගීතෙහි, නාගෙහි පුරක්ඛතො★

පුත්තා'පි තස්ස බහවෝ, එකනාමා'ති මෙ සුතං★
අසීතිං දස එකෝ ච, ඉන්දනාමා මහබ්බලා★
තෙ චාපි බුද්ධං දිස්වාන, බුද්ධං ආදිච්චබන්ධුනං★
දූරතෝ'ව නමස්සන්ති, මහන්තං වීතසාරදං★
නමෝ තෙ පුරිසාජඤ්ඤ, නමෝ තෙ පුරිසුත්තම★

යස පිරිවර ඇත්තාවූ යම් මහරජෙක් ඒ දිශාව ආරක්ෂා කෙරේද, නාගයන්ට අධිපති වූ විරූපාක්ෂ නම් වූ ඒ චරම්රජ තෙම නාගයන් විසින් පිරිවරණ ලද්දේ නැටුම් ගී කිම්වලින් සිත් අලවා වෙසෙයි. ඒ චරම් රජහුගේ එක නම ඇති බොහෝ වූ පුත්‍රයෝ ද ඇත්තාහයි මා විසින් අසන ලදි. මහත් බල ඇත්තා වූ ඉන්ද්‍ර නම් ඔවුහු අනූඑක්දෙනෙක් වන්නාහ. ඔව්හූ ද සූර්‍යවංශයට නෑ වූ මහත් බවට පැමිණියාවූ පහවූ භය ඇති සර්වඥයන් වහන්සේ දැක දුරදීම පුරුෂ ශ්‍රේෂ්ඨයන් වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවා, පුරුෂොත්තමයන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා යි නමස්කාර කරත්.

කුසලෙන සමෙක්ඛසි,★ අමනුස්සාපි තං වන්දන්ති සුතං නෙ'තං අභිණ්හසෝ,★
තස්මා එවං වදෙමසෙ ජිනං වන්දථ ගොතමං, ජිනං වන්දාම ගොතමං★
විජ්ජාචරණසම්පන්නං, බුද්ධං වන්දාම ගොතමං ති★

දක්ෂවූ සර්වඥතාඥානයෙන් ජනයා බලන්නෙහි යයි කියා අමනුෂ්‍යයෝ ද නුඹවහන්සේට වඳිති. මේ වැඳීම අප විසින් නැවත නැවත අසන ලදි. එහෙයින් මෙසේ කියමිහ. (තෙපි) ගෞතම නම් වූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරවුදැයි (අප විසින් අසන ලද යක්ෂයෝ) ගෞතම නම් සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හ. ඒ විද්‍යාචරණ (නුවණ හා සීල සමාධි) ගුණයෙන් යුක්ත වූ ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හයි කියති.

යෙන උත්තරකුරූ රම්මා, මහානෙරු සුදස්සනෝ★
මනුස්සා තත්ථ ජායන්ති, අමමා අපරිග්ගහා★
න තෙ බීජං පවපන්ති, නපි නීයන්ති නඞ්ගලා★
අකට්ඨපාකිමං සාලිං, පරිභුඤ්ජන්ති මානුසා★
අකණං අථුසං සුද්ධං සුගන්ධං තණ්ඩුලප්ඵලං★
තුණ්ඩිබීරෙ පචිත්වාන, තතෝ භුඤ්ජන්ති භොජනං★

යම් දිසාවෙක් හිරමය්‍යවූ උතුරු කුරු දිවයින පිහිටියේද දැකුම් කටයුතුවූ මහාමෙරු පර්වතය වන්නේද, ඒ උතුරු කුරු දිවයිනෙහි වස්ත්‍රාභරණාදිය මගේය මගේය යයි ගැනීමක් නැත්තාහු භාය්‍යාපග්‍රහයක් (භාය්‍යාවන් අයත් කර ගැන්මක්) නැත්තා වූ මනුෂ්‍යයෝ උපදිත්. ඒ මිනිස්සු වී නො වපුරන්නාහ. සීසෑම පිණිස නගුල් කෙතට නොගෙනියත්. ඒ මනුෂ්‍යයෝ නොසානා ලද භූමියෙහි හට ගෙණ පැසුණා වූ ඇල්

සාල් බත් අනුභව කරත්. කුඩු නැත්තාවූද පොතු නැත්තාවූද පිරිසිදු වූ සුවඳ ඇති සහල් ඵල කොට ඇතිහැල් රන් සැළියෙහි ලා (ජොතිපාසාණ නම් ගල් උණුසුමෙන්) පිස ඒ සැළියෙන් ගත් කෑම කති.

ගාවිං එකබුරං කත්වා, අනුයන්ති දිසොදිසං★
පසුං එකබුරං කත්වා, අනුයන්ති දිසොදිසං★
ඉත්ථීවාහනං කත්වා, අනුයන්ති දිසොදිසං★
පුරිසවාහනං කත්වා, අනුයන්ති දිසොදිසං★
කුමාරීවාහනං කත්වා, අනුයන්ති දිසොදිසං★
කුමාරවාහනං කත්වා, අනුයන්ති දිසොදිසං★

ඔව්හු ගවදෙනෙකු එක් කුර ඇති වාහනයක් කොට දිසානුදිසාවන් හි සංචාරය කරති.
සිව්පාසතෙකු එක් කුර ඇති වාහනයක් කොට දිසානුදිසාවන් හි සංචාරය කරති.
ස්ත්‍රියක් වාහනය කොට දිසානුදිසාවන් හි සංචාරය කරති.
පුරුෂයෙකු හෝ වාහනය කොට දිසානුදිසාවන් හි සංචාරය කරති.
තරුණියක් වාහනය කොට දිසානුදිසාවන් හි සංචාරය කරති.
තරුණයෙක් වාහනය කොට දිසානුදිසාවන් හි සංචාරය කරති.

තෙ යානෙ අභිරුහිත්වා, සබ්බා දිසා අනුපරියන්ති පචාරා තස්ස රාජිනොා★
හත්ථියානං අස්සයානං, දිබ්බං යානං උපට්ඨිතං★
පාසාදා සිවිකාවෙ'ව, මහාරාජස්ස යසස්සිනොා★

ඒ වෙසවුණු මහ රජුහුගේ පිරිවර යක්ෂයෝ හස්ත්‍යශ්වාදී අනේක ප්‍රකාර වූ වාහනවල නැගී සියලු දිසා භාගයෙහි වටකොට ඇවිදිති.
යස පිරිවර ඇත්තාවූ වෙසවුණු මහරජ හට ඇත් යානද, අස්ව යානද, දිව්‍ය යානාද, ප්‍රාසාදද, සිවිගෙවල්ද, උඩුමහල් ගෙවල්ද, රන්සිවිගෙවල්දැවි වන්නාහ.

තස්ස ච නගරා අහූ, අන්තලික්ඛෙ සුමාපිතා★
ආටානාටා කුසිනාටා පරකුසිනාටා, නාටපුරියා පරකුසිතනාටා★
උත්තරෙන කපීවන්තො, ජනොඝ මපරෙන ච★
නවනවතියො අම්බර අම්බරවතියො, ආළකමන්දා නාම රාජධානි★
කුවෙරස්ස ඛො පන, මාරිස, මහාරාජස්ස විසාණා නාම රාජධානි★
තස්මා කුවෙරො මහාරාජා, වෙස්සවණොා ති පවුච්චති★
පච්චෙසන්තො, පකාසෙන්ති, තතොලා තත්තලා තතොතලා ඔජසි තෙජසි තතොජසි, සුරො රාජා අරිට්ඨො නෙමි★

රහදෝ'පි තත්ථ ධරණී නාම,★ යතෝ මෙඝා පවස්සන්ති වස්සා යතෝපතායන්ති,★ සභා'පි තත්ථ භගලවතී නාම යත්ථ යක්ඛා පයිරුපාසන්ති★

ඒ රජහට අහස්හි (උස ස්ථානවල හෝ උසට) මොනවට මවන ලද නගරයෝ වූවාහුය. ආටානාට නම් වූ නුවරෙකි, කුසිනාට නම් වූ නුවරෙකි, පරකුසිනාට නම් වූ නුවරෙකි, නාටපුරිය නම් වූ නුවරෙකි, පරකුසිතනාට නම් වූ නුවරෙක් ද විය. උතුරු දිශාවෙන් කපිවන්ත නම් නුවරෙකි. ඊට බස්නාහිර දිසාවෙහි ජනොඝ නම් වූ නුවරෙකි, නවනවුතියය නම් වූ නුවරෙකි, අම්බරඅම්බරවතිය නම් වූ නුවරෙකි, හා ආළකමන්දා නම් රාජධානිය ද වන්නාහුය. ''නිදුකාණන් වහන්ස, කුවේර නම් මහරජහුගේ විසාණා නම් රාජධානියක් ද ඇත්තිය. ඒ කාරණයෙන් කුවේර නම් මහරජ තෙම වෛශ්‍රවණ යයි කියනු ලැබේ.
වෙන් වශයෙන් කරුණු පරීක්ෂාකර කියන්නාවූ තතොලා නම් යක්ෂයෙකි, තත්තලා නම් යක්ෂයෙකි, තතොතලා නම් යක්ෂයෙකි, ඔජසි නම් යක්ෂයෙකි, තෙජසි නම් යක්ෂයෙකි, තතොජසි නම් යක්ෂයෙකි, සූරෝ නම් යක්ෂයෙකි, රාජ නම් යක්ෂයෙකි, (එකෙක් සූරෝරාජා, සූරරාජා නම් යක්ෂයෙකි,) අරිට්ඨ නම් යක්ෂයෙකි, නෙමි නම් යක්ෂයෙකි යන යක්ෂයෝ දොළොස් දෙනෙක් වෙති.
යමකින් ජලය ගෙන වර්ෂාව වසී ද, වර්ෂාව යමකින් පැතිරේද, ඒ විෂාණා රාජධානියෙහි වූ පණස් යොදුන් පමණ වූ විල ධරණී නම් වන්නීය. ඒ විල අද්දර යක්ෂයෝ නිතර රැස්වන දොළොස් යොදුන් රත්න සභා ශාලාව භගලවතී නම් වන්නීය.

තත්ථ නිච්චඵලා රුක්ඛා, නානාදිජගණායුතා,★
මයූර කොඤ්චාභිරුදා කොකිලාභි හි වග්ගුභි★
ජීවංජීවකසද්දෙත්ථ, අථෝ ඔට්ඨව චිත්තකා★ කුකුත්ථකා කුළීරකා★
වනෙ පොක්ඛරසාතකා★ සුකසාළික සද්දෙ'ත්ථ,
දණ්ඩමාණවකානි ච★
සොභති සබ්බකාලං සා, කුවෙර නළිනී සදා★

ඒ ශාලාව වටා නිතර ගෙඩි ඇත්නාවූද, නොයෙක් කුරුළු සමූහයාගෙන් ගැවසුණාවූද, මොනරුන් කොස්වාලිහිනින් හා කෝකිල ආදී පක්ෂීන් විසින් ද පවත්වන ලද සිත් පිනවන නාද ඇති වෘක්ෂයෝ ඇත්තාහ. තවද පොකුණෙහි නාද කරන ජීවඤ්ජීවක නම් කුරුල්ලෝ ද උට්ඨවචිත්තක නම් කුරුල්ලෝද වන කුකුලෝද පියුම් වනයෙහි රන්වන් කකුළුවෝ ද තල් රෙහෙරු ද හැසිරෙන්නාහය.
මේ පොකුණෙහි ගිරා සැළලිහිණින්ගේ ශබ්ද ඇත්තේ ය. දණ්ඩමාණවක නම් පක්ෂීහු ද හැසිරෙන්නාහ.
ඒ කුවේර නම් මහ රජහුගේ පොකුණ හැමකල්හි එකම ආකාරයෙන් බබලන්නීය.

ඉතෝ සා උත්තරා දිසා, ඉති නං ආචික්ඛති ජනෝ★
යං දිසං අභිපාලෙති, මහාරාජා යසස්සි සෝ★

යක්ඛානං ආධිපති, කුවෙරෝ ඉති නාම සෝ★
රමතී නච්චගීතෙහි, යක්ඛෙහි පුරක්ඛතෝ★
පුත්තා'පි තස්ස බහවෝ, එකනාමා'ති මෙ සුතං★
අසීතිං දස එකෝ ච, ඉන්දනාමා මහබ්බලා★
තෙ චාපි බුද්ධං දිස්වාන, බුද්ධං ආදිච්චබන්ධුනං★
දූරතෝ'ව නමස්සන්ති, මහන්තං වීතසාරදං★
නමෝ තෙ පුරිසාජඤ්ඤ, නමෝ තෙ පුරිසුත්තම★

යස පිරිවර ඇත්තාවූ ඒ මහරජතෙම යම් දිසාවක් ආරක්ෂා කෙරේද ඒ දිසාව උතුරු දිසාව යයි මෙසේ ජන තෙම ඒ දිසාවට කියන්නේය. ඒ රජහුගේ බොහෝ වූ පුත්‍රයෝ ද සමාන නම් ඇති ඇත්තාහයි මා විසින් අසන ලදි. මහත් බල ඇති ඉන්ද්‍ර යන නම් ඇත්තාවූ ඔවිහූ අනූඑක්දෙනෙක් වන්නාහ.
ඒ පුත්‍රයෝ ද ප්‍රබුද්ධ වූ ආදිච්චබන්ධු වූ මහත් බවට පැමිණියාවූ පහවූ භය ඇති සර්වඥයන් වහන්සේ දුරදීම දැක පුරුෂ ශ්‍රේෂඨයන් වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවා, පුරුෂ උත්තමයන් වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවා, යි කියා නමස්කාර කරති.

කුසලෙන සමෙක්ඛසි,★ අමනුස්සාපි තං වන්දන්ති සුතං නෙ'තං අභිණ්හසෝ,★
තස්මා එවං වදෙමසෙ පීනං වන්දථ ගොතමං, පීනං වන්දාම ගොතමං★
විජ්ජාචරණසම්පන්නං, බුද්ධං වන්දාම ගොතම'න්ති★

දක්ෂ වූ සර්වඥතාඥානයෙන් ලෝකයා බලන සේක (එහෙයින්) අමනුෂ්‍යයෝ ද නුඹවහන්සේට වඳිති. මේ වචනය අප විසින් නැවත නැවත අසන ලදි. එහෙයින් මෙසේ කියමිහ.
ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරවුදැයි (අසන ලද්දාවූ ඔවිහු) ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරම්හ. විද්‍යාචරණ (නුවණ හා සීල සමාධි) ගුණයෙන් යුක්ත වූ ගෞතම සර්වඥයන් වහන්සේට නමස්කාර කරම්හයි කියති.

අයං බො සා මාරිස, ආටානාටියා රක්ඛා★ භික්ඛූනං භික්ඛුණීං★ උපාසකානං උපාසිකානං★ ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසු විහාරාය''ති.★ යස්ස කස්ස චි, මාරිස,★ භික්ඛුස්ස වා භික්ඛුණියා වා★ උපාසකස්ස වා උපාසිකාය වා★ අයං ආටානාටියා රක්ඛා★ සුග්ගහිතා භවිස්සති සමත්තා පරියාපුතා★ තඤ්චෙ අමනුස්සෝ★

නිදුකාණන් වහන්ස, ඒ මේ ආටානාටිය පිරිත වනාහි භික්ෂූන්ගේද, භික්ෂුණීන්ගේ ද, උපාසකවරුන්ගේද, උපාසිකාවරුන්ගේද, උවදුරු වැළැක්ම පිණිස, ආරක්ෂාව පිණිස, හිංසා වැළැක්වීම පිණිස, සැපසේ විසීම පිණිස, නොවෙහෙසීම පිණිස ද, වන්නීය. නිදුකාණන් වහන්ස, යම්කිසි භික්ෂුවක් විසින් හෝ, භික්ෂුණියක් විසින් හෝ, උපාසකයෙකු විසින් හෝ, උපාසිකාවක් විසින් හෝ, ( ) ආටානාටිය නම් ආරක්ෂාව යහපත්ව ඉගෙන දැන ගන්නා ලද්දී ද, අක්ෂර පද නොපිරිහෙලා සම්පූර්ණකොට ඉගෙන ගන්නා ලද්දී ද, ඉදින් ඒ ආටානාටිය පිරිත ඉගෙන ගත්තාවූ ඔහු, යම් අමනුෂ්‍ය වූ,

යක්ඛො වා යක්ඛිණී වා★ යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා★ යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛපචාරො වා★ ගන්ධබ්බො වා ගන්ධබ්බී වා★ ගන්ධබ්බපොතකො වා ගන්ධබ්බපොතිකා වා★ ගන්ධබ්බමහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බපචාරො වා★ කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා★ කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩපොතිකා වා★ කුම්භණ්ඩමහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩපචාරො වා★ නාගො වා නාගිනී වා★ නාගපොතකො වා නාගපොතිකා වා★ නාගමහාමත්තො වා නාගපාරිසජ්ජො වා නාගපචාරො වා★ පදුට්ඨචිත්තො★ ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය,★ ඨිතං වා උපතිට්ඨෙය්‍ය,★ නිසින්නං වා උපනිසීදෙය්‍ය,★ නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය.★

යක්ෂයෙක් හෝ යක්ෂණියක් හෝ යක්ෂ පොතකයෙක් හෝ යක්ෂ පොතිකාවක් හෝ යක්ෂ මහාමාත්‍යයෙක් හෝ යක්ෂ පිරිසෙහි වූවෙක් හෝ යක්ෂ වැඩකරුවෙක් හෝ ගාන්ධර්වයෙක් හෝ ගාන්ධර්ව ස්ත්‍රියක් හෝ ගාන්ධර්ව පොතකයෙක් හෝ ගාන්ධර්ව පොතිකාවක් හෝ ගාන්ධර්ව මහාමාත්‍යයෙක් හෝ ගාන්ධර්ව පිරිසෙහි වූවෙක් හෝ ගාන්ධර්ව වැඩකරුවෙක් හෝ කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩියක් හෝ කුම්භාණ්ඩ පොතකයෙක් හෝ කුම්භාණ්ඩ පොතිකාවක් හෝ කුම්භාණ්ඩ මහාමාත්‍යයෙක් හෝ කුම්භාණ්ඩ පිරිසෙහි වූවෙක් හෝ කුම්භාණ්ඩ වැඩකරුවෙක් හෝ නාගයෙක් හෝ නාගිනියක් හෝ නාග පොතකයෙක් හෝ නාග පොතිකාවක් හෝ නාග මහාමාත්‍යයෙක් හෝ නාග පිරිසෙහි වූවෙක් හෝ නාග වැඩකරුවෙක් හෝ නපුරු සිත් ඇතිව, යන්නහු පසුපස්සේ යන්නේ හෝ වේද, සිටියහු ළඟ සිටින්නේ හෝ වේද, හිඳින්නහු ළඟ හිඳින්නේ හෝ වේද, නිදාගන්නහු ළඟ නිදාගන්නේ හෝ වේද,

න මෙ සො, මාරිස, අමනුස්සො ලභෙය්‍ය★ ගාමෙසු වා නිගමෙසු වා★ සක්කාරං වා ගරුකාරං වා.★ න මෙ සො, මාරිස, අමනුස්සො ලභෙය්‍ය★ ආළකමන්දාය රාජධානියා වත්ථුං වා වාසං වා★ න මෙ සො, මාරිස, අමනුස්සො ලභෙය්‍ය★ යක්ඛා නං සමිතිං ගන්තුං★ අපිස්සුනං මාරිස, අමනුස්සා★ අනවය්හම්පි නං කරෙය්‍යුං★ අවිවය්හං★ අපිස්සුනං මාරිස, අමනුස්සා★ අත්තාහි'පි

පරිපුණ්ණාහි පරිභාසාහි පරිභාසෙය්‍යුං★ අපිස්සුනං මාරිස, අමනුස්සා★ රිත්තං'පි පත්තං සීසෙ නික්කුජ්ජෙය්‍යුං★ අපිස්සුනං මාරිස, අමනුස්සා★ සත්තධා පිස්ස මුද්ධං ඵාලෙය්‍යුං★

නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙම මාගේ ගම්වල හෝ නියම් ගම්වල හෝ සත්කාරයක් හෝ ගරු කිරීමක් නොලබන්නේය.
නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙම මාගේ ආළකමන්දා නම් වූ රාජධානියෙහි වාසය කිරීමට තැනක් හෝ ස්ථිරවාසයක් හෝ නොලබන්නේය. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙම මාගේ යක්ෂයන්ගේ සමාගමට යන්ට ද නොලබන්නේය. නිදුකාණන් වහන්ස, තව ද ඔහු අමනුෂ්‍යයෝ අවාහවිවාහයන්ට නුසුදුස්සකු ද කරන්නාහුය. නිදුකාණන් වහන්ස, තව ද ඔහුට අමනුෂ්‍යයෝ ඔහුගේ ආත්මභාවය දක්වා සම්පූර්ණ පද ශබ්ද ඇති අපහාස වචන වලින් නින්දා කරන්නාහුය. නිදුකාණන් වහන්ස, තව ද ඔහුගේ හිසෙහි අමනුෂ්‍යයෝ හිස් වූ ලෝහ පාත්‍රයක් ද මුනින් නමන්නාහුය. නිදුකාණන් වහන්ස, තව ද ඔහුගේ හිස ද සත් කඩක් කොට පලන්නාහුය.

සන්තිහි, මාරිස, අමනුස්සා චණ්ඩා රුද්දා රභසා,★ තෙ නෙව මහාරාජානං ආදියන්ති★ න මහාරාජානං පුරිසකානං ආදියන්ති,★ න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති.★ තෙ බො තෙ මාරිස අමනුස්සා★ මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.★

නිදුකාණන් වහන්ස, රෞද්‍ර වූ නපුරු ගති ඇති එකට එක කරන්නාවූ අමනුෂ්‍යයෝ ඇත්තාහුය. ඒ අමනුෂ්‍යයෝ සතරවරම් රජ දරුවන්ගේ (වචනය) නොඅදහත්. සතරවරම් රජ දරුවන්ගේ අමාත්‍යයන්ගේ වචනය නොපිළිගනිති. යක් සෙනවියන් වෙනුවට සිටින්නන්ගේ වචනය නොපිළිගනිති. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යයෝ සතරවරම් මහරජදරුවන්ට අකීකරු වූයෝ යයි කියනු ලැබෙත්.

සෙය්‍යථාපි, මාරිස, රඤ්ඤෙද්‍දා මාගධස්ස විජිතෙ චොරා.★ තෙ නෙ'ව රඤ්ඤෙද්‍දා මාගධස්ස ආදියන්ති,★ න රඤ්ඤෙද්‍දා මාගධස්ස පුරිසකානං ආදියන්ති★ න රඤ්ඤෙද්‍දා මාගධස්ස පුරිසකානං පුරිසකානං ආදියන්ති★ තෙ බො තෙ මාරිස, මහා චොරා★ රඤ්ඤෙද්‍දා මාගධස්ස අවරුද්ධා නාම වුච්චන්ති.★

යම් සේ මගධ රටට අධිපති වූ රජහුගේ රටෙහි සොරු වෙත් ද, ඒ සොරු මගධ රටට අධිපති වූ රජහුගේ වචනය නොපිළිගනිති. මගධ රජහුගේ අමාත්‍යයන් ගේ වචනය නොපිළිගනිති. මගධ රජහුගේ අමාත්‍යයන් වෙනුවට සිටින පුරුෂයන් ගේ වචනය නොපිළිගනිති. නිදුකාණන් වහන්ස, ඒ මහ සොරහු වනාහි මගධ රජහට අකීකරු වූවෝ නම් වෙත් යයි කියනු ලැබෙත්.

එවමෙව බො, මාරිස, සන්තිහි අමනුස්සා චණ්ඩා රුද්දා රභසා,★ තෙ නෙව මහාරාජානං ආදියන්ති★ න මහාරාජානං පුරිසකානං ආදියන්ති,★ න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති.★

තෙ බො තෙ මාරිස අමනුස්සා★ මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.★

නිදුකාණන් වහන්ස, එපරිද්දෙන්ම නපුරු ගති ඇති ෘද්‍ර වූ එකට එක කරන්නාවූ අමනුෂ්‍යයෝ ඇත්තාහුය. ඒ අමනුෂ්‍යයෝ සතරවරම් මහරජදරුවන්ගේ වචනය නොපිළිගනිත්. වරම් රජ දරුවන්ගේ සෙනවියන්ගේ වචනය නොපිළිගනිති. වරම් රජ දරුවන්ගේ සෙනවියන් වෙනුවට සිටින පුරුෂයන්ගේ වචනය,නොපිළිගනිති. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යයෝ වරම් රජදරුවන්ට අකීකරු වූයෝ යයි කියනු ලැබෙත්.

යොහි කොචි, මාරිස, අමනුස්සො★ යක්ඛො වා යක්ඛිණී වා★ යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා★ යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛපචාරො වා★ ගන්ධබ්බො වා ගන්ධබ්බී වා★ ගන්ධබ්බපොතකො වා ගන්ධබ්බපොතිකා වා★ ගන්ධබ්බමහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බපචාරො වා★ කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා★ කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩපොතිකා වා★ කුම්භණ්ඩමහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩපචාරො වා★ නාගො වා නාගිනී වා★ නාගපොතකො වා නාගපොතිකා වා★ නාගමහාමත්තො වා නාගපාරිසජ්ජො වා නාගපචාරො වා★ පදුට්ඨචිත්තො★ භික්ඛුං වා භික්ඛුණිං වා★ උපාසකං වා උපාසිකං වා★ ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය,★ ඨිතං වා උපතිට්ඨෙය්‍ය,★ නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය.★ ඉමෙසං යක්ඛානං මහායක්ඛානං★ සෙනාපතීනං මහාසෙනාපතීනං★ උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං විරවිතබ්බං★ අයං යක්ඛො ගණ්හාති,★ අයං යක්ඛො ආවිසති,★ අයං යක්ඛො හෙඨෙති,★ අයං යක්ඛො විහෙඨෙති,★ අයං යක්ඛො හිංසති★ අයං යක්ඛො විහිංසති ★අයං යක්ඛො න මුඤ්චතී'ති.★

නිදුකාණන් වහන්ස, යම්කිසි අමනුෂ්‍ය යක්ෂයෙක් හෝ යක්ෂණියක් හෝ යක්ෂ පොතකයෙක් හෝ යක්ෂ පොතිකාවක් හෝ යක්ෂ මහාමාත්‍යයෙක් හෝ යක්ෂ පිරිසෙහි වූවෙක් හෝ යක්ෂ වැඩකාරයෙක් හෝ ගාන්ධර්වයෙක් හෝ ගාන්ධර්ව ස්ත්‍රියක් හෝ ගාන්ධර්ව පොතකයෙක් හෝ ගාන්ධර්ව පොතිකාවක් හෝ ගාන්ධර්ව මහාමාත්‍යයෙක් හෝ ගාන්ධර්ව පිරිසෙහි වූවෙක් හෝ ගාන්ධර්ව වැඩකරුවෙක් හෝ කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩියක් හෝ කුම්භාණ්ඩ පොතකයෙක් හෝ කුම්භාණ්ඩ පොතිකාවක් හෝ කුම්භාණ්ඩ මහාමාත්‍යයෙක් හෝ කුම්භාණ්ඩ පිරිසෙහි වූවෙක් හෝ කුම්භාණ්ඩ වැඩකරුවෙක් හෝ නාගයෙක් හෝ නාගිනියක් හෝ නාග පොතකයෙක් හෝ නාග පොතිකාවක් හෝ නාග මහාමාත්‍යයෙක් හෝ නාග පිරිසෙහි

වූවෙක් හෝ නාග වැඩකරුවෙක් හෝ නපුරු සිත් ඇතිව, භික්ෂුවක් හෝ, භික්ෂුණියක් හෝ, උපාසකයෙකු හෝ, උපාසිකාවක් හෝ යන්නහු සමග පසුපස්සේ යන්නේ හෝ වේද, සිටියහු ළඟ සිටින්නේ හෝ වේද, හිඳින්නහු ළඟ හිඳින්නේ හෝ වේද, නිදාගන්නහු ළඟ නිදාගන්නේ හෝ වේද, මේ යක්ෂතෙම අල්වන්නේය. මේ යක්ෂතෙම ආවෙශ වන්නේය. මේ යක්ෂතෙම පීඩා කරන්නේය. මේ යක්ෂතෙම විශේෂයෙන් පීඩාකරන්නේය. මේ යක්ෂතෙම හිංසා කරන්නේය. මේ යක්ෂතෙම විශෙෂයෙන් හිංසා කරන්නේය. කියා ප්‍රධාන යක්ෂ වූ යක්ෂ සේනාවට අධිපති වූ එහෙයින් මම හා සේනාපතිවූ මේ යක්ෂයන්ට යක්ෂ තෙම නොහරනේ යයි ඝෝෂා කොට දැන්විය යුතුයි. ශබ්ද නගා කිය යුතුයි. මුරගා කිය යුතුයි.

කතමෙසං යක්ඛානං මහායක්ඛානං★ සෙනාපතීනං මහාසෙනාපතීනං★

ඉන්දෝ සොමෝ වරුණෝ ච, භාරද්වාජෝ පජාපති★
චන්දනෝ කාමසෙට්ඨෝ ච, කින්නුඝණ්ඩු නිඝණ්ඩු ච★
පනාදෝ ඔපමඤ්ඤෙදා ච, දෙවසූතෝ ච මාතලී★
චිත්තසෙනෝ ච ගන්ධබ්බෝ, නළෝ රාජා ජනෙසභෝ★
සාතාගිරෝ හෙමවතෝ, පුණ්ණකෝ කරතියෝ ගුළෝ★
සීවකෝ මුවලින්දෝ ච, වෙස්සාමිත්තෝ යුගන්ධරෝ★
ගොපාලෝ සුප්පගෙධෝ ච ★හිරිනෙත්ති ච මන්දියෝ,★
පඤ්චාලචණ්ඩෝ ආළවකෝ, පජ්ජුන්නෝ සුමනෝ සුමුඛෝ
දධිමුඛෝ★ මණි මාණි චරෝ දීඝෝ අථෝ සෙරිස්සකෝ සහා.★

කවර යක්ෂ කෙනෙකුන්ට, කවර මහා යක්ෂ කෙනෙකුන්ට, කවර සෙනවිරත් කෙනෙකුන්ට, කවර මහ සෙනවිරත් කෙනෙකුට ද යත්?

ඉන්ද්‍රය, සොමය, වරුණය, භාරද්වාජය, ප්‍රජාපතිය, චන්දනය, කාමසෙට්ඨය, කින්නුඝණ්ඩුය, නිඝණ්ඩුය, පණාදය, ඔපමඤ්ඤදය, දේවසූතය, මාතලිය, චිත්‍රසේනය, ගන්ධර්වය, නළය, රාජය, ජනෙසභය, සාතාගිරය, හෙමවතය, පුණ්ණාකය, කර්තියය, ගුලය, සීවකය, මුවලින්දය, විශ්වාමිත්‍රය, යුගන්ධරය, ගොපාලය, සුප්පගෙධය, හිරිය, නෙත්තිය, මන්දිය, පඤ්චාලචණ්ඩය, ආලවකය, පජ්ජුන්නය, සුමනය, සුමුබය, දධිමුබය, මනිමානීවරය, දීඝය (යන යක්ෂ සේනාධිපතිහුද) තවද මොවුන් හා එක්වූ සෙරිස්සක නම් යක්ෂයෙක් ද ඇත්තේය.

ඉමෙසං යක්ඛානං මහායක්ඛානං★ සෙනාපතීනං මහාසෙනාපතීනං★ උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං★ විරවිතබ්බං අයං යක්ඛෝ ගණ්හාති,★ අයං යක්ඛෝ ආවිසති,★ අයං යක්ඛෝ හෙඨෙති,★ අයං යක්ඛෝ විහෙඨෙති,★ අයං යක්ඛෝ හිංසති★ අයං යක්ඛෝ විහිංසති★ අයං යක්ඛෝ න මුඤ්චතී'ති.★

අයං බො සා මාරිස, ආටානාටියා රක්ඛා★ භික්ඛූනං භික්ඛුණීං උපාසකානං උපාසිකානං★ ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසු විහාරාය''ති.

මේ යක්ෂතෙම අල්වාගන්නේය. මේ යක්ෂතෙම ආවේශ වන්නේය. මේ යක්ෂතෙම පීඩා කරන්නේය. මේ යක්ෂතෙම විශේෂයෙන් පීඩාකරන්නේය. මේ යක්ෂතෙම හිංසා කරන්නේය. මේ යක්ෂතෙම අත් නොහරින්නේයයි කියා ප්‍රධාන යක්ෂ වූ, යක්ෂ සේනාපති වූ, මේ යක්ෂයන්ට මෙපරිද්දෙන් දැන්විය යුත්තේය. ඝෝෂා කොට දැන්විය යුත්තේය. ශබ්ද නගා කිය යුත්තේය. මුරගා කිය යුත්තේය.
නිදුකාණන් වහන්ස, ඒ මේ ආටානාටිය ආරක්ෂාව වනාහි භික්ෂූන් ගේ ද, භික්ෂුණීන් ගේ ද, උපාසකයන්ගේ ද, උපාසිකාවන් ගේ ආරක්ෂාව පිණිස ද, (යක්ෂොපද්‍රව වලින්) නොවෙහෙසීම පිණිස ද, සුවසේ විසීම පිණිස ද පවත්නේය.

හන්දච'දානි මයං, මාරිස, ගච්ඡාම★ බහුකිච්චා මයං බහුකරණීයා'ති★
යස්ස'දානි තුම්හෙ මහාරාජානො කාලං මඤ්ඤථා'ති★

අථ බො චත්තාරො මහාරාජා උට්ඨායාසනා★ භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු.★ තෙපි බො යක්ඛා උට්ඨායාසනා★ අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු.★ අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු,★ සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා තත්ථෙවන්තරධායිංසු.★ අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා★ තත්ථෙවන්තරධායිංසු.★ අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා තත්ථෙවන්තරධායිංසු.★ අප්පෙකච්චෙ තුණ්හීභූතා තත්ථෙවන්තරධායිංසූ'ති.★

නිදුකාණන් වහන්ස, අපි බොහෝ වැඩ කටයුතු ඇත්තම්හ. එබැවින් දැන් අපි යම්හයි භාග්‍යවතුන් වහන්සේට දැන් වූවාහුය. වරම්රජදරුවෙනි, තෙපි දැන් යම් ගමනක් සිතව්ද එයට කාලය බව දනිව් යයි වදාළ සේක.

ඉක්බිත්තෙන් සතරවරම් මහරජදරුවෝ උන් ආසනවලින් නැගිට භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කොට ප්‍රදක්ෂිණා කොට එතන්හිම අන්තර්ධාන වූවාහුය. ඒ (අනිකුත්) යක්ෂයෝද උන් ආසන වලින් නැගිට සමහර කෙනෙක් භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණු කොට එතන්හිම නොපෙනී ගියාහුය.
ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූවාහුය. සතුටු විය යුතු වූ සිහි කටයුතුවූ කථා පවත්වා එතන්හිම නොපෙනී ගියාහුය. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේට ඇඳිලි බැඳ නමස්කාර කොට එහිම අන්තර්ධාන වූවාහුය. ඇතැම් කෙනෙක් තමන්ගෙ නාම ගොත්‍ර කියා එතන්හිම අතුරුදහන් වූහ. සමහර කෙනෙක් තුෂ්ණීම්භූත වූවාහු (කිසිවක් නොකියා) එතන්හිම නොපෙනී ගියාහුය.

ආටානාටිය සුත්තං

ආටානාටිය සූත්‍රය

දුතියක භාණවාරං

අථ බො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි★

ඉමං භික්ඛවෙ රත්තිං චත්තාරො මහාරාජා★ මහතියා ච යක්ඛසෙනාය★ මහතියා ච ගන්ධබ්බසෙනාය★ මහතියා ච කුම්භණ්ඩසෙනාය★ මහතියා ච නාගසෙනාය★ චතුද්දිසං රක්ඛං ඨපෙත්වා★ චතුද්දිසං ගුම්බං ඨපෙත්වා★ චතුද්දිසං ඔවරණං ඨපෙත්වා★ අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා★ කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා★ යෙනාහං තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා★ මං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.★

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රියගේ ඇවෑමෙන් භික්ෂූන්ට කථා කළහ.

''මහණෙනි, මේ ඉකුත් රාත්‍රියෙහි සතරවරම් මහ රජ දරුවෝ මහත් වූ යක්ෂ සේනාවෙන් ද, මහත් වූ ගාන්ධර්ව සේනාවෙන් ද, මහත් වූ කුම්භාණ්ඩ සේනාවෙන් ද, මහත් වූ නාග සේනාවෙන් ද, සතර දිසාවෙහි ආරක්ෂා පිහිටුවා, සතර දිසාවෙහි බල සෙනග පිහිටුවා, සතර දිසාවෙහි රැකවල් දමා, රාත්‍රියේ ප්‍රථම භාගය ඉක්ම ගිය කල්හි (තමන්ගේ) ශරීර ආලෝකයෙන් හාත්පස ගිජ්ඣකූට පර්වතය බබුළුවා මම යම් තැනෙක ද එතනට පැමිණියාහුය.

තෙපි බො භික්ඛවෙ යක්ඛා★ අප්පෙකච්චෙ මං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.★
අප්පෙකච්චෙ මම සද්ධිං සම්මොදිංසු,★ සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු,★ අප්පෙකච්චෙ යෙනාහං★ තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු,★ අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු,★ අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු.★

පැමිණ මට හොඳාකාර වැඳ එක පැත්තකින් හුන්නාහුය. ඒ යක්ෂයෝ සමහර කෙනෙක් මට වැඳ එක පැත්තක හුන්නාහුය. සමහර කෙනෙක් මා සමග සතුටු වූවාහුය. සතුටු වියයුතු, සිහිකට යුතු කථාව නිමකර එක පැත්තකින් හුන්නාහුය. සමහර කෙනෙක් මා දෙසට දොහොත් මුදුන් දී වැඳ එක පැත්තකට වී හුන්නාහුය. සමහර කෙනෙක් නාම ගොත්‍රය කියා එක පැත්තක හුන්නාහුය.

එකමන්තං නිසින්නො බො භික්ඛවෙ වෙස්සවණ්‍ණො මහාරාජා මං එතදවොච★

''සන්ති හි හන්තෙ, උළාරා යක්ඛා භගවතො අප්පසන්නා.★ සන්ති හි හන්තෙ, උළාරා යක්ඛා භගවතො පසන්නා.★ සන්ති හි හන්තෙ, මජ්ඣිමා යක්ඛා භගවතො අප්පසන්නා.★ සන්ති හි හන්තෙ, මජ්ඣිමා යක්ඛා භගවතො පසන්නා.★ සන්ති හි හන්තෙ, නීචා යක්ඛා භගවතො අප්පසන්නා.★ සන්ති හි හන්තෙ, නීචා යක්ඛා භගවතො පසන්නා.★

එක පැත්තක හුන්නාවූ වෛශ්‍රවණ නම් වූ මහරජ තෙමෙ මට මේ කරුණ කීයේය.

''ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේට අසතුටු වූ උසස් (බලවත්) යක්ෂයෝ ද ඇත්තාහුය. ''ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේට සතුටු වූ උසස් (බලවත්) යක්ෂයෝ ද ඇත්තාහුමය. ''ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේට අසතුටු වූ මධ්‍යම ආනුභාව ඇත්තාවූ යක්ෂයෝ ද ඇත්තාහුමය. ''ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේට සතුටු වූ මධ්‍යම ආනුභාව ඇත්තාවූ යක්ෂයෝ ද ඇත්තාහුමය. ''ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේට අසතුටු වූ පහත් වූ යක්ෂයෝ ද ඇත්තාහුමය.
''ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේට සතුටු වූ පහත් වූ යක්ෂයෝ ද ඇත්තාහුමය.

යෙහුය්‍යෙන බො පන, හන්තෙ, යක්ඛා★ අප්පසන්නා යෙව භගවතො. තං කිස්ස හෙතු? ★ භගවා හි, හන්තෙ, පාණාතිපාතා වෙරමණියා ධම්මං දෙසෙති,★ අදින්නාදානා වෙරමණියා ධම්මං දෙසෙති,★ කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ධම්මං දෙසෙති,★ මුසාවාදා වෙරමණියා ධම්මං දෙසෙති,★ සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණියා ධම්මං දෙසෙති.★

''ස්වාමීනී, බොහෝ සෙයින් යක්ෂයෝ භාග්‍යවතුන් වහන්සේට අසතුටු වූවාහුමය. එයට හේතු කවරේද? ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ වනාහි සතුන් මැරීමෙන් වැළකීම පිණිස ධර්මය දේශනා කරන්නාහ. සොරකම් කිරීමෙන් වැළකීම පිණිස ධර්මය දේශනා කරන්නාහ. කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීම පිණිස ධර්මය දේශනා කරන්නාහ. බොරු කීමෙන් වැළකීම පිණිස ධර්මය දේශනා කරන්නාහ. මත් බවට හා ප්‍රමාදයට කාරණා වූ සුරා පානයෙන් වැළකීම පිණිස ධර්මය දේශනා කරන්නාහ.

යෙහුය්‍යෙන බො පන, හන්තෙ, යක්ඛා★ අප්පටිවිරතා යෙව පාණාතිපාතා,★ අප්පටිවිරතා අදින්නාදානා,★ අප්පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා,★ අප්පටිවිරතා මුසාවාදා,★ අප්පටිවිරතා

සුරාමෙරය මජ්ජපමාදට්ඨානා.★ තෙසං තං හොති අප්පියං අමනාපං.★

''ස්වාමීනී, බොහෝ සෙයින් යක්ෂයෝ සතුන් මැරීමෙන් නොවැළක්කාහුමය. සොරකම් කිරීමෙන් නොවැළක්කාහුමය. කාමයන්හි වරදවා හැසිරීමෙන් නොවැළක්කාහුමය. බොරු කීමෙන් නොවැළක්කාහුමය. මත් බවට හා ප්‍රමාදයට කාරණා වූ සුරා පානයෙන් නොවැළක්කාහුමය. ඒ යක්ෂයන්ට ඒ ධර්ම දේශනාව අප්‍රිය වේ. හිත් සතුටුවන්නේ නොවේ.

සන්ති හි භන්තෙ භගවතො සාවකා★ අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති★ අප්පසද්දානි අප්පනිග්ඝොසානි★ විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි.★

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවකයෝ කැලෑවෙහි වූ ද ගම් සීමාව ඉක්මවූ වන සේනාසන වූ ද (කැලෑවෙහි) ඉතා දුරවූ නිශ්ශබ්ද වූ ද කලබල නැත්තා වූ ද මිනිසුන්ගෙන් තොර වූ සුලඟ ඇත්තා වූ ද මනුෂ්‍යයන් ගේ රහස් කටයුතු වලට යෝග්‍ය වූ ද, හිත එකඟ කර ගැනීමට සුදුසු වූ ද, සේනාසනයන් (වසන තැන්) සේවනය කරති.

තත්ථ සන්ති උළාරා යක්ඛා නිවාසිනො,★ යෙ ඉමස්මිං භගවතො පාවචනෙ අප්පසන්නා,★ තෙසං පසාදාය★ උග්ගණ්හාතු, භන්තෙ, භගවා ආටානාටියං රක්ඛං★ භික්ඛූනං භික්ඛුණීං★ උපාසකානං උපාසිකානං★ ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසු විහාරාය'ති.★

අධිවාසෙසිං බො අහං භික්ඛවෙ තුණ්හීභාවෙන★ අථ බො භික්ඛවෙ වෙස්සවණ්ණො මහාරාජා මං අධිවාසනං විදිත්වා★ තායං වෙලායං ඉමං ආටානාටියං රක්ඛං අභාසි★

ඒ තන්හි නිතර වාසය කරන්නා වූ මහා බලසම්පන්න වූ යක්ෂයෝ ඇත්තාහුය. යම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවෙහි නො සතුටු වන්නාහු ද ඔවුන්ගේ සතුට පිණිස ස්වාමීනි භික්ෂූන්ගේ ද භික්ෂුණීන්ගේ ද උපාසකවරුන්ගේ ද උපාසිකාවන්ගේ ද පාලනය පිණිස ද ආරක්ෂාව පිණිස ද වෙහෙස නොවන පිණිස ද පහසු හැසිරීම පිණිස ද භාග්‍යවතුන් වහන්සේ (ආටානාට නම් නගරයෙහි බඳින ලද හෙයින්) මේ ආටානාටිය (නම් වූ) පිරිත පිළිගත මැනව.''යි දැන්වූයේ ය.

භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව පිළිගත්හ. එවිට වෙසවුණු මහරජ තෙම භාග්‍යවතුන් වහන්සේ ගේ පිළිගැණීම දැන ඒ වේලාවෙහි මේ ආටානාටිය පිරිත කීයේය.

විපස්සිස්ස නමත්ථු, චක්ඛුමන්තස්ස සිරීමතෝ★
සිඛිස්ස'පි නමත්ථු, සබ්බභූතානුකම්පිනෝ★
වෙස්සභුස්ස නමත්ථු, නහාතකස්ස තපස්සිනෝ★
නමත්ථු කකුසන්ධස්ස, මාරසෙනා පමද්දිනෝ★
කොණාගමනස්ස නමත්ථු, බ්‍රාහ්මණස්ස වුසීමතෝ★
කස්සපස්ස නමත්ථු, විප්පමුත්තස්ස සබ්බධි★
අඞ්ගීරසස්ස නමත්ථු, සක්‍යපුත්තස්ස සිරීමතෝ★
යෝ ඉමං ධම්මමදෙසෙසි සබ්බදුක්ඛාපනූදනං★
යෙවාපි නිබ්බුතා ලොකෙ, යථාභූතං විපස්සිසුං★
තෙ ජනා අපිසුණා මහන්තා වීතසාරදා★
හිතං දෙවමනුස්සානං, යං නමස්සන්ති ගොතමං★
විජ්ජාචරණසම්පන්නං, මහන්තං වීතසාරදං★

පසැස් ඇත්තා වූ සොභාමත් වූ විපස්සී නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.
සියලු සත්වයන් කෙරෙහි පතළ කරුණාවෙන් යුක්ත වූ සිඛී නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.
කෙලෙස් විනාස කළාවූ කෙලෙසුන් තවන වීර්යය ඇති වෙස්සභූ නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.
මාරයන් යටත් කළාවූ කකුසඳ නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.
සියලු පව් අහක කළාවූ වැස නිමවන ලද බ්‍රහ්මචර්‍යය ඇති කොනාගමන නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.
සිය කෙලෙසුන්ගෙන් මිදුනාවූ කාශ්‍යප නම් සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.
යම් තථාගත කෙනෙක් සියලු සංසාර දුක්දුරු කරන්නාවූ මේ ධර්මය දේශනා කළාහුද ශ්‍රීමත් වූ ද ශාක්‍ය පුත්‍ර වූ ඒ ගෞතම සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා. ලෝකයෙහි යම් රහත් කෙනෙක් පිරිනිවියාහුද තත්වූ පරිද්දෙන් දැක වදාළාහු ද ඒ රහත් වූ පිසුණු (අර්ථ නැති වචන) නොකියන්නාහ. මහත් බවට පැමිණියාහ. භය නැති කළහ. උන් වහන්සේලාට නමස්කාර වේවා.
අෂ්ට විද්‍යා පසළොස්චරණයන්ගෙන් (නුවණ අට සහ චරණ පසලොසින්) යුක්ත වූ මහත් බවට පැමිණියාවූ භය නැති කළාවූ දෙවි මිනිසුන්ට හිතවූ යම් ගෞතම සර්වඥයන් වහන්සේ කෙනෙකුට නමස්කාර කෙරෙද්ද උන්වහන්සේට ද නමස්කාර වේවා.

යතෝ උග්ගච්ඡති සුරියෝ, ආදිච්චෝ මණ්ඩලී මහා★
යස්සවුග්ගච්ඡමානස්ස, සංවරීපි නිරුජ්ඣති★
යස්සවුග්ගතෙ සුරියෙ, දිවසෝ ති පවුච්චති★
රහදොපි තත්ථ ගම්භීරෝ, සමුද්දෝ සරිතොදකෝ★
එවං නං තත්ථ ජානන්ති, සමුද්දෝ සරිතොදකෝ★
ඉතෝ සා පුරිමා දිසා, ඉති නං ආචික්ඛති ජනෝ★

දිලිසෙන මහත් මණ්ඩල ඇති, සූයශීය තෙම යම් තැනකින් උදාවේද, යමෙක් උදාවන කල්හි රාත්‍රිය ද අන්තර්ධානවේද,
යම් දිසාවකින් හිරු උදාවූ කල්හි දවස යයි කියනු ලැබේද, එහි ගැඹුරු වූ පැතුරුණා වූ ජලය ඇති සමුද්‍රයයි කියන ලද දිය විලෙක් ද ඇත්තේය.
ඒ ස්ථානයෙහි පැතුරුණාවූ ජලය ඇති ඒ දිය විල සමුද්‍රයයි, මෙසේ දනිත්. මේ නිසා ඒ දිසාවට නැගෙනහිර දිසාව යයි ජනයා කියන්නේය.

යං දිසං අභිපාලෙති, මහාරාජා යසස්සි සෝ★
ගන්ධබ්බානං ආධිපති, ධතරට්ඨෝ ඉති නාම සෝ★
රමතී නච්චගීතෙහි, ගන්ධබ්බෙහි පුරක්ඛතෝ★
පුත්තා'පි තස්ස බහවෝ, එකනාමා'ති මේ සුතං★
අසීතිං දස එකෝ ච, ඉන්දනාමා මහබ්බලා★
තෙ චාපි බුද්ධං දිස්වාන, බුද්ධං ආදිච්චබන්ධුනං★
දූරතෝ'ව නමස්සන්ති, මහන්තං වීතසාරදං★
නමෝ තෙ පුරිසාජඤ්ඤ, නමෝ තෙ පුරිසුත්තම★

යස පිරිවර ඇත්තාවූ ඒ මහරජ තෙම යම් දිසාවක් ආරක්ෂා කෙරේද, ගාන්ධර්වයන්ට අධිපති වූ ඔහු ධතරාෂ්ට්‍රය නම් වන්නේය. ඒ මහරජ තෙම ගාන්ධර්වයන් විසින් පිරිවරණ ලද්දේ නැටුම් ගී කීම්වලින් සිත් අලවා වෙසෙයි.
ඉන්ද්‍රය යන නම් ඇත්තාවූ මහත් බල ඇත්තා වූ අනූඑක්දෙනෙක් පමණ වූ ඔහුගේ සමාන නම් ඇත්තාවූ බොහෝ පුත්‍රයෝ ද ඇත්තාහයි මා විසින් අසන ලදි.
ඔවුහු ද මහත් බවට පැමිණියාවූ විශාරද බුද්ධ නම්වූ (සූයශීවංශයෙහි උපන් හෙයින්) ආදිච්චබන්ධු නම්වූ සර්වඥයන් වහන්ස, ශ්‍රේෂඨ පුරුෂයන් වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවයි කියා දුරදීම නමස්කාර කරති.

කුසලෙන සමෙක්ඛසි, අමනුස්සාපි තං වන්දන්ති★
සුතං නෙ'තං අභිණ්හසෝ, තස්මා එවං වදෙමසෙ★
පිනං වන්දථ ගොතමං, පිනං වන්දාම ගොතමං★
විජ්ජාචරණසම්පන්නං, බුද්ධං වන්දාම ගොතමං★

දක්ෂවූ සර්වඥතාඥානයෙන් මහජනයා බලන්නෙහි යයි කියා අමනුෂ්‍යයෝ ද නුඹවහන්සේට වඳිති. මේ වැඳීම අප විසින් නැවත නැවත අසන ලදි. එහෙයින් මෙසේ කියමිහ. ගෞතම නම් වූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරවුදැයි (අප විසින් විචාරණ ලද යක්ෂයෝ) ගෞතම සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරමිහයි (කියති.) විද්‍යාචරණ (නුවණ හා සීල සමාධි) ගුණයෙන් යුක්ත වූ ගෞතම බුදුන් වහන්සේට අපි නමස්කාර කරමිහයි (කීවාහුය.)

යෙන පෙතා පවුච්චන්ති, පිසුණා පිට්ඨිමංසිකා★
පාණාතිපාතිනෝ ලුද්දා, චොරා නෙකතිකා ජනා★
ඉතෝ සා දක්ඛිණා දිසා, ඉති නං ආචික්ඛති ජනෝ★
යං දිසං අභිපාලෙති, මහාරාජා යසස්සි සෝ★

කුම්භණ්ඩානං ආධිපති, විරූළ්හො ඉති නාම සො★
රමති නච්චගීතෙහි, කුම්භණ්ඩෙහි පුරක්ඛතො★
පුත්තා'පි තස්ස බහවො, එකනාමා'ති මෙ සුතං★
අසීතිං දස එකො ච, ඉන්දනාමා මහබ්බලා★
තෙ චාපි බුද්ධං දිස්වාන, බුද්ධං ආදිච්ච බන්ධුනං★
දූරතො'ව නමස්සන්ති, මහන්තං වීතසාරදං★
නමො තෙ පුරිසාජඤ්ඤ, නමො තෙ පුරිසුත්තම★

යම් දිශාවකින් මළමිනී ගෙන යනු ලැබෙත් ද? පිසුණු (කේලාම්) කියන්නාවූ ඉදිරිපිට නැති තැන නින්දා කරන්නාවූ, ප්‍රාණඝාත කරන ගත ඇති රෞද්‍ර වූ සොරසිත් ඇත්තාවූ වඤ්චාකාරී වූ ජනයෝ (යම් දිශා භාගයකින් ගෙන යනු ලැබෙතියි කියත් ද) යස පිරිවර ඇත්තාවූ ඒ මහරජ තෙම යම් දිශාවක් ආරක්ෂා කෙරේද ජන තෙම ඒ දිශාවට දකුණු දිශාව යයි කියන්නේය. මෙයින් ඒ දිශාව දකුණු දිශා නම් වන්නීය.
කුම්භාණ්ඩයන්ට අධිපති වූ ඔහු විරූඪ නම් වන්නේය. ඒ මහරජ තෙම කුම්භාණ්ඩයන් විසින් පිරිවරණ ලද්දේ නැටුම් ගී කීම්වලින් සිත් අලවා වෙසෙයි.
ඒ රජහුගේ එක නම් ඇති බොහෝ වූ පුත්‍රයෝ ද ඇත්තාහයි මා විසින් අසන ලදි. මහත් බල ඇති ඉන්ද්‍ර යන නම් ඇත්තාවූ ඔව්හූද අනූඑක්දෙනෙක් වන්නාහ.
ඒ පුත්‍රයෝ ද ආදිච්චබන්ධු වූ මහත් බවට පැමිණියාවූ පහවූ භය ඇති සර්වඥයන් වහන්සේ දැක දුරදීම පුරුෂ ශ්‍රේෂඨයන් වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවා, පුරුෂ උත්තමයන් වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවා, යි කියා නමස්කාර කරති.

කුසලෙන සමෙක්ඛසි,★ අමනුස්සාපි තං වන්දන්ති සුතං නෙ'තං අභිණ්හසො,★
තස්මා එවං වදෙමසෙ★ජිනං වන්දථ ගොතමං,★ ජිනං වන්දාම ගොතමං★
විජ්ජාචරණසම්පන්නං, බුද්ධං වන්දාම ගොතමං★

සර්වඥතාඥානයෙන් ලෝකයා බලන සේක (එහෙයින්) අමනුෂ්‍යයෝ ද නුඹවහන්සේට වඳිති. මේ වචනය අප විසින් නැවත නැවත අසන ලදි. එහෙයින් මෙසේ කියමිහ. ගෞතම නම් වූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරවුදැයි (අසමිහ එසේ අප විසින් විචාරණ ලද යක්ෂයෝ) ගෞතම සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හයි (කියති.) විද්‍යාචරණ (නුවණ හා සීල සමාධි) ගුණයෙන් යුක්ත වූ ගෞතම බුදුන් වහන්සේට අපි නමස්කාර කරම්හයි (කීවාහුය.)

යත්ථ චොග්ගච්ඡති සුරියො, ආදිච්චො මණ්ඩලි මහා★
යස්ස චොග්ගච්ඡමානස්ස, දිවසො'පි නිරුජ්ඣති★
යස්ස චොග්ගතෙ සුරියෙ, සංවරී'ති පවුච්චති★
රහදොපි තත්ථ ගම්භීරො, සමුද්දො සරිතොදකො★
එවං නං තත්ථ ජානන්ති, සමුද්දො සරිතොදකො★

යම් දිශාවෙක්හි දිලිසෙන මහත් මණ්ඩල ඇති, සූයශීයා බැසයයිද, සූයශීයා බැස ගිය කල්හි දවල් කාලය නැතිවේද, යම් සූයශීයෙකු බැස ගිය කල්හි රාත්‍රියයි

කියනු ලැබේද, ඒ සූයස්‍යියා බැස ගිය තන්හි (ඇත්තාවූ) ඒ විල ගැඹුරු වූ පැතුරුණා වූ ජලය ඇති සමුද්‍රය නම් වන්නේය. ඒ සූයස්‍යියා බැස ගිය තන්හි (ඇත්තාවූ) ඒ විල පැතුරුණාවූ ජලය ඇත්තා වූ සමුද්‍රයයි දනිති. මෙයින් ඒ දිශාව බස්නාහිර දිශාව යයි ජනයා කියන්නේය.

ඉතො සා පච්ඡිමා දිසා, ඉති නං ආචික්ඛති ජනෝ★
යං දිසං අභිපාලෙති, මහාරාජා යසස්සිසෝ★
නාගානං ආධිපති, විරූපක්ඛෝ ඉති නාමසෝ★
රමතී නච්චගීතෙහි, නාගෙහි පුරක්ඛතෝ★
පුත්තා'පි තස්ස බහවෝ, එකනාමා'ති මෙ සුතං★
අසීතිං දස එකෝ ච, ඉන්දනාමා මහබ්බලා★
තෙ චාපි බුද්ධං දිස්වාන, බුද්ධං ආදිච්චබන්ධුනං★
දූරතෝ'ව නමස්සන්ති, මහන්තං වීතසාරදං★
නමෝ තෙ පුරිසාජඤ්ඤ, නමෝ තෙ පුරිසුත්තම★

යස පිරිවර ඇත්තාවූ යම් මහරජෙක් ඒ දිශාව ආරක්ෂා කෙරේද, නාගයන්ට අධිපති වූ විරූපාක්ෂ නම් වූ ඒ වරම්රජ තෙම නාගයන් විසින් පිරිවරණ ලද්දේ නැටුම් ගී කීම්වලින් සිත් අලවා වෙසෙයි. ඒ වරම් රජහුගේ එක නම ඇති බොහෝ වූ පුත්‍රයෝ ද ඇත්තාහයි මා විසින් අසන ලදි. මහත් බල ඇත්තා වූ ඉන්ද්‍ර නම් ඔවුහු අනූඑක්දෙනෙක් වන්නාහ. ඔව්හු ද සූයස්‍යිවංශයට නෑ වූ මහත් බවට පැමිණියාවූ පහවූ භය ඇති සර්වඥයන් වහන්සේ දැක දුරදීම පුරුෂ ශ්‍රේෂඨයන් වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවා, පුරුෂොත්තමයන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා යි නමස්කාර කරත්.

කුසලෙන සමෙක්ඛසි,★ අමනුස්සාපි තං වන්දන්ති සුතං නෙ'තං අභිණ්හසෝ,★
තස්මා එවං වදෙමසෙ ජිනං වන්දථ ගොතමං, ජිනං වන්දාම ගොතමං★
විජ්ජාචරණසම්පන්නං, බුද්ධං වන්දාම ගොතමං★

දක්ෂවූ සර්වඥතාඥානයෙන් ජනයා බලන්නෙහි යයි කියා අමනුෂ්‍යයෝ ද නුඹවහන්සේට වඳිති. මේ වැඳීම අප විසින් නැවත නැවත අසන ලදි. එහෙයින් මෙසේ කියම්හ. (තෙපි) ගෞතම නම් වූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරවුදැයි (අප විසින් අසන ලද යක්ෂයෝ) ගෞතම නම් සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හ. ඒ විද්‍යාචරණ (නුවණ හා සීල සමාධි) ගුණයෙන් යුක්ත වූ ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට අපි නමස්කාර කරම්හයි කියති.

යෙන උත්තරකුරූ රම්මා, මහානෙරු සුදස්සනෝ★
මනුස්සා තත්ථ ජායන්ති, අමමා අපරිග්ගහා★
න තෙ බීජං පවපන්ති, නපි නීයන්ති නඞ්ගලා★

අකට්ඨපාකිමං සාලිං, පරිභුඤ්ජන්ති මානුසා★
අකණං අථුසං සුද්ධං සුගන්ධං තණ්ඩුලප්ඵලං★
තුණ්ඩිබීරෙ පචිත්වාන, තතො භුඤ්ජන්ති භොජනං★

යම් දිසාවෙක් හිරමය්‍යවූ උතුරු කුරු දිවයින පිහිටියේද දැකුම් කටයුතුවූ මහාමෙරු පර්වතය වන්නේද, ඒ උතුරු කුරු දිවයිනෙහි වස්ත්‍රාභරණාදිය මගේය මගේය යයි ගැනීමක් නැත්තාහු භාය්‍යාපග්‍රහයක් (භාය්‍යාවන් අයත් කර ගැන්මක්) නැත්තා වූ මනුෂ්‍යයෝ උපදිත්. ඒ මිනිස්සු වී නොවපුරන්නාහ. සීසෑම පිණිස නගුල් කෙතට නොගෙනියත්. ඒ මනුෂ්‍යයෝ නොසානා ලද භූමියෙහි හට ගෙණ පැසුණා වූ ඇල් සාල් බත් අනුභව කරත්. කුඩු නැත්තාවූද පොතු නැත්තාවූද පිරිසිදු වූ සුවඳ ඇති සහල් ඵල කොට ඇතිහැල් රන් සැළියෙහි ලා (ජොතිපාසාණ නම් ගල් උණුසුමෙන්) පිස ඒ සැළියෙන් ගත් කෑම කති.

ගාවිං එකබුරං කත්වා, අනුයන්ති දිසොදිසං★
පසුං එකබුරං කත්වා, අනුයන්ති දිසොදිසං★
ඉත්ථිවාහනං කත්වා, අනුයන්ති දිසොදිසං★
පුරිසවාහනං කත්වා, අනුයන්ති දිසොදිසං★
කුමාරිවාහනං කත්වා, අනුයන්ති දිසොදිසං★
කුමාරවාහනං කත්වා, අනුයන්ති දිසොදිසං★

ඔව්හු ගවදෙනෙකු එක් කුර ඇති වාහනයක් කොට දිසානුදිසාවන්හි සංචාරය කරති.
සිව්පාසතෙකු එක් කුර ඇති වාහනයක් කොට දිසානුදිසාවන්හි සංචාරය කරති.
ස්ත්‍රියක් වාහනය කොට දිසානුදිසාවන්හි සංචාරය කරති.
පුරුෂයෙකු හෝ වාහනය කොට දිසානුදිසාවන්හි සංචාරය කරති.
තරුණියක් වාහනය කොට දිසානුදිසාවන්හි සංචාරය කරති.
තරුණයෙක් වාහනය කොට දිසානුදිසාවන්හි සංචාරය කරති.

තෙ යානෙ අභිරුහිත්වා, සබ්බා දිසා අනුපරියන්ති පචාරා තස්ස රාජිනො★
හත්ථියානං අස්සයානං, දිබ්බං යානං උපට්ඨිතං★
පාසාදා සිවිකාචෙ'ව, මහාරාජස්ස යසස්සිනො★

ඒ වෙසවුණු මහ රජුහුගේ පිරිවර යක්ෂයෝ හස්ත්‍යශ්වාදී අනේක ප්‍රකාර වූ වාහනවල නැගී සියලු දිසා භාගයෙහි වටකොට ඇවිදිති.
යස පිරිවර ඇත්තාවූ වෙසවුණු මහරජ හට ඇත් යානද, අස්ව යානද, දිව්‍ය යානාද, ප්‍රාසාදද, සිවිගෙවල්ද, උඩුමහල් ගෙවල්ද, රන්සිවිගෙවල්දවි වන්නාහ.

තස්ස ච නගරා අහූ, අන්තලික්ඛෙ සුමාපිතා★
ආටානාටා කුසිනාටා පරකුසිනාටා, නාටපුරියා පරකුසිතනාටා★
උත්තරෙන කපීවන්තො, ජනොඝ මපරෙන ච★

නවනවතියො අම්බර අම්බරවතියො, ආළකමන්දා නාම රාජධානි★
කුවෙරස්ස බො පන, මාරිස, මහාරාජස්ස විසාණා නාම රාජධානි★
තස්මා කුවෙරො මහාරාජා, වෙස්සවණ්ණො ති පවුච්චති★
පච්චෙසන්තො, පකාසෙන්ති, තතොලා තත්තලා තතොතලා ඔජසි තෙජසි තතොජසි, සුරො රාජා අරිට්ඨො නෙමි★
රහදොපි තත්ථ ධරණී නාම,★ යතො මෙඝා පවස්සන්ති වස්සා යතොපතායන්ති,★ සභාපි තත්ථ භගලවතී නාම යත්ථ යක්ඛා පයිරුපාසන්ති★

ඒ රජහට අහස්හි (උස ස්ථානවල හෝ උසට) මොනවට මවන ලද නගරයෝ වූවාහුය. ආටානාට නම් වූ නුවරෙකි, කුසිනාට නම් වූ නුවරෙකි, පරකුසිනාට නම් වූ නුවරෙකි, නාටපුරිය නම් වූ නුවරෙකි, පරකුසිතනාට නම් වූ නුවරෙක් ද විය. උතුරු දිශාවෙන් කපිවන්ත නම් නුවරෙකි. ඊට බස්නාහිර දිසාවෙහි ජනොඝ නම් වූ නුවරෙකි, නවනවුතියය නම් වූ නුවරෙකි, අම්බරඅම්බරවතිය නම් වූ නුවරෙකි, හා ආළකමන්දා නම් රාජධානිය ද වන්නාහුය. ''නිදුකාණන් වහන්ස, කුවෙර නම් මහරජහුගේ විසාණා නම් රාජධානියක් ද ඇත්තිය. ඒ කාරණයෙන් කුවෙර නම් මහරජ තෙම වෛශ්‍රවණ යයි කියනු ලැබේ.
වෙන් වශයෙන් කරුණු පරීක්ෂාකර කියන්නාවූ තතොලා නම් යක්ෂයෙකි, තත්තලා නම් යක්ෂයෙකි, තතොතලා නම් යක්ෂයෙකි, ඔජසි නම් යක්ෂයෙකි, තෙජසි නම් යක්ෂයෙකි, තතොජසි නම් යක්ෂයෙකි, සූරො නම් යක්ෂයෙකි, රාජ නම් යක්ෂයෙකි, (එකෙක් සූරොරාජා, සූරරාජා නම් යක්ෂයෙකි,) අරිට්ඨ නම් යක්ෂයෙකි, නෙමි නම් යක්ෂයෙකි යන යක්ෂයෝ දොළොස් දෙනෙක් වෙති.
යමකින් ජලය ගෙන වර්ෂාව වසී ද, වර්ෂාව යමකින් පැතිරේද, ඒ විසාණා රාජධානියෙහි වූ පණස් යොදුන් පමණ වූ විල ධරණී නම් වන්නිය. ඒ විල අද්දර යක්ෂයෝ නිතර රැස්වන දොළොස් යොදුන් රත්න සභා ශාලාව භගලවතී නම් වන්නිය.

තත්ථ නිච්චඵලා රුක්ඛා, නානාදිජගණායුතා,★
මයූර කොඤ්චාභිරුදා කොකිලාභි හි වග්ගුභි★
ජීවංජීවකසද්දෙත්ථ, අථො ඔට්ඨව චිත්තකා★ කුකුත්ථකා කුළීරකා★
වනෙ පොක්ඛරසාතකා★ සුකසාළික සද්දෙත්ථ, දණ්ඩමාණවකානි ච★
සොභති සබ්බකාලං සා, කුවෙර නළිනී සදා★

ඒ ශාලාව වටා නිතර ගෙඩි ඇත්තාවූද, නොයෙක් කුරුළු සමූහයාගෙන් ගැවසුණාවූද, මොනරුන් කොස්වාලිහිනින් හා කෝකිල ආදී පක්ෂීන් විසින් ද පවත්වන ලද සිත් පිනවන නාද ඇති වෘක්ෂයෝ ඇත්තාහ.

තවද පොකුණෙහි නාද කරන ජීවඤ්ජීවක නම් කුරුල්ලෝ ද උට්ඨවච්ත්තක නම් කුරුල්ලෝද වන කුකුලෝද පියුම් වනයෙහි රන්වන් කකුළුවෝ ද තල් රෙහෙරු ද හැසිරෙන්නාහය.
මේ පොකුණෙහි ගිරා සැළලිහිණින්ගේ ශබ්ද ඇත්තේ ය. දණ්ඩමාණවක නම් පක්ෂීහු ද හැසිරෙන්නාහ.
ඒ කුවේර නම් මහ රජහුගේ පොකුණ හැමකල්හි එකම ආකාරයෙන් බබලන්නීය.

ඉතෝ සා උත්තරා දිසා, ඉති නං ආචික්ඛති ජනෝ★
යං දිසං අභිපාලෙති, මහාරාජා යසස්සි සෝ★
යක්ඛානං ආධිපති, කුවෙරෝ ඉති නාම සෝ★
රමතී නච්චගීතෙහි, යක්ඛෙහි පුරක්ඛතෝ★
පුත්තා'පි තස්ස බහවෝ, එකනාමා'ති මේ සුතං★
අසීතිං දස එකෝ ච, ඉන්දනාමා මහබ්බලා★
තෙ චාපි බුද්ධං දිස්වාන, බුද්ධං ආදිච්චබන්ධුනං★
දූරතෝ'ව නමස්සන්ති, මහන්තං වීතසාරදං★
නමෝ තෙ පුරිසාජඤ්ඤ, නමෝ තෙ පුරිසුත්තම★

යස පිරිවර ඇත්තාවූ ඒ මහරජතෙම යම් දිසාවක් ආරක්ෂා කෙරේද ඒ දිසාව උතුරු දිසාව යයි මෙසේ ජන තෙම ඒ දිසාවට කියන්නේය. ඒ රජහුගේ බොහෝ වූ පුත්‍රයෝ ද සමාන නම් ඇති ඇත්තාහයි මා විසින් අසන ලදි. මහත් බල ඇති ඉන්ද්‍ර යන නම් ඇත්තාවූ ඔවුහු අනූඑක්දෙනෙක් වන්නාහ.
ඒ පුත්‍රයෝ ද ප්‍රබුද්ධ වූ ආදිච්චබන්ධු වූ මහත් බවට පැමිණියාවූ පහවූ භය ඇති සර්වඥයන් වහන්සේ දුරදීම දැක පුරුෂ ශ්‍රේෂඨයන් වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවා, පුරුෂ උත්තමයන් වහන්ස, නුඹ වහන්සේට නමස්කාර වේවා, යි කියා නමස්කාර කරති.

කුසලෙන සමෙක්ඛසි,★ අමනුස්සාපි තං වන්දන්ති සුතං නෙ'තං අභිණ්හසෝ,★
තස්මා එවං වදෙමසෙ ජිනං වන්දථ ගොතමං, ජිනං වන්දාම ගොතමං★
විජ්ජාචරණසම්පන්නං, බුද්ධං වන්දාම ගොතම'න්ති★

දක්ෂ වූ සර්වඥතාඥානයෙන් ලෝකයා බලන සේක (එහෙයින්) අමනුෂ්‍යයෝ ද නුඹවහන්සේට වඳිති. මේ වචනය අප විසින් නැවත නැවත අසන ලදි. එහෙයින් මෙසේ කියමිහ. ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරවුදැයි (අසන ලද්දාවූ ඔවුහු) ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරමිහ. විද්‍යාචරණ (නුවණ හා සීල සමාධි) ගුණයෙන් යුක්ත වූ ගෞතම සර්වඥයන් වහන්සේට නමස්කාර කරම්හයි කියති.

අයං බො සා මාරිස, ආටානාටියා රක්ඛා★ භික්ඛූනං භික්ඛුණීං★
උපාසකානං උපාසිකානං★ ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසු

විහාරායා''ති.★ යස්ස කස්ස චි, මාරිස,★ භික්ඛුස්ස වා භික්ඛුණියා වා★ උපාසකස්ස වා උපාසිකාය වා★ අයං ආටානාටියා රක්ඛා★ සුග්ගහිතා භවිස්සති සමත්තා පරියාපුතා★ තඤ්චේ අමනුස්සෝ★

නිදුකාණන් වහන්ස, ඒ මේ ආටානාටිය පිරිත වනාහි භික්ෂූන්ගේද, භික්ෂුණීන්ගේ ද, උපාසකවරුන්ගේද, උපාසිකාවරුන්ගේද, උවදුරු වැළැක්ම පිණිස, ආරක්ෂාව පිණිස, හිංසා වැළැක්වීම පිණිස, සැපසේ විසීම පිණිස, නොවෙහෙසීම පිණිස ද, වන්නිය. නිදුකාණන් වහන්ස, යම්කිසි භික්ෂුවක් විසින් හෝ, භික්ෂුණියක් විසින් හෝ, උපාසකයෙකු විසින් හෝ, උපාසිකාවක් විසින් හෝ, මේ ආටානාටිය නම් ආරක්ෂාව යහපත්ව ඉගෙන දැන ගන්නා ලද්දී ද, අක්ෂර පද නොපිරිහෙලා සම්පූර්ණකොට ඉගෙන ගන්නා ලද්දී ද, ඉදින් ඒ ආටානාටිය පිරිත ඉගෙන ගත්තාවූ ඔහු, යම් අමනුෂ්‍ය වූ,

යක්ඛො වා යක්ඛිණී වා★ යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා★ යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජෝ වා යක්ඛපචාරෝ වා★ ගන්ධබ්බො වා ගන්ධබ්බී වා★ ගන්ධබ්බපොතකො වා ගන්ධබ්බපොතිකා වා★ ගන්ධබ්බමහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජෝ වා ගන්ධබ්බපචාරෝ වා★ කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා★ කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩපොතිකා වා★ කුම්භණ්ඩමහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජෝ වා කුම්භණ්ඩපචාරෝ වා★ නාගො වා නාගිනී වා★ නාගපොතකො වා නාගපොතිකා වා★ නාගමහාමත්තො වා නාගපාරිසජ්ජෝ වා නාගපචාරෝ වා★ පදුට්ඨචිත්තෝ★ ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය,★ ඨිතං වා උපතිට්ඨෙය්‍ය,★ නිසින්නං වා උපනිසීදෙය්‍ය,★ නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය.★

යක්ෂයෙක් හෝ යක්ෂණියක් හෝ යක්ෂ පොතකයෙක් හෝ යක්ෂ පොතිකාවක් හෝ යක්ෂ මහාමාත්‍යයෙක් හෝ යක්ෂ පිරිසෙහි වූවෙක් හෝ යක්ෂ වැඩකරුවෙක් හෝ ගාන්ධර්වයෙක් හෝ ගාන්ධර්ව ස්ත්‍රියක් හෝ ගාන්ධර්ව පොතකයෙක් හෝ ගාන්ධර්ව පොතිකාවක් හෝ ගාන්ධර්ව මහාමාත්‍යයෙක් හෝ ගාන්ධර්ව පිරිසෙහි වූවෙක් හෝ ගාන්ධර්ව වැඩකරුවෙක් හෝ කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩියක් හෝ කුම්භාණ්ඩ පොතකයෙක් හෝ කුම්භාණ්ඩ පොතිකාවක් හෝ කුම්භාණ්ඩ මහාමාත්‍යයෙක් හෝ කුම්භාණ්ඩ පිරිසෙහි වූවෙක් හෝ කුම්භාණ්ඩ වැඩකරුවෙක් හෝ නාගයෙක් හෝ නාගිනියක් හෝ නාග පොතකයෙක් හෝ නාග පොතිකාවක් හෝ නාග මහාමාත්‍යයෙක් හෝ නාග පිරිසෙහි වූවෙක් හෝ නාග වැඩකරුවෙක් හෝ නපුරු සිත් ඇතිව, යන්නහු පසුපස්සේ යන්නේ හෝ වේද, සිටියහු ළඟ සිටින්නේ හෝ වේද, හිඳින්නහු ළඟ හිඳින්නේ හෝ වේද, නිදාගන්නහු ළඟ නිදාගන්නේ හෝ වේද,

න මෙ සො, මාරිස, අමනුස්සො ලභෙය්‍ය★ ගාමෙසු වා නිගමෙසු වා★ සක්කාරං වා ගරුකාරං වා.★ න මෙ සො, මාරිස, අමනුස්සො ලභෙය්‍ය★ ආළකමන්දාය රාජධානියා වත්ථුං වා වාසං වා★ න මෙ සො, මාරිස, අමනුස්සෙ ලභෙය්‍ය★ යක්ඛා නං සමිතිං ගන්තුං★ අපිස්සුනං මාරිස, අමනුස්සා★ අනවය්හම්පි නං කරෙය්‍යුං★ අවිවය්හං★ අපිස්සුනං මාරිස, අමනුස්සා★ අත්තාහි'පි පරිපුණ්ණාහි පරිභාසාහි පරිභාසෙය්‍යුං★ අපිස්සුනං මාරිස, අමනුස්සා★ රිත්තං'පි පත්තං සීසෙ නික්කුජ්ජෙය්‍යුං★ අපිස්සුනං මාරිස, අමනුස්සා★ සත්තධා පිස්ස මුද්ධං ඵාලෙය්‍යුං★

නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙම මාගේ ගම්වල හෝ නියම් ගම්වල හෝ සත්කාරයක් හෝ ගරු කිරීමක් නොලබන්නේය
නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙම මාගේ ආළකමන්දා නම් වූ රාජධානියෙහි වාසය කිරීමට තැනක් හෝ ස්ථිරවාසයක් හෝ නොලබන්නේය. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙම මාගේ යක්ෂයන්ගේ සමාගමට යන්ට ද නොලබන්නේය. නිදුකාණන් වහන්ස, තව ද ඔහු අමනුෂ්‍යයෝ අවාහවිවාහයන්ට නුසුදුස්සකු ද කරන්නාහුය. නිදුකාණන් වහන්ස, තව ද ඔහුට අමනුෂ්‍යයෝ ඔහුගේ ආත්මභාවය දක්වා සම්පූර්ණ පද ශබ්ද ඇති අපහාස වචන වලින් නින්දා කරන්නාහුය. නිදුකාණන් වහන්ස, තව ද ඔහුගේ හිසෙහි අමනුෂ්‍යයෝ හිස් වූ ලෝහ පාත්‍රයක් ද මුනින් නමන්නාහුය. නිදුකාණන් වහන්ස, තව ද ඔහුගේ හිස ද සත් කඩක් කොට පලන්නාහුය.

සන්තිහි, මාරිස, අමනුස්සා චණ්ඩා රුද්දා රභසා,★ තෙ නෙව මහාරාජානං ආදියන්ති★ න මහාරාජානං පුරිසකානං ආදියන්ති,★ න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති.★ තෙ බො තෙ මාරිස අමනුස්සා★ මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.★

නිදුකාණන් වහන්ස, රෞද්‍ර වූ නපුරු ගති ඇති එකට එක කරන්නාවූ අමනුෂ්‍යයෝ ඇත්තාහුය. ඒ අමනුෂ්‍යයෝ සතරවරම් රජ දරුවන්ගේ (වචනය) නොඅදහත්. සතරවරම් රජ දරුවන්ගේ අමාත්‍යයන්ගේ වචනය නොපිළිගනිති. යක් සෙනවියන් වෙනුවට සිටින්නන්ගේ වචනය නොපිළිගනිති. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යයෝ සතරවරම් මහරජදරුවන්ට අකීකරු වූයෝ යයි කියනු ලැබෙත්.

සෙය්‍යථාපි, මාරිස, රඤ්ඤෙදා මාගධස්ස විජිතෙ චොරා.★ තෙ නෙ'ව රඤ්ඤෙදා මාගධස්ස ආදියන්ති,★ න රඤ්ඤෙදා මාගධස්ස පුරිසකානං ආදියන්ති★ න රඤ්ඤෙදා මාගධස්ස පුරිසකානං පුරිසකානං ආදියන්ති★ තෙ බො තෙ මාරිස, මහා චොරා★ රඤ්ඤෙදා මාගධස්ස අවරුද්ධා නාම වුච්චන්ති.★

යම් සේ මගධ රටට අධිපති වූ රජහුගේ රටෙහි සොරු වෙත් ද, ඒ සොරු මගධ රටට අධිපති වූ රජහුගේ වචනය නොපිළිගනිති. මගධ රජහුගේ අමාත්‍යයන් ගේ

වචනය නොපිළිගනිති. මගධ රජහුගේ අමාත්‍යයන් වෙනුවට සිටින පුරුෂයන් ගේ වචනය නොපිළිගනිති. නිදුකාණන් වහන්ස, ඒ මහ සොරහු වනාහි මගධ රජහට අකීකරු වූවෝ නම් වෙත් යයි කියනු ලැබෙත්.

එවමෙව බො, මාරිස, සන්තිහි අමනුස්සා චණ්ඩා රුද්දා රභසා,★ තෙ නෙව මහාරාජානං ආදියන්ති★ න මහාරාජානං පුරිසකානං ආදියන්ති,★ න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති.★ තෙ බො තෙ මාරිස අමනුස්සා★ මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.★

නිදුකාණන් වහන්ස, එපරිද්දෙන්ම නපුරු ගති ඇති රෞද්‍ර වූ එකට එක කරන්නාවූ අමනුෂ්‍යයෝ ඇත්තාහුය. ඒ අමනුෂ්‍යයෝ සතරවරම් මහරජදරුවන්ගේ වචනය නොපිළිගනිත්. වරම් රජ දරුවන්ගේ සෙනවියන්ගේ වචනය නොපිළිගනිති. වරම් රජ දරුවන්ගේ සෙනවියන් වෙනුවට සිටින පුරුෂයන්ගේ වචනය නොපිළිගනිති. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යයෝ වරම් රජදරුවන්ට අකීකරු වූයෝ යයි කියනු ලැබෙත්.

යොහි කොචි, මාරිස, අමනුස්සො★ යක්ඛො වා යක්ඛිණී වා★ යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා★ යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛපචාරො වා★ ගන්ධබ්බො වා ගන්ධබ්බී වා★ ගන්ධබ්බපොතකො වා ගන්ධබ්බපොතිකා වා★ ගන්ධබ්බමහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බපචාරො වා★ කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා★ කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩපොතිකා වා★ කුම්භණ්ඩමහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩපචාරො වා★ නාගො වා නාගිනී වා★ නාගපොතකො වා නාගපොතිකා වා★ නාගමහාමත්තො වා නාගපාරිසජ්ජො වා නාගපචාරො වා★ පදුට්ඨචිත්තො★ භික්ඛුං වා භික්ඛුණිං වා★ උපාසකං වා උපාසිකං වා★ ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය,★ ඨිතං වා උපතිට්ඨෙය්‍ය,★ නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය.★ ඉමෙසං යක්ඛානං මහායක්ඛානං★ සෙනාපතීනං මහාසෙනාපතීනං★ උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං විරවිතබ්බං★ අයං යක්ඛො ගණ්හාති,★ අයං යක්ඛො ආවිසති,★ අයං යක්ඛො හෙඨෙති,★ අයං යක්ඛො විහෙඨෙති,★ අයං යක්ඛො හිංසති★ අයං යක්ඛො විහිංසති ★අයං යක්ඛො න මුඤ්චතී'ති.★

නිදුකාණන් වහන්ස, යම්කිසි අමනුෂ්‍ය යක්ෂයෙක් හෝ යක්ෂණියක් හෝ යක්ෂ පොතකයෙක් හෝ යක්ෂ පොතිකාවක් හෝ යක්ෂ මහාමාත්‍යයෙක් හෝ යක්ෂ පිරිසෙහි වූවෙක් හෝ යක්ෂ වැඩකාරයෙක් හෝ ගාන්ධර්වයෙක් හෝ ගාන්ධර්ව ස්ත්‍රියක් හෝ ගාන්ධර්ව පොතකයෙක් හෝ ගාන්ධර්ව පොතිකාවක් හෝ ගාන්ධර්ව මහාමාත්‍යයෙක් හෝ ගාන්ධර්ව පිරිසෙහි වූවෙක් හෝ ගාන්ධර්ව වැඩකරුවෙක් හෝ කුම්භාණ්ඩයෙක් හෝ කුම්භාණ්ඩියක් හෝ කුම්භාණ්ඩ පොතකයෙක් හෝ කුම්භාණ්ඩ පොතිකාවක් හෝ කුම්භාණ්ඩ මහාමාත්‍යයෙක් හෝ කුම්භාණ්ඩ පිරිසෙහි වූවෙක් හෝ කුම්භාණ්ඩ වැඩකරුවෙක් හෝ නාගයෙක් හෝ නාගිනියක් හෝ නාග පොතකයෙක් හෝ නාග පොතිකාවක් හෝ නාග මහාමාත්‍යයෙක් හෝ නාග පිරිසෙහි වූවෙක් හෝ නාග වැඩකරුවෙක් හෝ නපුරු සිත් ඇතිව, භික්ෂුවක් හෝ, භික්ෂුණියක් හෝ, උපාසකයෙකු හෝ, උපාසිකාවක් හෝ යන්නහු සමග පසුපස්සේ යන්නේ හෝ වේද, සිටියහු ළඟ සිටින්නේ හෝ වේද, හිඳින්නහු ළඟ හිඳින්නේ හෝ වේද, නිදාගන්නහු ළඟ නිදාගන්නේ හෝ වේද, මේ යක්ෂතෙම අල්වන්නේය. මේ යක්ෂතෙම ආවේශ වන්නේය. මේ යක්ෂතෙම පීඩා කරන්නේය. මේ යක්ෂතෙම විශේෂයෙන් පීඩාකරන්නේය. මේ යක්ෂතෙම හිංසා කරන්නේය. මේ යක්ෂතෙම විශෙෂයෙන් හිංසා කරන්නේය. කියා ප්‍රධාන යක්ෂ වූ යක්ෂ සේනාවට අධිපති වූ එහෙයින් මම හා සේනාපතිවූ මේ යක්ෂයන්ට යක්ෂ තෙම නොහරනේ යයි ඝෝෂා කොට දැන්විය යුතුයි. ශබ්ද නගා කිය යුතුයි. මුරගා කිය යුතුයි.

කතමෙසං යක්ඛානං මහායක්ඛානං★ සෙනාපතීනං මහාසෙනාපතීනං★

ඉන්දෝ සොමෝ වරුණෝ ච, භාරද්වාජෝ පජාපති★
චන්දනෝ කාමසෙට්ඨෝ ච, කින්නුඝණ්ඩු නිඝණ්ඩු ච★
පනාදෝ ඔපමඤ්ඤෙදා ච, දෙවසූතෝ ච මාතලී★
චිත්තසෙනෝ ච ගන්ධබ්බෝ, නළෝ රාජා ජනෙසභෝ★
සාතාගිරෝ හෙමවතෝ, පුණ්ණකෝ කරතියෝ ගුළෝ★
සීවකෝ මුවලින්දෝ ච, වෙස්සාමිත්තෝ යුගන්ධරෝ★
ගොපාලෝ සුප්පගෙධෝ ච ★හිරිනෙත්ති ච මන්දියෝ,★
පඤ්චාලචණ්ඩෝ ආළවකෝ, පජ්ජුන්නෝ සුමනෝ සුමුඛෝ
දධිමුඛෝ★ මණි මාණි චරෝ දීඝෝ අථෝ සෙරිස්සකෝ සහා.★

කවර යක්ෂ කෙනෙකුන්ට, කවර මහා යක්ෂ කෙනෙකුන්ට, කවර සෙනවිරත් කෙනෙකුන්ට, කවර මහ සෙනවිරත් කෙනෙකුට ද යත්?

ඉන්ද්‍රය, සොමය, වරුණය, භාරද්වාජය, ප්‍රජාපතිය, චන්දනය, කාමසෙට්ඨය, කින්නුඝණ්ඩුය, නිඝණ්ඩුය, පණාදය, ඔපමඤ්ඤදය, දේවසූතය, මාතලීය, චිත්‍රසේනය, ගන්ධර්වය, නළය, රාජය, ජනෙසභය, සාතාගිරය, හෙමවතය, පුණ්ණකය, කර්තියය, ගුලය, සීවකය, මුවලින්දය, විශ්වාමිත්‍රය, යුගන්ධරය, ගොපාලය, සුප්පගෙධය, හිරිය, නෙත්තිය, මන්දිය, පඤ්චාලචණ්ඩය, ආලවකය, පජ්ජුන්නය, සුමනය, සුමුඛය, දධිමුඛය, මනිමානීවරය, දීඝය (යන යක්ෂ සේනාධිපතීහුද) තවද මොවුන් හා එක්වූ සෙරිස්සක නම් යක්ෂයෙක් ද ඇත්තේය.

ඉමෙසං යක්ඛානං මහායක්ඛානං★ සෙනාපතීනං මහාසෙනාපතීනං★ උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං★ විරවිතබ්බං අයං යක්ඛො ගණ්හාති,★ අයං යක්ඛො ආවිසති,★ අයං යක්ඛො හෙඨෙති,★ අයං යක්ඛො විහෙඨෙති,★ අයං යක්ඛො හිංසති★ අයං යක්ඛො විහිංසති★ අයං යක්ඛො න මුඤ්චතී'ති.★ අයං ඛො සා මාරිස, ආටානාටියා රක්ඛා★ භික්ඛූනං භික්ඛුණීං උපාසකානං උපාසිකානං★ ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසු විහාරායා''ති.★

මේ යක්ෂතෙම අල්වාගන්නේය. මේ යක්ෂතෙම ආවේශ වන්නේය. මේ යක්ෂතෙම පීඩා කරන්නේය. මේ යක්ෂතෙම විශේෂයෙන් පීඩාකරන්නේය. මේ යක්ෂතෙම හිංසා කරන්නේය. මේ යක්ෂතෙම අත් නොහරින්නේයයි කියා ප්‍රධාන යක්ෂ වූ, යක්ෂ සේනාපති වූ, මේ යක්ෂයන්ට මෙපරිද්දෙන් දැන්විය යුත්තේය. ඝෝෂා කොට දැන්විය යුත්තේය. ශබ්ද නගා කිය යුත්තේය. මුරගා කිය යුත්තේය.
නිදුකාණන් වහන්ස, ඒ මේ ආටානාටිය ආරක්ෂාව වනාහි භික්ෂූන් ගේ ද, භික්ෂුණීන් ගේ ද, උපාසකයන්ගේ ද, උපාසිකාවන් ගේ ආරක්ෂාව පිණිස ද, (යක්ෂොපද්‍රව වලින්) නොවෙහෙසීම පිණිස ද, සුවසේ විසීම පිණිස ද පවත්නේය.

හන්දච'දානි මයං, මාරිස, ගච්ඡාම★ බහුකිච්චා මයං බහුකරණීයා'ති★
යස්ස'දානි තුම්හෙ මහාරාජානො කාලං මඤ්ඤථා'ති★
අථ ඛො භික්ඛවෙ චත්තාරො මහාරාජා උට්ඨායාසනා★ මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු.★
තෙපි ඛො භික්ඛවෙ යක්ඛා උට්ඨායාසනා★ අප්පෙකච්චෙ මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු.★
අප්පෙකච්චෙ මම සද්ධිං සම්මොදිංසු,★ සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා තත්ථෙවන්තරධායිංසු.★
අප්පෙකච්චෙ යෙනාහං තෙනඤ්ජලිං පණාමෙත්වා★ තත්ථෙවන්තරධායිංසු.★ අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා තත්ථෙවන්තරධායිංසු.★
අප්පෙකච්චෙ තුණ්හීභූතා තත්ථෙවන්තරධායිංසූ'ති.★

නිදුකාණන් වහන්ස, අපි බොහෝ වැඩ කටයුතු ඇත්තමිහ. එබැවින් දැන් අපි යම්හයි භාග්‍යවතුන් වහන්සේට දැන් වූවාහුය.
වරම්රජදරුවෙනි, තෙපි දැන් යම් ගමනක් සිතව්ද එයට කාලය බව දනිව් යයි වදාළ සේක.
ඉක්බිත්තෙන් සතරවරම් මහරජදරුවෝ උන් ආසනවලින් නැගිට මාහට නමස්කාර කොට ප්‍රදක්ෂිණා කොට එතන්හිම අන්තර්ධාන වූවාහුය.
ඒ (අනිකුත්) යක්ෂයෝද උන් ආසන වලින් නැගිට සමහර කෙනෙක් මාහට වැඳ පැදකුණු කොට එතන්හිම නොපෙනී ගියාහුය.

ඇතැම් කෙනෙක් මා සමග සතුටු වූවාහුය. සතුටු විය යුතු වූ සිහි කටයුතුවූ කථා පවත්වා එතන්හිම නොපෙනී ගියාහුය. ඇතැම් කෙනෙක් මාහට ඇඳිලි බැඳ නමස්කාර කොට එහිම අන්තර්ධාන වූවාහුය. ඇතැම් කෙනෙක් තමන්ගෙ නාම ගොත්‍ර කියා එතන්හිම අතුරුදහන් වූහ. සමහර කෙනෙක් තුෂ්ණීම්භූත වූවාහු (කිසිවක් නොකියා) එතන්හිම නොපෙනී ගියාහුය.

උග්ගණ්හාථ භික්ඛවෙ, ආටානාටියං රක්ඛං★
පරියාපුණාථ, භික්ඛවෙ, ආටානාටියං රක්ඛං★
ධාරෙථ, භික්ඛවෙ, ආටානාටියං රක්ඛං★
අත්ථසංහිතාය භික්ඛවෙ, ආටානාටියං රක්ඛා★ භික්ඛූනං භික්ඛුණීං★
උපාසකානං උපාසිකානං★ ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසු විහාරායා''ති.★

ඉදමවොච භගවා★ අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්'ති

චතුත්ථ භාණවාරං නිට්ඨිතං

''මහණෙනි, ආටානාටිය නම් පිරිත උගනිව්. මහණෙනි, ආටානාටිය නම් පිරිත නිතර පුහුණු කරව්. ආටානාටිය නම් පිරිත සිත්හි ලා දරා ගනිව්. මහණෙනි, ආටානාටිය පිරිත වැඩදායක වන්නේය. ආටානාටිය නම් පිරිත භික්ෂූන් ගේ ද, භික්ෂුණීන් ගේ ද, උපාසකයන්ගේ ද, උපාසිකාවන් ගේ ආරක්ෂාව පිණිස ද, පීඩා නොම පිණිස ද, සුවසේ විසීම පිණිස ද පවත්නේය.

වරම් රජ දරුවන් විසින් පළමුවෙන් කී හෙයින් දේවභාෂිත වූ මේ සූත්‍රය දෙවනි වර ශ්‍රී මුඛයෙන් දේශනා කොට වදාළ සේක. සතුටු සිත් ඇති ඒ ඇසූ භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේ ගේ වචනයට විශේෂයෙන් සතුටු වූවාහුය.

සතර වන බණවර කියා නිමවන ලදි.



ගරු වේරගොඩ සාරද නායක මහා ස්ථවිරයන් වහන්සේ විසින් කතෘත්වය දැරූ පොත්




















THE GREATEST MAN WHO EVER LIVED
THE SUPREME BUDDHA


BUDDHA'S CONSTANT COMPANION VENERABLE ANANDA
VEN. WERAGODA SARADA MAHA THERO


TEACH YOURSELF PALI IN ENGLISH
By
Ven. Weragoda Sarada Maha Thero


MAHAMANGALA SUTTA
THE HIGHEST BLESSING
VEN. WERAGODA SARADA MAHA THERO


The First Discourse of The Buddha
Ven. Narada Maha Thero

THE BUDDHIST WAY OF MEDITATION

"THE BUDDHA - WORD"


VANDANA
Buddhist Devotions


REFLECTION ON DEATH


DOCTRINAL & CULTURAL ASPECTS OF BUDDHISM
VEN. WERAGODA SARADA MAHA THERO

MEDITATION
ON LOVING KINDNESS
(KARANIYA METTA SUTTA)
REV. W. SARADA
THE SINGAPORE BUDDHIST MEDITATION CENTRE


ILLUSTRATED
DHAMMAPADA


FIRST SERMON OF THE BUDDHA


BUDDHIST DEVOTIONS

MAHA SATIPATTHANA SUTTA
THE ONLY PATH TO NIBBANA

BUDDHIST PROTECTIVE CHANTS


THE GREAT BOOK OF PROTECTION

Blessings to Conquer Sickness

THE HIGHEST BLESSING

TEACH YOURSELF PALI IN ENGLISH


The Great Book of Protection

ගරු වේරගොඩ සාරද නායක මහා ස්ථවිරයන් වහන්සේ



නූතන බුද්ධ භාෂිතය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අසහාය සාමයික මෙහෙය උදෙසා, සිය කාලය හා ශ්‍රමය සපුරා වැය කරමින්, මානව වංශයට දහම් මග හෙළි පෙහෙළි කිරීමේ මහා මෙහෙවරට කැප වී සිටින ගරු වේරගොඩ සාරද, සිංගප්පූරුවේ සංඝ නායක මහා ස්ථවිරයන් වහන්සේ අදලොව වෙසෙන ප්‍රශස්ථතම ධර්ම දූත යතිනායකවරයාණන් වහන්සේ නමකි.

1941කේ නොවැම්බර් මස 27 වනදා දකුණු ලක වේරගොඩ දී උපත ලද මේ යති ප්‍රභූවරයානෝ, උපාධි ලාභීව, ධර්මදූත මෙහෙය ආරම්භ කළේ ඉතා යොවුන් අවධියේ දීමය. දැනට ශතක 6 ක් පුරා ධර්මදූත මෙහෙයෙහි යෙදී සිටින ගරුතර වේරගොඩ සාරද යතිනායකයානන් වහන්සේ මුද්‍රිත මාධ්‍යයෙන් සහ විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම දුරකථන තාක්ෂණයෙන් පවා අද ලොවට ධර්මදානය සපයන්නේ නවීනයන්ගේ මනස හා ආධ්‍යාත්මික ගති-පැවතුම් පිළිබඳ පැහැදිලි අවබෝධයකිනි.

ගරු වේරගොඩ සාරද නායක මහා ස්ථවිරයන් වහන්සේ වර්තමානික ග්‍රාහක පිරිස, ශ්‍රව්‍ය-දෘෂ්‍ය මාධ්‍ය මගින් දැනුමත් විනෝදාස්වාදයත් ලබන්නට පුරුදු වී සිටින පරපුරක් හෙයින්, ගරුතර වේරගොඩ සාරද හිමිපාණෝ, ඔවුනගේ මනසට සරිලන පරිද්දෙන් බුද්ධ භාෂිතය, ඔවුන් අතට පත් කරන සේක. මුද්‍රිත හා විද්‍යුත් ප්‍රකාශන 700 ක් පමණ ලොවට පිරිනමා සිටින මේ යතිනායකයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම භාණ්ඩාගාරය නම් ඉංග්‍රීසි කෘතිය දොරට වැඩීමේ උළෙලේ දී, ඒ පිළිබඳ ව එක් දිනක් තුල පමණක් ලැබුණු දුරකථන ඇමතුම් සංඛ්‍යාව 2000 කටත් අධික විය. ඒ නිසා එය සිංගප්පූරු රාජ්‍යයේ ග්‍රන්ථ ප්‍රකාශන ඉතිහාසයේ සුවිශිෂ්ට වාර්තාවකට හිමිකම් කියන්නේය.

දැනට, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය භාරව වැඩ සිටින ගරු වේරගොඩ සාරද නායක ස්ථවිර පාදයන් වහන්සේ ලෝකයේ බොහෝ දේශයන් හී බුද්ධ ශාසනයේ ප්‍රගතියට හිතකාමී ධර්ම දූත මෙහෙවරක යෙදී සිටින සේක. එතුමන් ගේ ප්‍රධාන ප්‍රකාශ අතර, සිංහල හා ඉංගිරිසි ධම්මපදයත්, ජාතක කථා පිළිබඳ විද්‍යුත් ප්‍රකාශනයත් ප්‍රධාන තැන් ගනී. එතුමන් විසින්, ඉටු කෙරෙන මහා සාමයික මෙහෙය අඛන්ඩව පවත්වා ගෙන යනු පිණිස, ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුව පැතීම, බෞද්ධ ජනතාවගෙන් ඉටු විය යුතු කෘතඥතා පූර්වක චාරිත්‍රයකි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

ISBN No: 978-955-54970-1-5